328 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 328 - இல. 11
Volume 328 - No. 11

2026 අගෝස්තු 06වන බ්‍රහස්පතින්දා
2026 ஓகஸ்ட் 06, வியாழக்கிழமை
Thursday, 06th August, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1887]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1888-1931]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

MNP ක්‍රියාත්මක කිරීම සහ විදුලි සංදේශ සේවා සපයන්නන්ට සමාන පහසුකම් සැපයීම [තීරුව 1932]

උතුරු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ස්ථානගත කිරීම [තීරුව 1938]

**මහජන සෞඛ්‍යයට දුම්කොළවලින් වන බලපෑම සහ නීති විරෝධී දුම්කොළ වෙළෙඳාම හේතුවෙන් රජයේ ආදායම අහිමි වීම:**

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1941]

**සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 1947-2056]

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 2056-2057]

**කල්තැබීමේ ප්‍රශ්න** [තීරු 2058-2068]


# பிரதான உள்ளடக்கம்


**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப:1887]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1888-1931]

**தனி அறிவித்தல் மூல வினா:**

MNPஐச் செயற்படுத்தலும் தொலைத்தொடர்பு சேவை வழங்குநர்களுக்குச் சமமான வசதிகளை வழங்கலும் [ப: 1932]

வட மாகாண விளையாட்டுத் திணைக்களத்தை கிளிநொச்சி மாவட்டத்துக்கு இடமாற்றம் செய்தல் [ப: 1938]

**பொது மக்களின் சுகாதாரத்துக்கு புகையிலையால் ஏற்படும் பாதிப்பும் சட்டவிரோத புகையிலை வர்த்தகத்தால் அரச வருவாய் இழப்பும்:**

நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 1941]

**விலங்குகள் (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 1947-2056]

**தேசிய நீர்வழங்கல், வடிகால் சேவைகள் சபை (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 2056-2057]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 2058-2068]


# PRINCIPAL CONTENTS


SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1887]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1888-1931]

QUESTION BY PRIVATE NOTICE:

Implementation of MNP and Equal Facilitation of Telecommunication Service Providers [Col. 1932]

Relocation of Department of Sports of Northern Province in Kilinochchi District [Col. 1938]

IMPACT OF TOBACCO ON PUBLIC HEALTH AND LOSS OF GOVERNMENT REVENUE DUE TO ILLICIT TOBACCO TRADE:

Statement by Deputy Minister of Finance and Planning [Col. 1941]

ANIMALS (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed [Cols. 1947-2056]

NATIONAL WATER SUPPLY AND DRAINAGE BOARD (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed [Cols. 2056-2057]

ADJOURNMENT QUESTIONS [Cols. 2058-2068]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 අගෝස්තු 06වන බ්‍රහස්පතින්දා***
*2026 ஓகஸ்ட் 06, வியாழக்கிழமை*
*Thursday, 06th August, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m., MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Reports of the Sustainable Development Council for the years 2022, 2023 and 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Performance Report of the Administrative Appeals Tribunal for the year 2025.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා එවකට පැවති ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2024/2025 වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු .(ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කුරුණෑගල හරහා, කනත්තේ වැව, මල්වාන යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ජේ. කාලින්ද කල්කි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, දෙනියාය, කන්දිල්පාන, පිබිදෙනගම යන ලිපිනයෙහි පදිංචි ටී.එම්.එල්.පී.කේ. තෙන්නකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

ගරු කථානායකතුමනි, ගලිගමුව නගරය, දම්මල, අංක ඊ-07/2 යන ලිපිනයෙහි පදිංචි වී.එන්.සී. තෙන්නකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### 'අපි වෙනුවෙන් අපි' අරමුදල: විස්තර
### ‘அபி வெனுவென் அபி' நிதியம்: விபரம்
### “API WENUWEN API” FUND: DETAILS

368/2025

**1. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'අපි වෙනුවෙන් අපි' අරමුදල ආරම්භ කළ දිනය කවරේද;

(ii) අරමුදල සතු මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම අරමුදල මඟින් මුදල් වැය කළ එක් එක් කාර්යය, අදාළ ප්‍රතිලාභියා සහ වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) අරමුදල වඩාත් ඵලදායි ලෙස පවත්වාගෙන යාම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ‘அபி வெனுவென் அபி' நிதியம் ஆரம்பிக் கப்பட்ட திகதி யாது;

(ii) அந்நிதியத்திலுள்ள பணத்தொகை யாது;

(iii) மேற்படி நிதியத்தின் பணம் செலவிடப்பட்டுள்ள செயற்பாடுகள், அதனுடன் தொடர்புடைய பயனாளிகள் மற்றும் செலவிடப்பட்டுள்ள பணத் தொகை ஆகியன வெவ்வேறாக யாது;

(iv) மேற்படி நிதியத்தை மிகவும் பயனுள்ள வகையில் முன்னெடுத்துச் செல்வதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the date on which the "Api Wenuwen Api" Fund was established;

(ii) the amount of money held by the fund;

(iii) separately, the specific purpose for which money was spent from the fund, the relevant beneficiary and the amount of money spent on such purpose; and

(iv) the steps that will be taken to maintain the fund more effectively?

(b) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 'අපි වෙනුවෙන් අපි' අරමුදල 2008 පෙබරවාරි 19වන දින 2008 අංක 6 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනත මඟින් ආරම්භ කර ඇත.

(ii) 2026.07.31 දිනට 'අපි වෙනුවෙන් අපි' අරමුදලේ ශේෂය රුපියල් 1,986,278,324.59ක් වේ.

(iii)

- 2021 වර්ෂයේ සිට මේ දක්වා අරමුදල මඟින් වැය කළ එක් එක් කාර්යයන් පහත පරිදි වේ.

  අ. ත්‍රිවිධ හමුදා සහ පොලිසිය ප්‍රතිලාභීන් වෙත අර්ධ සහ පූර්ණ නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම. (ව්‍යාපෘති සංවර්ධන වියදම්)

  ආ. ත්‍රිවිධ හමුදා හා පොලිසිය වෙත ව්‍යාපෘති පරිපාලන වියදම් ගෙවීම.

  ඇ. රණජයපුර වෙළඳ සංකීර්ණයේ සහ කාර්යාලයේ පරිපාලන වියදම් ගෙවීම.

  ඈ. ස්ථාවර තැන්පත් සඳහා රඳවා ගැනීමේ බදු ගෙවීම.

  ඉ. ජාතික විගණන කාර්යාලය වෙත විගණන ගාස්තු ගෙවීම.

  ඊ. ව්‍යාපෘති දුරකථන, නිවාස සමීක්ෂණ, සංග්‍රහ/ගමන් හා කාර්ය මණ්ඩල දීමනා ඇතුළු ව්‍යාපෘති මෙහෙයුම් වියදම් හා වෙනත් වියදම්.

- මෙකේ පාලක මණ්ඩලයක් තිබෙනවා. පාලක මණ්ඩලයේ සමහර ගෙවීම් සහ මණ්ඩල සාකච්ඡා වාර සඳහා ගෙවීම් සහ ඔවුන්ගේ සංග්‍රහ සහ ගමන් වියදම් සඳහා තමයි ඒ වියදම් කරලා තිබෙන්නේ.

- 2010-2024 වර්ෂ තුළ මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව 'අපි වෙනුවෙන් අපි' අරමුදලේ නිවාස ව්‍යාපෘති වියදම් සාරාංශය ඇමුණුම i මඟින් දක්වා ඇත.

- "අපි වෙනුවෙන් අපි" අරමුදලේ 2021 සිට 2024 වර්ෂය දක්වා නිවාස ව්‍යාපෘති ගෙවීම් සාරාංශය ඇමුණුම ii මඟින් දක්වා ඇත.

ඒකේ විශේෂයෙන්ම තිබෙන්නේ ප්‍රතිලාභීන්ගේ අර්ධ නිවාස, ඒ කියන්නේ සම්පූර්ණ කර නැති නිවාස සහ සම්පූර්ණයෙන්ම හදන්න තිබෙන නිවාස පිළිබඳව වාගේම ඉඩම් හිමි අයවලුන් සඳහා මුදල් පහසුකම් ලබා දීම පිළිබඳවයි.

ඒ වාගේම නිවාස ව්‍යාපෘති ගෙවීම් සාරාංශය වෙනම තිබෙනවා. ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය සහ වැය කළ මුදල් ප්‍රමාණය iii සිට ix දක්වා වූ ඇමුණුම් මඟින් දක්වා ඇත.

2021 වර්ෂයට පෙර කාලය සඳහා අදාළ තොරතුරු සියල්ලම ලබා දීම සඳහා තවත් කාලයක් ගතවෙනවා, ගරු මන්ත්‍රීතුමනි. එබැවින් ඒ තොරතුරු ඉදිරි කාලයේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා. මොකද, 2008 පෙබරවාරි සිට 2021 දක්වා - වසර 13ක - කාල සීමාවට අදාළ තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශයේ නැහැ. අපි දැන් ඒ තොරතුරු එකතු කරගෙන යනවා. එවකට සිටි ආරක්ෂක ලේකම් සහ ඒ අරමුදල භාරව කටයුතු කරපු නිලධාරින් ඒවා එකතු කරලා තිබුණේ නැහැ. අපි බලයට පත් වුණාට පස්සේ තමයි ඒවා එකතු කරගෙන යන්නේ. ඒ කාලයේදී ඒ අරමුදල වෙනත් අමාත්‍යාංශයක් යටතේ පැවතිලා තිබෙනවා. ඒ පිළිබඳ තොරතුරු ලබා ගැනීමටත් අපි කටයුතු කරගෙන යනවා. එම තොරතුරු ලැබුණු පසු ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්.

(iv) "අපි වෙනුවෙන් අපි" අරමුදල සහ ජාතික ආරක්ෂක අරමුදල යන පනත් දෙකෙහි ම සඳහන් අරමුණ සහ පරමාර්ථ ජාතික ආරක්ෂක ප්‍රවර්ධනය සහ රණ විරු සුබසාධනයට අදාළ වන බැවින්, මෙම පනත් දෙක ඒකාබද්ධ කරමින් රණ විරුවන් වෙනුවෙන් තනි පනතක් යටතේ එක් ශක්තිමත් අරමුදලක් පවත්වාගෙන යෑම කෙරෙහි අපි අවධානය යොමු කර තිබෙනවා. ඒක ජාතික ආරක්ෂක අරමුදලේ පාලක මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කරන්නත් උපදෙස් ලබා දීලා තිබෙනවා. මොකද, අරමුදල් දෙකේම පොදු අරමුණු - common aims - තිබෙන නිසා තමයි අපි එකක් සකස් කරන්න බලාපොරොත්තු වන්නේ.

මේ වන විට මෙම පනත් දෙක ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් මූලිකව කරුණු සොයා බැලීම සඳහා විශේෂ විද්වත් කමිටුවක් පත් කිරීම සම්බන්ධයෙන්ද අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතිනවා.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, දීර්ඝ විස්තර සහිත ලේඛන බැවින් ඇමුණුම් i සිට ix දක්වා මම **සභාගත*** කරනවා.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මේ රට ආරක්ෂා කර ගැනීම සඳහා, මේ රටේ ඒකීයභාවය ආරක්ෂා කර ගැනීම සඳහා රණ විරුවන් 23,790ක් දිවි පිදුවා. ඒ වාගේම 60,000කට අධික රණ විරුවන් ජීවිත පරිත්‍යාගයෙන් සටන් කරලා බරපතළ තුවාලවලට ලක් වුණා. ඒ දිවි පිදූ රණ විරුවන්ගේ පවුල්වල අය, තුවාල ලද රණ විරුවන් වාගේම මහත් දුෂ්කරතා යටතේ කැපවීමෙන් දැනට සේවයේ නියුක්තව රට වෙනුවෙන් තම වගකීම් ඉටු කරන රණ විරුවන් ආරක්ෂා කිරීමේ වගකීම රජයටත්, අපටත් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරෙන් හෙළිදරව් වුණා, රුපියල් බිලියනයකට වැඩි විශාල මුදල් ප්‍රමාණයක් ගැන. ඔබතුමා කියපු සංඛ්‍යාව මට පැහැදිලි වුණේ නැහැ. සමහර විට ඔබතුමාට ඒක කියවද්දි වැරදෙන්න ඇති. ඔබතුමා දෙපාරක්ම කියෙව්වත්, ඒ සංඛ්‍යාව හරියට කියැවුණේ නැහැ. කොහොම වුණත්, රුපියල් බිලියන ගණනක මුදල් 'අපි වෙනුවෙන් අපි' අරමුදලේ තිබෙනවා. කෙසේ නමුත්, අවශ්‍ය අරමුදල් රට වෙනුවෙන් දිවි පුදපු අයගේ පවුල්වලට, කැපවීම් කරපු ඒ රණ විරුවන්ට හෝ දැනට ධුරය දරන රණ විරුවන්ට ප්‍රමාණවත් විධියට නොලැබෙන බවට මැසිවිලි රාශියක් ඉදිරිපත් වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, ඔබතුමා දිව්‍ය ලෝකයේ ඉඳලා පැමිණි කෙනෙක් කියලා. එහෙම නම් ඒ දිවි පිදූ රණ විරුවන් 23,790දෙනාගෙන් බොහෝදෙනෙක් ඔබතුමාට දිව්‍ය ලෝකයේදී මුණ ගැහෙන්න ඇති. මොකද, රට වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කරපු ඒ රණ විරුවන් අනිවාර්යයෙන්ම දිව්‍ය ලෝකයේ තමයි ඉන්නේ. එසේ දිව්‍ය ලෝකයේදී මුණ ගැහුණු අවස්ථාවේදීවත් ඔවුන් ඔබතුමාට කිව්වේ නැද්ද, රණ විරුවන්ගේ සුබසාධනය පිළිබඳව කරන වැඩ පිළිවෙළ මදි, ඒ වාගේම කරලා තිබෙන ආයෝජනය මදි, අතිවිශාල මුදල් ප්‍රමාණයක් ගොනු කරගෙන ප්‍රමාණවත් ලෙස ආයෝජනය නොකර සිටිනවා කියලා? ඔබතුමා ඒ පිළිබඳව ඉදිරියේදී ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, රණ විරුවන් ගැන කියනවා නම් ඔවුන් සම්බන්ධව තිබෙන සියලු දේවල් පිළිබඳව අපි ඉතාම හොඳින් අවබෝධ කරගෙන තිබෙන්නේ. ආණ්ඩුව විධියටත්, රජය විධියටත් අපි ඉතාම හොඳින් අවධාරණය කරගෙන තිබෙනවා, රණ විරුවන් සම්බන්ධයෙන් පසුගිය කාල වකවානුවල පැවැති රජයන් ක්‍රියා කළේ කොහොමද කියන එක.

මූලික වශයෙන්ම මෙම අරමුදල මඟින් ප්‍රතිලාභ ලැබෙන්නේ මිය ගිය සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වලට, ආබාධිත, විශ්‍රාමික සහ සේවයේ නියුතු අයවලුන්ටයි. ඔබතුමා කිව්වා වාගේම එහි විශාල මුදලක් තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් සොයා බැලුවාම දැනගන්න ලැබුණා, පසුගිය මාස 20ක විතර කාලයක් තුළදී නිවාස ඉදිකිරීමට සහ නිවාස අලුත්වැඩියා කිරීමට තමයි මූලික වශයෙන් කටයුතු කරලා තිබෙන්නේ කියන එක.

ප්‍රධාන වශයෙන්, රණවිරු ගම්මානම සෑහෙන ප්‍රමාණයක් තිබෙනවා. ඒවාට ගිහිල්ලා බැලුවාම පෙනෙනවා, පසුගිය දශක එකහමාරක් තිස්සේ එම රණවිරු ගම්මානවල යටිතල පහසුකම් හදලා නැති බව. ඒ වාගේම ජලය සපයා නැති, විදුලිය සපයා නැති, මාර්ග පද්ධතිය සකස් කරලා නැති සමහර රණවිරු ගම්මාන තිබෙනවා. එම නිසා රණ විරුවන් බාගෙට හදපු ගෙවල් වර්ෂ ගණනක් තිස්සේ අත්හැර තිබෙනවා. ඒ, ඔබතුමන්ලාගේ කාලවලදී ඒ රණ විරුවන්ව බලා ගත්ත හැටි තමයි. එම නිසා මම පෞද්ගලිකව රණවිරු ගම්මානවලට ගිහිල්ලා, මේ අරමුදලින් රණ විරුවන්ගේ සුබසාධන කටයුතු කරන්නේ කොහොමද කියලා සොයා බලනවා.

ගරු මන්ත්‍රීතුමනි, සමහර රණ විරුවන් මූල්‍ය ආයතනවලින් ණය මුදල් අරගෙන සමාජය තුළ ලොකු ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙනවා. ඔවුන් ඒ ණය අර්බුදයෙන් ගලවා ගන්නේ කොහොමද කියලාත්, මේ අරමුදල පාවිච්චි කරලා සහන ක්‍රමය යටතේ කටයුතු කරන්නේ කොහොමද කියන එකත් අපි බලනවා.

අපේ රටේ රණ විරුවන් විශාල ප්‍රමාණයක් ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ, විශේෂ කාර්ය බලකායේ ඉන්නවා. ඔවුන් සියලුදෙනා ගැනම අපි ඉතාම හොඳ සැලකිල්ලෙන් කටයුතු කරනවා. ඒ වාගේම ඉදිරියේදී විශේෂයෙන් මේ අරමුදල ඔවුන් වෙනුවෙන්ම කටයුතු කරන්න අපි යොදවනවා කියන එකත් මම කියන්න ඕනෑ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, ආරක්ෂක ඇමතිතුමා සාමාන්‍යයෙන් ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නේ නැති නිසා නියෝජ්‍ය ඇමතිතුමා වශයෙන් මෙතුමාට තමයි ආරක්ෂාව පිළිබඳව පිළිතුරු දීමේ වගකීම තිබෙන්නේ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට ආරක්ෂාව පිළිබඳව විශාල පළපුරුද්දක් තිබෙන බව අපි දන්නවා. ඒ ගැන අපි අහලා තිබෙනවා වාගේම ඔබතුමාත් ඒ ගැන කියලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, නැවත යුද්ධයක් ඇති වීම වැළැක්වීම තමයි අපි කළ යුතු ප්‍රධානම දේ. නැවත යුද්ධයක් ඇති වීම වැළැක්වීම සඳහා, විශේෂයෙන්ම උතුර, නැඟෙනහිර ජීවත් වන සාමාන්‍ය ජනතාවගේ - සිංහල, දෙමළ, මුස්ලිම් කියන තුන් වර්ගයම උතුර, නැඟෙනහිර ජීවත් වෙනවා - ජීවන තත්ත්වය උසස් කරන්න අපි ඉන්දියාව සමඟ අවබෝධතා ගිවිසුම් කිහිපයකට ඇතුළත් වුණා, 2025.04.05වැනි දා. ඒ කියන්නේ, ඉන්දු-ලංකා සබඳතා ඇති කරලා, විශේෂයෙන්ම උතුර, නැඟෙනහිර ප්‍රදේශවල දියුණුවෙන් ආපස්සට ගොස් සිටින ජනතාවගේ ජීවිත ගොඩනඟා ගන්න අවස්ථා ඇති කරන්න. ඒ වාගේම, කන්කසන්තුරේ වරාය ගොඩනඟන්නට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රධාන ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ප්‍රධාන ප්‍රශ්නයට අදාළයි, ගරු කථානායකතුමනි. ඔබතුමාට ඒ ගැන තේරුම් යයි, මම මේ අතුරු ප්‍රශ්නය ඇහුවාම.

ඒ වාගේම, උතුරේ කන්කසන්තුරේ වරාය, පලාලි ගුවන් තොටුපළ දියුණු කිරීම සඳහා ඉන්දියාව ලොකු ආධාර මුදලක් ලබා දීලා තිබෙනවා. හැබැයි, ඒ කිසිවක් පාවිච්චි වෙන්නේ නැහැ.

දැන් ඔබතුමා මේ 'අපි වෙනුවෙන් අපි' අරමුදල පාවිච්චි කරලා රණ විරුවන්ගේ ජීවිතය ශක්තිමත් කරනවා වාගේ ඒ ප්‍රදේශවල ජීවත් වන සිවිල් ජනතාවගේ ජීවිතය දියුණු කරන්න. විශේෂයෙන්ම ඉන්දියාව සමඟ ඇති කරගෙන තිබෙන මේ ගිවිසුම් ශක්තිමත් කරලා, සත්‍ය වශයෙන්ම ඒවා ක්‍රියාත්මක කරලා,

ආරක්ෂාවට හානියක් නොවන ආකාරයෙන් කටයුතු කරන්න. අපි දන්නවා, මේ සබඳතා පිළිබඳව තිබෙන ගැටලුව සම්බන්ධයෙන්. ගිවිසුම් අත්සන් කළාට ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය තමයි ඔබතුමාට තිබෙන්නේ. පාලම හදන්න කැමැති නැහැ, ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය නිසා. වරාය හදන්න කැමැති නැහැ, ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය නිසා. ගුවන් තොටුපළ දියුණු කරන්න කැමැති නැහැ, ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය නිසා. ඒ අනුව, උතුරේ නැවත යුද්ධයක් ඇති වීම වළක්වන්නත්, විධිමත් ලෙස මේ අරමුදල් පරිහරණය කරන්නත් ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, මෙතුමා මූලික ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ 'අපි වෙනුවෙන් අපි' අරමුදල සම්බන්ධවයි. මම දන්නේ නැහැ, මෙතුමා ඒක මේ කාරණයට සම්බන්ධ කරගන්නේ කොහොමද කියලා. මෙම අරමුදල පාවිච්චි කරලා ආරක්ෂාව සපයන්න,- *[බාධා කිරීමක්]* ඔබතුමාත් නීතිඥයෙක්. ඒක නිසා ඔබතුමා මේ ගැන හොඳින් කල්පනා කරන්න. *[බාධා කිරීමක්]* අන්න හරි. මොකක්ද? "වුැක් පැනලා" කියලාද ඒකට කියන්නේ? ඒ විධියේ ප්‍රශ්නයක්, ඒ විධියට ඇහුවොත් තමයි සාමාන්‍යයෙන් හොඳ, පරිණත, professional, intelligent උත්තරයක් දෙන්න පුළුවන් වෙන්නේ. ඒක ඔබතුමාට තේරෙනවා නේ. මොකද, පසුගිය කාල වකවානුවල ඔබතුමන්ලා බලයේ ඉන්නකොට ජන වාර්ගික ප්‍රශ්නය ඇති කරන්න ජන භේද ඇති කළේ. ඒ වුණාට අපි එහෙම නොවෙයි. ජන වාර්ගික ප්‍රශ්නය ඉතාම හොඳින් අවබෝධ කරගෙන අපි ඒ ජනතාව ළඟට ගිහිල්ලා කටයුතු කරනවා. මම පසුගිය සුමානයේත් මුලතිව්වලට ගියා. ඊට කලින් මන්නාරමට ගියා, යාපනයට ගියා. ඒ ප්‍රදේශවල මහජනතාව හමු වෙලා, ඔවුන්ගේ ප්‍රශ්න ගැන සොයා බැලුවා. ඒ ප්‍රශ්න විසඳන්න මේ අරමුදලින් මුදල් යොදවන්න බැහැ. ඒ සඳහා අපේ වෙනමම පරිපාලන ව්‍යුහයක් තිබෙනවා.

ඔබතුමා දැක්කා නේ, ජනාධිපතිතුමා යාපනයට ගියාම ඒ ජනතාව තුළ එතුමා කෙරෙහි තිබුණු ආදරය, ඇල්ම කොහොමද කියලා. ඒ මොකද? අපි දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරනවා කියලාද? එහෙම නැත්නම් ෆෙඩරල් ක්‍රමය දෙනවා කියලාද? නැහැ. අපි අරගෙන ගියේ අපේ වැඩ පිළිවෙළ, ශක්තිමත්කම, පරිණතකම. ඒ නිසා ප්‍රශ්නයක් අහනකොට බුද්ධිමත්ව අහන්න. එපමණයි මට ඒ සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

## ආනයනික පිරිපහදු නොකළ පොල්තෙල්: හිඟ බදු
## இறக்குமதி செய்யப்பட்ட சுத்திகரிக்கப்படாத தேங்காய் எண்ணெய்: நிலுவை வரி
## IMPORTED UNREFINED COCONUT OIL: TAXES OUTSTANDING

463/2025

**2. ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024.01.01 සිට 2024.12.31 දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පිරිපහදු නොකළ පොල් තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) එම ප්‍රමාණයෙන් පිරිපහදු කර අළෙවි කර ඇති ප්‍රමාණය සඳහා 18%ක වැට් බද්ද සහ 2.5%ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ආනයනය කළ ආයතන විසින් ගෙවා තිබේද;

(iii) එසේ නම්, ගෙවා ඇති මුළු බදු මුදල කොපමණද;

(iv) ගෙවීමට ඇති හිඟ බදු මුදල කොපමණද;

(v) එම හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(vi) එම ආයතන සඳහා බදු සහන ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024.01.01 தொடக்கம் 2024.12.31 வரை இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட சுத்திகரிக்கப்படாத தேங்காய் எண்ணெயின் அளவு எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி அளவில் சுத்திகரிக்கப்பட்டு விற்பனை செய்யப்பட்ட அளவுக்காக 18% வற் வரி மற்றும் 2.5% சமூகப் பாதுகாப்பு உதவுத்தொகை அறவீடு என்பன இறக்குமதி செய்த நிறுவனங் களால் செலுத்தப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், செலுத்தப்பட்டுள்ள மொத்த வரி எவ்வளவு என்பதையும்;

(iv) செலுத்த வேண்டியுள்ள நிலுவை வரி எவ்வளவு என்பதையும்;

(v) மேற்படி நிலுவை வரியை அறவிடுவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(vi) மேற்படி நிறுவனங்களுக்கு வரிச் சலுகைகள் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the quantity of unrefined coconut oil imported into Sri Lanka during the period from 01.01.2024 to 31.12.2024;

(ii) whether the importing companies have paid 18 per cent VAT and 2.5 per cent Social Security Contribution Levy (SSCL) on the quantity that was refined and sold from the imported stock;

(iii) if so, the total amount of taxes paid;

(iv) the outstanding tax amount due;

(v) the measures that will be taken to recover the outstanding tax revenue; and

(vi) whether tax concessions have been granted to those companies?

(b) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2024.01.01 සිට 2024.12.31 දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පිරිපහදු නොකළ පොල්තෙල් ප්‍රමාණය පහත දැක්වේ.

| YEAR | HS CODE | UNIT | QUANTITY | CIF VALUE Rs. | TAX | | | | | | DESCRIPTION 01 | DESCRIPTION 02 | DESCRIPTION 03 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | VAT Rs. | EIC Rs. | PAL Rs. | SCL Rs. | CID Rs. | SSL Rs. | | | |
| 2024 | 15131111 | Kg | 18 | 22,579 | 0 | 0 | 0 | 2,216 | 0 | 0 | Animal, Vegetable or microbial fats and oils and their cleavage products; prepared edible fats; animal or vegetable waxes | Coconut (copra), palm kernel or babassu oil and fractions thereof, whether or not refined, but not chemically modified. | Coconut (copra) oil and its fractions: Crude oil: In bulk: Virgin coconut oil |
| 2024 | 15131119 | Kg | 33,630,234 | 12,920,831,458 | 0 | 0 | 0 | 2,010,091,942 | 0 | 0 | Animal, Vegetable or microbial fats and oils and their cleavage products; prepared edible fats; animal or vegetable waxes | Coconut (copra), palm kernel or babassu oil and fractions thereof, whether or not refined, but not chemically modified. | Coconut (copra) oil and its fractions: Crude oil: In bulk: Other |
| 2024 | 15131121 | Kg | 2 | 3,244 | 0 | 0 | 0 | 213 | 0 | 0 | Animal, Vegetable or microbial fats and oils and their cleavage products; prepared edible fats; animal or vegetable waxes | Coconut (copra), palm kernel or babassu oil and fractions thereof, whether or not refined, but not chemically modified. | Coconut (copra) oil and its fractions: Crude oil: Other: Virgin coconut oil |
| 2024 | 15131129 | Kg | 3 | 5,399 | 0 | 0 | 0 | 326 | 0 | 0 | Animal, Vegetable or microbial fats and oils and their cleavage products; prepared edible fats; animal or vegetable waxes | Coconut (copra), palm kernel or babassu oil and fractions thereof, whether or not refined, but not chemically modified. | Coconut (copra) oil and its fractions: Crude oil: Other: Other |

(ii) 2024.01.01 දින සිට පිරිපහදු නොකළ පොල්තෙල් ආනයනය කරන ලද සමාගම් 6ක් අතරින් එක සමාගමක් පමණක් එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවා ඇත. අනෙකුත් සමාගම් 5 සඳහා තක්සේරු නිකුත් කර ඇත.

(iii) වාර්තා ඉදිරිපත් කර අදාළ බදු ගෙවා තිබූ සමාගමට අනුව, වැට් සඳහා රුපියල් 2,428,772,107ක් ද - රුපියල් මිලියන 2,429ක් - සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා රුපියල් 434,144,509ක් ද - රුපියල් මිලියන 434ක් - ගෙවා තිබේ.

(iv) ඉතිරි සමාගම් 5ට අදාළව එකතු කළ අගය මත බද්ද සඳහා 2024 වර්ෂයේ කාර්තු හතර සඳහා රුපියල් 2,723,983,077ක - රුපියල් මිලියන 2,724ක - තක්සේරු දැන්වීම් නිකුත් කර ඇත. එකී මුදල් මේ වන විට හිඟ බදු ලෙස පවතී. එමෙන්ම සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා 2024 වර්ෂයේ කාර්තු හතර සඳහා රුපියල් 167,684,941ක - රුපියල් මිලියන 168ක - තක්සේරු නිකුත් කර ඇති අතර, එම මුදලද මේ වන විට හිඟ බදු ලෙස පවතී.

(v) තක්සේරු නිකුත් කර ඇති එක් සමාගමක් මේ වනවිට අභියාචනා කර ඇති අතර, එකී අභියාචනා විභාග වෙමින් පවතී. අනෙකුත් සමාගම්වලට නිකුත් කර ඇති තක්සේරු දැන්වීම් සඳහා අභියාචනා කිරීමට ඇති කාලය තවදුරටත් පවතින බැවින් එම කාලය ඉකුත් වූ වහාම අදාළ ක්‍රියාමාර්ග ගැනීම සිදු කරනු ලබන බව දන්වමි.

(vi) මෙම කිසිදු සමාගමක් සඳහා එකතු කළ අගය මත බද්ද සඳහා හෝ සමාජ ආරක්ෂණ බදු සඳහා සහන ලබා දී නොමැත.

(ආ) පැන නොනඟී.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ප්‍රශ්නය 2024 ජනවාරි මාසයේ පළමුවැනිදා ඉඳලා අද මේ මොහොත දක්වාම තිබෙනවා. මම මේ පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් ගිය අවුරුද්දේ ප්‍රශ්නයක් ඇහුවා. එතුමිය කිව්වා, අය කරගන්නවා කියලා. මුදල් නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇහුවා, වෙළෙඳ ඇමතිතුමාගෙන් අහලා තිබෙනවා. මම හිතන විධියට මේ ප්‍රශ්නය හයවැනි වතාවට ද කොහේද මේ අහන්නේ.

පසුගිය ජුනි 30වැනිදා වෙනකොට මේ සමාගම් පහ බදු ගෙවන්නේ නැතිව පොල් තෙල් ගෙනැල්ලා රුපියල් බිලියන 9.7ක් බදු ගෙවන්න තිබෙනවා. ඒගොල්ලන් මුදල් අමාත්‍යාංශයට ලියලා, පැවැති ආණ්ඩුවෙන් බදු සහන ඉල්ලුවා. ඒ පිළිබඳව සොයා බැලීමකුත් කරලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහන දෙන්න බැහැ කියලා තිබෙනවා. එක කට්ටියක් බදු ගෙවනවා. තව කට්ටියක් බදු ගෙවන්නේ නැහැ. ඒගොල්ලන්ට බදු ගෙවන්න නියෝග කළාම ඒගොල්ලන් අභියාචනා කරනවා. ඇයි, මේක අවුරුදු දෙකහමාරක් ඇදෙන්නේ?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා හොඳ ප්‍රශ්නයක් මතු කළේ. ඒකට පිළිතුර මෙහෙමයි. මේ සමාගම්වලින් එක සමාගමක් විතරක් බදු මුදල් හරි විධියට ගෙවලා තිබෙනවා. නමුත් ඊළඟ සමාගම් එක්ක කථා කරද්දී ඒගොල්ලන් විවිධ නීතිමය බාධක ඉදිරිපත් කරනවා, මේක නිෂ්පාදන කාර්යයක නිරත වෙන්නේ නැහැ කියලා. එහෙම විවිධ තර්ක ඉදිරිපත් කරමින් මේ තර්ක එක්ක ගැටිලා, නීතිපති දෙපාර්තමේන්තුවට interpretation එකක් ගන්න යවලා, එතැනින් එයට සම්බන්ධ වන අංශවලින් ඒක නිෂ්පාදන කාර්යයක්ද කියලා තොරතුරු තහවුරු කරගෙන සහ විවිධ ආයතනවලින් ආපු data ප්‍රමාණයන් අරගන්න ගිය කාලය තමයි තිබෙන්නේ. නමුත් මේ වනවිට පැහැදිලිව තක්සේරු නිකුත් කරලා තිබෙනවා. හැබැයි, ඔබ කියපු අගය වැරැදියි. බිලියන 12ක ප්‍රමාණයකට ඇවිල්ලා බිලියන 9ක් හිඟ බදු විධියට එන්න බැහැ.

මෙහෙම දෙයක් තිබෙනවා. බදු ගෙවන්නාගේ එකඟතාවෙන් තොරව තමයි තක්සේරු දැන්වීම් නිකුත් කරලා තිබෙන්නේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තීරණය කරලා තිබෙනවා, "පැහැදිලිව මේක නිෂ්පාදන ක්‍රියාවලියක්. ඒක නිසා පොල් තෙල් ගෙනැල්ලා නිෂ්පාදනය කරලා විකුණුවොත් එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ බද්ද ගෙවිය යුතුයි" කියලා. නමුත් බදු ගෙවන්නා එකඟ වෙන්නේ නැහැ. බදු පරිපාලන ක්‍රියාදාමය අනුව, බදු ගෙවන්නා එකඟ වෙන්නේ නැති අවස්ථාවක ඔහුට තක්සේරුවක් නිකුත් කරන කොට බදු ගෙවන්නාට අයිතිවාසිකමක් තිබෙනවා, ඊට එරෙහිව අභියාචනා කරන්න. මේ අවස්ථාවේදී නිකුත් කරලා තිබෙන තක්සේරුවලට අදාළව එක සමාගමක් මේ වෙනකොට අභියාචනය කරලා තිබෙනවා. ඒ අභියාචනය කරන අවස්ථාවේදී හිඟ බදු මුදල අය කරගන්න බැහැ. හිඟ බදු මුදල අය කරගන්න අභියාචනය අහලා අවසන් කරන්න ඕනෑ. නමුත් දෙපාර්තමේන්තුවෙන් අභියාචනය අහලා අවසන් කළාට පසුව බදු ගෙවන්නා තවදුරටත් එකඟ නොවෙනවා නම් බදු අභියාචනා කොමිෂන් සභාවට -Tax Appeals Commission - යන්න පුළුවන්. එතැනදීත් එකඟ නොවෙනවා නම්, අභියාචනාධිකරණයට යනවා. එතැනිනුත් නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා යන්න පුළුවන්. මෙන්න මේ ආයතනවලින් ගිහිල්ලා අවසාන තීන්දුව එනකල් මේ බදු මුදල අය කර ගන්න බැහැ, බදු ගෙවන්නා එකඟතාවකට එන්නේ නැත්නම්. ඔන්න ඔය ප්‍රමාදය තමයි තිබෙන්නේ, හිඟ බදු මුදල අය කර ගැනීමට.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියපු පරිදි, ගැසට් පත්‍රයේ පැහැදිලිව තිබෙනවා, "සියයට 18කට මේ බද්ද එනවා, SSCL එක සියයට 2.5ක් එනවා" කියලා. ඒ නිසා තමයි අනෙක් සමාගම් බදු ගෙවන්නේ. හැබැයි, මේ සමාගම් ගෙවන්නේ නැහැ. නමුත් අපි දකිනවා, පොඩි පොඩි බදු අඩුපාඩුවලටත් හැමෝම වාගේ අත්අඩංගුවට ගන්නා ආකාරය, phone එකත් එක්කම. හැබැයි, කොම්පැනි පහක් විතරක් survive වෙන එක පිළිබඳව සාධාරණ සැකයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ ගණන් ටික සොයා බලන්න. මම මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ 2024 අවුරුද්ද ගැන විතරයි. හැබැයි, 2025 අවුරුද්ද සහ 2026 අවුරුද්දේ ජුනි මාසය වනකල් ගත්තාම, අවුරුදු දෙකහමාරක එකතුව තමයි Rs. 9.7 billion කියලා මම කිව්වේ. මේ තුළින් සමාන වෙළෙඳ පොළක් නිර්මාණය වෙලා නැහැ නේ. ගෙවන්න ඕනෑ නැහැ කියලා ඒගොල්ලන් කියනවා නම්, එක්කෝ ඒගොල්ලෝ crude coconut oil ගෙනැල්ලා පිරිපහදු නොකර aflatoxin තිබෙන විෂකාරක වෙළෙඳ පොළට දමා තිබෙනවා. එහෙම ගෙවන්න ඕනෑ නම් අභියාචනා කර කර ඉන්න දෙයක් නැහැ. ගැසට් එකේ කරුණු පැහැදිලිව තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මට ඔබතුමා කියන දේ තේරෙනවා. ඒ නීතිය අනුව අභියාචනා කරන්න ඉඩ දෙන්න ඕනෑ. නමුත් මෙහි අකාර්යක්ෂමතාවකුත් තිබෙනවා. මොකද, වෙන

[ගරු එස්. එම්. මරික්කාර් මහතා]

අයට නීති තද වෙන්නයි, මේ කොම්පැනි පහට මේ නීතිය ඇදෙන්නයි විධියක් නැහැ නේ. මේ ක්‍රියාදාමය ඉවර වෙන්නේ කවදාද, මෙය අය කර ගැනීමට අවශ්‍ය අවසාන පියවර ගන්නා දිනය, කාල වකවානුව කවදාද කියා ඔබතුමාට දළ වශයෙන් කියන්න පුළුවන්ද?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරක් දෙන්න බැහැ. එසේ නිශ්චිත පිළිතුරක් දෙන්න බැරි හේතුවක් තිබෙනවා. මොකද, බදු ගෙවන්නාට අයිතියක් තිබෙනවා, තමන්ට විරුද්ධව තක්සේරුවක් නිකුත් කළොත් ඊට එරෙහිව- *[බාධා කිරීමක්]* ඒක තමයි බදු නීතිය. ඔබතුමා පොඩ්ඩක් අධ්‍යයනය කරලා බලන්න. අපේ රටේ විතරක් නොවෙයි, ලෝකයේ ඕනෑම රටක තිබෙන බදු නීතිය ඒකයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විධියට පැහැදිලිවම තීරණය කර තිබෙන්නේ බදු ගෙවන්නන් එකතු කළ අගය මත බද්ද සහ SSCL එක ගෙවන්න ඕනෑ කියලායි. මේකට රජය මැදිහත් වෙන්නේ නැහැ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බදු පරිපාලකයා විධියට තීරණය කර තිබෙනවා, මේගොල්ලන් ගෙවන්න ඕනෑ කියලා. නමුත් බදු ගෙවන්නන් ඒකට එකඟ වෙලා නැහැ. එතකොට බදු පරිපාලන ක්‍රියාදාමය අනුව, බදු ගෙවන්නාගේ අයිතිවාසිකම අනුව ඒ appeal එක ඉක්මනින් අසා බදු ගෙවන්නා එකඟතාවකට එන්නේ නැති වුණොත්, ඉහළ අධිකරණවලට යෑමේ හැකියාව තිබෙනවා. අපි දන්නේ නැහැ ඔවුන් එහෙම යයිද කියලා. එහෙම නොගියොත්, ඒ කියන්නේ පළමු අවස්ථාවේදීම සමථයකට පත් වුණොත්, appeal එක අහලා ඉවර වෙච්ච ගමන් වහාම අය කර ගන්න පුළුවන්. මේ ක්‍රියාදාමය අනුව අය කර ගන්න ඕනෑ කියන තැන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විධියට අපි පැහැදිලිවම ඉන්නවා. කාටවත් විශේෂයෙන් බදු සහන දෙන්න අපට අවශ්‍ය නැහැ. ඔබතුමා කියනවා වාගේ එක්කෙනෙක් ගෙවන කොට තවත් කෙනෙකු ගෙවන්නේ නැති වුණාම අසාධාරණයක් වෙනවා තමයි. ඔබතුමා කියන එක හරි. ඒක පැහැදිලියි. අපි ඒක පිළිගන්නවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විධියට, පවතින නීති රාමුව ඇතුළේ ගන්න පුළුවන් උපරිම ක්‍රියාමාර්ග මේ වන කොට අරගෙන තිබෙනවා.

## ශ්‍රී ලංකා ටෙලිකොම්: 2020 සිට මූල්‍ය කාර්යසාධනය
## இலங்கை ரெலிகொம்: 2020 முதல் நிதிச் செயலாற்றுகை
## SRI LANKA TELECOM: FINANCIAL PERFORMANCE SINCE 2020

471/2025

3. **ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) හි මුළු ආදායම එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ටෙලිකොම්හි මුළු ලාභය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) ඉහත (i) සහ (ii) ට අදාළව මුළු සෘජු සහ වක්‍ර බදු වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකා ටෙලිකොම් විසින් සේවයේ යොදවා ඇති මුළු කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව සහ පසුගිය වර්ෂ 5 සඳහා වැටුප් සහ වේතන සඳහා දරන ලද මුළු වාර්ෂික පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශේෂ පත්‍රයේ පිළිබිඹු වන ශ්‍රී ලංකා ටෙලිකොම්හි මුළු වත්කම් වටිනාකම සහ අනුරූප වෙළෙඳ පොළ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ශ්‍රී ලංකා ටෙලිකොම්හි ප්‍රධාන කොටස් හිමියන් තිදෙනා කවුරුන්ද;

(vii) රජය සතු කොටස්වල මුළු වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

டிஜிட்டல் பொருளாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை இலங்கை 'ரெலிகொம்' (SLT) ஈட்டிய மொத்த வருமானம் வருடாந்த அடிப்படையில் எவ்வளவு என்பதையும்;

(ii) 2020ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை இலங்கை 'ரெலிகொம்' ஈட்டிய மொத்த இலாபம் வருடாந்த அடிப்படையில் எவ்வளவு என்பதையும்;

(iii) மேலே (i) மற்றும் (ii) தொடர்பான மொத்த நேரடி மற்றும் மறைமுக வரிகள் எவ்வளவு என்பதை வெவ்வேறாகவும்;

(iv) இலங்கை 'ரெலிகொம்'இல் பணிக்கமர்த்தப்பட்ட பணியாட்டொகுதி உறுப்பினர்களின் மொத்த எண்ணிக்கை மற்றும் கடந்த 05 ஆண்டு களுக்கான சம்பளம் மற்றும் ஊதியங்களுக்காக ஏற்பட்ட மொத்த வருடாந்தச் செலவு எவ்வளவு என்பதை வெவ்வேறாகவும்;

(v) ஐந்தொகையில் பிரதிபலிக்கும் இலங்கை 'ரெலிகொம்'இன் மொத்த சொத்துப் பெறுமதி மற்றும் தொடர்புடைய சந்தைப் பெறுமதி எவ்வளவு என்பதை வெவ்வேறாகவும்;

(vi) இலங்கை 'ரெலிகொம்'இன் மூன்று பிரதான பங்குதாரர்கள் யாவர் என்பதையும்;

(vii) அரசாங்கத்திடமுள்ள பங்குகளின் மொத்தப் பெறுமதி இலங்கை ரூபாயில் எவ்வளவு என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Digital Economy:

(a) Will he state the -

(i) total revenue of the Sri Lanka Telecom (SLT) for the years from 2020 to date, on a yearly basis;

(ii) total profit of SLT for the years from 2020 to date, on yearly basis;

(iii) total direct and indirect taxes in relation to (i) and (ii) above, separately;

(iv) total number of staff members employed by SLT and the total annual cost incurred for the salaries and emoluments for the last five years, separately;

(v) total asset value of SLT reflected in the balance sheet, and the corresponding market value, separately;

(vi) three main shareholders of SLT; and

(vii) total value in Sri Lankan Rupees of the shares held by the Government?

(b) If not, why?

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

ගරු කථානායකතුමනි, ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| රුපියල් මිලියන | ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| මුළු ආදායම | 91,119 | 102,348 | 107,710 | 106,418 | 111,148 | 114,176 |

2026 මූල්‍ය වර්ෂයේ ටෙලිකොම් සමූහයේ පළමු කාර්තුවේ ආදායම රුපියල් බිලියන 30.8යි. ඒ කියන්නේ, පසු ගිය වර්ෂයට සාපේක්ෂව සියයට 10.6ක වර්ධනයක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 2020 සිට පළමුවෙනි අවුරුදු පහේ ප්‍රමාණයන් කියන්න පුළුවන්ද?

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

ඒ අවුරුදු පහේ ප්‍රමාණයන් තමයි මම කිව්වේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඒ අවුරුදු 5ම ගැන මම කිව්වා. 2026 අවුරුද්දේ පළමු කාර්තුවේ ඒවා විතරයි තවම තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පිළිතුර ලබා දීලා අවසන් කරන්න.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

On yearly basis තමයි මම දුන්නේ, ගරු මන්ත්‍රීතුමනි. මම දැන් ප්‍රශ්නයේ (ii) කොටසේ පිළිතුර කියන්නම්.

(ii)

| රුපියල් මිලියන | ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| බදු ගෙවීමෙන් පසු ලාභය | 7,881 | 12,161 | 4,765 | (3,921) | 3,120 | 10,014 |

ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහයේ බදු ගෙවීමෙන් පසු ලාභය 2026 වර්ෂයේ පළමුවැනි කාර්තුවේදී රුපියල් බිලියන 3.1ක් වෙනවා. ඒ කියන්නේ, පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 53.3ක වර්ධනයක් මේ අවුරුද්දේ පළමුවැනි කාර්තුවේ තිබෙනවා.

(iii)

| රුපියල් මිලියන | ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| සෘජු බදු හා අය කිරීම් | 5,398 | 5,926 | 11,235 | 10,688 | 10,159 | 7,997 |
| වක්‍ර බදු හා අය කිරීම් | 11,715 | 13,394 | 15,813 | 21,247 | 21,337 | 25,715 |
| මුළු එකතුව** | 17,113 | 19,320 | 27,048 | 31,935 | 31,496 | 33,712 |

** දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රේගුව සහ අනෙකුත් පළාත් පාලන හා රාජ්‍ය ආයතන වැනි බදු සහ අයකිරීම් එකතු කරන ආයතන වෙත ගෙවන ලද බදු හා අයකිරීම්.

(iv)

| | ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| සේවක සංඛ්‍යාව (එස් එල් ටී සහ මොබිටෙල්) | 8,179 | 8,032 | 8,058 | 7,629 | 7,435 | 7,225 |

මේකෙන් පැහැදිලි වෙනවා, අපි කාර්යක්ෂමතාව වැඩි කරලා තිබෙන බව, සේවක සංඛ්‍යාව අඩු වුණත්. ආදායම සහ ලාභය වැඩිවෙලා තිබෙනවා, ආයතන දෙකේ

| රුපියල් මිලියන | ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| කාර්ය මණ්ඩල පිරිවැය - වැටුප්, වේතන, අර්ථසාධක අරමුදල් දායක මුදල්, පාරිතෝෂික අරමුදල් දායක මුදල්, දීමනා සහ අනෙකුත් ප්‍රතිලාභ | 19,250 | 20,648 | 21,784 | 22,277 | 23,018 | 24,355 |

[ගරු එරංග වීරරත්න මහතා]

(v)

| රුපියල් මිලියන | ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| මුළු වත්කම් | 204,456 | 219,941 | 240,584 | 246,675 | 239,161 | 234,350 |

(vi)

| | | |
|---|---|---|
| 1 | මහා භාණ්ඩාගාර ලේකම් | 50.23% |
| 2 | ග්ලෝබල් ටෙලිකොමියුනිකේෂන්ස් හෝල්ඩින්ස් එන් වී | 44.98% |
| 3 | සේවක අර්ථසාධක අරමුදල | 1.40% |

(vii) ශ්‍රී ලංකා රජයට ශ්‍රී ලංකා ටෙලිකොම්හි සියයට 50.23ක කොටස් හිමි වෙනවා. ඒ අනුව, ආසන්න වශයෙන් රුපියල් බිලියන 78ක කොටස් වටිනාකමක් තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, රුපියල්වලින් තමයි මේ ශේෂ පත්‍රය ඉදිරිපත් කරන්නේ. ඔබතුමා ඉහත (iv) වැනි ප්‍රශ්නයට ලබා දුන් උත්තරය තුළ අපට පෙනෙනවා, රුපියලේ අගය අවප්‍රමාණ වීම නිසා රුපියල් බිලියන 216ක තිබුණු එක 2025 වර්ෂයේදී 234ක් වෙලා තිබෙන බව. ඒක අවප්‍රමාණය වෙලා තිබෙන ප්‍රමාණය බැලුවොත්, රුපියල් 275ට තිබුණු ඩොලරය රුපියල් 344ට ගිහිල්ලා තිබියදීත් ශේෂ පත්‍රයේ අඩුවීමක් ඇති වෙලා තිබෙන්නේ කොහොමද? ඒ වාගේම සෘජු බදු ප්‍රමාණය බිලියන 15ක් ගෙවන එක බිලියන 7.5කට - මට තොරතුරු ලැබුණු විධියට - අඩු වීගෙන ගිහින් තිබෙනවා. නමුත් වක්‍රශීලී බදු ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ ජනතාවගෙන් වැඩිය අය කරනවා, නමුත් කොම්පැනියෙන් සෘජු බදු අඩුවෙන් ගන්නවා. ඒ ඇති වෙලා තිබෙන විෂමතාව මොකක්ද?

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

ගරු කථානායකතුමනි, මේ වටිනාකම අඩු වෙන්න ප්‍රධානම හේතුව තමයි depreciation. මේ ආයතනයේ වාර්ෂික depreciation එක රුපියල් බිලියන 23ක්. ඒ වාගේම තිබුණු සමහර systems යල්පැන ගිහිල්ලා dispose වෙලා තිබෙනවා. මේ අවුරුදු 5ටම investments සිදු වෙලා නැහැ. මේ අවුරුද්දේ තමයි අලුතෙන් investments එන්නේ, 5G වාගේ තාක්ෂණයන්ට investments එනවා. මේ අවුරුද්දේ කරන investmentsවලින් ලබන අවුරුද්දේ ඔය asset value එක වැඩි වෙයි. පරණ අවුරුදුවල investments වෙලා නැහැ. තිබෙන ඒවා depreciate වෙලා, dispose වෙලා. ඒ නිසා තමයි මේ ආයතනයේ වත්කම අඩු වෙලා තිබෙන්නේ.

ඔබතුමා දෙවෙනි ප්‍රශ්නයෙන් ඇහුවා වක්‍ර බදු පිළිබඳව. වක්‍ර බදු ගොඩක් වෙලාවට එන්නේ spectrum space එකට ගෙවන බදු වාගේ ඒවායින්. සෘජු බදු ජනතාවගෙන් කෙළින්ම අය කරන ඒවා. මෙකේ අපි දකින trend එක තමයි, voice සහ SMS සේවාවලට විතරයි දැනට බදු තිබෙන්නේ. Dataවලට බදු නැහැ. Voice සහ SMS කියන ඒවා පාවිච්චිය එන්න එන්න අඩු වෙනවා. ඒ අඩුවීම උඩ සෘජු බදු අඩු වෙනවා. Dataවලට බදු ගහන්නේ නැති නිසා data පරිහරණය වැඩි වුණත්, ඒකෙන් බදු ආදායමක් එන්නේ නැහැ. ඒ නිසා තමයි එන්න එන්නම බදු ප්‍රමාණය අඩු වෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ඒ බදු ගහන්නේ ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තියක් අනුව නේ. ඉස්සෙල්ලා බද්දක් තිබුණා. ඒක අඩු වෙලාද, නැද්ද කියන එක මම දන්නේ නැහැ. නොදන්නා නිසා මම ඒ ප්‍රශ්නය ඉදිරියට ගෙනියන්නේ නැහැ.

නමුත් මට පෙනෙනවා, සේවක පිරිස සහ කළමනාකරණ අංශය අතර ලොකු ප්‍රශ්නයක් තිබෙනවා කියලා. කළමනාකරණ අංශය එක්ක ලොකු ප්‍රශ්න තිබෙනවා. ඒගොල්ලන්ට ඇහුම්කන් දෙන්නේ නැහැ කියන ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. මේ ඔක්කෝම බැලුවාම ඒගොල්ලන්ගේ ඉදිරි අනාගතය, going concern concept එක නැති වෙයි කියන ප්‍රශ්නය උඩද ඒ සේවක පිරිස ඒ ආකාරයට අඩු වෙන්නේ? මොකද, සේවක පිරිස අඩු වෙනවා. තමන්ගේ ශේෂ පත්‍රයේ වටිනාකම නැති වෙනවා. ඔබතුමා කියන විධියට depreciation අවුරුදු ගණනාවකට අඩු වී ගෙන යනවා නම්, ආයෝජනය කරන්නේ නැත්නම්, ඒකෙන් සියයට 45ක් පිට තිබෙනවා. ඒ වාගේම management එක සියයට 100ක් පිටතට දීලා තිබෙනවා. There could be a run-down of capital assets. So, acquiring more things has got to be looked at. ඒ සම්බන්ධව බැලුවොත්, මේ තිබෙන ප්‍රශ්නය භයානක තත්ත්වයකට ගමන් කරනවා. මොකද, ඔබතුමා කිව්වා voice සේවා පාවිච්චිය අඩු වනවා, 5G technology සඳහා ආයෝජන එනවා කියලා. ඒවා ඔක්කෝම ඕනෑ ආකාරයකට goodwill value එකේම දාන්න පුළුවන්. මොකද, capital base එකක් එන්නේ නැහැ නේ. ආයතනයේ කළමනාකරණය පිටතට දීලා, ownership එක රජය සතුව තිබීම නැති කිරීමේ ප්‍රවණතාවකට ගිහිල්ලා තිබෙනවා ද කියන ප්‍රශ්නය තමයි මට දැන් සේවක පිරිස අඩු වීමේ ප්‍රශ්නයෙන් මතු වෙන්නේ. රජය වශයෙන් ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් මොකක්ද කරන්නේ?

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

Hon. Speaker, the Hon. Member's Question is about the current state of the institution. If you really look at it, you would clearly see that the institution, which had been making losses in 2023, had made a huge profit in 2025. We have also shown that in the first quarter of this year, the performance of both the top-line and the bottom-line has increased by 10.6 per cent and 53.3 per cent, respectively. That shows the company is now on the right path, the management has adopted a proper and clear strategy in order to bring the company out of the dip and is gaining the right momentum. Even though the number of staff members has come down, the company is currently making improvement in the top-line and the bottom-line. The customer satisfaction is increasing, the number of subscribers is growing and the revenue is also increasing. Those achievements have been made through utilization of new technologies, restructuring of internal

staff as well as utilizing new systems to improve the efficiency of the organization. Especially, this Government has not been creating employment opportunities arbitrarily. That is the main reason why the number of employees has not increased this year.

## වෛද්‍ය නිලධාරින්: වැටුප් සහ විදේශගත වීම්
மருத்துவர்கள்: ஊதியம் மற்றும் புலம்பெயர்தல்
MEDICAL OFFICERS: SALARIES AND MIGRATION

599/2025

**4.** ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) සාමාන්‍ය වෛද්‍යවරයෙකුට සහ විශේෂඥ වෛද්‍යවරයෙකුට රජය විසින් ගෙවනු ලබන මාසික වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රජයේ සේවයේ නියුතුව සිටියදී නිවාඩු ලබා හෝ සේවයෙන් ඉවත්වී මේ වන විට විදේශගතව සිටින සාමාන්‍ය වෛද්‍යවරුන් සහ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2020 සිට 2025 දක්වා වාර්ෂිකව විදේශගතවූ මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එලෙස විදේශගත වීමට බලපා ඇති හේතු කවරේද;

(v) මේ වන විට විදේශගත වීම සඳහා ඉල්ලුම් කර ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(vi) වෛද්‍යවරුන්ගේ වැටුප් වැඩි කිරීම සඳහා රජය විසින් පියවර ගෙන තිබේද;

(vii) වෛද්‍යවරුන් රට හැර යෑම අවම කිරීම සඳහා වත්මන් රජය සතු වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொது மருத்துவர் ஒவருக்கும் விசேட மருத்துவ நிபுணர் ஒருவருக்கும் அரசாங்கத்தால் செலுத் தப்படும் மாதாந்த ஊதியம் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) அரசாங்க சேவையில் இருக்கும்போது லீவு பெற்று அல்லது சேவையிலிருந்து விலகி இன்றளவில் வெளிநாடுகளுக்குச் சென்றுள்ள பொது மருத்துவர்கள் மற்றும் விசேட மருத்துவ நிபுணர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) 2020ஆம் ஆண்டிலிருந்து 2025ஆம் ஆண்டு வரை வருடாந்தம் வெளிநாடுகளுக்குச் சென்றுள்ள மருத்துவர்களின் மொத்த எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அவ்வாறு வெளிநாடுகளுக்குச் செல்வதற்குத் தாக்கம் செலுத்திய காரணிகள் யாவை என்பதையும்;

(v) இன்றளவில் வெளிநாடுகளுக்குச் செல்வதற் காக விண்ணப்பித்துள்ள மருத்துவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(vi) மருத்துவர்களின் ஊதியங்களை உயர்த்துவதற்கு அரசாங்கம் நடவடிக்கை மேற்கொண்டுள்ளதா என்பதையும்;

(vii) மருத்துவர்கள் நாட்டை விட்டுச் செல்வதைக் குறைப்பதற்கு தற்போதைய அரசாங்கத்திட முள்ள வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) separately, the monthly salary paid by the Government to a Medical Officer and a Specialist Medical Officer;

(ii) the number of Medical Officers and Specialist Medical Officers, separately, who are currently abroad, having obtained leave or having resigned from the Public Service;

(iii) the total number of doctors who have migrated annually from the year 2020 to 2025;

(iv) the reasons for aforesaid migration;

(v) the number of doctors who have applied to go abroad so far;

(vi) whether the Government has taken steps to increase the salaries of the doctors; and

(vii) the programme of the current Government to mitigate the migration of doctors?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ප්‍රාථමික ශ්‍රේණියේ පත්වීමක් ලද වෛද්‍යවරයෙකුගේ ආරම්භක වැටුප,

- 2026.01.01 දින සිට රු. 84,574 + දීමනා
- 2027.01.01 දින සිට රු. 94,150 + දීමනා

විශේෂඥ වෛද්‍යවරයෙකුගේ ආරම්භක වැටුප,

- 2026.01.01 දින සිට රු. 136,575 + දීමනා
- 2027.01.01 දින සිට රු. 156,000 + දීමනා

[ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා ]

(ii) වැටුප් රහිත විදේශ නිවාඩු ලබාගෙන ඇති සාමාන්‍ය වෛද්‍යවරුන් සංඛ්‍යාව 1,429

(2020 වර්ෂයේ සිට 2026.06.19 දක්වා)

වැටුප් රහිත විදේශ නිවාඩු ලබාගෙන ඇති විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව 140

(2022 වර්ෂයේ සිට 2026.06.15 දක්වා)

සේවය හැරයාම හා ඉල්ලා අස්වීමෙන් පසු වෛද්‍යවරුන් විදේශගතව සිටී ද යන්න පිළිබඳව නිශ්චිත යමක් අමාත්‍යාංශයට ප්‍රකාශ කළ නොහැක.

(iii) වෛද්‍යවරුන් 3,791ක් විදේශගත වෙලා තිබෙනවා, 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා. 2020, 2021, 2022, 2023, 2024, 2025 කියන වර්ෂ අනුව ගත්තාම, විශේෂඥ වෛද්‍යවරුන් සැලෙන සංඛ්‍යාවක් විදේශගත වෙලා තිබෙනවා. ඒ විදේශගත වීම වැඩි වශයෙන් සිද්ධ වෙලා තිබෙන්නේ විදේශ විශේෂඥ පුහුණුව ලබා ගැනීමට යාම නිසා. අමාත්‍යාංශය මඟින් මැදිහත්වීමෙන් යවපු ප්‍රමාණය තමයි ඉතාම ඉහළ අගයක් ගන්නේ. අනෙක් අගය සැලකිය යුතු අගයක් දක්වන්නේ නැහැ. ඒ පිළිබඳව පහත වගුවෙහි විස්තරාත්මකව දක්වා තිබෙනවා.

| වර්ෂය | | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | |
|---|---|---|---|---|---|---|---|---|
| සාමාන්‍ය වෛද්‍යවරුන් | ආයතන සංග්‍රහය අනුව | 38 | 84 | 214 | 280 | 363 | 214 | |
| | 14/2022 චක්‍රලේඛ අනුව | - | - | 24 | 173 | 28 | 11 | |
| විශේෂඥ වෛද්‍යවරුන් | විදේශ පුහුණුව ලබා ගැනීම සඳහා (විශේෂඥ වෛද්‍යවර යෙකු වීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලීමට) | 196 | 335 | 468 | 454 | 390 | 379 | |
| | ආයතන සංග්‍රහය අනුව | 02 | 06 | 53 | 85 | 20 | 01 | 194 |
| | 14/2022 චක්‍රලේඛ අනුව | - | - | 14 | 05 | 01 | 07 | |

- 2020 - 2025 දක්වා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගත් විශේෂඥ වෛද්‍යවරුන් 194 දෙනා අතුරින් 54දෙනෙකු වරින් වර නැවත සේවයට වාර්තා කර ඇති අතර, විදේශගතව සිටින මුළු විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව (2020 - 2025 දක්වා විදේශගත වූ) 140කි.

(iv) අධ්‍යයන කටයුතු - postgraduate අධ්‍යයන කටයුතු - complete කර ගන්න තමයි වැඩිම ප්‍රමාණයක් ගිහිල්ලා තිබෙන්නේ. ඒ වාගේම විදේශ රැකියා, කලත්‍රයා සමඟ විදේශගත වීම, අධ්‍යාපන කටයුතු සඳහා, මඳසරුභාවය සඳහා ප්‍රතිකාර ලබා ගැනීම වැනි පෞද්ගලික හේතු මත වෛද්‍යවරුන් විදේශගත වී ඇත.

(v) ආයතන සංග්‍රහය හා චක්‍රලේඛ අනුව ඉල්ලුම්කරු කර ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව 280කි. (2026.01.01 දින සිට 2026.07.31 දින දක්වා)

(vi) රාජ්‍ය සේවයේ එක් ක්ෂේත්‍රයකට පමණක් වැටුප් වැඩි කිරීමක් ලබා දිය නොහැකි අතර, වත්මන් රජය බලයට පත් වීමත් සමඟ සමස්ත රාජ්‍ය සේවකයින් සඳහා විශාල වැටුප් වැඩිවීමක් සිදු කර තිබෙනවා. ඒ නිසා වෛද්‍යවරුන්ගේත් මූලික වැටුපට අමතරව අතිකාල දීමනා, අනෙකුත් දීමනා ඇතුළු සියලු දේ වැඩි වෙලා තිබෙනවා.

(vii) එක කාරණයක් තමයි, වෛද්‍යවරුන්ට සේවය කිරීමට සුදුසු පරිසර තත්ත්වයක් අපි නිර්මාණය කරමින් තිබෙනවා.

ඒ වාගේම වෛද්‍යවරුන්ට සේවය කිරීම සඳහා අවශ්‍ය guidelines හදන එක, protocols හදන එක අපි කරගෙන යනවා. ඒ වාගේම වෛද්‍යවරුන් සඳහා වූ දීමනා සහ අනෙකුත් පහසුකම් ලබා දීමටත් අපි කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම ප්‍රවාහන පහසුකම් සහ නවාතැන් පහසුකම් වැඩිදියුණු කිරීම සම්බන්ධව අපි අවශ්‍ය කටයුතු සලසා තිබෙනවා වාගේම ඒ සම්බන්ධයෙන් වූ නව යෝජනා අපි අධ්‍යයනය කරමින් තිබෙනවා. ඒ වාගේම විශේෂඥ වෛද්‍යවරුන්ට වාගේම විශේෂයෙන්ම ශ්‍රේණි වෛද්‍යවරුන්ට ඔවුන්ගේ රැකියාවේ තෘප්තිය ලබා ගැනීමට අවශ්‍ය වෘත්තීය ඉහළට යෑම් සම්බන්ධ pathway එකක් දැනට නැහැ. ඒ නිසා අපි Middle-Grade කියන සංකල්පය යටතේ ඒ pathway එක මේ දිනවල හදාගෙන යනවා. ඒ වාගේම Medical Ordinance එක සහ අනෙකුත් නීති රීති සහ ඒ පද්ධතිවල විය යුතු වෙනස්වීම් අපි මේ දවස්වල කරමින් යනවා. ඒ සමහර දේවල් ළඟදීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නත් අපි බලාපොරොත්තු වනවා.

(ආ) පැන නොනඟී.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

පිළිතුරු ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම ඔබතුමා ඒ උත්තරයේදී බොහොම පැහැදිලිව කරුණු ගණනාවක් ඉදිරිපත් කළා, guidelines සම්බන්ධයෙන්, protocols, ප්‍රවාහන දීමනා ඇතුළු අනෙකුත් දීමනා, නවාතැන් පහසුකම් ආදිය සම්බන්ධයෙන් තිබෙන තත්ත්වයන් පිළිබඳව.

මම ඔබතුමාගෙන් මෙන්න මේ කාරණයත් අහන්න කැමැතියි. ගරු කථානායකතුමනි, ඔබතුමාටත් මේක වැදගත් වනවා. මොකද, ඔබතුමාත් වෛද්‍ය සේවයේ හිටපු කෙනෙක්. අද වන විට ඇමතුම් රාජකාරි - on-call - ඉන්න වෛද්‍යවරුන්ට වැඩ කිරීමට අවශ්‍ය ඉන්ධන හා දවසේ පැය 24ම වැඩ කිරීමට අවශ්‍ය DAT එක ගැන ඔබතුමාත් දන්නවා. දැනට ඇත්තටම ගෙවන්නේ රුපියල් 70,000යි. ඇත්තටම දැන් තිබෙන ජීවන තත්ත්වය සහ මාසික ජීවන වියදමත් එක්ක ගළපා බැලුවොත් මේක රුපියල් 260,000ක් විතර වනවා. ඒ වාගේම අනෙක් එක තමයි, අමතර රාජකාරි දීමනාව. විශේෂයෙන්ම postmortem තියන ඒවාට, රෝගීන් බලනවාට, administration වැඩවලදී, මාසයකට අමතර පැය 120ක් වැඩ කිරීම වෙනුවෙන් කොළ පුරවා පුරවා තමයි දැන් මේ මුදල් ගන්න ඒ වෛද්‍යවරුන්ට සිද්ධ වෙලා තිබෙන්නේ. එම නිසා මේක ස්ථිර දීමනාවක් ලෙස සකස් කරන්න කටයුතු කරනවා නම් ඇත්තටම හොඳයි.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතට රජයේ සියලුම විධායක නිලධාරින් ඇතුළත් වනවා. හැබැයි, වෛද්‍යවරුන් මේකට ඇතුළත් වන්නේ නැහැ. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට මම අහන්නේ මෙයයි. විශේෂයෙන්ම මෙන්න මේ කාරණා තුන සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගන්න හදන පියවර මොකක්ද? ඒ කියන්නේ, DAT එක වැඩි කරනවාද? මොකද, දැන් තිබෙන තත්ත්වය අනුව ඒ දීමනාව රුපියල් 260,000ක් දක්වා වැඩි විය යුතුව තිබෙනවා. මෙන්න මේ කාරණා සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගන්නා පියවර මොනවාද කියලා මම දැනගන්න කැමැතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ සම්බන්ධයෙන් කථා කරමින් ඉන්නවා. විශේෂයෙන්ම වෛද්‍යවරුන්ට OT එකක් දෙන්න බැහැ. මොකද, මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරින්ට OT දෙන්නේ නැති නිසා අමතර දීමනාවක් - extra duty එකක් - විධියට තමයි ඒක දෙන්නේ. ඒ වාගේම extra duty දෙනකොට යම් සීමාවක් පනවා තිබෙනවා. ඒක අද ඊයේ පනවපු එකක් නොවෙයි, අවුරුදු 20කට, 30කට කලින් පනවපු එකක්. මේ දීමනාව ගෙවන්නේ, දවසකට උපරිම පැය 6කට සහ මාසයකට උපරිම පැය 120කට. මේකෙන් සමහර වෛද්‍යවරුන්ට සාධාරණයක් වෙන්නේ නැහැ. ඒ නිසා එක් එක් වාට්ටුවල සහ එක් එක් unitsවල තිබෙන outcome අනුව ඒ දීමනාව වැඩි කිරීමට පුළුවන්ද කියන කාරණය ගැන අපි සලකා බලනවා. මෙතැනදි කොළ පිරවීමේදී ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂඥ වෛද්‍යවරුන්ට එදිනෙදා වැඩ කටයුතු කරගෙන යන අතරතුර කොළ පිරවීමට සිදුවීම නිසා ඔවුන් ලොකු අපහසුතාවකට පත්වනවා. ඒ නිසා අපි ඒක fix කරපු දීමනාවක් විධියට විශේෂඥ වෛද්‍යවරුන්ට ලබා දීමට මේ දවස්වල සාකච්ඡා කරමින් යනවා. මම පෞද්ගලිකවම හිතනවා, ඒ කටයුත්ත මේ අවුරුද්ද තුළදී සාර්ථක කරගන්න පුළුවන් වෙයි කියලා. ඉන් අනතුරුව අනෙක් වෛද්‍යවරුන්ටත් එය ලබා දීමට අවශ්‍ය කටයුතු අපි සිදු කරමින් යනවා. ඒ වාගේම අපි පිළිගන්නවා, ප්‍රවාහන දීමනාව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා, ඒක අපි address කරන්න ඕනෑය කියලා.

අනෙක් එක තමයි, on-call කරනකොට රෝහල් පද්ධතිය තුළ ප්‍රමාණවත් පහසුකම් නැති නිසා වෛද්‍යවරුන්ට රෑට අනවශ්‍ය ලෙස තමන්ගේ රථවලින් එහෙට මෙහෙට ගමන් කිරීමට සහ වාහනය ඇතුළේ නිදාගැනීමට සිදුවීම. ඒක බොහොම අවාසනාවන්ත තත්ත්වයක්. අපි ඒ තත්ත්වය හොඳින්ම හඳුනාගෙන තිබෙනවා. ඒවා නැති කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් අපි සාකච්ඡා කරමින් පවතිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ශ්‍රේණි වෛද්‍ය නිලධාරින් ගැන ඔබතුමා මොකක්ද කියන්නේ?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
විශේෂඥ වෛද්‍යවරුන්ට වඩා ශ්‍රේණි වෛද්‍ය නිලධාරින් තමයි on-call ප්‍රශ්නයට වැඩිපුරම මුහුණපාන්නේ. ඒ වාගේම ඔවුන්ට නවාතැන් පහසුකම් පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම දුෂ්කර ප්‍රදේශවල ඉන්න අයට මුදල් ගෙවවත් නවතින්න තැනක් සොයාගන්න ලැබෙන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් අපි ප්‍රායෝගික වැඩ පිළිවෙළක් යොදන්න බලාපොරොත්තු වනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 ගැනත් ඔබතුමා කියන්න.

ගරු කථානායකතුමනි, පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ විශේෂඥ වෛද්‍යවරුන් විධියට ලියාපදිංචි වෙච්ච අය රට යන්න බලාගෙන ඉන්නේ. ඒ සමහර අය පර්යන්ත රෝහල්වල වැඩ කරනවා නේ. නමුත් සති දෙකකට විතර කලින් පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය විසින් ඒක නවත්වා, ඊංගොල්ලන්ට එහි වැඩ කරන්න එපා කියලා තිබෙනවා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. මොකද, මොකක් හරි වැරැද්දක් වුණොත් විශේෂඥ වෛද්‍යවරයාට උසාවි යන්න වෙනවා. ඒ වාගේම විශාල වන්දියක් ගෙවන්නත් සිදුවනවා. ඒ නිසා පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයට මේ ගැන කියලා ඒක නිවැරදි කරන්න කියන ඉල්ලීමත් මම කරනවා.

ඒ වාගේම මේ විශේෂඥ වෛද්‍යවරුන් සම්බන්ධ අනෙක් කාරණය තමයි, අනුමත වෛද්‍යවරුන් සංඛ්‍යාව. අනුමත cadre එක ගත්තාම, 2015දී තිබුණු cadre එක තමයි දැනුත් තිබෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි, මේ සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ මහා භාණ්ඩාගාරයත් එක්ක සාකච්ඡා කරන්න කියලා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා හැම ඉස්පිරිතාලයකටම ගිහිල්ලා කියනවා, ප්‍රාථමික ඒකක වැඩි කරනවා, දිස්ත්‍රික් රෝහල් සංවර්ධනය කරනවා, අර භාණ්ඩ දෙනවා, මේවා දෙනවා කියලා. එහෙම කිව්වාට ඇත්තටම මේකට අවශ්‍ය කරන - *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමනි, ඉන්නකෝ ඉතින්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට මේක කරන්න දෙන්නේ නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
භෞතික සම්පත් වැඩි කළාට මානව සම්පතත් වැඩි කරන්න ඕනෑ නේද, ගරු අගමැතිතුමියනි? මානව සම්පත වැඩි කරන්න අවශ්‍ය කටයුතු ටික කරන්න ඕනෑ කියලායි මා හිතන්නේ. 2015න් පස්සේ අද වනතුරු cadre එක වැඩි කරලා නැහැ.

අනෙක් කාරණය මෙයයි. දැන් සීමාවාසික වෛද්‍ය පුහුණුව දෙන්න රෝහල් තිබෙන්නේ 62යි. හැබැයි, අද විදේශ රටවලින් ඇවිල්ලා ඉන්න 500ක් එක්ක 2,500ක් ඉන්නවා, ඒ පුහුණුව බලාපොරොත්තුවෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රධාන ප්‍රශ්නයෙන් පැන නැඟෙන කාරණයක් සම්බන්ධව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ අනුව තමයි මම මේ කියන්නේ. සමහර විට තව අවුරුදු 3කින් ඔබතුමාටත් ගිහිල්ලා ඔතැන තමයි ඉන්න වෙන්නේ. ඒකයි මම මේ කියන්නේ, මේක අහන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මුළු දෙපාර්තමේන්තුවේම ප්‍රශ්න අහන්න එපා. ඔබතුමාගේ ප්‍රධාන ප්‍රශ්නයට අදාළව දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි, තත්පර කිහිපයයි මම ගන්නේ. මම අහපු ප්‍රශ්නයට සම්බන්ධයි මේක. ඒකයි අහන්නේ. වෙන ඒවා නොවෙයි අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, එහෙම සම්බන්ධ නැහැ. එහෙම සම්බන්ධ වෙන්න විධියක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ධීවර කර්මාන්තයට, බුද්ධාගමට අදාළ ඒවා මම අහන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේම ප්‍රශ්න අහන්නයි හදන්නේ. ඔබතුමාගේ ප්‍රධාන ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සීමාවාසික වෛද්‍ය පුහුණුව ගත් අය 2,000ක් විතර ඉන්නවා, පත්වීම් දෙන්න බැරිව. අද මේක විශාල අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම වෛද්‍ය පරිපාලන සේවයේ නිලධාරින්ට අද දෙන්නේ රුපියල් 6,000ක දීමනාවක්. ඒ නිසා වෛද්‍ය පරිපාලන සේවයට එක්කෙනෙක්වත් එන්නේ නැහැ. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ කාරණා සම්බන්ධයෙන් ඔබතුමා ගන්න පියවර මොකක්ද කියලා.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ගරු මන්ත්‍රීතුමනි, මට හිතෙන්නේ ඔබතුමා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්න ඔක්කෝම වාගේ ඇහුවා කියලායි. සෑහෙන වෙලාවක් ඕනෑ වනවා, ඒවාට උත්තර දෙන්න. ඒ නිසා මම කෙටියෙන් උත්තර දෙන්නම්. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99ට වෛද්‍යවරුන් ඇතුළත් වෙලා තිබුණේ නැහැ. ඒක දශකයක්, දෙකක් තිස්සේ දිවෙන ප්‍රශ්නයක්. යම් යම් නීතිමය ප්‍රශ්න නිසා තමයි ඒක දිග හැරෙමින් පවතින්නේ. එම නිසා අපි බලනවා, මේ චක්‍රලේඛය ඇතුළට වෛද්‍යවරුන් රිංගවනවාට වඩා, වෛද්‍යවරුන්ගේ ප්‍රශ්න වෙනම හඳුනාගෙන ඒ ප්‍රශ්නයට උත්තරය දෙන්න පුළුවන්ද කියලා.

ඊට පස්සේ, PGIM එකේ ප්‍රශ්නයක් ගැන ඇහුවා. ඇත්තටම PGIM එක ඊට සමාන අදහසක් එන නිවේදනයක් නිකුත් කරලා තිබුණා. නමුත් වෛද්‍යවරුන් සේවයේ යෙදවීම සම්බන්ධ තීරණ ගන්නේ PGIM එක නොවෙයි, සෞඛ්‍ය අමාත්‍යාංශය. එම නිසා PGIM එකේ Director ඒ ලියුම ගහලා දවස් දෙකකට පස්සේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිවේදනයක් නිකුත් කර තිබෙනවා, ඒ අයට විශේෂඥ වෛද්‍යරුන් විධියට වැඩ කරන්න පුළුවන් කියලා. ඒ නිසා ඒ ප්‍රශ්නය එතැනදි විසඳෙනවා. ඊළඟට ඔබතුමා අහපු ප්‍රශ්නය -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Cadre එක ගැන.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ප්‍රශ්න දෙකක් නොවෙයි, සියයක් විතර අහලා තිබෙනවා නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
වට කරලා අහලා තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම 2015න් පස්සේ cadre එක වෙනස් කරලා තිබුණේ නැහැ. 2017-2019 වර්ෂවලත් මේ සම්බන්ධව සංශෝධන කරලා තිබුණා. නමුත්, අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන cadre එක මුදල් අමාත්‍යාංශය විසින් කොච්චර දුරට accept කරනවාද කියන ප්‍රශ්නය තිබුණා. එම නිසා ඒක වඩාත් විද්‍යාත්මකව සැදීම සඳහා අපි අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) මඟින් විශේෂ කමිටුවක් පිහිටුවා ඒ cadre එක දැන් හදලා තිබෙනවා. Cadre එක සම්බන්ධයෙන් අපි මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරන්න බලාපොරොත්තු වනවා.

ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ තිබුණු ප්‍රශ්නයක් තමයි, විවිධ අය තම තමන්ට ඕනෑ විධියට විවිධ රෝහල්වල අක්‍රමවත් විධියට ඒකක ඇති කර ගැනීම. ඒ අයට දැන් එහෙම කරන්න බැහැ. අපේ අමාත්‍යාංශයේ වෙනම Technical Committee එකක් තිබෙනවා. යම් කිසි වාට්ටුවක් හරි යම් කිසි සේවාවක් හරි පවත්වා ගෙන යෑමට අවශ්‍ය අවසරය ඒ කමිටුවෙන් ගන්න ඕනෑ. එහෙම නැතිව ඒවා පවත්වාගෙන යන්න බැහැ. අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වූ සංවර්ධන ක්‍රියාදාමය වඩාත් විධිමත්ව හා නිශ්චිත ඉලක්ක සහිතව සකසා තිබෙනවා, සමහර ඒවා සකසමින් යනවා. එම නිසා හොඳ සැලැස්මක් ඇතිව ඉදිරියට වැඩ කරන්න පුළුවන් වෙයි. Cadre එකේ ප්‍රශ්නයත් මේ අවුරුද්දේ විසඳෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතකොට සීමාවාසික පුහුණුව?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ඇත්තටම සීමාවාසික පුහුණුව සඳහා 2,000ක් එකතු වුණේ මේ අවුරුද්දේ නොවෙයි. ඒ, අවුරුදු ගණනාවක් තිස්සේ එකතු වෙච්ච පිරිසක්. අපි බලාපොරොත්තු වනවා, ඒ ප්‍රශ්නය විසඳීම සඳහා ඔවුන් අතිපිහිත - overlap - කරලා සීමාවාසික පුහුණුව ලබා දෙන්න. Sri Lanka Medical Council එකේ සහ UGC එකේ අවසරයත් අපි ලබාගෙන තිබෙනවා, ඒකේ quality එක අඩු නොකර overlap කරලා හෝ ඒ පුහුණුව ලබා දෙන්න. එම නිසා 2,000කට ආසන්නව ඉන්න සියලු අයට ඉදිරි මාස කිහිපය තුළදී අපි සීමාවාසික පුහුණුව ලබා දෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
What about the Administrative Allowance?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
දැන් ඇති නේද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඔබතුමාට මේක වටිනවා. රුපියල් 6,000යි දෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක හරි, ඒක හරි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ගරු මන්ත්‍රීතුමනි, Administrative Allowance කියන එක වෙනම ගත්තාම, ඔවුන්ට ලබා දෙන දීමනාවල යම් අඩුවක් තිබෙන බව අපි පිළිගන්නවා. රුපියල් 6,000යි කිව්වාට ඔවුන්ට අනිකුත් දීමනාත් ලැබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කීයද හම්බ වෙන්නේ, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Administrative Allowance එක රුපියල් 6,000යි. ගරු මන්ත්‍රීතුමනි, මම ගොනු කරලා දෙන්නම්, ඔබතුමා අතුරු ප්‍රශ්න දෙක ඇතුළේ තව ප්‍රශ්න කීයක් ඇහුවාද කියලා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමාගේ ප්‍රශ්නයත් ඒකෙන් ආවා, බලන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක දැන් මට අදාළ නැහැ.

ප්‍රශ්න අංක 5 -705/2025- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 -886/2025- (2), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ලග්ගල පදිංචි කළ අවතැන් වූ ජනතාව: ජල පහසුකම්

### லக்கலவில் மீளக்குடியமர்த்தப்பட்ட இடம்பெயர்ந்தோர்: நீர் வசதி

### DISPLACED PEOPLE RESETTLED IN LAGGALA: WATER FACILITIES

1037/2025

**7. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළු ගඟ-මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වූ ජනතාව පදිංචි කර ඇති ලග්ගල මැතිවරණ කොට්ඨාසයේ ජීවත් වන ජනතාවට ප්‍රමාණවත් ජල පහසුකම් නොමැතිව පීඩා විඳින බව දන්නේද;

(ii) එසේ නම්, එම ජනතාව මුහුණ දී ඇති ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களு கங்கை - மொரகஹகந்த நீர்த்தேக்க கருத்திட்டம் காரணமாக இடம்பெயர்ந்த மக்கள் குடியேற்றப்பட்டுள்ள லக்கல தேர்தல் தொகுதி யில் வாழும் மக்கள் போதிய நீர் வசதியின்றி சிரமங்களுக்கு உள்ளாவதை அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அம்மக்கள் முகங்கொடுத்துள்ள நீர்ப் பிரச்சினையை தீர்ப்பதற்காக மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) whether he is aware that the people living in the Laggala Electorate, who were displaced and resettled due to the Kalu Ganga-Moragahakanda Reservoir Project, are suffering without adequate water facilities; and

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

(ii) if so, the measures that will be taken to resolve the water issue faced by aforesaid people?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මොරගහකන්ද හා කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අවතැන් වූ නැවත පදිංචි කළ ජනතාවට සහ එම ප්‍රදේශවල දැනට පදිංචිව සිටින ජනතාවට ආරක්ෂිත පානීය ජලය ලබා දීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය ආරම්භ කළ අතර මේ වනවිට එහි වැඩකටයුතු අවසන් කර 2026.07.01වන දින සිට ප්‍රතිලාභී පවුල් සඳහා ජල සම්බන්ධතා ලබා දීම ආරම්භ කර ඇත. ඒ අනුව ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 21ක ජීවත් වන පවුල් 6,800කට නව ජල සැපයුම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
පිළිතුරු ලබා දුන්නාට ස්තුතියි, ගරු ඇමතිතුමනි. මේක බොහොම කාලයකට කලින් - අවුරුදු එකහමාරකට විතර කලින් - යොමු කළ ප්‍රශ්නයක්. ඔබතුමා කිව්වා වාගේ මේ වනකොට 6,800කට නව ජල සැප\යුම් ලබා දෙන්න ඕනෑ. Applications issue කරලා තිබෙනවා, 3,200ක්. Applications 1,840ක් ආපසු ලැබී තිබෙනවා. 400ක් ඇස්තමේන්තු කරලා තිබෙනවා. Connections 128ක් දීලා තිබෙනවා. මට පළමුවන අතුරු ප්‍රශ්නයෙන් දැනගන්න ඕනෑ මේ කාරණයයි, ගරු ඇමතිතුමනි. මේක ක්‍රියාත්මක කරන්න permanent cadre එකක් ඕනෑ. මේ වනකොට ඒ cadre එක නැතිකම තුළ ප්‍රශ්නයක් මතුව තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතියේ වැඩකටයුතු අවසන් කර තිබෙනවා. මේ වනකොට තිබුණු සම්බන්ධතා 186කට දැනටමත් අපි ජලය ලබා දෙමින් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ, අපට ජල සම්බන්ධතා සඳහා applications ලැබී තිබෙනවා. අපි ජල සම්බන්ධතා ලබා දෙනවා. අපි ලබන 12වැනි දා ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය නිල වශයෙන් විවෘත කරනවා. එතැන ව්‍යාපෘතිය පවත්වාගෙන යෑම සඳහා අනිවාර්යයෙන් cadre එකක් ඕනෑ. අපි ඒ සඳහා කටයුතු කරමින් සිටිනවා. එම ව්‍යාපෘතිය පවත්වා ගැනීම සඳහා staff එකක් ඕනෑ නේ. ඒ සඳහා බඳවා ගැනීම් කිරීමට කටයුතු කරනවා. ජනතාවට ජලය ලබා දීම කිසිසේත්ම අඩාළ නොවෙන්න අවශ්‍ය වැඩකටයුතු අපි සම්පාදනය කරන්නම්.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

මේ තැන්වල බට එළීමේදී යම් යම් ගැටලු මතු වෙලා තිබෙනවා. මම අවස්ථා 2ක් ගැන කියන්නම්. එක අවස්ථාවක් තමයි, පවුල් 6,800කට මාර්ගය හරහා නව ජල සැපයුම් ලබා දෙන්න ඕනෑ වුණත් අපි 128කට නේ, එය ලබා දීලා තිබෙන්නේ.

මාර්ග හරහා බට එළනකොට RDA සහ PRDA පාරවල්වලට අමතරව මහවැලියේ පාරවල් තමයි තිබෙන්නේ. එතකොට, ප්‍රාදේශීය සභාවට බට එළන්න කිව්වාට මහවැලියෙන් ඒ මාර්ග ප්‍රාදේශීය සභාව වෙත පවරන්නට ඕනෑ. මහවැලියෙන් ඒ මාර්ග ප්‍රාදේශීය සභාව වෙත පැවරීම ඔබතුමාට අයිති නැති වුණත්, බට එළීමේදී ඒ කටයුත්ත කර ගන්නට සිද්ධ වෙලා තිබෙනවා. නමුත්, ඒක තවමත් සිද්ධ වෙලා නැහැ.

ඊළඟ කාරණාව මෙයයි. මොරතැන්න, තෝරපිටිය, අකරහැඩිය වාගේම ඇලගමුව ගම්මානය ඇතුළු තවත් ගම්මාන ගණනාවක මේ වන තෙක් බට එළලා නැහැ. මම කිව්වේ එවැනි ගම්මාන කිහිපයක් ගැන විතරයි. මොකද, ඒ සඳහා ප්‍රතිපාදන නැහැ කියලා කියනවා. ඒ වාගේම, බට ටික දෙන්නම්, ඒ බට එළා ගන්න කියලා මිනිස්සුන්ට කියනවා. මෙතැනදී එක පිරිසකට එක විධියකටත්, තව පිරිසකට තව විධියකටත් තමයි ක්‍රියා කරලා තිබෙන්නේ. එම නිසා මහවැලියෙන් අදාළ මාර්ග පවරා ගැනීම සහ බට එළීම සඳහා ප්‍රතිපාදන නැහැ කියන කාරණා සම්බන්ධව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? සල්ලි නැහැ කියන්න බැහැ නේ. මොකද, මහා භාණ්ඩාගාරයේ සල්ලි තිබෙනවාය කියලා කියනවා නේ.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, මෙතුමිය අහන ප්‍රශ්නය ටිකක් ව්‍යාකූලයි. ඒ කියන්නේ, පාරක බට එළන්න ගියාම ඒ මාර්ගය ප්‍රාදේශීය සභාවට පවරන්න අවශ්‍ය නැහැ. ඒ වාගේම, එම මාර්ගය අයිති වෙන්නේ මහවැලියටද, ප්‍රාදේශීය සභාවටද, RDA එකටද, PRDA එකටද කියන එක අදාළ වෙන්නේත් නැහැ. නළ එළන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන්. ඒ සඳහා අදාළ ආයතනයේ අවසරය පමණයි ගන්න ඕනෑ.

ඊළඟට එතුමිය කිව්වා, ජල සම්බන්ධතා 128යි දීලා තිබෙන්නේ, මේ ප්‍රශ්නය නිසා ඉතුරු සම්බන්ධතා ටික දීලා නැහැ වාගේ කථාවක්. ඒකත් වැරැදියි. ඉල්ලුම් පත් ලැබෙනවා. ඉල්ලුම් පත් ලැබෙන අනුපිළිවෙළ අනුව තමයි ජල සම්බන්ධතා ලබා දෙන්නේ. නළ එළීම සම්බන්ධව ගත්තොත්, සමහර තැන්වල National Water Supply and Drainage Board එක ඒක ක්‍රියාත්මක කරලා තිබුණා, ගම්මාන ඇතුළේ අතුරු පාරවල්වල තිබෙන ගෙවල් සඳහා ජල නළ එළද්දී ඒවා ජනතා සහභාගිත්වයෙන් කරගන්න කියලා. නමුත්, ඒ ක්‍රමවේදය දැන් අපි වෙනස් කර තිබෙනවා. ජනතාවට අමතර පිරිවැයක් දරන්නේ නැතුව ජල නළ එළන එක National Water Supply and Drainage Board එකෙන් කරලා සම්බන්ධතාව ලබා ගැනීම සඳහා පමණක් ජනතාව සහභාගි කර ගන්න දැන් කටයුතු කරනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මට ගරු ඇමතිතුමාගෙන් පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, දැන් ඔබතුමාගේ පිළිතුර අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ප්‍රාදේශීය සභාවෙන් මේ කටයුත්ත කරන්න කිව්වාට,-

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ප්‍රාදේශීය සභාවෙන් කරන්න වැඩ කොටසක් නැහැ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් නළ එළන්න ගියාම ඒ පාර අයිති ආයතනයෙන් අවසර ගන්න ඕනෑ නේ. එහෙම අවසර ගන්න ගියාම මතු වුණු ගැටලුවක් ගැන තමයි ඔබතුමිය කියන්නේ. එහෙම නැතුව ඒ මාර්ග ප්‍රාදේශීය සභාවට පැවරිය යුතුයි කියලා එකක් නැහැ. අපි ඒක ඒ ආයතනත් එක්ක සාකච්ඡා කරන්නම්. නමුත්, අයිතිය පැවරීම සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වෙයි කියලා මම හිතන්නේ නැහැ.

ඊළඟට ගරු මන්ත්‍රීතුමිය කිව්වා, මුදල් නැති ප්‍රශ්නයක් ගැන කථා කරනවා කියලා. එහෙම එකක් නැහැ. අපි දැන් ජල ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කරලා තිබෙනවා. සම්බන්ධතා 6,800ක් ලබා දෙන්න තව නළ පද්ධතියක් - network එකක් - හදන්න ඕනෑ. ඒ සඳහා මුදල් අවශ්‍යයි. එක පැත්තකින් National Water Supply and Drainage Board එකේ තිබෙන fundsවලින් ඒක කරන්නත් පුළුවන්. ඕනෑ නම් අමතර වශයෙන් අය වැයෙන් මුදල් වෙන් කරගෙන ඒක කරන්නත් පුළුවන්.

නමුත්, ඒ සඳහා කාලයක් ගත වෙනවා. මුදල් නොවෙයි, කාලය ගත වීම තමයි තිබෙන ගැටලුව. ඒ නළ එළීම් පද්ධතියේ කටයුතු කරගෙන යන්න ඕනෑ. කොහොම වුණත්, අපි කඩිනමින් ඒ කටයුත්ත අවසන් කරනවා. මම නැවතත් කියනවා, ලබන 12වැනි දා ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය අපි නිල වශයෙන් විවෘත කරන බව. මේ වනකොටත් ජල සම්බන්ධතා ලබා දීම ආරම්භ කර තිබෙනවා. මේ ජනතාවට හැකි ඉක්මනින් පානීය ජලය ලබා දීමට අවශ්‍ය කටයුතු කරනවා කියලා මම පොරොන්දු වෙනවා, ගරු කථානායකතුමනි.

## 2015-2019 දක්වා NHDA මඟින් ක්‍රියාත්මක කරන ලද අඩු ආදායම් ලාභී නිවාස ව්‍යාපෘති: විස්තර
## 2015-2019 வரை NHDAஆல் செயற்படுத்தப்பட்ட குறைந்த வருமானம் பெறுபவர்களுக்கான வீட்டுத் திட்டங்கள்: விபரம்
## LOW INCOME EARNERS HOUSING PROJECTS IMPLEMENTED BY NHDA FROM 2015-2019: DETAILS

\\
1761/2025

**8. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාල සීමාව තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් අඩු සහ මැදි ආදායම්ලාභීන් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද නිවාස ණය සහ නිවාස ආධාර ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා එක් එක් වර්ෂය තුළ වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහතින් සඳහන් කළ ව්‍යාපෘති යටතේ ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ව්‍යාපෘති යටතේ 2019 වර්ෂය අවසන් වනවිට ඉදිකිරීම් අවසන්ව තිබූ නිවාස සහ ඉදිකිරීම් අවසන් කර නොතිබූ නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் 2019ஆம் ஆண்டு வரையிலான காலப்பகுதியில், தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையால் குறைந்த மற்றும் நடுத்தர வருமானம் பெறுபவர்களுக்காக நாடு முழுவதும் நடைமுறைப்படுத்தப்பட்ட வீட்டுக் கடன் மற்றும் வீட்டு உதவிக் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்தின் மூலமும் பயனடைந்தவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்துக்காகவும் ஆண்டு வாரியாக ஒதுக்கப்பட்ட நிதி வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டங்களின்கீழ் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்பட்ட வீடுகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(v) மேற்படி கருத்திட்டங்களின்கீழ் 2019ஆம் ஆண்டு நிறைவடையும்போது, நிர்மாணப் பணிகள் நிறைவு செய்யப்பட்டிருந்த வீடுகள் மற்றும் நிர்மாணப் பணிகள் நிறைவு செய்யப் படாத வீடுகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(vi) நிர்மாணப் பணிகளை நிறைவு செய்ய முடியாமல் போனமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House the -

(i) names of the housing loan and housing assistance projects implemented islandwide by the National Housing Development Authority for low-income and middle-income earners during the period from 2015 to 2019;

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

(ii) number of persons benefited from each of the said projects, separately;

(iii) amount of money allocated for each of the said projects in each year, separately;

(iv) number of houses of which construction works were commenced under each of the said projects, separately;

(v) number of houses of which construction works had been completed and the number of those of which construction works had not been completed under the said projects by the end of year 2019, separately; and

(vi) reasons as to why the construction works could not be completed?

(b) If not, why?

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2015 - 2019 දක්වා කාල සීමාව තුළ දිවයින පුරා අඩු සහ මැදි ආදායම්ලාභීන් සඳහා පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් සවිස්තරාත්මක විස්තර ඇමුණුම 01හි සඳහන් කර ඇත.

ආධාර වැඩසටහන්:-

- කපරාරු වැඩසටහන
- ආදර්ශ ගම්මාන
- සෙවණ ආධාර
- වකුගඩු ආධාර
- වැලිඔය තිරසර නිවාස ව්‍යාපෘතිය
- විරු සුමිතුරු
- ග්‍රාම ශක්ති විසිරි ආධාර
- සූර්යය උදාව - නිවහනක උදාව
- බෝගස්වැව ආධාර වැඩසටහන

**ණය වැඩසටහන්:-**

- විසිරි
- සම්පත් සෙවණ
- සොඳුරු පියස

**ණය + ආධාර වැඩසටහන්:-**

- විසිරි ණය + ආධාර
- ආදර්ශ ගම්මාන ණය + ආධාර ඉන්දියන් සමඟ

(ii) එක් එක් ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව පහත දැක්වෙන අතර, ඒ සම්බන්ධයෙන් විස්තර වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 හි සඳහන් කර ඇත.

- නිවාස ණය ප්‍රතිලාභී සංඛ්‍යාව 174,942කි.

විශේෂයෙන් 2015 සිට 2019 දක්වා සිටි නිවාස ණය ප්‍රතිලාභී සංඛ්‍යාව 174,942යි. 2015දී රුපියල් ලක්ෂයේ ණය ව්‍යාපෘති ක්‍රියාත්මක වෙලා තිබෙනවා. 2017, 2018 වාගේ වර්ෂවලදී රුපියල් ලක්ෂ 2, 3 වාගේ ණය ව්‍යාපෘති ක්‍රියාත්මක වෙලා තිබෙනවා. 2019 වනකොට රුපියල් ලක්ෂ පහේ ණය ව්‍යාපෘති ක්‍රියාත්මක වෙලා තිබෙනවා. නමුත් මේ කිසිවෙකුට ඒ සම්පූර්ණ මුදල දීලා නැහැ. මේක අසාර්ථකම ව්‍යාපෘතියක්. රුපියල් ලක්ෂයක් දෙනවා කියලා ඒ මිනිස්සුන්ට දීලා තිබෙන්නේ රුපියල් 20,000යි. රුපියල් ලක්ෂ පහක් දෙනවා කියලා ඒ මිනිසුන්ට දීලා තිබෙන්නේ රුපියල් 40,000යි. මේ 174,942 නිසා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මූල්‍ය අර්බුදයකට මුහුණ දී තිබෙනවා. මේ මුදල් අය කරගන්න බැහැ. මේ මිනිස්සුන්ව ප්‍රෝඩාවකට ලක් කර තමයි ඒ මොහොතේදී මේ මුදල් ලබා දීලා තිබෙන්නේ. රුපියල් ලක්ෂයක් දෙනවා කියලා රුපියල් 20,000ක් දුන්නාම ඒ මිනිස්සු අමාරුවේ වැටිලා තිබෙන්නේ. ඒවා ගෙවාගන්න බැහැ. රුපියල් ලක්ෂ පහක් දෙනවා කියලා රුපියල් 40,000යි දීලා තිබෙන්නේ. ඒ මිනිස්සු අමාරුවේ වැටිලා තිබෙන්නේ. ගරු ඇමතිවරයෙක් ඉතාම සැලසුම් සහගත ලෙස අමාත්‍යාංශයක කටයුතු කරපු කාලපරිච්ඡේදයට අදාළ සටහන් තමයි මේ තිබෙන්නේ.

- නිවාස ආධාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 136,170යි.

මෙතැන ආධාර කියලා තිබෙන්නේ සිමෙන්ති කොට්ට පහ, දහය දීපු ඒවා. නිවාස සම්පූර්ණ කරගෙන නැහැ. ටකරන් ලබා දීපු නිවාස, තහඩු ලබා දීපු නිවාස තිබෙනවා. එවැනි නිවාස 6,000කට වඩා යාපනයේ තිබෙනවා. අද ඒ නිවාසවල තහඩු ආවරණය කරගෙන ඉන්නේ. බිත්තියක්වත් බැඳගන්න බැරුව ඒ මිනිස්සු අසරණව ජීවත් වෙනවා. මේ 136,170 ඇතුළේ තිබෙන්නේ එවැනි නිවාස. ඒවා සම්පූර්ණ වෙච්ච නිවාස නොවෙයි.

- නිවාස ණය සහ ආධාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 63,869යි.

සංඛ්‍යාලේඛන තමයි විශාල. නමුත් මේවායේ එහෙම ඉදිවීම් වෙලා නැහැ.

ඒ අනුව මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 374,981කි.

(iii) එක් එක් ව්‍යාපෘතිය සඳහා අදාළ වර්ෂය තුළ වෙන් කළ ප්‍රතිපාදන පහතින් දක්වා ඇති අතර, විස්තර වෙන් වෙන් වශයෙන් ඇමුණුම 03හි සඳහන් කර ඇත.

- නිවාස ණය ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 19,785.10
- නිවාස ආධාර ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 11,464.04

➢ නිවාස ණය සහ ආධාර ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 35,082.81

ඒ අනුව වෙන්කර ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 66,331.96කි.

රුපියල් මිලියන 66,331.96කින් - සම්පූර්ණ ලක්ෂ පහකට අදාළ නිවාස ව්‍යාපෘති - අවසන් කරලා තිබෙන්නේ, සාමාන්‍යයෙන් නිවාස 11,000කට ආසන්න ප්‍රමාණයක්.

(iv) එක් එක් ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස සංඛ්‍යාව පහත දැක්වෙන අතර, වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02හි සඳහන් කර ඇත.

➢ නිවාස ණය - ඉදිකිරීම් ආරම්භ කළ නිවාස සංඛ්‍යාව 174,942

➢ නිවාස ආධාර - ඉදිකිරීම් ආරම්භ කළ නිවාස සංඛ්‍යාව 136,170

➢ නිවාස ණය සහ ආධාර - ඉදිකිරීම් ආරම්භ කළ නිවාස සංඛ්‍යාව 63,869

ඒ අනුව ඉදිකිරීම් ආරම්භ කළ මුළු නිවාස සංඛ්‍යාව 374,981කි.

(v) 2019 වර්ෂය අවසන් වනවිට ඉදිකිරීම් අවසන් කර තිබූ නිවාස සහ ඉදිකිරීම් අවසන් කර නොතිබූ නිවාස සංඛ්‍යාව පහතින් දක්වා ඇති අතර, ඒවායෙහි විස්තර වෙන් වෙන් වශයෙන් ඇමුණුම් අංක 04 සහ 05හි දක්වා ඇත.

ඉදිකිරීම් අවසන්ව ඇති නිවාස:

➢ ණය ව්‍යාපෘති නිවාස සංඛ්‍යාව 95,357කි.

මෙය අවසන් කියලා කිව්වාට, මේ නිවාසත් රුපියල් ලක්ෂයක් දෙනවා කියලා ලක්ෂයම දීලා අවසන් කරපුවා නොවෙයි. ලක්ෂයකට රුපියල් 20,000යි දීලා තිබෙන්නේ. රුපියල් ලක්ෂ පහ දෙනවා කියලා රුපියල් 40,000යි දීලා තිබෙන්නේ. ඒ ආකාරයෙන් අවසන් වෙච්ච ඒවා තමයි මේ කියන්නේ.

➢ ආධාර ව්‍යාපෘති නිවාස සංඛ්‍යාව 124,852යි.

මේකෙන් 116,000කට ආසන්නවම තිබෙන්නේ කපරාරු කරන්න සිමෙන්ති කොට්ට පහ, දහය දීපුවා; බිත්තියක් කපරාරු කරපුවා. මේ 124,000ක ප්‍රමාණය නිවාස විධියට හදලා අවසන් වුණු ඒවා නොවෙයි.

➢ ණය සහ ආධාර ව්‍යාපෘති නිවාස සංඛ්‍යාව 30,089යි.

ඒ අනුව ඉදිකිරීම් අවසන්ව ඇති මුළු සංඛ්‍යාව 250,298කි.

**ඉදිකිරීම් අවසන්ව නැති නිවාස:**

➢ ණය ව්‍යාපෘති නිවාස සංඛ්‍යාව 79,585යි.

➢ ආධාර ව්‍යාපෘති නිවාස සංඛ්‍යාව 11,318යි.

➢ ණය සහ ආධාර ව්‍යාපෘති නිවාස සංඛ්‍යාව 33,780යි.

ඒ අනුව ඉදිකිරීම් අවසන්ව ඇති මුළු නිවාස සංඛ්‍යාව 124,683කි.

(vi) 2019 වර්ෂයෙන් පසු පැවති රජයන් වෙනස්වීමත් සමඟ ප්‍රතිපාදන මුදල් නොලැබීම හේතුවෙන් හා පසුකාලීනව මුහුණ දුන් කොවිඩ් වසංගතය හේතුවෙන් ඇති වූ ආර්ථික පරිහානිය නිසා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තාවකාලිකව නවතන ලදී. ඒ වාගේම අවිධිමත්භාවය සහ නිවැරදි කළමනාකරණයක් නොතිබීම හේතුවෙනුත් මේ නිවාස අවසන් කරගන්නට නොහැකි වෙලා තිබෙනවා.

එසේම මෙම වැඩසටහන් සහභාගිත්ව සංවර්ධන වැඩසටහන් ලෙස ක්‍රියාත්මක වූ බැවින් ප්‍රතිලාභීන්ගේ දිළිඳුබව මත ලබාදුන් ආධාර මුදල් ප්‍රමාණවත් නොවීම හා ගොඩනැඟිලි ද්‍රව්‍ය මිල ඉහළ යාම ආදී කරුණු මත මෙම ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වී ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් 01,02,03,04 සහ 05 **සභාගත*** කරමි.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2015-2019 දක්වා කාලය තුළ විශේෂයෙන්ම නිවාස අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරපු නිවාස ව්‍යාපෘතිවලින් මහා ලොකු සංදර්ශනයක් දමලා පෙන්නුවා නේ. හැබැයි අපි දන්නවා, ඒ ක්‍රමවේදය ඇතුළේ නිවාස ආධාර දෙනවා කියලා කිව්වාට අද බොහෝ ජනතාව ඒවා නිසා අමාරුවේ වැටිලා තිබෙන බව. දැන් සමහරුන්ට ණය ගෙවා ගන්න බැරි වෙලා තිබෙනවා. නිවාස ආධාර නොවෙයි, ණය තමයි ලබා දීලා තිබෙන්නේ. සමහර වෙලාවට නිවාස ආධාර කියලා රුපියල් 136,000ක්, රුපියල් 200,000ක් දීලා තිබෙනවා. ඒ වාගේම සිමෙන්ති කොට්ට 10යි, 15යි විධියට දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙම ණය ලබා දීම් සහ අය කර ගැනීම්, ආධාර ලබා දීම් ක්‍රමවේදය ඇතුළේ මේ ක්‍රියාවලිය සිද්ධ වෙලා තිබෙන්නේ කොහොමද කියන එක මම සවිස්තරාත්මකව දැන ගන්න කැමැතියි, පළමුවන අතුරු ප්‍රශ්නය හැටියට.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
ගරු කථානායකතුමනි, මේ වසර 4 තුළ ක්‍රියාත්මක කළ මෙම ව්‍යාපෘති එකක්වත් ඒ ඒ පුද්ගලයාගේ අවශ්‍යතාව මත, නිවාස අවශ්‍යතාව මත ක්‍රියාත්මක කළ ඒවා නොවෙයි; නිවාස ලබා දීමේ වුවමනාව මත ආපු යෝජනා නොවෙයි. සමහර පුද්ගලයින්ට ණය නිකුත් කර තිබෙනවා. ඒ, එවකට හිටපු දේශපාලන අධිකාරිත්වයට අදාළ පුද්ගලයින්ට. එකම පවුලේ දෙන්නා තුන්දෙනාටත් ණය නිකුත් වෙලා තිබෙනවා. මේ ණය පිළිබඳව සම්පූර්ණ සවිස්තර වාර්තාවක් ලබා ගැනීමේ පවා නොහැකියාවක් තිබෙනවා. ඒ මොහොතේ දේශපාලන අධිකාරිත්වය මත ලබා දීපු දේවල් තිබෙනවා. බලපෑම් මත ලබා දීපු දේවල් තිබෙනවා. මේවා අතිශය අසාර්ථක ව්‍යාපෘති. මොන තරම් සැලසුම් තිබුණත් අසාර්ථක ව්‍යාපෘති. සමහර වෙලාවට මෙම ව්‍යාපෘති කරපු අය අද විපක්ෂයේ ඉඳගෙන ඉරානයට ගහන බෝම්බ වර්ගයත් කියන්න

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ටී.බී. සරත් මහතා]

දන්නවා. අද ඇමෙරිකාවෙන් ගහපු බෝම්බ වර්ගය මොකක්ද, නිෂ්පාදන වර්ෂය මොකක්ද කියන්න ඔක්කෝම දන්නවා. හැබැයි, මේවා අතිශය අසාර්ථකයි. *[බාධා කිරීමක්]* බොහොම අමාරුවෙන් හොයා ගත්තේ, ඔබතුමා කියන නිසාම.

මේ ව්‍යාපෘතිවලට දීපු ණය අය කර ගන්න බැහැ. මේ හේතුව නිසා තමයි නිවාස සංවර්ධන අධිකාරිය මූල්‍ය අර්බුදයකට මුහුණ දීලා තිබෙන්නේ. වර්තමානයේ රටේ ජනතාවට ණය මුදලක් ලබා දෙන්න පවා නොහැකි තත්ත්වයකට මුහුණ දීලා තිබෙන්නේ මේ බරපතළ මූල්‍ය අර්බුදය නිසායි. ඉතින් සමහර නිවාස ඉදි කරලා තිබෙනවා වනජීවී කලාප ඇතුළේ. ඒ වනජීවී කලාප ඇතුළේ ඉදි කරපු නිවාස නැවත ජනතාවට ලබා දෙන්න බැහැ. සමහර ගම්මානවල නිවාස 15, 20, 30, 40 හදපුවා තිබෙනවා. හැබැයි, පදිංචිව ඉන්නේ එක්කෙනායි. අනෙක් අය හොයා ගන්නත් බැහැ. මේ, අතිශය අසාර්ථක ව්‍යාපෘති. දැනට මේ ගම්මානවල තිබෙන ගෙවල් අපි හඳුනා ගනිමින් ඉන්නවා; තොරතුරු එක්රැස් කරමින් ඉන්නවා. දැනට පදිංචිව සිටින නිවාස සඳහා විශේෂ ආධාර මුදලක් අපි ලබන වසරේ අය වැයෙන් දෙන්න යෝජනා කරලා තිබෙනවා. ඒ අය අද බරපතළ තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා. විශේෂයෙන් උතුර, නැගෙනහිර ගෙවල් 6,000කට වඩා තිබෙනවා, කූඩාරම් වාගේ. ඒ ගෙවල්වල තිබෙන්නේ තහඩු විතරයි. බිත්තියක්වත් නැහැ. තහඩු ආවරණය කර ගෙන මිනිසුන් ජීවත් වෙන ගෙවල් 6,000කට වඩා තිබෙනවා. ඒ ගෙවල් හදා දෙන්න ඕනෑ; ගොඩනගන්න ඕනෑ. ඒ නිසා ඒ සඳහා ලබන අවුරුද්දට විශේෂ ව්‍යාපෘතියක් යෝජනා කර තිබෙනවා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ප්‍රශ්නයට ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් යම් පිළිතුරකුත් ලැබුණා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිවාස ව්‍යාපෘති ගණනාවක්ම 2015-2020 කාලය තුළ ඉදි කර තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත් කැබිතිගොල්ලෑවේ, කනුගහවැව නිවාස 34ක ව්‍යාපෘතියක් කර තිබෙනවා. එම නිවාස 34න් නිවාස 16ක් තිබෙන්නේ වන සංරක්ෂණ කලාපය ඇතුළේ. ඒ වාගේම මැදවච්චිය, පුල්එළිය ගම්මානයේ නිවාස ව්‍යාපෘතියක් තිබෙනවා. එහි නිවාස 20ක් තිබෙනවා. නමුත් ඒ නිවාස 20න් දැනට එකක පමණයි පදිංචි වෙලා ඉන්නේ. මේවා, 2015 වසරේ පටන් ගත් නිවාස ව්‍යාපෘති. ඒ වාගේම, පදවිය 1 කණුව ප්‍රදේශයේ නිවාස 20ක ව්‍යාපෘතියක් තිබෙනවා. ඒ නිවාස 20න් 3ක විතරක් පදිංචි වෙලා ඉන්නවා. ඉතිරි නිවාස ටික වල්වැදිලායි තිබෙන්නේ. ඒ වාගේම බුද්ධංගල නිවාස 26ක ව්‍යාපෘතියක් තිබෙනවා. ඒවායෙන් නිවාස 5ක තමයි පදිංචි වෙලා ඉන්නේ. ශ්‍රාවස්තිපුර අලි කොරිඩෝව මැද්දේයි නිවාස ව්‍යාපෘතියක් ඉදි කර තිබෙන්නේ. පසුගිය කාලයේ අලි මංකඩවල් හරස් කරලා තමයි ඇතැම් නිවාස ව්‍යාපෘති හැදුවේ. කහටගස්දිගිලිය, කනදරා රත්මලේ වනජීවී කලාපය තුළ නිවාස ව්‍යාපෘතියක් හදා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ සමහර නිවාස ව්‍යාපෘතිවලින් දේශපාලනඥයන්ගේ හිතවතුන්ට, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, නිවාස තිබෙන කට්ටියට නිවාස ලබා දී තිබෙන බවක් අපි දකිනවා. නිවාසවල පදිංචි වෙලා හිටපු සමහර කට්ටියට තවත් නිවාසයක් දීලා තිබෙනවා. මේ වාගේ අක්‍රමිකතා සිදු වෙලා තිබෙනවා. මේ සම්බන්ධව විශේෂ විමර්ශනයක්, පරීක්ෂණයක් සිදු වන්නේද කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා දැන ගන්න කැමැතියි.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු කථානායකතුමනි, මේ පිළිබඳ සම්පූර්ණ සොයා බැලීමක් කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ හිටපු ලේකම්තුමා ප්‍රමුඛව අපි කමිටුවක් පත් කර තිබෙනවා. එම කමිටුවෙන් මේ පිළිබඳ සම්පූර්ණ තොරතුරු, දත්ත සෙවීම සඳහා දැනට කටයුතු කරමින් යනවා. එම තොරතුරු සොයා ගත්තාට පසුව මේ කියන සමහර නිවාසවල කවුරුවත් පදිංචි වෙලා නැත්නම් නිවාස අවශ්‍යතාව තිබෙන අයට ඒ නිවාස ලබා දීමටත්, හදලා අවසන් කර නැති නිවාස පිළිබඳ තොරතුරු ලැබුණාට පසුව ඉදිරියේදී එම නිවාස හදා අවසන් කර ඒවා අවශ්‍ය අයට ලබා දීමටත් කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එම තොරතුරු මේ මොහොත වන විටත් සොයමින් පවතිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 -2137/2026- (1), ගරු නිශාන්ත පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## වාර්ෂික ලොකු ලූනු නිෂ්පාදනය: විස්තර
### வருடாந்த வெங்காய உற்பத்தி: விபரம்
### ANNUAL BIG ONION PRODUCTION: DETAILS

2138/2026

**10. ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික ලොකු ලූනු පරිභෝජනය මෙට්‍රික් ටොන් කොපමණද;

(ii) එම පරිභෝජනයෙන් කොපමණ ප්‍රමාණයක් දේශීය ලොකු ලූනු නිෂ්පාදනය මඟින් සපුරාලනු ලබන්නේද;

(iii) ඉතිරි අවශ්‍යතාව සපුරාලීම සඳහා වාර්ෂිකව ආනයනය කරනු ලබන ලොකු ලූනු ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(iv) දේශීය ලොකු ලූනු අස්වනු නෙළන කාල සීමාව තුළ දේශීය ලොකු ලූනු ගොවීන්ගේ ආදායම සහ වෙළෙඳ පොළ ආරක්ෂා කිරීම සඳහා, ආනයනික ලොකු ලූනු කිලෝවක් මත අය කරනු ලබන බදු සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ මැදිහත්වීම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் வருடாந்த பெரிய வெங்காய நுகர்வு மெற்றிக் தொன்களில் எவ்வளவு என்பதையும்;

(ii) உள்நாட்டுப் பெரிய வெங்காய உற்பத்திமூலம் அந்நுகர்வில் எவ்வளவு பங்கு பூர்த்தி செய்யப் படுகிறது என்பதையும்;

(iii) எஞ்சிய தேவையைப் பூர்த்தி செய்வதற்கு ஆண்டுதோறும் இறக்குமதி செய்யப்படும் பெரிய வெங்காயத்தின் அளவு மெற்றிக் தொன்களில் எவ்வளவு என்பதையும்;

(iv) உள்நாட்டுப் பெரிய வெங்காய அறுவடைக் காலப்பகுதியில் உள்நாட்டுப் பெரிய வெங்காய செய்கையாளர்களின் வருமானம் மற்றும் சந்தையைப் பாதுகாப்பதற்காக, இறக்குமதி செய்யப்படும் ஒரு கிலோகிராம் பெரிய வெங்காயத்தின்மீது விதிக்கப்படும் வரி தொடர்பாக அமைச்சின் தலையீடுகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House the -

(i) annual consumption of big onions in Sri Lanka in metric tons;

(ii) proportion of the said consumption met by local big onion production;

(iii) quantity of big onions in metric tons imported annually to meet the remaining requirement; and

(iv) intervention made by the Ministry with regard to taxes levied on a kilogram of imported big onions in order to safeguard the market and income of local big onion farmers during the local big onion harvesting season?

(b) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වාර්ෂික ලොකු ලූනු අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 275,000ක්, 300,000ක් පමණ වේ.

(ii)

| වර්ෂය | වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලැබූ ප්‍රමාණය (මෙට්රික්ටොන්) |
|---|---|
| 2026 යල (පුරෝකථන) | 36,000.0 |
| 2025 | 21,389.0 |
| 2024 | 8,828.2 |
| 2023 | 5,084.0 |
| 2022 | 17,799.0 |
| 2021 | 65,907.0 |
| 2020 | 43,018.0 |
| 2019 | 18,603.0 |

මේ අවුරුද්දේ -2026- අස්වැන්න හැටියට මෙට්‍රික්ටොන් 36,000ත්, 40,000ත් අතර ප්‍රමාණයක් අපේක්ෂිතයි.

ඒ අනුව 2025 වර්ෂය පිළිබඳව අවධානය යොමු කිරීමේදී ලොකු ලූනු අවශ්‍යතාවෙන් සියයට 7කට ආසන්න ප්‍රමාණයක් දේශීය ලොකු ලූනු නිෂ්පාදනයෙන් සපුරා ගෙන ඇත.

ඒ කියන්නේ, 2025 අවුරුද්දේ දේශීයව නිෂ්පාදනය කරපු ලොකු ලූනු මෙට්‍රික්ටොන් 21,000කට ආසන්න ප්‍රමාණය ගැන සැලකුවාම, මුළු පරිභෝජනයෙන් සියයට 7කට ආසන්න ප්‍රමාණයක් තමයි තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

(iii)

| වර්ෂය | වාර්ෂිකව ආනයනය කරනු ලැබූ ප්‍රමාණය (මෙට්රික්ටොන්) |
|---|---|
| 2026 ජුනි | 158,693.3 |
| 2025 | 273,207.4 |
| 2024 | 212,720.0 |
| 2023 | 294,463.0 |
| 2022 | 263,781.0 |
| 2021 | 257,421.0 |
| 2020 | 265,863.0 |
| 2019 | 240,102.0 |

(iv) සාමාන්‍යයෙන් දේශීය ලොකු ලූනු අස්වැන්න නෙළන කාල සීමාවන්හිදී, එනම් අගෝස්තු සිට සැප්තැම්බර් දක්වා කාලය තුළදී ආනයනික ලොකු ලූනු සඳහා අය කෙරෙන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද - Special Commodity Levy, SCL - ඉහළ නැංවීම සිදු කරයි. ඒ අනුව දැනට ආනයනික ලොකු ලූනු කිලෝවක් සඳහා මාසිකව රුපියල් 50ක බද්දක් පනවා ඇත.

මේ ගැන විශේෂයෙන් කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. අපි ගිය වසරේ පනවපු බද්ද අඩු කළේ නැතිව, ගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ සිට අඛණ්ඩව රුපියල් 50 සීමාවේ පවත්වා ගෙන යනවා.

තවද, ලොකු ලූනු ඇතුළුව දේශීයව නිෂ්පාදනය කෙරෙන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යයන්හි වෙළෙඳ පොළ මිල ස්ථාවරව පවත්වා ගැනීම සඳහා අදාළ වන ප්‍රතිපත්තිමය තීරණ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යවරයා සහ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යවරයාගේ සම සභාපතිත්වයෙන් යුත් ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව විසින් ගනු ලබයි.

(ආ) අදාළ නොවේ.

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, අපට ඉතා අඩු මිලකට ලොකු ලූනු ආනයනය කිරීමේ හැකියාව තිබෙනවා. එහෙම අඩු මිලකට ලොකු ලූනු ආනයනය කළොත්, පාරිභෝගිකයන්ට සහනයක් දෙන්න අපට පුළුවන්. නමුත්, එතැනදී ගැටලුවක් මතු වෙනවා; දේශීය ලූනු නිෂ්පාදකයන්ට අසාධාරණයක් වෙනවා. දේශීය ලොකු ලූනු නිෂ්පාදකයන්ගෙන් වැඩි මිලට ලොකු ලූනු මිල දී ගැනීම තුළින් පාරිභෝගිකයන්ට අඩු මිලට ලොකු ලූනු දෙන්න තිබෙන අවස්ථාව අහිමි වෙනවා. මෙන්න මේ කණ්ඩායම් දෙකම අසාධාරණයට ලක් නොකර දෙපාර්ශ්වයටම යම් සහනයක් ලබා දීමට හැකි වන වැඩ පිළිවෙළක් අමාත්‍යාංශය විධියට මේ වන විට ක්‍රියාත්මක කරනවාද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පළමුවන අතුරු ප්‍රශ්නයට පිළිතුර දෙමින් මා සඳහන් කළා වාගේම ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් ගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබූ, ජනාධිපති ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයාගේ කැඳවුම්කාරිත්වයෙන් පවත්වාගෙන යන, කෘෂිකර්ම ඇමතිවරයාත්, මමත් සම සභාපතිත්වය දරන අපේ කමිටුව මේ පිළිබඳව නිතර අවධානය යොමු කරනවා. අපි ගිය වසරේත් මේ ප්‍රශ්නයට මේ හා සමානවම මුහුණ දුන්නා. අපි දිගටම මේ ප්‍රශ්නය දිහා බැලුවා. මොකද, අපේ රටේ දේශීයව ලූනු වගා කරන්නේ සියයට 10කට අඩුවෙන්. 2025දී එය සියයට 7යි. 2026දී සියයට 10කට, 12කට ආසන්න ප්‍රමාණයකට අපි මේ වගාව වැඩි කර තිබෙනවා. ඊට කලින් සමහර අවුරුදුවල මුළු ආනයනයෙන් සියයට 1කට ආසන්න ප්‍රමාණයක් තමයි වගා කරලා තිබෙන්නේ. ඉතිරි සියල්ල අපි පිටරටින් තමයි ආනයනය කරලා තිබෙන්නේ. මේ ප්‍රශ්නය නිසා ගිය අවුරුද්දේ වගා කරපු ගොවීන්ට මිලක් දෙන්න වුවමනා වුණා.

ගරු කථානායකතුමනි, ගොවීන්ට එසේ මිලක් දෙන්න වුවමනා වුණාම කිලෝවකට රුපියල් 10ක්ව තිබිච්ච ලූනු බද්ද අපි රුපියල් 50 දක්වා වැඩි කළා. ඒ වැඩි කළේ අපේ දේශීය ගොවියාගේ අස්වැන්නට මිලක් ලබා දෙන්න වුවමනා වුණු නිසායි. මොකද, මා ඉදිරිපත් කරපු සංඛ්‍යාලේඛන අනුව 2023, 2024 වර්ෂ ගෙන බැලුවොත් ඔබට පෙනෙනවා, අපේ වාර්ෂික දේශීය ලොකු ලූනු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 5,000ක් සහ 8,000ක් බව. මෙට්‍රික් ටොන් 275,000ත් 300,000ත් අතර ප්‍රමාණයක පරිභෝජනයක් තිබියදී, 2022, 2023 වර්ෂවල මෙට්‍රික් ටොන් 5,000ක් සහ 8,000ක් පමණයි වගා කරලා තිබෙන්නේ. ඒ නිසා 2025 ලූනු වවපු ගොවීන් මිලක් ඉල්ලදී අප කරපු දේ තමයි විශේෂයෙන් තීරු බද්ද, Special Commodity Levy එක රුපියල් 50 දක්වා වැඩි කිරීම. ඒ වැඩි කිරීම හරහා අපට පුළුවන් වුණා, ලූනුවල මිල රුපියල් 120න් උඩට ගේන්න. දේශීය වෙළෙඳ පොළේ ලූනුවල මිලත්, ආනයනික ලූනුවල මිලත් අතර පරතරයක් එන එක අපි යම් ප්‍රමාණයකට අඩු කර ගත්තා, මේ රුපියල් 50 බද්ද පනවලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහනවා වාගේ ආපසු රුපියල් 50ක බද්ද පැනවීම විසින් දේශීය ලූනුවල මිල රුපියල් 130න්, 140න් උඩට ආවා. හැබැයි, ඒ වාගේම ඒකට සමගාමීව ආනයනික ලූනුවලටත් රුපියල් 50ක බද්දක් තිබෙනවා. මොකද, අපි ලූනු සියයට 90ක්ම පිටරටිනුයි ගෙන එන්නේ. ඒ ගෙනෙන ලූනුවලට කිලෝවකට රුපියල් 50ක බද්දක් වැටෙනවා. නමුත් දේශීයව වගා කිරීමක් අපට අවශ්‍යයි. විශේෂයෙන් ලෝකයේ ඇති වන තත්ත්වයන්ට මුහුණ දීම සඳහා දේශීයවත් යම් නිෂ්පාදනයක් සිදු නොවුණොත්, ආනයන මතම සීමා වෙන්න සිදු වුණොත් අපට ඒක ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. මොකද, අපි වැඩිපුර ලූනු ආනයනය කරන්නේ ඉන්දියාව, පාකිස්තානය ආදි රටවලින්. චීනය සහ අනෙකුත් රටවලින් ඉතාම සුළු ප්‍රමාණයක් තමයි ආනයනය කරන්නේ. ඒ නිසා අප දැනටත් කල්පනා කර තිබෙන්නේ රුපියල් 50 පවතින බද්ද පාරිභෝගිකයාගේ ආරක්ෂාව වෙනුවෙනුත්, අපේ ගොවියාගේ ආරක්ෂාව වෙනුවෙනුත් අඛණ්ඩව පවත්වාගෙන යැමටයි. අපි එය ගිය අවුරුද්දේ අගෝස්තු සිට අඛණ්ඩව පවත්වාගෙන ආවා. ගරු කථානායකතුමනි, වෙනදා කළේ ලූනු අස්වැන්න ගැලවෙන කාලයට මාස තුනකට බද්ද ගහනවා; ආයෙත් අයින් කරනවා. එතකොට ඕනෑ තරම් ලූනු ගෙනැල්ලා තියාගෙන ඉන්නවා. මේ ප්‍රශ්නයට උත්තරයක් හොයා ගන්න අපට හැමදාම බැරි වුණා. ඒ නිසා අපි තීරණයක් අරගෙන, පනවපු බද්ද අඛණ්ඩව ඒ විධියටම පවත්වාගෙන ආවා. දැන් මේ අගෝස්තු මාසය. මේ කන්නයේ ලූනු ගැලවීමට ආසන්නයි. විශේෂයෙන් මේ කන්නයේදී අපි අපේක්ෂා කරනවා, ලූනු මෙට්‍රික් ටොන් 36,000ක්. මෙට්‍රික් ටොන් 36,000ක් කිව්වාම, හෙක්ටෙයාර 1,800ක පමණ තමයි වගා කරලා තිබෙන්නේ. වැඩිපුරම අනුරාධපුරය සහ දඹුල්ල කියන ප්‍රදේශ දෙකේ තමයි වගා කරලා තිබෙන්නේ. ඉතින් අපි ඉලක්ක කරනවා, මේ කන්නයේදීත් ලූනු මිල දී ගැනීමේ ක්‍රියාවලියට රජය මැදිහත් කර ගන්න. ඒ හරහා ආනයනික ලූනුත්, දේශීය ලූනුත් රුපියල් 200කට ආසන්න මිලකට මිල දී ගන්න පාරිභෝගිකයාට පුළුවන්කම තිබෙනවා, සිල්ලර වෙළෙඳ පොළෙන්. ඒ වාගේම, ආනයනික ලූනු හරහා දේශීය ගොවියාට බලපෑමක් සිද්ධ වෙනවා නම් ඒක නවත්වන්න සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව හරහා වෙළෙඳ පොළ තුළ දේශීයව ලූනු මිල දී අරගෙන ලංකා සතොසත්, සමුපකාර හරහාත් විකිණීමට අවශ්‍ය පියවර ගන්නවා. අප සියයට 90කට වැඩි ප්‍රමාණයක් ලොකු ලූනු ආනයනය කරන නිසා මේක තමයි මේ තත්ත්වය balance කරන්න තිබෙන ක්‍රමය.

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි.

ඔබතුමාගේ පිළිතුරේ සඳහන් වුණු විධියටම, දැනට දේශීයව නිෂ්පාදනය වන ලොකු ලූනු ප්‍රමාණය සමස්ත පාරිභෝගික අවශ්‍යතාවෙන් සියයට 7ක් වාගේ කියලායි කියැවුණේ. ඒ ප්‍රමාණය තවදුරටත් වැඩි කරන්න සහ ලොකු ලූනු මත පනවා තිබෙන බදු ක්‍රමය ඉදිරියේදීත් පාරිභෝගිකයන්ට සහ නිෂ්පාදකයන්ට සහනයක් වන විධියට ගළපා ගන්න කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ඔබතුමාගේ අමාත්‍යාංශය ඒකාබද්ධව දැනට සැලසුම් කර තිබෙන ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා හොඳ ප්‍රශ්නයක් ඇහුවේ, ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්, වගා කරන ගොවියාගේ විශ්වාසය ආරක්ෂා කළේ නැත්නම්, ගොවියා ගොවිතැනින් අයින් වෙනවා. ඒ නිසා තමයි ගරු කෘෂිකර්ම ඇමතිතුමාත් මාත් සම සභාපතිත්වය දරන ආහාර ප්‍රතිපත්ති සහ සුරක්ෂිතතා කමිටුව විධියට අප තීරණය කළේ, ලූනු සඳහා පනවපු බද්ද එහෙමම තියාගෙන යන්න. ඒ විතරක්

නොවෙයි. අල කිලෝවකට රුපියල් 80ක බද්දක් පැනෙව්වා; අල බද්ද රුපියල් 80ක් කළා. එම නිසා දැන් ආනයනික අල කිලෝවකට රුපියල් 80ක බද්දක් අය වෙනවා; ලූනු කිලෝවකට රුපියල් 50ක බද්දක් අය වෙනවා. ඒ බද්ද අපි අඛණ්ඩව පවත්වාගෙන ආවේ, ගොවියාගේ විශ්වාසය හදන්නයි.

ගරු මන්ත්‍රීතුමනි, සංඛ්‍යාලේඛන අනුව ඔබතුමාට පෙනෙනවා ඇති, ලොකු ලූනු නිෂ්පාදනය 2022දී තිබුණේ මෙට්‍රික් ටොන් 5,000ක් සහ 2023දී තිබුණේ මෙට්‍රික් ටොන් 8,800ක් බව. හැබැයි, 2025 වනකොට අපි මෙට්‍රික් ටොන් 21,389ක අස්වැන්නක් අරගෙන තිබෙනවා. ඒ කියන්නේ, නිෂ්පාදනය හතරගුණයකින් වැඩි කරලා තිබෙනවා, බදු පැනවීම මඟින් සහ ගොවියා තුළ විශ්වාසය ඇති කිරීම මඟින්. ඒ විතරක් නොවෙයි. 2026 වනකොට මෙට්‍රික් ටොන් 21,000 තිබ්බ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 40,000 සීමාවට ගෙන එන මට්ටමට ගොවියා වගාව වැඩි කර තිබෙනවා. ඉතින් අපි බදු සීමාව තියාගෙන යන ගමන් ගොවියා තුළ විශ්වාසය හදලා තිබෙනවා, දේශීයව ලූනු වැව්වොත් ඒකට මිලක් තිබෙනවා කියලා. මොකද, ආනයනික ලූනු සඳහා බද්දක් තිබෙනවා. රුපියල් 50ක බද්දක් තිබීම නිසා ආනයනික ලූනුවලට, විශේෂයෙන්ම ඉන්දියානු සහ පාකිස්තාන ලූනුවලට වෙළෙඳ පොළ තුළ රුපියල් 150-170 අතර තොග මිලක් තිබෙනවා. ඉතින් අපි හිතනවා, සිල්ලර වෙළෙඳ පොළේ රුපියල් 200කට හෝ රුපියල් 200ට අඩු මිලකට ලොකු ලූනු අළෙවි වෙන්න පුළුවන් කියලා. දේශීය ලූනුවලටත් ඒ මිල පවත්වාගෙන ගියොත් ඔබතුමා කියනවා වාගේ පාරිභෝගිකයාටත් සහනයක් වෙනවා, ගොවියාත් ආරක්ෂා වෙනවා, වෙළෙඳ පොළ තුළ අපට ඒ ප්‍රශ්නය balance කර ගන්නත් පුළුවන් වෙනවා. ඒ නිසා අපි මේ බද්ද පවත්වාගෙන යමින් ගොවියා තුළ විශ්වාසය හදනවා ලූනු වැඩිපුර වගා කරන්න. එතකොට අපට ආනයනය අඩු කරන්න පුළුවන්, දේශීය ගොවියාගේ ලූනු වගාව වැඩි කරන්න පුළුවන්. ඒකෙන් එක පැත්තකින් ඩොලර් පිට රට යන එක නවතිනවා, අනෙක් පැත්තෙන් ගොවියාට හොඳ මිලක් ලැබෙනවා, ගොවියාගේ ආදායම ස්ථාවර වෙනවා. මේ හරහා තමයි අපට ඒ දෙක balance කරන්න පුළුවන් වෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 5 -705/2025- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රජයේ ඉඩම්වල පදිංචිකරුවන් විසින් ලබා ගන්නා ලද දීමනා පත්‍ර/ඉඩම් බලපත්‍ර: එරාවූර්පත්තුව, වෙන්කලඩි ප්‍රා.ලේ. කොට්ඨාසය

அளிப்புப் பத்திரங்கள்/காணி உரிமப் பத்திரங்கள் வழங்கப்பட்ட அரச காணிகளில் வசிப்போர்: ஏறாவூர்பற்று, செங்கலடி பிரதேச செயலாளர் பிரிவு

DEEDS OF GRANT/ LAND PERMITS RECEIVED BY SETTLERS ON STATE LAND: ERAVURPATTU, CHENKALADY DS DIVISION

886/2025

**6. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Dr.) M.L.A.M. Hizbullah)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර්පත්තුව, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාලවකවානුව තුළ රජයේ දීමනා පත්‍ර හෝ ඉඩම් බලපත්‍ර ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017.01.01ஆம் திகதி தொடக்கம் 2025.03.31ஆம் திகதி வரையான காலப்பகுதியில், மட்டக்களப்பு மாவட்டத்தின், ஏறாவூர்பற்று, செங்கலடி பிரதேச செயலாளர் பிரிவில், அரசாங்கத்தால் 'அளிப்புப் பத்திரங்கள்' அல்லது 'காணி உரிமப் பத்திரங்கள்' ஊடாக வழங்கப்பட்ட அரச காணிகளில் மக்கள் வசிக்கின்றார்கள் என்பதை அறிவாரா என்ப தையும்;

(ii) ஆமெனில், அவ்வாட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய தகவல்கள் என்பன யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform the House -

(i) whether he is aware that people have settled in State land, for which Deeds of Grant or Land Permits of the State were given during the period from 01.01.2017 to 31.03.2025,

[ගරු ගයන්ත කරුණාතිලක මහතා ]

out of the State lands situated in the Divisional Secretary's Division of Eravurpattu, Chenkaladi in the Batticaloa District; and

(ii) if so, the total number of such people, their names and relevant information?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) 2017 ජනවාරි 01 දින සිට 2025 මාර්තු 31 දක්වා කාලය තුළ බලපත්‍ර 1,106ක් සහ ප්‍රදාන 294ක් නිකුත් කර ඇත. අදාළ නාම ලේඛනය ඇමුණුම** මඟින් දැක්වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 -2137/2026- (1), ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා ලබාදීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### MNP ක්‍රියාත්මක කිරීම සහ විදුලි සංදේශ සේවා සපයන්නන්ට සමාන පහසුකම් සැපයීම
MNPஐச் செயற்படுத்தலும் தொலைத்தொடர்பு சேவை வழங்குநர்களுக்குச் சமமான வசதிகளை வழங்கலும்
IMPLEMENTATION OF MNP AND EQUAL FACILITATION OF TELECOMMUNICATION SERVICE PROVIDERS

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

දුරකථන සන්නිවේදනය ආර්ථික වර්ධනය, ඩිජිටල් රාජ්‍ය පාලනය, මූල්‍ය සේවා, අධ්‍යාපනය, සෞඛ්‍ය රක්ෂණය, ජාතික ආරක්ෂාව සහ පුරවැසියන්ගේ එදිනෙදා ජීවිතය සඳහා සහාය වන තීරණාත්මක ජාතික යටිතල පහසුකමක් බවට පත්ව තිබීම හේතුවෙන් සහ වසර ගණනාවක සූදානම තිබියදීත් ජංගම දුරකථන අංක අතේ ගෙන යෑමේ හැකියාව - Mobile Number Portability, MNP - ක්‍රියාත්මක කිරීමේ දීර්ඝ ප්‍රමාදයත්, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය සැලකිය යුතු ලෙස පරිවර්තනය කරනු ලබන ස්ටාර්ලින්ක් - Starlink - වැනි චන්ද්‍රිකා පදනම් කර ගත් මෙහෙයුම්කරුවන්ගේ පැමිණීමත් සලකා බලමින් ඩිජිටල් ආර්ථික අමාත්‍යවරයා පහත සඳහන් කරුණු පාර්ලිමේන්තුවට දැනුම් දෙන්නේද?

1. ජංගම දුරකථන අංක අතේ ගෙන යෑමේ හැකියාව - MNP - මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත්තේ මන්ද සහ එහි හඳුන්වාදීම ප්‍රමාද කිරීමට හේතු වී ඇති තාක්ෂණික, නෛතික, නියාමන, වාණිජමය හෝ පරිපාලනමය බාධා මොනවාද?

2. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ - TRCSLහි - සූදානම ශ්‍රී ලංකා නම්බර් පෝටබිලිටි සර්විසස් - LNPS - බලපත්‍රලාභී මෙහෙයුම්කරුවන්, පද්ධති පරීක්ෂාවන්, ඉතිරිව ඇති ප්‍රධාන පියවර - milestones, ව්‍යාපෘති වියදම් සහ අනුකූල නොවීම සඳහා වන දඩ මුදල් සමඟින් එය නියත වශයෙන්ම ක්‍රියාත්මක කරන දිනය ඇතුළුව MNP ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය කුමක්ද?

3. MNP යනු තරගකාරිත්වය ප්‍රවර්ධනය කරන, සේවා ගුණාත්මකභාවය ඉහළ නංවන, ගාස්තු පහත හෙළන, නවෝත්පාදන දිරි ගන්වන සහ පාරිභෝගිකයන්ගේ බැංකු, ව්‍යාපාරික, රාජ්‍ය සහ ඩිජිටල් සේවාවලට බාධාවකින් තොරව මෙහෙයුම්කරුවන් මාරු කිරීමට ඉඩ සලසන මූලික පාරිභෝගික අයිතියක් බව රජය පිළිගන්නේද?

4. ස්ටාර්ලින්ක් සහ අනෙකුත් චන්ද්‍රිකා මෙහෙයුම්කරුවන්ගේ පැමිණීම මඟින් තරගකාරිත්වය, දැරිය හැකි මිල, සර්වව්‍යාපී බ්‍රෝඩ්බෑන්ඩ් ප්‍රවේශය, ආයෝජන, නවෝත්පාදන සහ විදුලි සංදේශ සේවාවල සමස්ත ගුණාත්මකභාවය ඉහළ නැංවීම තහවුරු කිරීම සඳහා සකස් කර ඇති ජාතික උපාය මාර්ගය කුමක්ද?

5. What revised Quality of Service - QoS - Standards and Key Performance Indicators - KPIs - will the TRCSL enforce on all operators regarding coverage, call quality, data speed, latency, network availability, complaint resolution customer satisfaction and compensation for service failures, and how will compliance be independently monitored and publicly reported?

6. Will all telecommunications operators, including satellite-based providers such as Starlink, be equally subjected to Sri Lankan law, including licensing conditions, taxation, consumer protection, data protection, cyber security, lawful interception requirements and compliance with lawful orders of Sri Lankan courts and competent authorities?

   A law had been brought in to write it off; if no payment had been made to Starlink or any foreign operator, that would be taken off from the Inland Revenue debt requirement.

7. Will all operators be subjected to identical licence fees, regulatory charges, taxes and statutory levies, thereby ensuring a competitive level playing field without conferring unfair commercial advantages on any provider?

   Hon. Speaker, I am informed that for telephone tapping and things like that, access is being given without any court order et cetera. So, just have a look into that.

8. Will the Minister table before Parliament the Mobile Number Portability implementation roadmap, operator readiness reports, the regulatory framework applicable to satellite operators, the licence conditions applicable to Starlink and the Government's long-term National Telecommunications Competition and Consumer Protection Strategy?

   Thank you, Sir.

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)

(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

Hon. Speaker, I answer the Question on behalf of the Minister of Digital Economy.

1. The Hon. Member's question relates specifically to Mobile Number Portability - MNP. It is important to clarify, however, that the project previously agreed upon by the participating operators and established through Lanka Number Portability Services Limited is a broader Number Portability - NP - project, under which both Mobile Number Portability - MNP - and Fixed Number Portability - FNP - were intended to be implemented simultaneously. Accordingly, a Guarantee Company consisting of all fixed and mobile operators, namely Lanka Number Portability Services Limited - LNPS, was set up to carry out operational activities and a licence was issued in September, 2024. All technical standards and operational guidelines in line with international standards and best practices were finalized in coordination with all these operators. The total cost of this project is borne both by fixed and mobile operators. However, one fixed operator has subsequently requested that this approach be reconsidered, stating that the implementation of Fixed Number Portability across their fixed network together with newer IP and fibre platforms would require substantial modifications to routing, signalling, subscriber-management, billing and operational-support systems as well as extensive testing. That operator has, therefore, expressed concerns regarding the additional time, effort and cost involved and the absence of a clear commercial return on such investment. The operator has further stated that the current public demand is predominantly for Mobile Number Portability.

   That maybe why the Hon. Member also specifically requested for information about Mobile Number Portability.

   The operator has further said that fixed connections are increasingly used for fibre-based Internet access, where changing broadband providers is generally not dependent on retaining the associated telephone number in the same manner as in mobile services.

   When we study the international use cases, it shows that mobile-first approach is what is being used in the emerging markets and also demonstrates a phased approach: India introduced MNP in 2011, Pakistan, in 2007, Bangladesh, in 2018, Nigeria, in 2013 and Kenya, in 2011, while general FNP - Fixed Number Portability - in several such markets remains absent or limited. MNP is also more widespread than Fixed Number Portability, internationally.

   Accordingly, the fixed operator has proposed implementing MNP first and considering FNP subsequently, subject to demonstrated consumer demand, a detailed cost-benefit assessment and agreement among relevant parties to amend the original simultaneous implementation scope.

   Therefore, a discussion between the Ministry of Digital Economy, the TRCSL and the operators are currently ongoing to identify a suitable way forward for the implementation of Mobile Number Portability in Sri Lanka. If the telecom industry does not come to an agreement by the end of September, the Telecommunication Regulatory Commission will proceed by way of direction under the Sri Lanka Telecommunications Act and the conditions of the operators' licences. The Government will, if necessary, commission Mobile Number Portability first, ahead of fixed connections, so that the greater majority of subscribers are not made to wait on a dispute that does not concern them.

[ගරු එරංග වීරරත්න මහතා]

2. The TRCSL has taken steps to finalize the drafting of rules and guidelines in coordination with the operators, which could be published upon the finalization of implementation date.

Lanka Number Portability Services (Guarantee) Limited - LNPS - has taken steps to procure the technical solution and the Letter of Intent is already being issued, but the agreement and the PO are on hold due to the disagreement of one fixed operator in original implementation plan.

Licensed operators have reported that they have already done initial investments required for making their networks ready for providing Mobile Number Portability services to customers, but the process is on hold due to the change in original implementation plans, as per the request that came from one operator.

3. The Government accepts, without qualification, that the ability to change operators while retaining one's number is an entitlement due to consumers in a modern telecommunications market and that its delivery is a matter of Government policy commitment rather than of operator discretion.

Mobile Number Portability lowers the cost of switching and in doing so, it disciplines price, drives quality of service and rewards operators who innovate. It matters more today than when it was first proposed because a mobile number is no longer only a telephone number, but the identifier by which citizens access banking, government and other digital services and make payment. To be locked to an operator is now to be locked out of a choice, which affects far more than a telephone bill.

That is precisely why the Government does not regard the present delay as acceptable, and why my Answer to question No. 1 sets out what would follow, if the remaining disagreement is not resolved by the industry.

4. The TRCSL has taken steps to revise the existing Broadband Quality of Service Rules to monitor networks of different technologies. With licensing of the new category of satellite service providers, including Starlink, a national strategy will be introduced for universal broadband connectivity in addition to existing programmes, conducting through fixed and mobile operators to serve the unserved and underserved areas.

5. The TRCSL is in the process of revising Broadband Quality of Service - QoS - Rules to incorporate new monitoring requirements related to the service quality of 5G networks, satellite networks and the monitoring Quality of Experience - QoE - indicators such as latency as well. Currently, monitoring of QoS indicators depend on the operator data, but the TRCSL is in the process of acquiring a system to independently monitor both QoS and QoE indicators through ADB funding.

6. All satellite network providers, including Starlink, are governed by the provisions of Sri Lanka Telecommunications Act Provider Rules published in Extraordinary Gazette No. 2395/34 and the proposed dashboard to be set up to ensure lawful orders of competent authorities.

7. Identical licence fees for same service category of operators and licence fees for all types of provider licences are stipulated in Provider Rules published in Extraordinary Gazette No. 2395/34. Other taxes and statutory levies are same for all operators and providers.

8. MNP implementation roadmap and the operator readiness reports could be finalized based on the outcome of the discussions with operators, as I mentioned in Answer to question No. 1.

The regulatory framework applicable to satellite operators and the licence conditions applicable to Starlink are included in Provider Rules published in Extraordinary Gazette No. 2395/34.

Also, the Government's long-term National Telecommunications Competition and Consumer Protection Strategy is in the process of declaring the operator with Significant Market Power - SMP - and introducing obligations to that operator to ensure fair competition. Steps are being taken to introduce models to determine cost-based tariffs. Also, we are hopeful that SMP and the cost models would get out within this year.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Ravi Karunanayake, now, it is time for you to seek a clarifications.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I thank the Hon. Deputy Minister for the Answer, which was a breath of fresh air and modernized in line with what is required.

Hon. Deputy Minister, one of the prime duties of the Regulator - the Telecommunications Regulatory Commission of Sri Lanka - would be to ensure consumer protection and to give top priority to consumer satisfaction. You were saying that one operator does not want to go ahead and that it should not be a policy change. You, of course, qualified to say that in September it would be put into place. But, the request from that service operator should not have even been entertained because if consumer satisfaction and provision of a quality service come first, I guess the market share of an operator is not what should be determined, but whether the quality of service drops. Today, it takes 35 seconds for a call to be connected and that is the reason why competition should be brought in, which would ensure the necessary consumer protection.

Also, Hon. Deputy Minister, is there telephone tapping on WhatsApp or on normal telephones because that is a general issue which many people speak of? When certain things are spoken of, that information gets passed on prior to taking that action, which is a very alarming state. So, I would appreciate it if an honest answer comes from you, taking that matter into consideration.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
Hon. Speaker, regarding Mobile Number Portability, the main concern raised by that fixed operator was about business and the return on investment they are going to make in Fixed Number Portability.

His main argument is that, since there is one major operator providing fibre connectivity to homes, there is no secondary network developed to the same extent. Based on the infrastructure-sharing guidelines in the country, putting up a separate secondary fibre network is also not required and infrastructure-sharing should happen at the same time to protect both the environment as well as the investments and also to lower the cost to the end consumers. Therefore, it is prudent that we analyse the real benefits that Fixed Number Portability would and would not bring in. Also, as I mentioned before, when looking at the international use cases, we see that the emerging markets have adopted a kind of mobile-first approach and in most of the markets, Fixed Number Portability is not implemented. The need for Fixed Number Portability is going down day-by-day and it is the Mobile Number Portability that is in demand. So, as a Government which listens to the concerns of the industry as well as focuses on the public need, it is our duty to clearly assess whether we, as a country, should invest on Fixed Number Portability or whether foreign currency would be drained out of the country by introducing all these technologies, which may not add real value to the end consumer. So, that is why we have really taken steps to assess that before taking a final decision. And, as I mentioned, if the industry does not reach a decision by the end of September, the Government will intervene and give a policy directive to proceed with the implementation of the Mobile Number Portability first, followed by Fixed Number Portability based on the need of the industry.

Then, with regard to call tapping on WhatsApp, I would say that no action has been taken by any party in Sri Lanka to do that. I do not know whether anybody is spreading rumours or making allegations with evidence. I have not seen any evidence to back up their claims. So, on behalf of the Ministry responsible for telecommunication, I can clearly say that there is no initiative or anything currently being carried out for tapping communication on WhatsApp.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා.

## II

## උතුරු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ස්ථානගත කිරීම

### வட மாகாண விளையாட்டுத் திணைக்களத்தை கிளிநொச்சி மாவட்டத்துக்கு இடமாற்றம் செய்தல்

### RELOCATION OF DEPARTMENT OF SPORTS OF NORTHERN PROVINCE IN KILINOCHCHI DISTRICT

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே!

நிலையியற் கட்டளை 27(2)இன்கீழ், வட மாகாண விளையாட்டுத் துறையின் வளர்ச்சி மற்றும் வன்னிப் பிராந்திய இளம் விளையாட்டு வீரர்களின் எதிர்காலம் சார்ந்த அவசர பொது முக்கியத்துவம் வாய்ந்த விடயமொன்றை கௌரவ இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர் அவர்களின் கவனத்துக்குக் கொண்டுவர விரும்பு கின்றேன். வட மாகாண விளையாட்டுத் திணைக்களத்தை கிளிநொச்சிக்கு இடமாற்றம் செய்வது தொடர்பில் அமைச்சரின் உடனடித் தலையீட்டை இச்சபை ஊடாகப் பணிவுடன் கேட்டு நிற்கின்றேன்.

வட மாகாண ஆளுநரால் இத்திணைக்களத்தை கிளிநொச்சிக்கு இடமாற்றம் செய்ய ஏற்கனவே பரிந்துரை செய்யப்பட்டு இருந்தபோதிலும், இதுவரை அது நடைமுறைப்படுத்தப்படவில்லை. இதன் காரணமாக மன்னார், வவுனியா, முல்லைத்தீவு மற்றும் கிளிநொச்சி மாவட்டங்களைச் சேர்ந்த வன்னிப் பிராந்தியத்திலுள்ள விளையாட்டு வீரர்கள், பயிற்றுவிப்பாளர்கள் மற்றும் பாடசாலைகள், விளையாட்டுக் கழகங்களின் நிருவாகத்தினர் தங்களின் நிருவாகத் தேவைகளைப் பூர்த்தி செய்வதில் பெரும் சிரமங்களை எதிர்கொண்டு வருகின்றனர்.

கிளிநொச்சி மாவட்டமானது, வட மாகாணத்தின் மத்திய பகுதியில் அமைந்திருப்பதால், மாகாண விளையாட்டுத் திணைக்களத்தை அங்கு நிறுவுவது அனைத்து மாவட்ட மக்களுக்கும் சமமான அணுகலை உறுதிப்படுத்தும். குறிப்பாக, வன்னிப் பிராந்திய இளம் விளையாட்டு வீரர்களின் முன்னேற்றத்துக்கும், திறமைகளை வளர்ப்பதற்கும், விளையாட்டு நிருவாக சேவைகளை எளிதில் பெற்றுக் கொள்வதற்கும் இது மிகவும் அவசியமானதாகும். இது வன்னிப் பிராந்திய மக்களின் நீண்டகால எதிர்பார்ப்பாகும். இந்த நடவடிக்கை வன்னிப் பிராந்திய மற்றும் கிளிநொச்சி மாவட்ட விளையாட்டு வீரர்களுக்குச் சமமான வாய்ப்புகளை உருவாக்குவதோடு, வட மாகாண விளையாட்டுத் துறையின் சமநிலை வளர்ச்சிக்கும் பெரும் பங்களிப்பாக அமையும். எனவே, நான் கௌரவ அமைச்சர் அவர்களிடம் பின்வரும் வினாக்களை கேட்கின்றேன்:

1. வட மாகாண ஆளுநரால் ஏற்கனவே பரிந்துரைக் கப்பட்டபடி மாகாண விளையாட்டுத் திணைக் களத்தை கிளிநொச்சிக்கு இடமாற்றம் செய்யும் நடவடிக்கை இதுவரை மேற்கொள்ளப்படாமைக்குக் காரணம் என்ன?

[ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

2. மன்னார், வவுனியா, முல்லைத்தீவு மற்றும் கிளிநொச்சி மாவட்ட விளையாட்டு வீரர்களின் நலனைக் கருத்திற்கொண்டு, இந்த இடமாற்றத்தை உடனடியாகச் சாத்தியமாக்க கௌரவ அமைச்சர் அவர்கள் சம்பந்தப்பட்ட அமைச்சு மற்றும் வட மாகாண அதிகாரிகளுடன் இணைந்து அவசர நடவடிக்கை எடுப்பாரா?

3. வட மாகாண விளையாட்டுத் திணைக்களத்தை கிளிநொச்சிக்கு இடமாற்றம் செய்யும் பணிகள் எப்போது ஆரம்பிக்கப்பட்டு, எப்போது நிறைவு செய்யப்படும் என்பதற்கான கால வரையறையை இந்தச் சபைக்கு அறிவிக்க முடியுமா?

நன்றி!

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. උතුරු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ස්ථානගත කිරීම සම්බන්ධව සාකච්ඡා පැවැත්වෙමින් තිබෙනවා. නමුත්, අවසාන නිර්දේශයක් ආණ්ඩුකාරතුමා විසින් ලබා දී නොමැති බව තමයි අපට වාර්තා වන්නේ. කොහොම වුණත් යටිතල පහසුකම් සකස් කිරීමෙන් පසු ඊට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනවා.

2. උතුරු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව කිලිනොච්චිය වෙත ස්ථානගත කිරීම පෙර සඳහන් කළ පරිදි සාකච්ඡා මට්ටමේ පවතින අතර, ඊට අදාළව ගරු ආණ්ඩුකාරතුමා විසින් නියෝගයක් නිකුත් කිරීමෙන් අනතුරුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනවා.

3. උතුරු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව කිලිනොච්චිය වෙත ස්ථානගත කිරීම සාකච්ඡා මට්ටමේ පවතින බැවින්, ඒ සඳහා කාල සීමාවක් සඳහන් කිරීම අපහසුයි.

ගරු කථානායකතුමනි, කෙසේ වුවත් මේ වන විට ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා විසින් උතුරු පළාතේ ක්‍රීඩා කටයුතු සංවර්ධනය සඳහා වැඩ කටයුතු රාශියක් ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගනිමින් තිබෙනවා. විශේෂයෙන්ම උතුරු පළාතේ තරුණ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් වර්ධනය කර ගැනීම සහ ඔවුන්ට ජාතික තලයේත්, ජාත්‍යන්තර තලයේත් ක්‍රීඩාවලට සහභාගි වීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට රජය මේ වන විට කටයුතු කරමින් සිටිනවා. නමුත්, කනගාටුදායක තත්ත්වයක් තිබෙනවා. ක්‍රීඩා සංවර්ධනයට අදාළව සමහර ක්‍රියාකාරකම් සම්බන්ධ කාරණා පළාතේ ඇතැම් දේශපාලනඥයන් විසින් අධිකරණයට ගෙන ගොස් තිබෙන නිසාම ඒ කටයුතු යම් ආකාරයක ප්‍රමාද වීමක් සිදු වෙලා තිබෙනවා. කොහොම වුණත්, ඒ සියලු කටයුතු අවසන් වුණාට පසු උතුරු පළාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පහසුකම් වැඩිදියුණු කිරීමටත්, ඔවුන්ට ජාතික සහ ජාත්‍යන්තර තලයේ තරගවලට සහභාගි වීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කර දීම සඳහාත් අප කටයුතු කරනවා. විශේෂයෙන්ම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව කිලිනොච්චිය වෙත ස්ථානගත කිරීමට අවශ්‍ය මූලික කටයුතු අවසන් වීමෙන් පසු මේ කාර්යය අපි අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ அமைச்சர் அவர்களே, நன்றி!

வட மாகாண இணைப்பாளராக இருக்கின்ற பாராளு மன்றச் சபை முதல்வரும் அமைச்சருமான கௌரவ பிமல் ரத்நாயக்க அவர்களிடம் நான் ஒரு வேண்டுகோளை விடுக்கிறேன். இந்த விடயத்தில் கவனம் செலுத்தி, வட மாகாண விளையாட்டுத் திணைக்களத்தை கிளிநொச்சிக்கு அல்லது மாங்குளத்துக்கு இடமாற்றம் செய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். ஏனெனில், வன்னிப் பிராந்தியத் திலுள்ள விளையாட்டு வீரர்கள் யாழ்ப்பாணத்துக்குச் சென்றுவருவது என்பது சிரமமான விடயமாகும். தற்பொழுது, இந்த விடயம் discussionஇல் இருப்பதாகச் சொல்கிறார்கள். இது தொடர்பில் ஒரு முடிவை எடுத்து, ஆளுநரின் அனுமதியோடு இதற்குரிய நடவடிக்கையை எடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එතුමා ගරු බිමල් රත්නායක ඇමතිතුමාට අදහසක් ඉදිරිපත් කළා. මම ඒ ගැනත් සඳහන් කරන්න කැමැතියි. ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට ඉතාම කඩිනමින් මේ කටයුතු අපි අවසන් කරනවා. ප්‍රදේශයේ සමහර දේශපාලනඥයන් මේ ක්‍රියාකාරකම් අඩාළ කිරීම සඳහා කටයුතු කරමින් ඉන්නවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාත් ඒ සඳහා මැදිහත් වෙලා, මේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අපට සහයෝගය ලබා දෙන්න කියලා මේ අවස්ථාවේදී මා ඉල්ලා සිටිනවා.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ அமைச்சர் அவர்களே, இதற்கு எங்களுடைய பூரண ஒத்துழைப்பு கட்டாயம் இருக்கும். இந்த விடயத்துக்காக நான் உங்களோடு இணைந்து பயணிப்பதற்குத் தயாராக இருக்கிறேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන.

2026.06.11වන දින ගරු රවී කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා.

## මහජන සෞඛ්‍යයට දුම්කොළවලින් වන බලපෑම සහ නීති විරෝධී දුම්කොළ වෙළෙඳාම හේතුවෙන් රජයේ ආදායම අහිමි වීම: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## பொது மக்களின் சுகாதாரத்துக்கு புகையிலையால் ஏற்படும் பாதிப்பும் சட்டவிரோத புகையிலை வர்த்தகத்தால் அரச வருவாய் இழப்பும்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று

## IMPACT OF TOBACCO ON PUBLIC HEALTH AND LOSS OF GOVERNMENT REVENUE DUE TO ILLICIT TOBACCO TRADE: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

Hon. Speaker, the Answer is as follows:

1. The Global Adult Tobacco Survey - GATS - Sri Lanka 2020 Report, published by the Ministry of Health, estimates 24,461 smoking-attributable deaths in 2019, while the Annual Trend Survey on Tobacco Use in Sri Lanka 2024, published by the Alcohol and Drug Information Centre - ADIC - estimates approximately 18,250 smoking-related deaths annually. Accordingly, the available estimates indicate that tobacco use is associated with more than 20,000 deaths annually in Sri Lanka.

2. The Government recognizes that tobacco consumption imposes significant economic and healthcare costs on society. However, the total cost varies depending on the methodology and assumptions used and therefore, no single official estimate has been adopted, as of now.

   On the other hand, tobacco taxation remains an important policy tool to discourage tobacco consumption while generating Government revenue. The revenue collected from tobacco-related taxes, both indirect and corporate taxes, during the year 2025 amounted to Rs. 157,061 million, that is Rs. 157 billion.

3. The annual cigarette consumption declined significantly by 53.1 per cent from approximately 4.1 billion sticks in 2015 to 1.923 billion sticks in 2025. Over the same period, the Government revenue from Excise Duty on cigarettes and Tobacco Tax increased from Rs. 81 billion in 2015 to Rs. 102.7 billion in 2025.

   In addition to the Excise Duty and the Tobacco Tax, cigarettes are subject to the Value Added Tax and a Social Security Contribution Levy of 2.5 per cent. Furthermore, companies engaged in the manufacture and sale of tobacco products are subject to Corporate Income Tax - CIT - at a rate of 45 per cent, compared to the standard Corporate Income Tax rate of 30 per cent applicable to other businesses.

   To preserve the real value of the Excise Duty over time and prevent erosion of the tax burden due to inflation, an inflation indexation mechanism for cigarette Excise Duty was introduced with effect from 01st January, 2024. Accordingly, the Excise Duty on cigarettes increased by 14 per cent in 2024 and by 5.9 per cent in 2025.

   The illegal importation of cigarettes constitutes an offence under the Customs Ordinance and the Tobacco Tax Act. In Sri Lanka, the Customs take necessary action to detect and seize such illicit imports at the country's airports and seaports and to initiate legal proceedings against the persons involved in such offences. In addition, the Department of Excise, the Sri Lanka Navy and the Sri Lanka Police undertake enforcement and surveillance activities, including inspections, investigations, raids and intelligence-sharing, to prevent illegal importation, distribution, and sale of illicit cigarettes. Those agencies work in coordination with each other to combat the illicit tobacco trade and to ensure compliance with the applicable laws and regulations.

4. The Government continuously monitors the illicit tobacco trade through information obtained from relevant enforcement agencies. Estimates of the market share of illicit tobacco products and the associated revenue losses are likely to vary depending on the methodology, scope and data sources used. However, no single estimate has been officially adopted. The Government remains committed to strengthening the data gathering and enforcement efforts to better assess the extent of the illicit trade and to support evidence-based policy decisions.

5. Amendments to the Tobacco Tax Act are currently being drafted with the objective of strengthening tax administration and improving compliance. I just want to inform you that currently they are at the Legal Draftsman's Department.

   To date, approximately, there are over 700 registered beedi manufacturers who have obtained licences from the Excise Department. The Department is currently taking steps to identify small-scale beedi manufacturers and create a necessary framework to enable them to market their products through formal channels.

   The Government recognizes the importance of safeguarding the livelihoods of genuine small-scale beedi workers while advancing national public health objectives. The raids are conducted with the assistance of the Sri Lanka Navy to prevent the illegal importation of raw materials used in beedi manufacturing. Measures have also been taken to restrict the purchase and use of

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

illegally imported beedi raw materials. Accordingly, beedi manufacturers are now required and have been instructed to procure raw materials only from registered importers.

6. The Government continues to review the tobacco Excise Tax framework based on available evidence, the prevailing economic conditions and public health considerations. Tobacco tax reforms will continue to be considered under the Medium-Term Revenue Strategy with the aim of developing a health-aligned framework that supports both the reduction of tobacco consumption and the stabilization of Government revenue. In the meantime, the cigarette Excise Duty continues to be revised annually in accordance with the established inflation indexation mechanism to preserve the real value and effectiveness of the tax.

 The Government is committed to enhance enforcement measures for the collection of beedi taxes through amendments to the Tobacco Tax Act with the objective of strengthening tax administration and improving compliance.

7. These enforcement measures have been explained in the last paragraphs of Answers to Question Nos. 3 and 5.

8. The Government's tobacco excise policy is designed to balance the multiple policy objectives, including reducing tobacco consumption, protecting public health, generating sustainable Government revenue and fulfilment of Sri Lanka's commitments under the WHO Framework Convention on Tobacco Control.

 The Government continues to review the tobacco excise framework periodically, taking into account public health objectives, revenue considerations, economic conditions and available evidence with a view to maintaining an appropriate balance among these policy objectives.

9. At present, the tobacco tax revenue is credited to the Consolidated Fund in accordance with established public finance principles and is allocated through the annual budgetary process. Tobacco control, smoking cessation, public awareness and enforcement programmes are funded through budgetary allocations made to the relevant institutions.

 The Government will continue to consider funding requirements for tobacco control programmes within the broader framework of national budget priorities and available fiscal resources.

10. The Government continues to implement a range of measures through the National Authority on Tobacco and Alcohol - NATA, the National Tobacco Control Programme, the tobacco excise policy, the Customs and excise enforcement and the implementation of Sri Lanka's obligations under the WHO Framework Convention on Tobacco Control.

 The Government remains committed to strengthening coordination among relevant institutions and to continuously reviewing existing policies and programmes to enhance public health outcomes, combat the illicit tobacco trade and safeguard Government revenue. Future policy measures will continue to be guided by evidence, stakeholder consultations and national priorities.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, it is time for you to seek a clarification?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Minister, thank you for the very comprehensive Answer. But, the question that begs an answer relates to revenue sources. What was asked in question no. 6 is whether the length of the cigarette would be a determining factor in earning revenue, and about the illegal cigarettes that are coming into the country. I am sure, if you get your Excise Officers to go round the country, you would see that there are a lot of imported cigarettes in normal shops. If those are brought in through legal channels, there would not be a problem. Even though it is not palatable, this is one of the biggest revenue sources that the Government has, which is about Rs. 140 billion. There is a reduction in that revenue because cigarettes are coming into the market illegally. The less affluent classes are using beedi and also those smuggled cigarettes. So, you have to have a balance in collecting revenue. Therefore, would you be able to tell us how you are going balance that? It has been reported that that revenue reduction is taking place owing to the illegal cigarettes that are coming from various sources into the country. So, that is as bad as monies going out of the country. Therefore, I guess it is a necessity to stop those illegal cigarettes from entering into the country.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Thank you very much, Hon. Member. Sir, I think the points highlighted by the Hon. Member are really important. Of course, now, lots of measures are being taken in that regard. In fact, our objective is to bring the informal and illegal trading into the formal mechanism. How best that could be done is a challenge.

As of now, as I highlighted in my Answer, the Tobacco Tax Act is being amended. Even the raw materials used in the manufacture of beedi would be brought under the purview of this Tobacco Tax Act and appropriate measures will be taken.

In addition, when it comes to the cigarette market, yes, we admit that illegal cigarettes are entering the country. The Customs and other enforcement authorities are conducting raids and other investigations, but still, there are some avenues through which these cigarettes enter the market. We are trying hard to stop this.

As of now, on cigarettes, taxes have been imposed under four categories. We have identified one category where there is a particular leakage because some cigarettes under this category could be used as substitutes for the cigarettes brought in formally.

At the same time, there is another factor. There is a monopoly in the cigarette market and cigarette manufacturing. In doing this, we need to take many aspects into account including Government revenue, public health and monopolistic market conditions. So, rather than just focusing on the revenue, we are now moving ahead figuring out how best we could improve public health by improving the quality of the cigarettes as well.

So, Hon. Member, thank you very much for those ideas. We will take those into consideration and incorporate them in the next revisions and the policy framework.

Thank you very much.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ආණ්ඩුව වෙනුවෙන්, අමාත්‍යවරුන්ගේ නිවේදන යටතේ මා නිවේදනයක් කිරීමට කැමැතියි.

විශේෂයෙන්ම, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත කියන්නේ, අපේ රට තුළ විශාල වෙනසක් ඇති කළ පනතක්. එම පනතේ 86 සහ 88 වගන්ති අනුව අපේ රටේ දේශපාලන නායකත්වය සහ ඉහළ නිලධාරින් සියලු දෙනාම වත්කම් බැරකම් ප්‍රකාශවල තමන්ගේ තොරතුරු ඇතුළත් කළ යුතුයි. ගරු කථානායකතුමනි, ඒ අනුව ආසන්න වශයෙන් පුද්ගලයින් 300ක් පමණ -ජනාධිපතිතුමාගේ සිට පහළට - තමන්ගේ තොරතුරු ඇතුළත් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දිය යුතුව තිබුණා. එය දිය යුතුව තිබුණේ මුද්‍රිතව; අතින් ලියලා දෙන්න තිබුණේ.

ඉන්පසුව ඒ තොරතුරු ලබා දීමේ ක්‍රමවේදය සංශෝධනය කළා, electronically, online විධියට ලබා දෙන්න පුළුවන් වෙන ආකාරයට. මම හිතන විධියට, මේ ගරු මන්ත්‍රීවරු අතිවිශාල ප්‍රමාණයක් ඒ ආකාරයට ඒවා ලබා දුන්නා. 2025 වසරේ සිදු කළ සංශෝධනයෙන් පස්සේ, එනම් මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියක් මඟින් තොරතුරු ලබා දීමට කටයුතු කළාට පස්සේ තොරතුරු ලබා දීමේ පිරිස 160,000ක් දක්වා පුළුල් වුණා. දේශපාලනඥයින් පමණක් නොවෙයි, විවිධාකාර පුද්ගලයින් 160,000කට ආසන්න ප්‍රමාණයක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම වෙත එම තොරතුරු ලබා දීම අනිවාර්ය නීතිමය තත්ත්වයක් වුණා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 88වන වගන්තියේ සඳහන් "ජනතා ප්‍රවේශය" කියන කොටස අනුව, එම පුද්ගලයින් 160,000ම ලබා දෙන තොරතුරු website එකේ පළ කරන්නත්, ඒ තොරතුරු මහජනතාවට ලබා ගන්නටත් අයිතිවාසිකම ලබා දුන්නා. ඒක, ජනතා ප්‍රවේශය පැත්තෙන්, විනිවිදභාවය පැත්තෙන් ගත් ඉහළ පියවරක්. නමුත් ඒ ඉහළ පියවර - ඉතා ප්‍රජාතන්ත්‍රවාදී සාධනීය පියවර - අද වෙනකොට සමහර වගකීම් විරහිත පුද්ගලයින් සහ මාධ්‍ය යැයි කියා හඳුන්වා ගන්නා සමහර පුද්ගලයින් විසින් යම් ප්‍රමාණයකට අවභාවිත කරමින් සිටින බව ඉතා පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. මොකද, මේ වාර්තා ලබා දෙන පුද්ගලයින්ගේ තොරතුරු පමණක් නොවෙයි, ඔවුන්ගේ දරුවන්ගේ තොරතුරුත් ඒවායේ තිබෙනවා. අපි දැක්කා, පසුගිය කාලයේ ඇමතිවරුන්ගේ පවා ඒ වත්කම් බැරකම් ප්‍රකාශ අරගෙන - කාටත් ප්‍රවේශය තිබුණු නිසා - ඒවායේ කොටස් විකෘති කර තිබුණු ආකාරය. ඒවායෙන් victims බවට පත්වෙච්ච ඇමතිවරු මෙතැනත් ඉන්නවා. වත්කම් මෙච්චරයි අච්චරයි කියලා විකෘති කරලා දැම්මා. එම නිසා දූෂණ විරෝධී පනතෙන් ඉටු වුණු හොඳ අරමුණු තිබෙනවා වාගේම, මේ සිදු කරන ඇතැම් ක්‍රියා නිසා යම් ප්‍රමාණයකට මිනිසුන්ගේ පෞද්ගලිකත්වයට - privacy එකට - අනවශ්‍ය පහරක්, බලපෑමක් ඇතිවෙලා තිබෙන බවත් අපට දැනගන්න ලැබී තිබෙනවා. එම නිසා තමයි මේ පනත සංශෝධනය කිරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම තීන්දු කරන්නේ. දැන් සංශෝධනය විධියට යෝජනා වෙමින් තිබෙන දෙය තමයි, මෙම "ජනතා ප්‍රවේශය" කියන කොටස යටතේ, සියලු දෙනාගේ තොරතුරු ඇතුළත් වත්කම් බැරකම් ප්‍රකාශ website එකේ පළ කරන්න ඕනෑ, නමුත් ඕනෑම කෙනෙකුටම ඒක ලබා ගන්න පුළුවන් වීමේ ඉඩකඩ යම්කිසි ප්‍රමාණයකට සීමා කළ යුතුයි කියන එක. තොරතුරු ගනිද්දී SMS එකක් යනවා. ඒක හරි. නමුත්, ඒක සීමා කළ යුතුයි කියන එක තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පදනම. නමුත්, අපි ආණ්ඩුව වශයෙන් තීන්දු කරලා තිබෙනවා, එම සීමා කිරීම මහජන නියෝජිතයන්ට අදාළව සිදු විය යුතු නැහැ කියලා. ඒ නිසා මහජන නියෝජිතයන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඕනෑ කෙනෙකුට බලන්න පුළුවන්; ඕනෑ කෙනෙකුට ඒකට access තිබෙනවා. අපි එම සංශෝධනයේදී බලාපොරොත්තු වනවා, මහජන නියෝජිතයන්ට අදාළ ඒවා දැනට මේ තිබෙන විධියටම ඕනෑ කෙනෙකුට ලබා ගන්නට පුළුවන් තත්ත්වයේ තබන්න. හැබැයි, එය misuse කරන එක හොඳ නැහැ. ඒ අයිතිවාසිකම ජනතාවට එලෙසම ඉතුරු කරලා මහජන නියෝජිතයන් නොවන අනෙක් අයගේ ඒවා සම්බන්ධයෙන් යම්කිසි සීමා කිරීමක් කරන්න බලාපොරොත්තු වනවා. රජයේ නිලධාරින් ඉන්නවා, විවිධ පුද්ගලයන් ඉන්නවා. අන්න ඒගොල්ලන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කෙරෙන විධියට එම පනත සංශෝධනය කරන අවස්ථාවේදී කටයුතු කරන්න බලාපොරොත්තු වනවා.

මහජන නියෝජිතයන්ට අදාළව ගත්තොත්, ඒ අයගේ වත්කම් ගැන ජනතාව දැන ගත යුතුයි. මොකද, මහජන නියෝජිතයින් විධියට කරන්නේ රස්සාවක් නොවෙයි, ඒක වෙන දෙයක්. එම නිසා ජනතාව දැන ගත යුතුයි මහජන නියෝජිතයාගේ වත්කම් ගැන; ඔවුන්ගේ ඥාතීන්ගේ වත්කම් ගැන. ඒකට අපි කැමැත්තෙන්මයි මේ දේශපාලනය කරන්නේ; මහජන සේවය තෝරාගෙන තිබෙන්නේ. එම නිසා අපේ ඒ දේවල් විවෘත වුණාට ප්‍රශ්නයක් නැහැ. නමුත්, රජයේ නිලධාරින් හා වෙනත් ආයතනවල පුද්ගලයන් ඇතුළු අනෙකුත් සියලුදෙනාම මේ තත්ත්වයට ගොදුරු වීම හොඳ නැහැ කියලා අපි විශ්වාස කරනවා. මොකද, හොඳ දෙයක් හොඳ විධියට පාවිච්චි කර ගන්න බැරි නරක සංස්කෘතියකුත් අපේ රටේ තිබෙනවා.

විශේෂයෙන්ම ඉතාම පහත් මට්ටමේ සමහර මාධ්‍ය ආයතන විසින් යම් යම් පුද්ගලයන්ට හිරිහැර කිරීම නිසා - දේශපාලනඥයන් ගැන නොවෙයි, මම කියන්නේ - ඔවුන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමක් අවශ්‍යයි කියලා අල්ලස් හෝ

[ගරු බිමල් රත්නායක මහතා]

දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව දකින නිසායි එවැනි සීමාවක් කරන්න යෝජනා කළේ. එම සංශෝධනයේදී ආණ්ඩුව පැත්තෙන් අප යෝජනා කරන්නේ, මහජන නියෝජිතයන්ට අදාළ තොරතුරු පෙර තිබුණු විධියටම ඕනෑ කෙනෙකුට ලබා ගන්න පුළුවන් විධියට තියන්න ඕනෑ කියන එකයි. *[බාධා කිරීමක්]* ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ඒකට එකඟයි කියලා ද කිව්වේ?

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
එකඟයි, අනිවාර්යයෙන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහෙම තිබෙන්න ඕනෑ. එතුමාත් එකඟතාව පළ කරනවා. මේ සම්බන්ධව දැනුවත් කිරීම තමයි ගරු කථානායකතුමනි, මම සිදු කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 ඉදිරිපත් කිරීම, the Hon. K.D. Lal Kantha. You have 15 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

## සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත
## விலங்குகள் (திருத்தம்) சட்டமூலம்
## ANIMALS (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 11.44]

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත ද දෙවන වර කියවීම සඳහා මා ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කරුණු දක්වන්න බලාපොරොත්තු වනවා, 1958 අංක 29 දරන සත්ව පනත පිළිබඳව. එම පනත 1964 අංක 20, 1968 අංක 10, 1988 අංක 46 සහ 2009 අංක 10 දරන පනත් මඟින් සංශෝධනය වුණා. ඊට පසුව තමයි අද අපි විවාදයට ගන්නා මෙම සංශෝධනය ඇතුළත් වෙන්නේ. මෙම පනත් කෙටුම්පත පළමුවන වර කියැවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් වීමෙන් පසුව පාර්ලිමේන්තුවෙන් පිටත සමාජය තුළ සාකච්ඡාවක් පැන නැඟිලා තිබෙනවා, සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත කියන එකට සත්ව සුබසාධන පනත යැයි පටලවා ගැනීමක් මඟින්. සත්ව සුබසාධන පනතක් ඕනෑ කියලා කාලයක් තිස්සේ සාකච්ඡා කරමින් තිබෙනවා. මා හිතන විධියට, එය බොහෝ කාලයක් සමාජය තුළ සාකච්ඡා වෙලා, පාර්ලිමේන්තුවේ සාකච්ඡාවටත් ඇවිල්ලා තිබෙන නමුත් ක්‍රියාත්මක නොවෙච්ච එකක්. ඒක තමයි, සත්ව සුබසාධන පනත් කෙටුම්පත. සත්ව සුබසාධන පනත් කෙටුම්පත තමයි මහත් සේ විවාදාත්මක එකක් බවට පත් වෙලා තිබෙන්නේ. අපි මේ වනකොට එම කෙටුම්පත ගැසට් කරලා තිබෙනවා. ඒක, සත්ව සුබසාධන පනත් කෙටුම්පත. මේ දෙක පටලවා ගැනීමක් කරගෙන තිබෙන නිසායි මගේ කථාව ආරම්භයේදීම මා මෙම පැහැදිලි කිරීම කරන්නේ. අද අප මේ සාකච්ඡා කරන්නේ, සංශෝධනය කරන්නේ සත්ව සුබසාධන පනත් කෙටුම්පතට සම්බන්ධ කාරණා නොවෙයි. අද අප කථා කරන්නේ සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත ගැනයි. සත්ව සුබසාධන පනත් කෙටුම්පත පිළිබඳව විවිධ මත පළ වෙනවා. දැනට ඉදිරිපත් කර තිබෙන, අප ගැසට් කර තිබෙන එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මේ වන කොට විවිධ පාර්ශ්වයන්ගෙන් විරෝධතා පැන නැඟිලා තිබෙනවා. ඒ පාර්ශ්ව ඒ පිළිබඳව අපිත් එක්ක - ඇමතිවරයා එක්ක, නියෝජ්‍ය ඇමතිවරයා එක්ක, අමාත්‍යාංශය එක්ක - තවදුරටත් සාකච්ඡා කිරීමට අවශ්‍යයි කියා දැනුම් දීලා තිබෙනවා. ඒ අනුව මේ වන කොටත් ඉදිරි දිනවලදී සාකච්ඡා ගණනාවක් යොදාගෙන තිබෙනවා. පෙරහැර පැවැත්වීමට අදාළ ගැටලුත් ඒවා අතර තිබෙනවා. අනෙක් සතුන් ගැන නොවෙයි, විශේෂයෙන්ම බොහෝ දුරට අලි ඇතුන් සම්බන්ධ ප්‍රශ්නය තමයි බරපතළ විධියට ඉදිරියට ගෙනැල්ලා තිබෙන්නේ. ඒ අනුව අපි තීරණයක් අරගෙන තිබෙනවා, සත්ව සුබසාධන පනත් කෙටුම්පත ගැසට් කරලා තිබුණත් ඒ පිළිබඳ පුළුල් සාකච්ඡාවක් තවදුරටත් පවත්වන්න. ඒ සාකච්ඡාවෙන් පසුව තමයි අපි සත්ව සුබසාධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට බලාපොරොත්තු වන්නේ. ඒක දැනුම්දීමක් වශයෙනුයි මා සඳහන් කළේ. මොකද, විශේෂයෙන්ම මේ ගැන රට දැන ගන්න ඕනෑ.

අද මේ කථා කරන්නේ ගෙන ඒමට නියමිත සත්ව සුබසාධන පනත් කෙටුම්පත ගැන නොව, සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත ගැනයි. එනම්, 1958 අංක 29 දරන සත්ව පනතට ගෙනෙන සංශෝධන පනත් කෙටුම්පත ගැනයි. සත්ව පනත 1958දී ගෙනෙන විට - ඒ අවධිය වන විට - අපේ රටේ එළ ගවයන් සහ මී ගවයන් කියන සතුන් දෙවර්ගයටම විශේෂ වටිනාකමක් තිබුණා. අදත් ඒ සතුන් වටිනවා. නමුත්, අදටත් වඩා ඒ අවධියේ ඒ සතුන්ට විශේෂ වටිනාකමක් තිබුණා. "ගව සම්පත" කියන නම තමයි අප කවුරුත් පාවිච්චි කළේ. ගව සම්පත කෘෂි කර්මාන්තයට - සී සෑම, කොළ පෑගීම ආදියට - පුළුල් ලෙස සම්බන්ධ කර ගත්තා; ප්‍රවාහන කටයුතුවලදී කරත්තවලට යොදා ගත්තා; අපේ ජාතික කිරි නිෂ්පාදනයට දායක කර ගත්තා. මේ ආදි වශයෙන් ගවයා විශාල වටිනාකමක් සහිත සතකු බවට පත් වෙලා තිබුණා. ඒ තත්ත්වය තුළ තමයි; ඒ වටපිටාව තුළ තමයි සත්ව පනත ගෙන ආවේ. අපේ රටේ තිබුණු කෘෂිකාර්මික ආර්ථිකය, සංස්කෘතික

පරිසරය, ගව සම්පතේ තිබුණු වටිනාකම, එයට ආර්ථිකයත් එක්ක තිබුණු සම්බන්ධය ආදි සියලු වටපිටාවන් තුළ තමයි 1958 අංක 29 දරන සත්ව පනත ගෙන ආවේ. ඒ පනතට අනුව "සතකු" කියන පදයට අර්ථ නිරූපණය දීලා තිබෙන්නේ එළ හරකා සහ මී හරකා කියන පදනමින් පමණයි. වෙනත් සතුන් ගැන එහි කථා කරන්නේ නැහැ. හැබැයි, ඒ පනතේ වෙනත් තැනක වෙනත් සතුන් ගැන කථා කරනවා, මෙන්න මෙහෙම. අපි හිතමු, සතෙක් කාගේ හරි වත්තකට පැන්නා කියලා. එහෙම දේවල් වුණා නේ, ඒ කාලයේත්. හේන් වගාව, කුඹුරු වගාව ඇතුළු කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයට හෝ වෙනත් ක්ෂේත්‍රවලට සතුන්ගෙන් යම් යම් ප්‍රශ්න ඇති වෙනවා. ඒ ගැන කථා කරද්දී පනතේ සඳහන් වෙනවා, එළ හරකා, මී හරකා විතරක් නොවෙයි, එළුවා, ඌරා, කුකුළා, බැටළුවා ආදි සතුන් පිළිබඳවත්. උදාහරණයක් වශයෙන් ගන්න පුළුවන්, ඒ කියපු සතෙක් කාගේ හරි වත්තකට පැනලා වගා හානියක් සිද්ධ කිරීම. ඒ ආදි කාරණා ගැන සාකච්ඡාවක් තිබෙනවා. නමුත් අද අප කථා කරන මේ සංශෝධනයට ගැනෙන්නේ සතුන් ප්‍රවාහනය සම්බන්ධවයි. දිස්ත්‍රික්කයකින් දිස්ත්‍රික්කයකට සතුන් ප්‍රවාහනය කරද්දි මී හරකා සහ එළ හරකා විතරයි මීට පෙර අදාළ වුණේ. අනෙක් සතුන් අදාළ කර ගත්තේ නැහැ; එළුවා, බැටළුවා, කුකුළා, ඌරා අදාළ කර ගත්තේ නැහැ. නමුත්, මේ වන විට පශු සම්පත් ක්ෂේත්‍රය ගොඩක් ඉදිරියට ඇවිත් තිබෙනවා සහ අපට එය ඉදිරියට ගෙන යන්න තිබෙනවා. පශු සම්පත් ක්ෂේත්‍රයේ ඉදිරි දැවැන්ත වැඩසටහන් පවා අපි නිර්මාණය කරගෙන තිබෙනවා. මේ අවුරුද්දේ අය වැයෙනුත් පශු සම්පත් ක්ෂේත්‍රයට විශාල වශයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ අනුව අපි පශු සම්පත් ක්ෂේත්‍රය ඉදිරියට ගෙන ඒම සඳහා, සංවර්ධනය කිරීම සඳහා වන වැඩසටහන් සැලසුම් කරලා දැන් ඒවා ආරම්භ කරලාත් තිබෙනවා.

පසුගිය දිනවල රටේ පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළව ලොකු ප්‍රශ්නයක් ආවා. ඒක සූකර කර්මාන්තයට බලපාපු ප්‍රශ්නයක්. ඒ තමයි අපේ සූකර සතුන්ට "අප්‍රිකානු සූකර උණ" කියන රෝගය වැලඳීම. සාමාන්‍ය වචනයෙන් කිව්වොත්, ඌරු මස්වලට, එහෙම නැත්නම් සූකර සතුන් ඇති දැඩි කිරීමට, ඒ කර්මාන්තය ඉදිරියට පවත්වාගෙන යැමට, ඒ කර්මාන්ත කරගෙන යන අයගේ ආර්ථිකයට ඒකෙන් බරපතළ ප්‍රහාරයක් එල්ල වුණා. ඇත්තෙන්ම කියනවා නම් ඔවුන්ගේ ආර්ථිකය කඩාගෙන වැටුණා. දැන් වුණත් ඒ කර්මාන්තය නැවත පටන් ගැනීමට අදාළව යම් දෙගිඩියාවන් ප්‍රමාණයක් තිබෙනවා. මොකද, අපේ සූකර සතුන්ට "අප්‍රිකානු සූකර උණ" කියන රෝගය හැදුණා. ඒ රෝගයත් එක්ක තමයි ඒ කර්මාන්තය දැවැන්ත විධියට කඩා වැටීමට පටන් ගත්තේ. ඇත්තටම ගත්තොත්, කැලෑ සතුන්ට පවා මේක බලපෑවා. වල් ඌරන් දක්වා මේ කාරණය පැතිරිලා ගියා. සෑහෙන මහන්සියක්, වෙහෙසක්, පරිශ්‍රමයක්, මැදිහත් වීමක් දරන්න සිද්ධ වුණා, ඒක පාලනය කර ගන්න. ඇත්තටම ගොවිපළවල හිටපු සත්තු විනාශ කරන්න සිද්ධ වුණා. අලුතෙන් පැටව් ලබා ගැනීම සම්බන්ධයෙන් පවා බරපතළ ප්‍රශ්න ගැටලු මතු වුණා. මේ ඇති වෙච්ච සෞඛ්‍ය ප්‍රශ්නය තුළ අපි මේ ක්ෂේත්‍රයට අදාළ විවිධ පාර්ශ්ව එක්ක කරන ලද සාකච්ඡාවලදී, වැඩමුළුවලදී, වැඩසටහන්වලදී, අපේ නිලධාරීන් සමඟ කරන ලද සාකච්ඡාවලදී ආපු අදහස තමයි ප්‍රවාහනයට අදාළ කොටසේදී, "සතා" යන්නෙන් අර්ථ දක්වා තිබෙන එළ හරකා සහ මී හරකාට අමතරව තවත් සතුන් ප්‍රමාණයක් ඇතුළු කළ යුතු බව. ඒක තමයි මේ සංශෝධනයෙන් සිද්ධ වෙන්නේ. ඒ ගැන තමයි අද අපි කථා කරන්නේ. එළහරකා, මීහරකා කියන සතුන් දෙදෙනාට අමතරව ඌරා, එළුවා, බැටළුවා, කුකුළා පිළිබඳව තමයි සාකච්ඡාව ආවේ. නමුත් එළහරකා, මීහරකා, බැටළුවා, එළුවා, ඌරා කියන සත්තු ටික තමයි සංශෝධනයට ඇතුළු කරන්නේ. මම හිතන විධියට, මේකට කවුරුත් විරුද්ධ වෙන එකක් නැහැ.

හැබැයි, මේ සම්බන්ධයෙනුත් යම් යම් ප්‍රශ්න කථා කරමින් තිබෙනවා. ඒ කියන්නේ, මේ ව්‍යාපාරය ටිකක් මහා පරිමාණයෙන් කරන අයට ඒක ප්‍රශ්නයක් විධියට ඇවිල්ලා නැහැ. නමුත්, සුළු පරිමාණයෙන් සතුන් ඇති කරන සමහර අයට මේ සංශෝධනය නිසා ප්‍රශ්න ඇති වී තිබෙනවා. විශේෂයෙන් සූකර කර්මාන්තය - සූකර සත්තු හදන එක - රටේ ගම්බද පළාත්වල ආර්ථික කටයුත්තක් විධියට පැතිරී තිබෙනවා. ඒ අයට මේකත් එක්ක ගැටලු මතු වෙනවා කියලා ඒගොල්ලෝ අපට මේ වෙනකොට සඳහන් කර තිබෙනවා. ඒගොල්ලෝ ඇත්තටම කියන්නේ මේක කරන්න එපා, මහා පරිමාණයෙන් සතුන් ඇති කරන අයට මේක ප්‍රශ්නයක් නැති වුණාට ඒගොල්ලන්ගේ ආර්ථිකයට මේක බලපානවා කියලායි. මේ සංශෝධනය අපි අද සම්මත කර ගත්තාට පසුව අපට පුළුවන්, අමාත්‍යාංශයේ නීති අංශයත්, අපේ පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ නීති අංශත් සම්බන්ධ කර ගෙන ප්‍රවාහන කටයුත්තේදී ඒ අයට මුහුණ දෙන්න වෙන යම් අපහසුතාවක් තිබෙනවා නම් ඒවාට සරිලන විධියට රෙගුලාසි සකස් කරන්න. ඒක තමයි අපේ සැලැස්ම වෙන්නේ. මේ සංශෝධනය කරනවා. එළහරකා, මීහරකාට අමතරව බැටළුවා, එළුවා, ඌරා කියන සත්තුත් මේකට ඇතුළු කරනවා.

මේ තුළ අපට තවත් අවශ්‍යතාවක් තිබෙනවා. අපි දැන් මේ කර්මාන්තය තුළ අපනයනය කිරීම පිළිබඳවත් සැලකිලි දක්වා තිබෙනවා. අපි දැනට ආනයනය කරන ප්‍රමාණයකුත් තිබෙනවා. අපනයනයේදී ඒ මට්ටමට එන්න නම් අපි අපේ අණපනත්වල මෙවැනි සංශෝධන ඇති කරගත යුතුව තිබෙනවා. ඒ කියන්නේ, අපි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව මේ කර්මාන්තය දියුණු කරනකොට අපට මෙවැනි සංශෝධන අවශ්‍ය වෙනවා. ඒ තුළින් තමයි අපට පුළුවන්කම ලැබෙන්නේ ඒ විශ්වාසනීයත්වය ඇති කර ගන්න.

අපි රටේ ජනතාවටත් කියනවා, මේ කර්මාන්තය වර්තමාන තත්ත්වයට ගැළපෙන්න, මේ කර්මාන්තය ඉදිරියට ඇවිල්ලා තිබෙන ප්‍රමාණයට ගැළපෙන්න, මේ කර්මාන්තය මුහුණ දී තිබෙන අභියෝග සැලකිල්ලට අරගෙන ඒ අභියෝගවලට හොඳින් මුහුණ දීමට අවශ්‍ය කරන තත්ත්වය සම්පාදනය කර ගැනීමට තමයි මේ සංශෝධනය කරන්නේ කියන එක. ඒකට මේ සභාවේ කවුරුවත් විරුද්ධයි කියලා මම හිතන්නේ නැහැ. නමුත්, මේ පිළිබඳ සාකච්ඡා කිරීම වැදගත්. අපි ඒ ගැන අද සාකච්ඡා කරමු. සාකච්ඡා කරලා මේක සම්මත කර ගනිමු. මේ කර්මාන්තයේ දියුණුවට මේක අවශ්‍ය වෙනවා. නැත්නම් සම්පූර්ණයෙන්ම මේ කර්මාන්තය විනාශ වෙනවා, අපි මේ සතුන්ගේ සෞඛ්‍ය පැත්තට අපේ අවධානය යොමු නොකළොත්.

මේ සෞඛ්‍ය කටයුත්තේදී බරපතළ විධියටම මේ රෝග පැතිරෙන්නේ අවිධිමත් ප්‍රවාහනය නිසා. මේ අවිධිමත් ප්‍රවාහනය විධිමත් කිරීම වෙනුවෙන් තමයි මේ සංශෝධනය මූලික වශයෙන් ගෙනෙන්නේ. අවසාන වශයෙන් මම කියනවා, මේක සත්ව සුබසාධන පනත නොවෙයි කියන එක. එවැනි පනතක් තිබෙනවා, 1907දී සම්මත කරපු. යටත් විජිත යුගයේ - 1907දී - සම්මත කරපු පනතක් තිබෙනවා. එතැනින් පසු ඒ පනත සංශෝධනය වෙලා නැහැ.

අද අපේ රටේ ආදරයට හදන සත්තු ඉන්නවා, පූසන්, බල්ලන්, සුරතල් මසුන් වැනි තව විශාල ප්‍රමාණයක්. අලි ඇතුන්ගේ ප්‍රශ්නය තිබෙනවා. අපේ පෙරහැර සම්බන්ධව ගත්තොත්, අපි පෙරහැර පවත්වන්න ඕනෑ. ඒවා කරගෙන යන්න ඕනෑ. ඒවාත් සැලකිල්ලට අරගෙන සමබර ආකාරයක සත්ව සුබසාධන පනත් කෙටුම්පතක්

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

පාර්ලිමේන්තුවේ සම්මත කරගන්න අවශ්‍යයි. ඒ වෙනුවෙන් දැන් ගැසට් කරලා තිබෙනවා, අපි හදලා තිබෙන කෙටුම්පත. ඒ සම්බන්ධයෙන් යම් යම් විරෝධතා තිබෙනවා. ඒවාත් සාකච්ඡා කරලා, පාර්ලිමේන්තුවත් සම්බන්ධ කරගෙන, කාටවත් ප්‍රශ්නයක් නොවන, සතුන්ගේ සුබසාධනයත් ඇතිවන ආකාරයේ සත්ව සුබසාධන පනතක් අපි ඉක්මනින් සම්පාදනය කරගනිමු කියා සභාවට යෝජනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Kins Nelson. You have ten minutes.

[අ.භා. 12.12]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා විසින් අද දින 1958 අංක 29 දරන සත්ව පනතට සංශෝධන ඉදිරිපත් කරන අවස්ථාවේ ඒ සම්බන්ධව අදහස් ඉදිරිපත් කරන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම ගරු ඇමතිතුමා සත්ව සුබසාධන පනත් කෙටුම්පත ගැනත් ප්‍රකාශ කළා. ඇත්තටම සත්ත්වයින් ප්‍රවාහනය කරන එක සම්බන්ධව සංශෝධන ගෙන එන එක ගැන අපේ විරෝධතාවක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන් අපි දැක්කා පසුගිය කාලය තුළ මේ සත්ව හිංසා පනතට සංශෝධන ගෙනෙන්න උත්සාහ කළ බව. කෑල්ල කෑල්ල සංශෝධන ගෙනෙනවාට වඩා අපි බලාපොරොත්තු වෙනවා සාකච්ඡා කරලා මේ සම්පූර්ණ පනතටම සංශෝධන ගෙන එයි කියලා. මොකද, සත්ව සුබසාධන පනත් කෙටුම්පත මම හිතන විධියට, 2002 වාගේ කාලයේ තමයි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. හැබැයි, තවම ඒක සම්මත කරගන්න බැරි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා කුමන ජාතික වනෝද්‍යානයට සුනඛයෙක්ව ගෙනිහින් දාලා දිවියන් මේ සුනඛයා අල්ලන්න එන විධියට ලැහැස්ති කරලා සංචාරකයින්ට ඡායාරූප ගන්න සැලසුම් කරලා තිබුණු හැටි. අද මේ සත්ව හිංසා පනතට මෙන්න මේ දේවල් පිළිබඳවත් ඇතුළත් වෙන්න ඕනෑ. මේ වාගේ දේවල් අපේ රට තුළ සිදු වෙනවා. ප්‍රවාහනය වන සතුන් සම්බන්ධව මේ ගෙනෙන සංශෝධනය හොඳයි. මීහරකුන්, එළහරකුන් වාගේම ඔබතුමා කියූ ආකාරයට එළුවන්, බැටළුවන්, ඌරන් වැනි සතුන් ප්‍රවාහනය කරනකොටට මේ දේ හොඳයි කියලා තමයි අපි යෝජනා කරන්නේ. ඒ ගැන කිසිම විරෝධතාවක් නැහැ. හැබැයි, මේ සත්ව සුබසාධන පනත් කෙටුම්පත කඩිනමින් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, එහි සංශෝධනය කළ යුතු දේ තිබෙනවා නම් අපේ රටට ගැළපෙන විධියට ඒවා සංශෝධනය කළොත් හොඳයි කියලා අපි කියනවා. මොකද, එක් පැත්තකින් දිගින් දිගටම අලි-මිනිස් ගැටුම වැඩි වෙනවා. ඒවාත් ඒ පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න ඕනෑ. වන උද්‍යානවල ඉන්න සතුන්, ගෙවල්වල ඇති කරන සුරතල් සතුන්, ඒ වාගේම සත්ව ගොවිපළවල ඉන්න සතුන් කියන හැම සතෙක් දෙසම බලන්න ඕනෑ. බොහොම සංවේදී යෝජනාවක් මේක. ඒ සම්බන්ධව අපේ කිසිම විරෝධතාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ සත්වයින් ගැන කථා කරනවා වාගේම, අද අපේ රටට තුළ ආන්දෝලනයක් ඇති වෙච්ච ප්‍රශ්නයක් තමයි මේ බන්ධනාගාරවල සිටින රැඳවියන් පිළිබඳ ප්‍රශ්නය.

බන්ධනාගාරවල සිටින රැඳවියන් ගැන අපි කථා කරන්න ඕනෑ. අද අපේ රට තුළ බන්ධනාගාර 26ක් තිබෙනවා. එම බන්ධනාගාර 26 තුළ රැඳවියන් 11,000කට තමයි ඉන්න පුළුවන්කම තිබෙන්නේ. හැබැයි, මේ වෙනකොට රැඳවියන් 44,000ක් ඉන්නවා. මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තොත්, මම ඊයේ පොළොන්නරුව බන්ධනාගාරයට කථා කරලා බැලුවා, 175දෙනෙකුටයි එතැන ඉන්න පුළුවන්. හැබැයි, මේ වෙනකොට එතැන 551දෙනෙක් ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක බරපතළ ප්‍රශ්නයක්.

එක පැත්තකින් පසුගිය කාලයේ කිව්වා, නඩු ලක්ෂ 11කට ආසන්න ප්‍රමාණයක් ගොඩගැසී තිබෙනවා, ඒ නිසා විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කරන්න ඕනෑ කියලා. හැබැයි, දෙපාර්තමේන්තුවල සිටින නිලධාරින් - අපි පොලීසිය ගත්තත්, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ගත්තත්, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ගත්තත්, ඒ වාගේම උසාවිවලට සම්බන්ධ දෙපාර්තමේන්තු ගත්තත් - ඒවායේ තොරතුරු උසාවියට එන්න ප්‍රමාද වීම නිසාම තමයි නඩු අහන එක ප්‍රමාද වෙලා තිබෙන්නේ. උදාහරණයක් විධියට විශේෂයෙන්ම පොදු සමාව ලබා දෙන එක ගන්න පුළුවන්. පොදු සමාව යටතේ පසුගිය රජයයන්වලින් වසරකට සිරකරුවන් 7,000ක් විතර නිදහස් වුණා. ජාතික නිදහස් දිනයට, සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයට, වෙසක්, පොසොන්, නත්තල් වගේ උත්සවවලට තමයි ඒ විධියට සිරකරුවන් නිදහස් වෙන්නේ. රාජ්‍ය නායකයා මැදිහත් වෙලා මීට පෙර වසරකට සිරකරුවන් 7,000ක පමණ පිරිසක් නිදහස් කළා. ඔබතුමන්ලා බලයට පත් වෙලා පසුගිය වසර එකහමාර තුළ පොදු සමාව යටතේ සිරකරුවන් 100යි නිදහස් වෙලා තිබෙන්නේ.

ඒ වාගේම, "ක්ලීන් ශ්‍රී ලංකා" සංකල්පය යටතේ විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග පනතේ 54වැනි වගන්තියට අනුව මේ වෙනකොට පාරේ හිටපු උදවිය 14,000ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඔවුන්ව නිදහස් කරන්න නම් රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිර්දේශ අවශ්‍ය වෙනවා. අත්අඩංගුවට ගන්නකොට ඔවුන් ළඟ තිබුණේ කුඩුද, නැත්නම් ඔවුන් ළඟ තිබුණේ වෙනත් දෙයක්ද කියන එක රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය නිසා දැනුම් දීලා නැහැ. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය නිසාම තමයි ඒ 14,000ක පිරිස අද ඇතුළට වෙලා ඉන්නේ. එම නිසා දෙපාර්තමේන්තුවල තිබෙන පුරප්පාඩු නිසි ලෙස පුරවාගන්න වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරනවා වාගේම ඒ පිරිස නිදහස් කර ගැනීම ගැනත් අපි කල්පනා කරන්න ඕනෑ කියලා මම යෝජනා කරනවා.

ඒ වාගේම අද තිබෙන දැවෙන ප්‍රශ්නයක් තමයි, මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ වී සඳහා ලබා දෙන මිල. වී මිල ගත්තොත්, අද ගොවියාට කරකියාගන්න දෙයක් නැහැ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගත්තොත් අද වෙනකොට ගම්මාන 10ක වී අස්වැන්න නෙළනවා. හැබැයි, මහ කන්නයේ මිලදී ගත් වී ටික තවම වී ගබඩාවල තියාගෙන ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඒවා හිස් කරන්නේ නැතුව; ඒවා නිදහස් කරන්නේ නැතුව මේ යල කන්නයේ වී ටික ගන්න විධියක් නැහැ. උදාහරණයක් ගත්තොත්, වැලිකන්දේ කඩවත්මඩුව, කුරුළුබැද්ද, නාගස්තැන්න, මහසෙන්පුර, ඒ වාගේම රුවන්පිටිය වගේ ගම්මානවල දැන් ගොයම් කපනවා. ඒ වාගේම මේ යල කන්නයේ පොළොන්නරුව

දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර් 68,000කට ආසන්න ප්‍රමාණයක වී වගා කරලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. එමෙන්ම, මේ යල කන්නයේ අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර් 55,300කට වැඩි ප්‍රමාණයක වී වගා කරලා තිබෙනවා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර් 31,300කට ආසන්න ප්‍රමාණයක වී වගා කරලා තිබෙනවා.

මේ වෙනකොට අම්පාර දිස්ත්‍රික්කයේ වී අස්වැන්නෙන් සියයට 95ක්ම නෙළලා ඉවරයි. අම්පාර දිස්ත්‍රික්කයේ වී ගබඩා 46ක් තිබෙනවා. මේ වෙනකොට ඒ ගබඩාවලින් විවෘතව තිබෙන්නේ ගබඩා 2යි. ඉතින්, දැන් ගොවියෝ ගිහිල්ලා ඒ ගබඩාවලට වී ටික දුන්නාම, ඒ වී රත්තරන් වාගේ බලනවා. මොකද, සියයට 14ක වියළි ප්‍රමිතිය බලනවා. ඒ වාගේම බොල් වී තිබෙනවාද කියලා බලනවා. වී එක්රැස් කරගෙන ගෝනියකට රුපියල් 80ක ප්‍රවාහන ගාස්තුවක් ගෙවාගෙන වී ගබඩාවට ගියාම, එතැන සිටින නිලධාරි මහත්වරු රත්තරන් වගේ බලලා කියනවා, "මේවායේ සියයට 14ක ප්‍රමිතිය නැහැ. මේවායේ බොල් වී වැඩියි. ඒ නිසා අපට මේවා ගන්න විධියක් නැහැ" කියලා. ඊට පස්සේ ඒ ගොවීන්ට නැවතත් ගාස්තු ගෙවාගෙන ඒවා ආපසු ඔවුන්ගේ ගෙවල්වලට අරගෙන යන්න සිද්ධ වෙනවා. මේ රට තුළ ඒ සඳහා නිසි ක්‍රමවේදයක් නැහැ. මම දැක්කා, ඔබතුමන්ලා බලයට එන්න කලින් නාමල් කරුණාරත්න මහත්මයා පොළොන්නරුව දිස්ත්‍රික්කයටම ඇවිල්ලා කුඹුරකට බැහැලා, ගොවීන් එක්ක එකතුවෙලා කිව්වා, වීවලට රුපියල් 154ක් දෙන්න පුළුවන් කියලා. එතුමාම නැවත කියනවා, එදා තිබුණු මිලට සාපේක්ෂව තමයි රුපියල් 154ට ගන්න පුළුවන් කිව්වේ කියලා. හැබැයි, එදා තිබුණු මිලට වඩා අද තුන් ගුණයකින් නිෂ්පාදන මිල වැඩි වෙලා තිබෙනවා. එදා රුපියල් 10,000ට අක්කරයක් හෑවා නම් අද එය රුපියල් 25,000ක් වෙලා තිබෙනවා. ඉන්ධන මිල වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම කෘෂි උපකරණවල මිල වැඩි වෙලා තිබෙනවා. පොහොර මිල එදා රුපියල් 50,000ට තිබුණා තමයි. අද පොහොර මිල රුපියල් 18,000ක් වුණාට අනෙක් සෑම වියදමක්ම වැඩි වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම දැක්කා ඔබතුමා පොළොන්නරුවට ආපු වෙලාවේ එක ගොවි මහත්මයෙක් කිව්වා, "අපට වී කිලෝ එකක් නිෂ්පාදනය කරන්න රුපියල් 142ක් ගිහිල්ලා තිබෙනවා" කියලා. ඔවුන්ට රුපියල් 142ක් ගිහිල්ලා තිබෙනවා නම්, වෙළිච්ච වීවලට රුපියල් 120යි දෙන්නේ කියලා රජය කියනවා නම්, ඉතිරි මුදල ඒ ගොවියා හොයාගන්නේ කොහෙන්ද? එහෙම නම් තෙත වී ගන්න, රුපියල් 120ට. රජය මැදිහත් වෙලා තෙත වී රුපියල් 120ට ගන්න මොනවා හරි ක්‍රමවේදයක් හදන්න. මේ විධියට ගියොත්, මේ යල කන්නයෙන් පසුව ගොවියා කුඹුරට බහීවි කියලා මම හිතන්නේ නැහැ.

ඔබතුමන්ලා එක පැත්තකින් කියනවා, වී අතිරික්තයක් තිබුණා කියලා. වී අතිරික්තයක් තිබෙද්දී පිටරටින් හාල් ගෙනාවේ ඇයි? අද මේ රටේ සිටින ප්‍රබල වී මෝල් මුදලාලිලාගෙන් ඇහුවොත්, ඒ සියලුදෙනාම කියන්නේ පිටරටින් හාල් ආනයනය කරපු නිසා තමයි මේ තත්ත්වය උදා වුණේ කියන එකයි. මේ තත්ත්වය දිගින් දිගටම ඇති වෙනවා නම්, මේ තත්ත්වය ගැන දිගින් දිගටම පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපට කියන්න සිද්ධ වෙනවා නම්, - වී මිල සම්බන්ධයෙන් මම පාර්ලිමේන්තුවේදී කොච්චර වාරයක් නම් කථා කර තිබෙනවාද? හැබැයි, මේකට කිසිම විසඳුමක් දෙන්න අද බැරි වෙලා තිබෙනවා. මේ ගැන කිසිකෙනෙක් කථා කරන්නෙත් නැහැ. ලාල් කාන්ත ඇමතිතුමනි, ඔබතුමා වටේ යනවා මම දැක්කා. ඔබතුමා වටේ යද්දී ඒ ගොවියන් නඟපු අඳෝනාව ඇහුණාද? ඒ අඳෝනාව ඔබතුමන්ලා බලයට එන්න කලින් අහලා, ඒකට විසඳුම් දෙනවා කියලා නේ කිව්වේ. ඉතින්, ඒකට විසඳුම් දෙන්න ඇයි ඔබතුමන්ලාට බැරි?

එක පැත්තකින් ජනාධිපතිතුමා කියනවා, මහා භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා යනවා කියලා. පිරිලා ඉතිරිලා යනවා නම් ඒකෙන් ටිකක් අරගෙන යල කන්නයේ ගොවියාට සාධාරණයක් කරන්න. එතුමා කියනවා නේ - එතුමාගේ වචනවලින්ම කියනවා, මම දැක්කා. පාර්ලිමේන්තුවට ඇවිල්ලාම කිව්වා. එහෙම කියලා අපේ පැත්තටත් ඇඟිල්ල දිගු කරලා කියනවා, ඔයගොල්ලන් කට්ටියත් ඒක පිළිගෙන තිබෙනවා කියලා. සල්ලි තිබෙන නිසා නේ පිරිලා ඉතිරිලා යන්නේ. අපි දන්නවා, සල්ලි පිරිලා ඉතිරිලා යනවා කියලා. අමාත්‍යාංශයට 2026 අය වැයෙන් වෙන් කරපු මුදල් තිබෙනවා නේ. හැබැයි, ඒ මුදල්වලින් සංවර්ධනයක් කොහේද වෙන්නේ? හොඳම උදාහරණය තමයි, "දිට්වා" සුළි කුණාටුවෙන් කඩා ගෙන ගිය ඇලහැර අමුණ. තවම වැලි කොට්ට ගහලා නේ තිබෙන්නේ. ඉතින්, ඕක තමයි සංවර්ධනය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ගෙනාපු සත්ව (සංශෝධන) පනත් කෙටුම්පතට අපේ කිසිම විරෝධතාවක් නැහැ. සත්ත්වයන් ප්‍රවාහනය කරනකොට මැරිච්ච සතුන් ගෙනියනවා හා සමානව ජීවත් වෙලා ඉන්න සත්තු ප්‍රවාහනය කරන ආකාරය අපි දැකලා තිබෙනවා. ඒ නිසා මේක හොඳ යෝජනාවක්. මෙයට අපේ කිසිම විරෝධතාවක් නැහැ. ඒ වාගේම සත්ව සුභසාධන පනතත් කඩිනමින් ගෙනෙන්න. ඒ සඳහා අපට දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දෙන්න අපි කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මට තත්පර 10ක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න ඕනෑ. හෝමියෝපති වෛද්‍යවරුන්ගේ විභාගය අවසන්වරට පවත්වා තිබෙන්නේ 2017. පසුගිය අගෝස්තු 03වැනි දා එම විභාගය පවත්වන්න නියමිතව තිබුණා. ඒ අයගේ ඉල්ලීමක් තිබෙනවා, ගරු ඇමතිතුමාත් එක්ක මේ ගැන සාකච්ඡා කරන්න. 2017දී තමයි මේ වෛද්‍යවරුන්ගේ විභාගය අවසන්වරට පවත්වා තිබෙන්නේ. ඒ නිසා කඩිනමින් එම විභාගය පවත්වන්න කියලාත් ඉල්ලමින්, මට කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Susil Ranasinghe. You have 15 minutes.

[අ.භා. 12.13]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද දින විවාදයට ගන්නා සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දක්වන්න කාල වේලාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි. විවාදය ආරම්භ කරමින් කෘෂිකර්ම අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වූවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පතට ගෙනෙන්න බලාපොරොත්තු වෙන්නේ කුමන සංශෝධනද, එහි අරමුණ මොකක්ද කියන එක සම්බන්ධයෙන් කරුණු දක්වන්න මම බලාපොරොත්තු වෙනවා.

[ගරු (වෛද්‍ය) ) සුසිල් රණසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජල සම්පාදන මණ්ඩලය පිහිටුවන්න කලින් වසර ගණනාවකට ඉස්සෙල්ලා එම ආයතනය තිබුණේ රජයේ වැඩ දෙපාර්තමේන්තුව යටතේයි. ඊට පස්සේ ක්‍රමිකව මේ ක්ෂේත්‍රය පුළුල් වෙනවාත් එක්ක මෙය උප දෙපාර්තමේන්තුවක් බවටත්, ඊට පසුව දෙපාර්තමේන්තුවක් බවටත් පත් කරනවා. අනතුරුව 1974 අංක 2 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත මඟින් මේ ආයතනය වෙනම මණ්ඩලයක් බවට පත් කරනවා. එම පනත 1992 අංක 13 දරන ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත විධියට 1992දී සංශෝධනය වනවා. මා හිතන විධියට මේ කරුණු අනුව, තොරතුරු අනුව අවුරුදු 34කට පස්සේ -1992න් පස්සේ- තමයි නැවත මෙම පනත සංශෝධනය කරන්න පියවර අරගෙන අද මේ පාර්ලිමේන්තුවේ විවාද වන්නේ.

මෙහි මූලික අරමුණු කිහිපයක් තිබෙනවා. ඒ අරමුණු සම්බන්ධයෙන් මගේ කථාව ඇතුළත මම පැහැදිලි කරන්නම්. මෙවර මේ පනතේ වගන්ති සඳහා සංශෝධන 19ක් ඇතුළත් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මූලික සේවා සපයන ආයතනයක භූමිකාවක ඉඳලා ක්‍රමවත්, කාර්යක්ෂම සහ තිරසර ජල කළමනාකරණයේ ප්‍රමුඛතම ආයතනයක් බවට පත් වන්න, එවැනි ආයතනයක් බවට පරිවර්තනය වෙන්න අවශ්‍ය සංශෝධන තමයි අපි මේ පනතට ගෙන එන්නේ. රජයක් විධියට අපට ලොකු වුවමනාවක් තිබෙනවා, අචංක වුවමනාවක් තිබෙනවා, අපේ රටේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කරන්න වැඩ කටයුතු කරන්න.

මේ වනකොට රටේ පානීය ජල සම්පාදන කටයුතුවලට ප්‍රධාන වශයෙන් මැදිහත් වෙලා තිබෙන ආයතන කිහිපයක් තිබෙනවා. එහි ප්‍රමුඛතම ආයතනය තමයි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය. ඊට අමතරව ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව තිබෙනවා, රට පුරා ප්‍රජා ජල ව්‍යාපෘති නියාමනය කරන ආයතනය විධියට. ඒ වාගේම පළාත් පාලන ආයතන -ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා- හරහා ජල සම්පාදන කටයුතු සිදුකරමින් තිබෙනවා, රටේ බොහෝ තැන්වල. ඊට අමතරව සමහර තැන්වල ග්‍රාමීය ජල ව්‍යාපෘති තිබෙනවා, විවිධ රාජ්‍ය නොවන සංවිධාන හරහා ඉදිකරලා ප්‍රජා සංවිධානවලට භාර දුන්. ඒවා විශාල සංඛ්‍යාවක් නැහැ. නමුත් රට පුරා ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

ඒ ජල සම්පාදන ව්‍යාපෘති තිබුණත්, තවමත් අපේ රටේ ලක්ෂ ගණනක් ජනතාව සුරක්ෂිත පානීය ජලය නැතිව ළිංවලින්, වෙනත් මූලාශ්‍රවලින් දුෂ්කරතා මධ්‍යයේ තමන්ගේ ජල අවශ්‍යතා සම්පූර්ණ කරගන්නා බව අපි දන්නවා. සමහර විට ඒ මූලාශ්‍රයේ තිබෙන ජලය හොඳ වෙන්නත් පුළුවන්. නමුත් විවිධ කාලවලදී තර්ජන ඇති වෙන්න පුළුවන්, එහි ගුණාත්මකභාවය සම්බන්ධයෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර ගම්වල ජනතාව බොන්න වතුර ලීටර් දෙක තුනක් ගේන්න කිලෝමීටර් දෙක තුනක් යන බව අපි දන්නවා. කළවලට, බූලිවලට තමයි ඔවුන් වතුර ගේන්නේ. සමහර ගම්මානවල ජනතාව බොන්න, උයන්න වතුර ගන්නේ RO plantsවලින්. එහෙම නැත්නම් ෆිල්ටර් එකක් සවිකරලා තිබෙන තැන්වලට ගිහිල්ලා සල්ලි ගෙවලා වතුර ගේන්නේ.

විශේෂයෙන් වියළි කලාපයේ - අනුරාධපුරය, පොළොන්නරුව - ප්‍රදේශවල පානීය ජලය කියන එක දැන් බිස්නස් එකක් වෙලා. චූන් පාන් නේ අපි දන්නා විධියට රථවලින් ගිහින් විකුණන්නේ. ඒ වාගේ සංගීත ඛණ්ඩයක් - music එකක් - දාගෙන ජලය විකුණන රථ දැන් පාරේ යනවා, සමහර ගම්මානවල. ඒ කියන්නේ, එම ප්‍රදේශවල ජීවත් වන ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලැබෙන්නේ නැහැ. එහෙම ගැටලුවක් අද අපේ රටේ තිබෙනවා. එම නිසා අපට ලොකු වුවමනාවක් තිබෙනවා, අපි සැලකිය යුතු මට්ටමේ වුවමනාවකින් වැඩ කරනවා, මේ ජනතාවට අපේ කාලය තුළ පිරිසිදු පානීය ජලය ලබා දෙන්න. ඇත්තටම අපේ බලාපොරොත්තුව අපේ පළමුවැනි පාලන කාලය ඇතුළත පානීය ජල පුනරුදයක් ඇති කිරීමයි.

ඒකේ ප්‍රමුඛතම ආයතනය තමයි, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ ප්‍රජා ජල දෙපාර්තමේන්තුව යටතේ ජල ව්‍යාපෘති 4,000කට ආසන්න සංඛ්‍යාවක් රට පුරා තිබෙනවා. ඒ වාගේම පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘතිත් තිබෙනවා. ඊට අමතරව පවුල් විවිධ මූලාශ්‍ර හරහාත් ජලය සම්පාදනය කර ගන්නවා. පානීය ජලය ලබා දෙනකොට කරුණු කිහිපයක් ගැන අපට බලන්න වෙනවා. හැබැයි, මෙහෙමයි. පසුගිය කාලයේ "සැමට ජලය" - “Water for All” - කියලා හැම ගෙදරකටම ටැප් එකක් සවි කරගෙන ගිය වැඩ පිළිවෙළ නම් අපි දිගට අරගෙන යන්නේ නැහැ. ඒ වැඩේ කරලා දැන් බස්නාහිර පළාතේ දළ වශයෙන් පවුල් 25,000ක් විතර ඉන්නවා, හරියට වතුර නොලැබෙන. සමහර පවුල්වලට වතුර ලැබෙන්නේ පැය දෙකයි. සමහර පවුල්වලට හොඳ pressure එකකින් වතුර ලැබෙන්නේ නැහැ. තවත් සමහර පිරිස්වලට දවස් දෙකක් තුනක් බලාගෙන ඉන්න වෙලා තිබෙනවා, වතුර ලබාගන්න. මේ වාගේ ගැටලු අද ඇති වෙලා තිබෙනවා. හැමෝටම වතුර දෙන්න නම් ධාරිතාව වැඩි කරන්න ඕනෑ. හැමෝටම වතුර දෙන්න කියලා අපි බොරු සිහිනයක් මවන්නේ නැහැ. නමුත් මේ පානීය ජල සැපයුමෙන් අපි සැලකිය යුතු මට්ටමක ප්‍රගතියක් අත් කර ගන්න බලාපොරොත්තු වනවා. ඒ සඳහා ධාරිතාව වැඩි කරන්න ඕනෑ. ධාරිතාව වැඩි කරනවා වාගේම ජලයේ ගුණාත්මකභාවයත් වැඩි කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට මාස දෙකකට ඉස්සෙල්ලා දෙනියාය ප්‍රදේශයේදී අවාසනාවන්ත සිද්ධියක් වුණා. පාසල් යන කුඩා දරුවන් 200කට මෙනින්ජයිටිස් රෝගය හැදුණා. එහි මූලාශ්‍රය ජලයයි. පානීය ජලයෙන් තමයි ළමයින් 200කට මෙනින්ජයිටිස් රෝගය හැදුණේ. එහෙම වුණේ පානීය ජලයේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් තිබෙන ගැටලුවක් නිසායි. එම නිසා අපේ රටේ පානීය ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් තිබෙන යන්ත්‍රණයේ ලොකු ගැටලුවක් තිබෙනවා.

ඒ වාගේම තමයි, ජල මූලාශ්‍රවල තිබෙන තත්ත්වය. ජල මූලාශ්‍ර අපවිත්‍ර වෙන්න නොදී, ඒවා ආරක්ෂා කර ගනිමින් මේ හැම පැත්තක් දිහා බලා තමයි පානීය ජල ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කරන්න අපි බලාපොරොත්තු වන්නේ. ඒක කරන්න ගියාම අපට අත්‍යවශ්‍යයෙන්ම පානීය ජලය නිෂ්පාදනය කරන, බෙදා හරින මේ ක්ෂේත්‍රයේ තාක්ෂණික දැනුම, අත්දැකීම, විශේෂඥභාවය ලබා ගැනීම අනිවාර්ය වනවා. අපේ රටේ පානීය ජල සම්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය බවට පත් වෙලා තිබෙන්නේ, ජල සම්පාදන මණ්ඩලයයි. ජල සම්පාදන මණ්ඩලය කියලා අපි ලෙහෙසියට කිව්වාට, මේක ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයයි. එහි කොටස් දෙකක් තිබෙනවා, ජල සම්පාදන කටයුතු සහ ජලාපවහන කටයුතු කියලා. මේ ආයතනයේ තමයි මේ ක්ෂේත්‍ර දෙකේම අපේ රටේ තිබෙන ඉහළම තාක්ෂණික දැනුම තිබෙන්නේ; ඉහළම විශේෂඥභාවය තිබෙන්නේ; ඉහළම ධාරිතාව තිබෙන්නේ. මේවාට අදාළ විශේෂඥභාවයක් සහිත සියලු කණ්ඩායම්වලින් මේ ආයතනය සමන්විතයි. එම නිසා මේ ආයතනය සතු දැනුම, අත්දැකීම්, තාක්ෂණය සහ විශේෂඥභාවය අනෙකුත් ආයතනවලට බෙදමින් අපේ රටේ ජනතාවට පානීය ජලය ලබා දීම හොඳම තත්ත්වයෙන්, ඉහළම ගුණාත්මකභාවයෙන් කරන්න ඕනෑ.

මම ඉස්සෙල්ලා කිව්වා වාගේ ප්‍රජා ජල දෙපාර්තමේන්තුව යටතේ තිබෙනවා, ජල ව්‍යාපෘති 4,000ක් විතර. ඒකෙන් 2,000කට විතර විවිධ මට්ටමේ ප්‍රතිසංස්කරණ අවශ්‍යයි; වැඩිදියුණු කිරීම් අවශ්‍යයි. ජල ව්‍යාපෘති විධියට තිබුණාට ඒවායේ තාක්ෂණික දෝෂ ගොඩක් තිබෙනවා. සමහර ඒවා පිරිපහදු කරන්නේ නැහැ. එම නිසා ඒවා තාක්ෂණිකව බලන්න ඕනෑ. බලා

ඒවාට අවශ්‍ය එකතු කිරීම් කරන්න ඕනෑ, වැඩිදියුණු කිරීම් කරන්න ඕනෑ. ඒවා කරන්න ගියාම ඒ අවශ්‍ය උපදෙස් ගන්න තිබෙන ආයතනය තමයි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය. ඒකේ තමයි විශේෂඥභාවය තිබෙන්නේ.

පළාත් පාලන ආයතන හරහා සැලකිය යුතු ජල සම්පාදන ව්‍යාපෘති සංඛ්‍යාවක් තිබෙනවා. ඒවායේ තාක්ෂණිකභාවය උසස් කරන්න ඕනෑ, වැඩිදියුණු කරන්න ඕනෑ. ඒවා කරන්න ගියාම උපදෙස් ගන්න, තාක්ෂණික දැනුම ලබා ගන්න තිබෙන ආයතනය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයයි. නමුත් පළාත් පාලන ආයතනවලටවත්, ප්‍රජා ජල දෙපාර්තමේන්තුවටවත්, වෙනත් ජල ව්‍යාපෘති වැඩිදියුණු කිරීමකටවත් තාක්ෂණික උපදෙස් ලබා ගැනීම සඳහා සහ ඒ තාක්ෂණික උපදෙස් ලබා දීම සඳහා නෛතික ප්‍රවේශයක්, නෛතික ඉඩකඩක් පනතේ නැහැ. එම නිසා තමයි අපි පනත සංශෝධනය කරන්නේ, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතුව තිබෙන මේ විශේෂඥභාවය, අත්දැකීම්, තාක්ෂණික හැකියාව කොහොමද අනෙක් ඒවා සඳහා ලබා දෙන්නේ කියලා.

රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තිබෙන්නේ, තරගකාරී ලංසු - competitive bidding - කැඳවීම යටතේ. තාක්ෂණික දැනුම වෙන්න පුළුවන්, වෙනත් දෙයක් ලබා ගැනීම සඳහා වෙන්න පුළුවන්, තරගකාරී ලංසු කැඳවීම යටතේ තමයි යම් ආයතනයක් යන්න ඕනෑ. එතකොට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සිදු වනවා, ඒ සඳහා ලංසු කැඳවන්න. නමුත් මේ තිබෙන පනතේ විධිවිධාන ප්‍රකාරව එහෙම යන්න ප්‍රවේශයක් නැහැ; අවකාශයක් නැහැ. එම නිසා පනත සංශෝධනය කරලා අපි බලාපොරොත්තු වනවා, එවැනි ආයතන සඳහා උපදේශන සේවා ලබා දීම සඳහා ඉඩහසර විවෘත කර ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ අපජල කළමනාකරණය - waste water management - සහ මලාපවහන කටයුතු ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව අපි දන්නවා. අපේ රටේ නගර අලුතින් නිර්මාණය වෙමින් තිබෙනවා, නාගරීකරණය සිදු වෙමින් තිබෙනවා, නගර දෙසට ජනතාව ඇදෙමින් තිබෙනවා, කර්මාන්ත ඇති වෙමින් තිබෙනවා. අපි රජයක් විධියට ඉලක්ක කරලා තිබෙනවා, කර්මාන්ත ක්ෂේත්‍රයේ ලොකු සංවර්ධනයක්. එම නිසා කර්මාන්තපුර, දැවැන්ත කර්මාන්ත ඉදිවන්න නියමිතයි. එම නිසා අපජල කළමනාකරණය කියන අවශ්‍යතාව සපුරන්න ඒ ක්ෂේත්‍රය දියුණු වෙන්න ඕනෑ. නමුත් ඒක අපේ රටේ දැනට තිබෙන්නේ එතරම් හොඳ මට්ටමක නොවෙයි. එම ක්ෂේත්‍රය තව දියුණු වෙන්න ඕනෑ. නගර කිහිපයක, තැන් කිහිපයක, ආයතන කිහිපයක පමණයි මේ අපජල කළමනාකරණය හොඳින්ම සිදු වන්නේ. එම නිසා ඒ ක්ෂේත්‍රයේ ශීඝ්‍ර දියුණුවක් ඇති වෙන්න ඕනෑ. ඒ ක්ෂේත්‍රයේ දියුණුවක් බලාපොරොත්තු වුණත් ඒ සඳහා තාක්ෂණික හැකියාව සහ විශේෂඥභාවය තිබෙන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මේ අදාළ අංශයට. මේ තාක්ෂණික හැකියාව ලබා දෙන්නේ කොහොමද? අපි දන්නවා, අපේ ශික්ෂණ රෝහල් හැම එකේම අපජල කළමනාකරණ පද්ධති තිබෙන බව. ඒවා විශාල මුදලක් වියදම් කරලා හොඳ තාක්ෂණයක් සහිතව ඉදි කරපු ඒවා. නමුත්, දැන් ඒවා පවත්වා ගෙන යන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. ඔබතුමාත් මේ සම්බන්ධව දන්නවා ඇති. මම අනුරාධපුර රෝහලේ වැඩ කරද්දී අනුරාධපුර රෝහලට JICA එකෙන් හදා දීලා තිබුණා, අපජල කළමනාකරණ පිළිබඳ හොඳ පද්ධතියක්. අනුරාධපුර රෝහලේ දවසකට අපජලය ලීටර් දහස් ගණනක් operation theatresවලින්, වාට්ටුවලින්, සින්ක්වලින් සහ toiletsවලින් මුදා හැරෙනවා. මේ ඔක්කොම අපජලය පිරිපහදු වුණා. කොතරම් හොඳින් මේ ජලය පිරිපහදු කළාද කියලා කියනවා නම් එතැන ඉන්න සේවකයෝ පිරිපහදු කරලා එළියට යන වතුර වීදුරුවකට අරගෙන බීලා පෙන්නුවා, මෙන්න මේ තරමට අපි ගුණාත්මකව මේ කටයුත්ත කරනවාය කියලා. නමුත් අවුරුදු දෙක තුනක් යනකොට මේ පද්ධතිය බිඳ වැටිලා එලෙස මුදා හරින ජලය පිරිපහදු නොකර මල්වතු ඔයට මුදා හරින තත්ත්වයට පත් වුණා. දැන් අපි ඒ සඳහා මුදල් වෙන් කරලා නැවතත් මේ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකෙන් කියැවෙන කථාව තමයි, මේ ආයතනවලට මේ පද්ධති හදලා දුන්නාට - විශේෂයෙන් රෝහල් පද්ධතියට - ඒවා නඩත්තු කර ගැනීම සඳහාත්, පවත්වා ගැනීම සඳහාත් ඔවුන්ට තාක්ෂණික දැනුමක් සහ අත්දැකීමක් නැහැ කියන එක. රෝහල් පද්ධති මෙහෙම සිය ගණනක් තිබෙනවා වාගේම අපි දන්නවා, පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති තිබෙන බව. මහ නගර සභාවලින් පවත්වාගෙන යන අපජල කළමනාකරණ පද්ධතිත් තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය සභාවල අපජල කළමනාකරණ පද්ධති තිබෙනවා. අපේ පළාත් පාලන විෂය භාර ඇමතිතුමා අදහස් කරනවා, පළාත් පාලන ආයතන හරහා තවත් මෙවැනි පද්ධති ඉදිකිරීම සඳහා මුදල් වෙන් කරන්න ඕනෑ කියලා. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා තවත් රෝහල් ගණනාවකට අපජල කළමනාකරණ පද්ධති හදන්න ඕනෑ කියලා එතුමා අදහස් කරනවා. ඒ පද්ධති හදන්න ගියාම උපදෙස් පතන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන්. ඒ උපදෙස් ලබා දීම සඳහා ඉඩකඩක් නැහැ. ඒ නිසා මෙන්න මේ අපජල කළමනාකරණ ක්ෂේත්‍රයේ ශීඝ්‍ර දියුණුවක් අපි බලාපොරොත්තු වනවා. ඒ සඳහාත් මුදල් වෙන් කරන්න අපි සූදානමින් ඉන්නවා.

ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය මේ ආයතන සඳහා බෙදා දීමට යම් ප්‍රවේශයක් ඕනෑ. ඒ සඳහා ඉඩහසර විවර කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපි දන්නවා, ජල සැපයුමකට ගෙදරකට හෝ යම් ආයතනයකට හෝ වෙනත් පරිශ්‍රයකට ගියාම ජල මීටරයෙන් එහාට ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරින්ට යන්න බැරි බව. ජල සැපයුම විසන්ධි කරන්න වෙන්න පුළුවන්, පරීක්ෂාවකට වෙන්න පුළුවන්, කිසිම දෙයකට ඔවුන්ට ජල මීටරයෙන් එහාට යන්න බැහැ. ඒ ගෙදර හෝ පරිශ්‍රයේ එකඟතාව මත, යාළුකම මත ජල මීටරයෙන් එහාට යන්න පුළුවන්. ඔවුන් විරුද්ධ වුණොත් එතැනින් එහාට යන්න බැහැ. නමුත්, අදාළ ස්ථාන පරීක්ෂා කළ යුතු වෙනවා. ඒ නිසා අපි මේ පනතෙන් ඉඩහසර හදා ගන්නවා, පොලීසිය වෙන්න පුළුවන්, එහෙමත් නැත්නම් වෙනත් ආරක්ෂක අංශවල සහයෝගයක් සහිතව අදාළ ස්ථානයට ප්‍රවිෂ්ට වෙන්න.

ඒ වාගේම සේවකයන්ගේ රක්ෂණය සම්බන්ධයෙනුත් මම කියන්න කැමතියි. ඔවුන් රාජකාරියේ යෙදී සිටියදී - රාජකාරි ආවරණය කරමින් සිටියදී - යම් අනතුරකට භාජන වුණොත් ඔවුන්ගේ රක්ෂණාවරණය සම්බන්ධයෙන් කටයුතු කරන්න අවශ්‍ය ඉඩහසරත් මේ පනත තුළින් අපි වෙන් කරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉස්සෙල්ලා කිව්වා වාගේ ජල සම්පාදන මණ්ඩලයට තමයි තාක්ෂණික විශේෂඥභාවය තිබෙන්නේ. ජලනල පැස්සුම් වෙන්න පුළුවන්, ජල පිරිපහදු තාක්ෂණය සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, යම් පුහුණු කිරීම් කරන්න ගියාම විශේෂයෙන්ම ජල සම්පාදන මණ්ඩලය සතුව තිබෙනවා, සේවා සපයන ආයතනයක්. ඒ ආයතනය වෙනත් පරිබාහිර කණ්ඩායම්වලට, ආයතනවලට පාවිච්චි කරන්න පුළුවන්. නමුත්, එය භාවිත කිරීම සඳහා ලබා දීමට ඉඩක් නැහැ. මොකද, ඒ සඳහා නීතිමය පදනමක් නැති නිසා. ඒ සඳහාත් ඉඩ අපි මේ පනතින් විවර කරනවා.

[ගරු (වෛද්‍ය) ) සුසිල් රණසිංහ මහතා]

විශේෂයෙන්ම ජල සම්පාදන මණ්ඩලය යටතේ තිබෙනවා, ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කරන පරීක්ෂණාගාර - labs - 30ක් විතර. ඒ සඳහා බාහිර පුද්ගලයන් - ජලය සම්බන්ධයෙන් පර්යේෂණ කරන පර්යේෂකයෝ වෙන්න පුළුවන්, විශ්වවිද්‍යාල වෙන්න පුළුවන්, වෙනත් ආයතන වෙන්න පුළුවන්, කර්මාන්ත වෙන්න පුළුවන් - ජලය පරීක්ෂා කර ගැනීම සඳහා සාම්පල් මේ labsවලට අරගෙන එනවා. නමුත්, ඒ පිරිවැය අය කරගෙන ඒ සේවාව ලබා දීම සඳහා නෛතික බාධාවක් තිබෙනවා. මේ නෛතික බාධාව නැතිව ගොස් තිබෙනවා, මේ පනතින්. එම නිසා ඒ සම්බන්ධ කටයුතුත් අපි මේ සංශෝධන පනත් කෙටුම්පත තුළින් සම්මත කර ගන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉස්සෙල්ලා කියපු අපජල කළමනාකරණය අපේ රටේ ඉදිරියට එමින් තිබෙන, සංවර්ධනය වෙමින් තිබෙන ක්ෂේත්‍රයක් නිසා මේ සම්බන්ධයෙන් වන නිර්ණායක ප්‍රමාණයක් අපි නිකුත් කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම අපජලය මුදා හැරීම සම්බන්ධයෙන්, අපජලය සහ මලාපවහන පද්ධති ගොඩනැඟීම් සම්බන්ධයෙන්, ඒවාට පාවිච්චි කරන උපකරණ සම්බන්ධයෙන් වාගේම ජලාපවහන උපදේශන සේවා, ඒවායේ යෙදෙන තාක්ෂණික ශිල්පීන් සම්බන්ධයෙන් නිර්ණායක පැනවීම සිද්ධ කරන්න අවශ්‍ය වී තිබෙනවා. එහෙම නැතිව මේ ක්ෂේත්‍ර විධිමත් කරන්න බැහැ. අපිට තාක්ෂණික ශිල්පීන් ඕනෑ. නමුත්, නිවැරදි නිර්ණායක යටතේ සේවය කරන ශිල්පීන් ඕනෑ. ඒ නිර්ණායක පැනවීම සඳහාත් මේ පනත සංශෝධනය කිරීම තුළින් නීතිමය අවසරය ලබා ගන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. මේ පනත් කෙටුම්පත සම්මත කිරීම හරහා තවත් කරුණු කිහිපයක් ඉටු කර ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

තව එක කාරණයක් ගැන සඳහන් කර මම කථාව අවසන් කරන්නම්. අපි දන්නවා, විශේෂයෙන්ම බිල්පත් නිකුත් කිරීමේදී කලින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරියෙක් ගිහින් පෑනෙන් ලියපු ලදුපතක් තමයි ලබා දුන්නේ කියන එක. පසුව එය SMS මඟින් ලබා දෙන තත්ත්වයට පත් වුණා. දැන් ඊමේල් හරහාත් යවනවා. නමුත් නෛතික පදනම විධියට, නීතිමය ලියවිල්ලක් විධියට තිබෙන්නේ තැපෑලෙන් යවන එකක් තමයි. දැන් ලෝකය ඩිජිටල්කරණය වෙමින් තිබෙන්නේ. විශේෂයෙන්ම අපි රජයක් විධියටත් ඩිජිටල්කරණය ප්‍රමුඛත්වයට ගන්න බලාපොරොත්තු වන යුගයක පාරිභෝගිකයාට ඩිජිටල් ලදුපතක් ලබා දීම නෛතික පදනමින් ගත යුතුව තිබෙනවා. දැන් ඒ ක්‍රියාවලිය ආරම්භ කර තිබුණාට ඒ සඳහා නීතිමය පදනමක් නැහැ. ඒ නිසා ජල සම්පාදන මණ්ඩලයෙන් ලබා දෙන ඩිජිටල් ලදුපත, නැත්නම් බිල්පත නීතිමය ලියවිල්ලක් කර ගැනීම සඳහා වන අවසරය ලබා ගන්නත් අපි මේ පනත සංශෝධනය කිරීම මඟින් බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, යම් හෙයකින් ජල සම්බන්ධතාව විසන්ධි කළා කියලා අපි හිතමු. එසේ ජල සම්බන්ධතාව විසන්ධි කළාට පසුව එම පාරිභෝගිකයා mobile phone එක පාවිච්චි කරලා ක්ෂණිකව online payment එකක් කරනවා. එසේ online payment එකක් කළාම, එන ලදුපතත් ජල සම්පාදන මණ්ඩලයට පිළිගන්න පුළුවන් වන මට්ටමට ගෙන ඒමට මේ තුළ සංශෝධනයක් සිදු වෙනවා. එතකොට online payment එකත් නීතිමය ලියවිල්ලක් විධියට පිළිගන්නා මට්ටමට පත් වෙනවා. මෙවැනි කාරණා රාශියක් පදනම් කරගෙන තමයි මේ පනත සංශෝධනය වෙන්නේ.

විශේෂයෙන්ම අපි ජල සම්පාදන ක්ෂේත්‍රයේ පුනරුදයක් බලාපොරොත්තු වෙනවා. එහිදී හැම ක්ෂේත්‍රයක්ම ආවරණය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව ගෙදරකට ගිහිල්ලා ජල සම්බන්ධතාව ලබා දෙන එක හෝ ටැප් එකක් සවි කරන එක විතරක් නොවෙයි, ධාරිතාව වැඩි කිරීම, ගුණාත්මකභාවය වැඩි කිරීම, තාක්ෂණිකව උසස් ජල පිරිපහදු පද්ධති යන්ත්‍රණය ශක්තිමත් කිරීම, මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් තාක්ෂණිකව ඉහළ ගුණාත්මක බවින් යුත් තාක්ෂණික ශිල්පීන් බිහි කිරීම වැනි පැති කිහිපයක් අරභයා තමයි අපි මේ සංශෝධන ගෙන එන්නේ. මේ සම්බන්ධව මන්ත්‍රීවරුන් අදහස් දැක්වූවා. මේ සංශෝධනය ඇත්තටම ප්‍රමාණවත් මදි. තව සංශෝධන ඕනෑ. අපි ඒවා යෝජනා කර තිබෙනවා. මේවා ප්‍රමාණවත් මදි. තවත් ඉදිරියට යනකොට සංශෝධන අවශ්‍යයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව ඉදිරියේදී මේ පනත සඳහා තවත් සංශෝධන අවශ්‍ය වුණොත් කාලීනව ඒවා ගෙන එනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා.

[අ.භා. 1.00]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සතුන් ගැන සාකච්ඡා වෙන මේ මොහොතේ සතෙකු ගැන කියමින්ම මා කථාව පටන් ගන්නම්. මේක ඊයේ රාත්‍රියේ සිදු වූ සිද්ධියක්. ඇත්ත වශයෙන්ම මම ඒ සිද්ධියත් එක්ක කරුණු කාරණා ගණනාවක් ඉදිරිපත් කරන්න ලැහැස්තියි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොටගල ප්‍රදේශයේ, ස්ටෝනික්ලිෆ් වතුයායේදී කොටියෙකු මද්දකට අහු වෙලා, බේරා ගන්නට තිබුණු අවස්ථාවක්. මමත් ඒ ගැන දැනුවත් වුණේ රාත්‍රී 12.00 විතර. විශේෂයෙන් ගැටලුවකට තිබුණේ, ඒ අවස්ථාව පශු වෛද්‍ය ක්ෂේත්‍රය අකුරට වැඩ කිරීමේ වෘත්තීය ක්‍රියාමාර්ගයක යෙදී සිටි අවස්ථාවක් වීමයි. ඇත්ත වශයෙන්ම බණ්ඩාර වාර්තාකාරතුමාත්, නුවන් මහත්මයාත් මාව දැනුවත් කළා, කොටගල, ස්ටෝනික්ලිෆ් වතු යායේදී කොටියකු මද්දකට හසු වෙලා ඉතාම අන්තරාදායක තත්ත්වයක, මාරාන්තික තත්ත්වයක සිටිනවා කියලා. මම ඒ අවස්ථාවේ පශු වෛද්‍ය, ගංගා මහත්මියටත්, ඒ වෘත්තීය සමිතිය භාර පශු වෛද්‍ය නිහාල් මැතිතුමාටත් කථා කරලා ඉල්ලීමක් කළා, රන්දෙණිගල අකලංක පශු වෛද්‍යතුමාව යවන්න කියලා. කියන්න සතුටුයි, ඒ මද්දට අහු වුණු කොටියාව බේරුණා; දැනට රන්දෙණිගල වනජීවී කටයුතු පිළිබඳ කාර්යාලයේ ජීවත්ව ඉන්නවා.

විශේෂයෙන්ම ඒ පශු වෛද්‍යවරුන් සියලුදෙනාටත්, ඒ තොරතුරු දැනුම් දුන්නු බණ්ඩාර හා නුවන් මහත්වරුන්ටත් මා ස්තුතිවන්ත වෙනවා. ඒ පශු වෛද්‍යවරුන්ගේ නම් ටික මම කියන්න ඕනෑ. ගංගා සහ නිහාල් කියන පශු වෛද්‍යවරුන් ඒ අතර ඉන්නවා. අකලංක කියන පශු වෛද්‍යතුමා තමයි, ඒ ස්ථානයට ගිහිල්ලා ඒ ප්‍රතිකාර කිරීමේ කටයුතු කළේ. වනජීවී කටයුතු පිළිබඳ නිලධාරීන් වන ශෂික, හර්ෂ හා මධුරංග යන අය ලොකු කාර්ය භාරයක් ඉෂ්ට කළා. වෘත්තීය ක්‍රියාමාර්ගයක නිරත වී සිටියදීත් ඒ අය මේ ශ්‍රේෂ්ඨ ක්‍රියාව ඉෂ්ට කළා.

ඒ වාගේම මා කියන්න කැමැතියි, විශේෂයෙන්ම වනජීවී ක්ෂේත්‍රය තුළ ඉන්න මේ පශු වෛද්‍ය කණ්ඩායම ගැන. තිස්තුන්දෙනෙක් ඉන්න ඕනෑ තැන, දාහත්දෙනෙකු තමයි ඉන්නේ. ඇත්තටම ඒ අයට වසර ගණනාවක් මුළුල්ලේ කුඩම්මාගේ සැලකිලි තමයි ලැබිලා තිබෙන්නේ. දශක කිහිපයක් කිව්වත් නිවැරදියි. ඇත්තටම කියනවා නම්, වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ බලතල ක්‍රියාත්මක කරන්නට මේ පශු වෛද්‍යවරුන්ට හැකියාව නැහැ. ආදායම අඩුයි, අධික වැඩ, අවදානම, ජීවිත තර්ජන තිබෙනවා වාගේම විවේක කාලයක් නැහැ. දුෂ්කර රාජකාරියක යෙදෙන්නේ. මේ නිලධාරීන්ට උසස්වීමේ ක්‍රමවේදයකුත් නැහැ. පශු වෛද්‍යවරයෙකු ලෙස බඳවා ගන්නා අය විශ්‍රාම යන්නේත් පශු වෛද්‍යවරුන් හැටියටමයි. ඒ කියන්නේ කිසිම උසස්වීමක් නැහැ. එක් අධ්‍යක්ෂක තනතුරක් විතරයි තිබෙන්නේ. නමුත්, පළපුරුද්දක් සහිත පළමුවැනි ශ්‍රේණියේ නිලධාරීන් ගණනාවක් ඉන්නවා. විශේෂයෙන් ඔවුන් වනජීවී සෞඛ්‍යයට අදාළ සාමාන්‍ය රාජකාරි වෙලාවෙන් ඔබ්බට ගිහිල්ලා, මුළු රාත්‍රිය පුරාවටම වනජීවී ක්ෂේත්‍රයේ තවත් නිලධාරීන් සමඟ ලොකු කාර්ය භාරයක් ඉෂ්ට කරනවා. නිවාඩු දින ගෙවීම් නැහැ. ඒ වාගේම අවදානම් දීමනා මොනවත් නැහැ. හැබැයි, අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන්ට ඒ බොහෝ දීමනා ගෙවනවා.

විශේෂයෙන්ම අපි අහන්න කැමැතියි, මේ පශු වෛද්‍ය නිලධාරීන් දාහත්දෙනා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට අන්තර්ග්‍රහණය කරන්න බැරි කියලා ඇයි කියලා. ඒ ගොල්ලන්ගේ දැනුම වර්ධනය කර ගන්නට විදේශ පුහුණුවක් පවා ලබා දීම වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, හැබැයි, ඒ අය ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයක් වන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට තමයි අනුයුක්ත කරලා ඉන්නේ. කිසිම ස්ථිරතාවක් නැහැ. හැබැයි, අර කොටියාව බේරා ගන්න ඒ ගොල්ලන්ගේ වැඩවර්ජන, අකුරට වැඩ කිරීම් ඔක්කොම නතර කරලා, ඒ කාර්ය භාරය ඉෂ්ට කළා. මමත් සතුටු වෙනවා, මට මැදිහත් වෙන්නට පුළුවන්කම ලැබීම ගැන. අකුරට වැඩ කරපු වෙලාවේ කළ ඉල්ලීම ඒ අය අකුරටම ඉටු කළා. මම මේකට දේශපාලනයක් ගාව ගන්න යන්නේ නැහැ. නමුත් මම යෝජනා කරනවා, ඔබතුමා වනජීවී විෂය භාර ඇමතිතුමාට කථා කරලා, කරුණාකරලා ඒ පශු වෛද්‍ය නිලධාරීන්ට සාධාරණත්වය, යුක්තිය ඉෂ්ට කරන්න කියලා.

ඒ වාගේම වනජීවී ක්ෂේත්‍රයේ බරපතළ ගැටලු තිබෙනවා. සහකාර අධ්‍යක්ෂවරුන්ගේ ඉඳලා, අඩවි වන නිලධාරි, අඩවි ආරක්ෂක, අඩවි නියාමක, ක්ෂේත්‍ර සහායක ඒ වාගේම ස්වේච්ඡා නිලධාරීන් දක්වා බරපතළ ගැටලු තිබෙනවා. ඒවා විසඳන්න ඕනෑ. සතුන් ගැන කථා කළාට මදි නේ. සතුන් රැක ගන්නට ඕනෑ නේ. සතුන් ආරක්ෂා කරන්නට ඕනෑ නේ. පශු වෛද්‍යවරයාගේ රාජකාරිය හවස 4.30ට ඉවර වෙන්නේ නැහැ. පැය 24ම ඒ රාජකාරියේ යෙදෙනවා. වනජීවී ක්ෂේත්‍රයේ බොහෝ නිලධාරීන්ගේ තත්ත්වය ඒකයි. ඒ නිසා මා නැවත නැවතත් ස්තුතිවන්ත වෙනවා, කොටගල ප්‍රදේශයේ, ස්ටෝනික්ලිෆ් වතු යායේදී ඒ කොටියාව බේරා ගැනීමට කටයුතු කළ නිලධාරීන්ට. ඒ මද්දට ඒ කොටියාගේ බෙල්ලම තමයි අහුවෙලා තිබුණේ. අන්ජලී වොට්සන් කියන කොටින් පිළිබඳ පර්යේෂණ කරන විද්‍යාඥවරියත් කියනවා, ඇත්ත වශයෙන්ම ඒ වටිනා කොටි දෙනක් බේරා ගත්තේ කියන එක. එතුමියත් එතුමියගේ කාර්ය භාරය ඉෂ්ට කළා. මම කාරුණිකව ඉල්ලීමක් කරනවා, ඒ පශු වෛද්‍ය නිලධාරීන් අකුරට වැඩ කරපු වෙලාවේදීත් ඒ කරපු සේවයට කරුණාකරලා වටිනාකමක් දෙන්න කියලා. ඒ ගොල්ලන්ගේ සේවාව අගයන්න. ඒ ගොල්ලන්ට එතැනත් නැහැ, මෙතැනත් නැහැ. කිසිම promotion එකක් නැහැ; දීමනා නැහැ. මම කියන්නේ නැහැ, මේක අද ඊයේ වුණු දෙයක් කියලා. මේවාට අපිත් වග කියනවා. හැබැයි, දැන්වත් මේ අය ගැන අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලා ක්‍රමයේ වෙනසක් නේ ඇති කරන්නේ. මේ ක්‍රමයේ වෙනස ඇති කරලා, ඒ පශු වෛද්‍ය නිලධාරීන්ට වන සත්ත්ව සහ වෘක්ෂලතා ආඥා පනත යටතේ වැඩ කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරලා, ඒ අයට දෙන්න පුළුවන් උපරිම ශක්තිය ලබා දෙන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

මම තවත් කරුණු දෙකක් පමණයි ඉදිරිපත් කරන්නේ. ගරු ඇමතිතුමනි, අද තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් ඇවිල්ලා පොල්දූව හන්දියේ සිටියා. එනකොට දකින්න ඇති නේ. 2023දී ඇති කරගත් government-to-government - ඊශ්‍රායලය සහ ශ්‍රී ලංකා රජය අතර - ගිවිසුමක් හරහා රැකියා 14,000ක් ලබා ගත්තා. ගිවිසුමේ තිබෙන විධියට එයින් සියයට 70ක් යන්නේ, රජය මාර්ගයෙන්. ඒකට ඒ තරුණ තරුණියන්ට වැය වෙනවා, රුපියල් ලක්ෂ 4ක් විතර. සියයට 30ක් යන්නේ, විදේශ රැකියා ආයතනවලින්. ඒකට වැය වෙනවා, රුපියල් ලක්ෂ 45ක් විතර. අපට ආරංචි විධියට එක ශ්‍රමිකයෙක් වෙනුවෙන් ඔය විදේශ රැකියා ආයතනවලට ලැබෙනවා ලු, ඩොලර් 5,000ක්. දැන් මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? Government-to-government deal එක අනුව සියයට 70ක් යවන්න ඕනෑ රජයෙන්. සියයට 30ක් යවන්න ඕනෑ පෞද්ගලික විදේශ රැකියා ආයතනවලින්. නමුත් දැන් ඒක අනෙක් පැත්තට ගිහිල්ලා. දැන් සියයට 70ක් යවන්නේ, පෞද්ගලික විදේශ රැකියා ආයතනවලින්. සියයට 30යි රජයෙන් යවන්නේ. එතකොට ඒ තරුණ තරුණියන්ට රුපියල් ලක්ෂ 45ක් විතර වැය වෙනවා. අර රුපියල් ලක්ෂ 4ක් ගෙවලා යන වැඩසටහනට ඇතුළත් වෙන්න ඒ අයට වරමක් නැහැ.

මේ මොහොත වන විට 3,500ක් ඉන්නවා, web එකේ. ඉතින් ඔබතුමාගේ ඔය සීට් එකට එහා පැත්තේ ඉන්න විජිත හේරත් ඇමතිතුමාට කථා කරලා - එතුමාගේ විෂය පථය යටතේ එන්නේ - කරුණාකරලා ඒ 3,500ක් වන පිරිසගේ රැකියා අයිතිය - ඒ කියන්නේ, රුපියල් ලක්ෂ 45 හරහා යන රැකියා අයිතිය නොවෙයි, රුපියල් ලක්ෂ 4 හරහා යන්න තිබෙන වරම - ලබා දෙන්න කටයුතු කරන්න. ඒක කරන්න නම්, ශ්‍රී ලංකා රජය, විදේශ කටයුතු අමාත්‍යාංශය, විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ඒ වාගේම ඊශ්‍රායලයේ අපේ තානාපති කාර්යාලය, ඒ නිලධාරීන්, ඒ රටේ PIBA කියන විදේශ රැකියා සම්බන්ධ ආයතනයත් එක්ක සාකච්ඡා කරලා, මේ government-to-government deal එක අනුව රජයෙන් යවන ප්‍රමාණය ප්‍රවර්ධනය කරන්නට කටයුතු කරන්නට ඕනෑ. ඒ අය යන්නේ ඇත්ත වශයෙන්ම caregiversලා හැටියට; කෘෂිකර්ම ක්ෂේත්‍රයේ අය හැටියට; ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අය හැටියට - ඉදිකිරීම් ක්ෂේත්‍රය තමයි වැඩි වශයෙන්ම යන ක්ෂේත්‍රය - ඒ වාගේම වාණිජ සහ සේවා සැපයුම් ක්ෂේත්‍රයේ සහ නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ අය හැටියට. ඉතින් මම ඒ අය වෙනුවෙන් ඉල්ලීමක් කරනවා. අද පොල්දූව හන්දියට ඇවිල්ලා තරුණ තරුණියන් ලොකු උද්ඝෝෂණයකුත් කළා. ඒකට සවන් දීලා, ඒ තාරුණ්‍යයට ලබා දෙන්න පුළුවන් අවස්ථාව ලබා දෙන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අවසාන වශයෙන්, පශු සම්පත් සම්බන්ධව නොවුණත් මම එනවා, ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත් මාතෘකාවක් වන "ගොවියා" පිළිබඳ කාරණයට. ගරු ඇමතිතුමා, ගොවියාට වී කිලෝවකට ලබා දෙන රුපියල් 120ක ස්ථාවර මිල ප්‍රමාණවත් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාම පිළිගත්තා, වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 137ක් යනවා කියලා. ඔබතුමා නොවුණත් ඔබතුමාගේ අමාත්‍යාංශය නියෝජනය කරන නියෝජ්‍ය ඇමතිතුමා ඇත්ත වශයෙන්ම පොරොන්දු වුණා, වී කිලෝවකට රුපියල් 150ක සහතික මිලක් ලබා දෙනවා කියලා. එතුමා කුඹුරට බැහැලායි එය ප්‍රකාශ කළේ. *[බාධා කිරීමක්]* ඔව්, එතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා; මට පෙනෙනවා. එතුමා කියපු කාරණාව අනුව,- *[බාධා කිරීමක්]* සමාවෙලා මා කථා කරලා ඉවර වුණාම කථා කරන්න. ඇත්ත වශයෙන්ම එතුමා කිව්වා, ඒ රුපියල් 150 යෝජනා කළේ පිරිවැය වැඩි නිසා කියලා. මොකද, ඒ කාලය රට බංකොලොත් වුණු කාලය, පෝලිම් තිබුණු කාලය, මිල ගණන් ඉහළ ගිය කාලය. ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, වී කිලෝවකට මේ ලබා දී තිබෙන රුපියල් 120 සාධාරණයි කියලා ඔබතුමාට අවංකව, හදවතට එකඟව කියන්න පුළුවන්ද කියලා. කියන්න පුළුවන්ද? ඔබතුමාගේම ගරු කැබිනට් ඇමතිතුමා වී කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 137යි කියන කොට, කොහොමද රුපියල් 120 සාධාරණීකරණය කරන්නේ? කොහොමද, රුපියල් 130 සාධාරණීකරණය කරන්නේ?

මම මේ ඔබතුමන්ලාට අපහාස කරනවා නොවෙයි. මම මේ අවංකව කරුණු දැක්වීමක් කරන්නේ. ඒකට තරහ ගන්න අවශ්‍ය නැහැ. කමක් නැහැ, මාත් එක්ක තරහ වුණත්. හැබැයි විසඳුම දෙන්න. *[බාධා කිරීමක්]* නැහැ, විසඳුම දෙන්න. වී කිලෝවකට සාධාරණ මිලක්, ගොවීන් ඉල්ලන මිල හෙවත් පිරිවැය ආවරණය වෙලා යම් ලාභයකුත් සහිත මිලක් ලබා දෙන්න. මොකද, ඒ මනුස්සයන්ට මේ කන්න දෙකෙන් නේ, ජීවත් වෙන්න කීයක් හරි උපයා ගන්න තිබෙන්නේ. මම පිළිගන්නවා, සමහරු අතුරු කන්නයකුත් වගා කරනවා කියලා. හැබැයි, ඒ අතුරු කන්නයේ වගා කරන ඒවාට පොහොර සහනාධාර මොකවත් ලැබෙන්නේ නැහැ නේ. ඒ නිසා ඇත්ත වශයෙන්ම ගොවි ජනතාවට පොරොන්දු වුණු දේවල් ඉටු කරන්න. ඔබතුමන්ලා ගොවි ජනතාවට පොහොසත් රටක් සහ ලස්සන ජීවිතයක් දෙන්න පොරොන්දු වුණා. දැන් ඒ දේ ඉෂ්ට කරන්න. ජනාධිපතිවරණයේදී ජනතාව පෝලිමේ ගිහිල්ලායි ඔබතුමන්ලාට කතිරය ගැහුවේ. ඊටත් වඩා කතිර ගැහුවා පාර්ලිමේන්තු මැතිවරණයේදී. පළාත් පාලන මැතිවරණයේදීත් ලොකු සහයෝගයක් ලබා දුන්නා. එහෙම නම් කරුණාකරලා මේ රටේ අහිංසක ගොවියා රැක ගන්න, වීවලට ස්ථාවර මිලක් ලබා දෙන්න.

ගරු ඇමතිතුමනි, මම ඊයේ දවසේ ඔබතුමාට යම් කාරණාවක් කියන්න හැදුවා. නමුත් ඒ කාරණාව කියන්න ඉඩ දුන්නේ නැහැ, ගරු කථානායකතුමා. ඒ නිසා මම දැන් එය කියන්නම්. කුඩා හා මධ්‍ය පරිමාණයේ මෝල් හිමියනුත් MSME category එකට අයිතියි. ඔබතුමා හිතන්න එපා, ඒ ගොල්ලෝ ණය අරගෙන ණය ගෙවීම පැහැර හැරියා කියලා. ඔබතුමා අවබෝධ කර ගන්න, පසුගිය අවුරුදු හතේ මුළු රටටම ඛේදවාචකයන් 5ක් ඇති වුණු බව. ඒවා තමයි පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය, කොරෝනා වසංගතය, රටේ බංකොලොත්භාවය, "දිට්වා" ආපදාව, මැද පෙරදිග අර්බුදය හෙවත් බටහිර ආසියානු crisis එක. මැද පෙරදිග අර්බුදය කියන්නේ, හෝර්මුස් සමුද්‍ර සන්ධිය කේන්ද්‍ර කරගෙන ඉරානය, ඊශ්‍රායලය සහ ඇමෙරිකා එක්සත් ජනපදය කරගෙන යන යුද්ධය. පසු ගිය කාලයේ මේ කියන ඛේදවාචකයන් 5 ඇති වුණා. ඔබතුමන්ලා දන්නවාද, ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් අමාරුවෙන් උපයා ගත්තු සම්පත් පරාටේ නීතිය හරහා අද තරගයට වෙන්දේසි කරන බව. මෝල් හිමියන්ටත් කරන්නේ එහෙමයි. මම මේ කථා කරන්නේ කුඩා හා මධ්‍ය පරිමාණයේ මෝල් හිමියන් ගැන.

ගරු ඇමතිතුමනි, මෝල් හිමියන්ට ලබා දුන්නා, pledge loan කියලා එකක්. ඒක සහන පොලී ණයක්. නමුත්, ඒ ණය ගන්න ඒ ගොල්ලන්ට බැහැ. මොකද, ඒ ගොල්ලන් blacklist කරලා - අසාදු ලේඛනගත කරලා. මේ වී නිෂ්පාදනය මිල දී ගන්න ඒ ගොල්ලන් අත්‍යවශ්‍යමයි. ඒ බව ඔබතුමාත් දන්නවා. ඊයේත් අපි මේ ගැන කථා කළා. ඔබතුමාම කිව්වා නේ, දැනට වී මිල දී ගෙන තිබෙන්නේ සියයට 3යි කියලා. අපි කියමු, අනික් ප්‍රදේශවල ගොයම් කැපී ගෙන එනවා කියලා. උපරිම සියයට 5යි, 6යි, 7යි, 8යි මිල දී ගන්නේ. කොහොම වුණත් සියයට 10ට අඩුයි. ඉතිරි ටික ගන්න නම් කුඩා හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ගේ මූල්‍ය ශක්තිය ප්‍රවර්ධනය කරන්න යම්කිසි වැඩ පිළිවෙළක් අවශ්‍යයි. විශේෂයෙන්ම ඔන්න ඔය කාරණාවත් මම ඉදිරිපත් කරනවා.

ගරු නාමල් කරුණාරත්න මැතිතුමනි, තරහ වෙන්න එපා, මේ කරුණු කාරණා ඉදිරිපත් කළාට. මම අවසානයේ එක ඉල්ලීමක් කරනවා. *[බාධා කිරීමක්]*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත ගැනත් කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඉතින් සත්ව සුභ සාධනයට පක්ෂ පුද්ගලයෙක්. ඒක ගැන ආයේ කථා දෙකක් නැහැ. මිනිස් සම්පතත් රැකෙන්නට ඕනෑ; සතා සිවුපාවාත් රැකෙන්නට ඕනෑ. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, පනත් කෙටුම්පතට වඩා මහ ජනතාවගේ ඇඟට පතට, බඩට දැනෙන දේ ගැන කථා කරන්න ඕනෑ නේ. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න කොට ඒවා ගැන කථා කළා. ඒක නිසයි ජනාධිපතිවරණය දිනුවේ. හැබැයි, දැන් ඒ කියපු දේවල් ක්‍රියාත්මක කරන්න. මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, මේ කරුණු කාරණා ඉදිරිපත් කරන්නේ සද්භාවයෙන් බව. කරුණාකර ගොවීන් බලාපොරොත්තු වන ඒ ස්ථාවර මිල ලබා දෙන්න කටයුතු කරන්න.

කරුණාකර ඔබතුමන්ලාගේ ගෝලබාලයින්ට කියන්න, ගොවීන්ට "කසිප්පුකාරයෝ", "ආටිෆිශල් ගොවියෝ" යනාදි එක එක දේවල් කියන්න යන්න එපා කියලා; එහෙම අපහාස කරන්න එපා කියලා. සමහරු කියනවා, වී වගා කරන්න බැරි නම් ගිහිල්ලා ඕනෑ එකක් වගා කර ගන්න කියලා. එතැනට යන්න එපා. සංවේදී වෙන්න, කරුණාවන්ත වෙන්න, දයාව, මෛත්‍රිය, අනුකම්පාව දක්වා වී ගොවියාත්, අනෙකුත් භෝග වගා කරන ගොවි ජනතාවත් රැක ගන්න කියා මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. අපට බැන්නත් කමක් නැහැ, අපව විවේචනය කළත් කමක් නැහැ; මොනවා කළත් කමක් නැහැ. ගොවීන්ට දිය යුතු සාධාරණ මිල ලබා දෙන්න කියා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.16]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

1958 අංක 29 දරන සත්ව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතත්, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතත් පිළිබඳව අද අපි සාකච්ඡා කරනවා.

අපේ ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා තමන්ගේ කථාව ඉවර වෙලා යන්න වාගෙයි සූදානම.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම යන්නේ ගරු කථානායකතුමා හමු වෙන්න. මොකද, මේ මොහොත වන විටත් මේ ගරු සභාවේ සිටිය යුතු ගරු චමින්ද විජේසිරි මැතිතුමාට ඒ අවස්ථාව ලබා දීලා නැහැ. ඒක ගැන සාකච්ඡා කරන්න ගරු කථානායකතුමා හමු වෙන්නයි මම යන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හරි, හරි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විනාඩියක් ඉන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ මන්ත්‍රීතුමාගේ වරප්‍රසාදයක් ඒක. ඊයේ දවසේ ඉඳලාම එතුමාගේ ඒ වරප්‍රසාදය ලබා දීම උදෙසා අපි ඉල්ලීම් කරනවා. ඊයේ ඉඳලාම දුරකථන ඇමතුම් විශාල ප්‍රමාණයක් ලබා දුන්නත් වැඩේ කෙරුණේ නැහැ. ඒ නිසා ගරු කථානායකතුමා හමු වෙන්නයි මම යන්නේ. එහෙම නැතිව ඔබතුමාගේ කථාවට මුහුණ දෙන්න බැරි නිසා නොවෙයි යන්නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මුහුණ දෙන්න බැරි නිසා යනවා කියලා මම කිව්වේ නැහැ නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මගේ කාලය දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට අවශ්‍ය කාලය ලබා දුන්නා නේ. කාලය කළමනාකරණය කර ගන්න අවශ්‍යයි.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
එතුමාට අවස්ථාව දුන්නා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභානායකතුමාට කථා කරන්න අවස්ථාව දෙනවා. එහෙම නම්, විපක්ෂ නායකවරයාට කථා කරන්න අයිතියක් නැද්ද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට පැහැදිලි කිරීමකට අවශ්‍ය කාලය ලබා දුන්නා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේ කාරණාව මේ ගරු සභාවේ ඉදිරිපත් කරන්න යන්නේ නැහැ. මම පණිවුඩයක් එවලා කිව්වා, ඒ යුතුකම ඉෂ්ට කරන්න කියලා. ගරු චමින්ද විජේසිරි මැතිතුමාගේ වරප්‍රසාද රකින්න ඕනෑ. ඒක ඔබතුමියගේත් වගකීමක්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාරණය අවබෝධ වුණා, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට පෙර කථා කළ ගරු විපක්ෂ නායකතුමා කාරණා ප්‍රමාණයක් මතු කළා. ඒවාට උත්තර දිය යුතුව තිබෙනවා. වී ගොවියාට වී කිලෝවකට රුපියල් 120ක සහතික මිලක් ලබා දීම ප්‍රමාණවත් නැහැ, එය වැඩි කරන්න කියලා එතුමා කිව්වා. අපි හිතනවා රුපියල් 120ක මිල ලබා දීම හොඳටම සාධාරණයි කියලා. ගොවීන්ට රුපියල් 120ක් නොලැබීමේ යම් ප්‍රශ්නයක් තිබෙනවා; ගැටලුවක් තිබෙනවා. අපි ඒක පිළිගෙන තිබෙනවා. අපි ඒකට විසඳුම් සොයමින් සිටිනවා; මැදිහත් වෙමින් සිටිනවා. ඒ කාලයේ ආණ්ඩු කළේ එතුමන්ලා නේ. ඉතින් ඒ කාලයේ ඔය කියපු ඒවා කරන්න තිබුණා නේ. වී අලෙවි මණ්ඩලය විකුණා දමලා විනාශ කරලා දැන් මේ ගරු සභාවට ඇවිත් වී කිලෝවකට රුපියල් 120ත් මදි කියනවා. ඒ කාලයේ ඒවා කරන්නේ නැතිව දැන් මෙතැනට ඇවිල්ලා දොඩවනවා. වී කිලෝවකට රුපියල් 120 ප්‍රමාණවත්. හැබැයි, දැන් ගොවියාට 120 හම්බ වෙන්නේ නැහැ. ඒක ඇත්ත. ඒකේ ප්‍රශ්නයක් තිබෙනවා; ගැටලුවක් තිබෙනවා. අපි ඒක පිළිගෙන ඒකට මැදිහත් වෙමින් ඉන්නවා.

ගරු විපක්ෂ නායකතුමා තවත් කාරණා කිහිපයක් මතු කළා. පසුගිය කාලයේ ඇති වුණු තත්ත්වයන් 5ක් ගැන එතුමා කිව්වා. මැද පෙර දිග යුද්ධය ගැන කිව්වා, පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන කිව්වා, රට බංකොලොත් වීම ගැන කිව්වා, කොරෝනා වසංගතය ගැනත් කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රට බංකොලොත් කළේ කවුද? බලයේ හිටපු ඒ කට්ටියම නේ රට බංකොලොත් වන තත්ත්වයට වැඩ කළේ. හොරා කාලා, වංචා කරලා රට විනාශ කළේ ඒ කට්ටිය. ඒ වාගේම පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු කළේ කවුද? පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු කළේ කවුද කියලා දැන් එළිවෙමින් තිබෙනවා. ඉතිරි ඒවා මොනවාද? එකක් තමයි, මැද පෙරදිග යුද්ධය. ඒක මැද පෙරදිග රටවල් ආශ්‍රිතව ඇති වන යුද්ධයක්. එය අප බලයේ සිටීම නිසා ඇති වෙච්ච දෙයක් නොවෙයි. ඒ කාරණා 5 ඇතුළේ තිබෙන, රට බංකොලොත් කිරීම කියන එකට වාගේම පාස්කු ඉරුදින ප්‍රහාරයට වග කියන්න ඕනෑ කට්ටිය විපක්ෂය පැත්තේ ඔය ඉස්සරහා පුටුවල වාඩි වෙලා ඉන්නවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

කවුරුවත් නැහැ, මම විතරයි.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂ නායකතුමා තවත් කාරණයක් මතු කළා. ඒ, පශු වෛද්‍යවරුන්ගේ උසස්වීම් ගැනයි. ඔව්, ඒ ගැන ප්‍රශ්නයක් තිබෙනවා, ගැටලුවක් තිබෙනවා. ඒ ගැන සාකච්ඡා වෙමින් තිබෙනවා. පසුගිය කාලයේ ගරු ඇමතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය තීරණයක් අරගෙන කමිටුවක් පත් කරලා ඒ ගැන සොයා බලන්න මැදිහත්වීමක් කරමින් තිබෙනවා. ඒ නිසා ඒ ප්‍රශ්නයත් විසඳන්න අපි ආණ්ඩුවක් විධියට කටයුතු කරනවා. අපි බලයට එන්න අවුරුදු 5කට, 10කට, 15කට, 20කට, 30කට, 40කට, 50කට හා 60කට කලින් පැවැති ආණ්ඩු කාලවල නොවිසඳපු ප්‍රශ්න විසඳන්න අපි ආණ්ඩුවක් විධියට මැදිහත් වෙමින්, ඒවාට අවධානය යොමු කරමින් තිබෙන බවත් මතක් කරන්න කැමැතියි.

මම දැන් යොමු වෙන්නම්, අද ඉදිරිපත් කරලා තිබෙන සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත වෙත. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1958 අංක 29 දරන සත්ත්ව පනතට අද සංශෝධනයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. අපේ කැබිනට් අමාත්‍ය ගරු ලාල් කාන්ත ඇමතිතුමා ඒ ගැන නිරවුල් ලෙස හොඳට පැහැදිලි කරලා දුන්නා. පනතේ තිබෙනවා විශේෂයෙන්ම සත්ත්ව ප්‍රවාහනය ගැන. සත්ත්ව ප්‍රවාහනය ගැන කියනකොට තව කාරණා කිහිපයක් මතු කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළව සත්ත්ව පනත තිබෙනවා, සත්ත්ව රෝග පනත තිබෙනවා, සත්ත්ව නිරෝධායන පනත තිබෙනවා, සත්ත්ව ප්‍රවාහන පනත තිබෙනවා, සත්ත්ව සුබසාධන පනත තිබෙනවා. මේ වාගේ පනත් ගණනාවක් පසුගිය කාලයේ ඉදිරිපත් වෙලා තිබෙනවා, ඒවා සංශෝධනය වෙලා තිබෙනවා, විශේෂයෙන්ම පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළව. අද නිරවුල් ලෙස මේ කථා කරන්නේ, අද මේ විවාද කරන්නේ සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත ගැන. සත්ත්ව සුබසාධන හෝ, සත්ත්ව රෝග හෝ සත්ත්ව නිරෝධායන පනත ගැන නොවෙයි අද මේ කථා කරන්නේ සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත ගැන.

සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරනකොට සතුන්ට වැලඳෙන රෝගත් අදාළ වෙනවා. ඒ ගැන කථා කරන්න ඕනෑ. ඒකට හේතුව මේකයි. 1958 පනතේ එළහරකා සහ මීහරකා ප්‍රවාහනය කිරීමට අදාළ යම් නීති ප්‍රමාණයක් පනවලා තිබෙනවා. ඒ වාගේම, 1958 ඉදිරිපත් කළ පනතේ 4වන වගන්තියෙන් තවත් කාරණා ප්‍රමාණයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ගැන අපේ ගරු ලාල් කාන්ත ඇමතිතුමා පැහැදිලි කළා. 4 වන වගන්තියේ තිබෙන්නේ, එළහරකා, මීහරකා, බැටළුවා, එළුවා, සූකරයා හා කුකුළා කියන සතුන් අනවසරයෙන් වෙනත් ස්ථානයකට, ප්‍රදේශයකට ඇතුළු වෙලා යම් හානියක් කරනවා නම්, වගාවට හානියක් කරනවා නම් ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කරුණු. එවැනි අවස්ථාවක කොහොමද නීතිය ක්‍රියාත්මක කරන්නේ කියලා කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා.

අද මේ ගෙනෙන පනත් කෙටුම්පත තුළින් නිරවුල් ලෙස කියන්නේ මොකක්ද? පසුගිය කාලයේ අප්‍රිකානු උණ සූකරයන්ට වැලඳුනා. ඒ මොහොතේ අපේ රටේ සූකර කර්මාන්තයේ යෙදී හිටපු හැම ගොවියාම කඩා වැටුණා. ඔවුන්ගේ ආර්ථිකය කඩා වැටුණා. නැවත සූකර කර්මාන්තය පටන් ගන්න බැරි තැනට දැන් පත් වෙමින් තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට අපේ ගරු ලාල් කාන්ත ඇමතිතුමා සහ ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමන්ලා ඒ ගොවියෝ එක්ක සාකච්ඡා කරමින් නැවත කර්මාන්තය නඟා සිටුවන්නේ කොහොමද කියලා කථාබහ කරමින් ඉන්නේ. අපේ රටේ ආර්ථිකයට මෙය බලපානවා. ඒ නිසා ප්‍රශ්නයක් තිබෙනවා. ඒක නිසාම තමයි මෙම සංශෝධනයෙන් ගෙනෙන්නේ, සත්ත්ව ප්‍රවාහනයේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග එළුවා, බැටළුවා හා සූකරයා කියන සතුන් තිදෙනාට අදාළවත් අනුගමනය කරන්න ඕනෑ කියලා. පශු වෛද්‍යවරයාගේ පරීක්ෂාවකින් පස්සේ ලෙඩක් - රෝගයක් - නැත්නම්, හුළඟින් බෝ වන ලෙඩක් නැත්නම්, සතුන් එකට ඇතිල්ලීමෙන් වැලඳෙන රෝගයක් නැත්නම් ඒ සතුන් ප්‍රවාහනය කිරීම සඳහා විධිමත් ක්‍රමයක් ඇතුළත් නීති හදන්න ඕනෑ කියලා තමයි මේ සාකච්ඡාව ඇවිල්ලා තිබෙන්නේ. අපි හිතන විධියට රටක් විධියට ගත්තොත් ඒක හොඳයි. ඇයි එහෙම හොඳ වෙන්නේ? මම එක උදාහරණයක් කියන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සතුන් අතර පැතිර ගිය කුර හා මුඛ රෝගය නිසා 2001 වර්ෂයේදී එංගලන්තයේ පවත්වන්න තිබුණු මැතිවරණයක් කල් දමා තිබෙනවා. ඒ තමයි එංගලන්තය කියන රට ඒ වෙලාවේ ආර්ථිකය ගැන කල්පනා කරලා තිබෙන විධිය. ආර්ථිකය ආරක්ෂා කර ගන්න ඕනෑය කියන අරමුණින් මැදිහත් වෙලා තිබෙන ආකාරය තමයි ඒ. ඒ වෙලාවේ මිලියන 6කට ආසන්න සතුන් ප්‍රමාණයක් අයින් කරලා - cull කරලා - තිබෙනවා. ඇයි ඒ? එසේ කිරීම රටේ ආර්ථිකයට වැදගත් නිසා. අපි මේ කියන කාරණා රටේ හරියට

අනුගමනය නොකළහොත් සතුන්ට විතරක් නොවෙයි, සමහර විට ජනතාවටත් රෝග වැලඳෙන්න පුළුවන්. පසුගිය කාලයේ සූකරයන්ට වැලඳුණු රෝගය වල් ඌරන්ටත් වැලඳුණා.

ඒ නිසා තමයි මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක කිරීමට සූදානම් වෙන්නේ. ලෝක සත්ව සෞඛ්‍ය සංවිධානය මඟින් විශේෂයෙන්ම අනුගමනය කරන සෞඛ්‍ය ක්‍රම තිබෙනවා, හදලා තිබෙන නීති පද්ධති තිබෙනවා. විශේෂයෙන්ම අපි රටක් විධියට, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය විධියට මේ ගන්නා ලද තීරණ හුදෙක් එක්කෙනෙකුගේ දෙදෙනෙකුගේ ඔළුවේ පැළ වන අදහස්ම නොවෙයි. ලෝකයේ දියුණු දේවල් අත්පත් කර ගනිමින් ඉන්න රටවල් අනුගමනය කරන නීති පද්ධති, ඒ වාගේම ආරක්ෂා කර ගන්න ඕනෑ දේවල් සමඟ ලෝකය අධ්‍යයනය කරමින් තමයි අපි මේ කටයුතු කරමින් ඉන්නේ. ඒ අනුව ලෝක සත්ව සෞඛ්‍ය සංවිධානයේ මඟ පෙන්වීම් සහ පූර්වාදර්ශ අපි අරගෙන තිබෙනවා, මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න යනකොට.

අපි දන්නවා, මේ කටයුත්ත කරන්න යනකොට විවිධ සාකච්ඡා, සංවාද හැදෙන්න පුළුවන් බව. අපේ ලාල් කාන්ත ඇමතිතුමා කිව්වා වාගේ, නිරවුල් ලෙස මේවා තේරුම් අරගෙන මැදිහත්වීම කරමින්, අපේ රටේ ජාතික ආර්ථිකයට පණ පොවනකොට, නිෂ්පාදන ආර්ථිකයට ශක්තියක් එකතු කරනකොට, එළුවන්, බැටළුවන්, සූකරයන් ඇති කිරීමේ ව්‍යාපාරවල යෙදිලා ඉන්න ජනතාවට අසාධාරණයක් නොවන විධියට, ඒවාට ගැළපෙන විධියට රෙගුලාසි සකස් කරලා, සමස්ත ආර්ථිකය ගැන හිතමින් මේ ව්‍යාපාරය ඉතා යහපත් ලෙස ඉස්සරහට ගෙනියන්න ඕනෑ කියලායි අපි විශ්වාස කරන්නේ. එම නිසා ඒ ගොවි ජනතාවට කිසිසේත් මේකෙන් හානියක් වෙන්නේ නැහැ කියලා අපි විශ්වාස කරනවා. අපි ආණ්ඩුවක් විධියට ඒකට වග වෙනවා. ජනතාවට ගැළපෙන විධියට ඒ පහසුකම් ටික හදලා දෙන්න ඕනෑ කරන රෙගුලාසි ඉදිරියේදී හදලා, ඒ මැදිහත්වීම කරලා ජනතාවට අවශ්‍ය සහනය ලබා දෙන්න සූදානම් කියන පණිවුඩයත් ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[පි.ව. 1.27]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! இன்று இந்தச் சபையில் இரண்டு முக்கிய துறைகள் சம்பந்தமாகப் பேசப்படுகின்றது. அதாவது, உயிர் வாழ்வதற்குத் தேவையான நீருடன் தொடர்புடைய தேசிய நீர் வழங்கல், வடிகால் சேவைகள் சபை (திருத்தம்) சட்டமூலம் பற்றியும், உயிர் வாழ்க்கைக்குத் தேவையான உணவுடன் தொடர்புடைய விலங்குகள் (திருத்தம்) சட்டமூலம் பற்றியும் பேசப்படுகின்றது.

நீர் விநியோகத்துடன் தொடர்புடைய வளங்கள்ள துஷ்பிரயோகம் செய்யப்படுவது, அரச வருமானத்தைக் குறைப்பது போன்ற விடயங்களுக்கு நீருடன் சம்பந்தப்பட்ட குறித்த சட்டத்தைத் திருத்துவதனூடாகத் தீர்வு காண்பதன் மூலம் இந்த நாட்டு மக்களுக்கு நீர் வழங்கலில் சிறந்த சேவையை அரசாங்கத்தால் வழங்க முடியுமென நான் நம்புகின்றேன். அதேபோல், விலங்குகள் சட்டத்தைத் திருத்துவதன்மூலம் மிருக வதையைத் தடுக்க முடியும் என்பதோடு, உயிர்கள்மீது அன்பும் கருணையும் காட்டக்கூடிய இலங்கையையும் கட்டியெழுப்பலாமென நான் எண்ணுகின்றேன்.

எங்களுடைய நாட்டில் ஏற்கெனவே விலங்குகள் சட்டம் இருந்தாலும், சட்டவிரோதமாக விலங்குகளைக் கடத்துவது அல்லது அவற்றை ஓர் இடத்திலிருந்து இன்னோரிடத்துக்குக் கொண்டுசெல்வது தொடர்பில் பாரிய பிரச்சினைகள் இருக்கின்றன. சட்டவிரோதமாக விலங்குகளை ஓரிடத்திலிருந்து இன்னோரிடத்துக்கு எடுத்துச் செல்வதால், விலங்குகள் களவுபோவது முக்கியமானதொரு பிரச்சினையாக இருக்கின்றது. இதனால் விலங்கு வேளாண்மையை நம்பி வாழ்கின்ற மக்கள் பொருளாதார ரீதியாகப் பாதிக்கப் படுகிறார்கள். விலங்குகளை அனுமதியின்றி சட்டவிரோதமாக ஓரிடத்திலிருந்து இன்னோரிடத்துக்கு எடுத்துச் செல்லும் போது, விலங்குகளில் ஏற்படுகின்ற நோய்களும் ஓரிடத்திலிருந்து இன்னோரிடத்துக்குப் பரவுவதற்கும் அதிக வாய்ப்புகள் இருக்கின்றன.

நான் கௌரவ அமைச்சர் அவர்களிடம் விலங்கு வேளாண்மையுடன் தொடர்புடைய இரண்டு முக்கிய விடயங்களை இந்தச் சட்டத் திருத்தத்தில் சேர்த்துக்கொள்ள வேண்டுமென வினயமாகக் கேட்டுக் கொள்கின்றேன். முதலாவது, மேய்ச்சல் தரை சம்பந்தமான விடயம். இது மிக மோசமான ஒரு பிரச்சினையாக மாறியிருக்கிறது. நாங்கள் இது தொடர்பாக நாங்கள் தொடர்ந்து பேசிக்கொண்டு இருக்கிறோம். இந்தப் பிரச்சினைக்கு சட்ட ரீதியாக ஒரு தீர்வைக் காண வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். இரண்டாவது, வீதி விபத்துகள் தொடர்பான விடயம். நாங்கள் இது பற்றி பல இடங்களில் பேசியிருக்கிறோம். குறிப்பாக, எங்களுடைய பிரதேசங்களில் இரவு வேளைகளில் வீதி விபத்துகள் ஏற்படுவதற்கு வளர்ப்புப் பிராணிகளே மிக முக்கிய காரணியாக இருக்கின்றது. அந்த வகையில், வளர்ப்புப் பிராணிகளுக்கு இரவில் ஒளிரக்கூடிய கழுத்துப் பட்டிகளை அணிவிப்பதன் மூலமும், பண்ணை விலங்குகளுக்கு அவற்றின் காதுகளில் போடுகின்ற ear tagsஐ இரவில் ஒளிரக்கூடிய விதத்தில் இடுவதன் மூலமும் வீதி விபத்துகளைக் குறைத்து, உயிர்களைக் காப்பாற்றக்கூடிய நிலையை நாங்கள் ஏற்படுத்தலாம். எனவே, இந்த இரண்டு விடயங்களையும் சட்ட ரீதியாக அணுக வேண்டுமென கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, இன்றைய விவாதத் தலைப்புடன் தொடர்பில்லாத ஒரு விடயத்தைக் கூற வேண்டும். இப்போது சிறுபோக நெல் கொள்வனவு தொடர்பாக ஒரு பிரச்சினை இருக்கிறது. இப்பொழுது, எங்களுடைய பிரதேசத்தில் சிறுபோக நெல் கொள்வனவு நடைபெறுகிறது. எனினும், அதற்காக ஒதுக்கப்பட்ட நிதி போதாமல் இருக்கிறது. அதை அதிகரிக்க வேண்டுமென நான் கௌரவ அமைச்சரிடம் இன்று கூறினேன். அதற்குரிய நடவடிக்கைகளை எடுப்பதாக அவர் சொன்னார். அதற்காக நான் அவருக்கு இந்த இடத்தில் நன்றி கூறுகின்றேன்.

அடுத்து, நான் நீர் சம்பந்தமான மிக முக்கியமானதொரு விடயத்தைச் சொல்ல வேண்டும். எங்களுடைய நாட்டிலுள்ள 88 சதவீதமான மக்களுக்குப் போதியளவு நீர் - sufficient water - கிடைப்பதாக புள்ளிவிபரங்கள் குறிப்பிடுகின்றன. அதிலும் 80

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

சதவீதமான மக்களுக்கு மேம்படுத்தப்பட்ட குடிநீர் வசதி - improved water facilities - கிடைப்பதாகச் சொல்லப்பட்டாலும், 65 சதவீதமான மக்கள் பயன்படுத்துகின்ற குடிநீரில் நுண்ணுயிர்கள் - E. coli contaminated - இருப்பதாகச் சொல்லப்படுகின்றது. Department of Census and Statisticsஇன் 2021ஆம் ஆண்டு தரவுகளை அடிப்படையாக வைத்தே நான் இதனைச் சொல்கின்றேன். இந்த நாட்டில் வாழுகின்ற 99 சதவீதமான மக்களுக்கு மலசலகூட வசதி காணப்படுகின்றது. அதிலும், 94 சதவீதமான மக்கள் தங்களுடைய சொந்த மலசல கூடத்தையே பாவிக்கிறார்கள். இவ்வாறு இருக்கும்பொழுது, 65 சதவீதமான மக்கள் பயன்படுத்தும் குடிநீரில் மலக்கழிவுகள் இருப்பதாகச் சொல்லப்படுகின்றது. இதற்கு இரண்டு முக்கிய காரணங்கள் சொல்லப்படுகின்றது. முதலாவது, இந்த நாட்டில் இருக்கின்ற மலசலகூடங்களில் 85 சதவீதமானவை சாதாரண 'கக்கூஸ்' குழிகள். அவற்றிலிருந்து தண்ணீர் வெளியேறும். இரண்டாவது, மலக்கழிவுகளை உரிய முறையில் அகற்றுவதற்கான இறுதிக் கழிவகற்றல் முறை - waste management system - எங்களுடைய நாட்டில் இல்லை. ஆனபடியால்தான், இலங்கையில் 65 சதவீதமான மக்கள் மலக்கழிவு தொற்றுள்ள - E. coli contaminated - நீரைக் குடிப்பதாகச் சொல்லப் படுகின்றது. இதனை நிவர்த்தி செய்ய வேண்டிய பாரிய பொறுப்பு கௌரவ அமைச்சர் அவர்களுக்கு இருக்கிறது. பொதுச் சுகாதாரத்தை மேம்படுத்துவதற்காக இந்த இரண்டு விடயங்களையும் நான் கௌரவ அமைச்சரின் கவனத்துக்குக் கொண்டுவருகிறேன்.

நேரம் போதாமையால் ஒரு விடயத்தைக் கூறி எனது உரையை முடிக்கலாமென நினைக்கின்றேன். இப்பொழுது, எல்நினோவின் தாக்கம் சம்பந்தமாகப் பல விஷயங்கள் பேசப்படுகின்றன. கடந்த வருடம் நவம்பர் மாதத்தின் இறுதியில் ஏற்பட்ட 'தித்வா' புயலின்போது, குறுகிய காலப்பகுதியில் கிட்டத்தட்ட 600 மில்லி மீற்றர் மழை வீழ்ச்சி பதிவாகியுள்ளதாக ஆராய்ச்சியாளர்கள் சொல்கிறார்கள். எதிர்வரும் செப்ரெம்பர் மாதத்தின் இறுதியில் இருந்து சனவரி மாதத்தின் ஆரம்பம்வரை மிக மோசமான எல்நினோ தாக்கம் ஏற்படுமெனவும், அந்தக் குறுகிய காலப்பகுதிக்குள் 900 மில்லி மீற்றர் மழை பெய்யுமெனவும் எதிர்வுகூறப்படுகின்றது. நாங்கள் அதை எதிர்கொள்வதற்கு ஆயத்தமாக வேண்டும். எங்களுடைய நாட்டின் சில பகுதிகளில் 600 மில்லி மீற்றர் மழை பெய்து, அதனால் ஏற்பட்ட பாரிய அழிவிலிருந்து நாங்கள் இன்னும் முழுமையாக மீள முடியாமல் இருக்கையில், 900 மில்லி மீற்றர் மழை குறுகிய காலப்பகுதிக்குள் பெய்தால் அதனால் ஏற்படக்கூடிய பாதிப்பைத் தாங்கக்கூடிய சக்தி இலங்கை மக்களுக்கோ, அரசாங்கத்துக்கோ இல்லை.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසානයි ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

எனவே, இப்போதிருந்தே நாங்கள் மழைநீர் வழிந்தோடக் கூடிய வகையில், ஆக்கிரமிக்கப்பட்ட கால்வாய்களைத் துப்புரவு செய்வதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். அதன்மூலம் இந்த வருடம் பாரியதோர் அனர்த்தம் ஏற்படாமல் தடுக்க முடியும். இன்னும் சில முக்கியமான விடயங்களைப் பேசவேண்டி இருந்தாலும், நேரம் போதாமல் இருப்பதால், என்னுடைய உரை அடங்கிய ஆவணத்தை சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்.** நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දිනිඳු සමන් හෙන්නායක නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.34]

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Dinindu Saman Hennayake - Deputy Minister of Youth Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ආණ්ඩු පක්ෂය විධියට විශේෂයෙන්ම අද දවසේ සුවිශේෂී පනත් කෙටුම්පත් දෙකක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සාකච්ඡා කරනවා. ඒ, 1958 අංක 29 දරන සත්ත්ව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සහ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතයි. මෙහිදී දෙවැනි පනත් කෙටුම්පත, ඒ කියන්නේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මම වැඩි අවධානයක් යොමු කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් අපේ රටවල් ඉතා වේගයෙන් - ශීඝ්‍රයෙන් - සංවර්ධනය වෙන රටවල් බව අපි දන්නවා. අපේ රටේ මිනිස්සුන්ගේ ජල අවශ්‍යතාව ගත්තාම, එය දිනෙන් දින වැඩි වෙනවා. ජල අවශ්‍යතාව ප්‍රමාණාත්මකව වැඩි වුණත්, ජලයේ ප්‍රමාණය වැඩිවීමක් අපට දකින්නට ලැබෙන්නේ නැහැ. මේ තිබෙන නාගරීකරණය වාගේ දේවල් නිසා සහ මිනිස් ජල පරිහරණයේදී තිබෙන අක්‍රමිකතා නිසා ජලය දූෂණය වීම ඉතා ඉහළ ගිහිල්ලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට මිනිස්සුන්ගේ ජල අවශ්‍යතාවට සරිලන විධියට ජල සම්පාදනය ලබා දීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලොකු ගැටලුවක් තිබෙනවා. ඒ ගැටලු, අභියෝග අපි ජයග්‍රහණය කළ යුතුයි.

අපි මේ වසර කිහිපය තුළ ජල සම්පාදනයේ පුනරුදයක් ඇති කරන්න ඕනෑ කියලා ගරු ඇමතිතුමා කිව්වා. අපි ජල සම්පාදනයේ පුනරුදයක් ඇති කරනවා නම් මේ තිබෙන තත්ත්වයත් එක්ක ඒ පුනරුදය අපට බලාපොරොත්තු වෙන්න බැහැ. ඒ නිසා ජල සම්පාදනයේ පුනරුදයක් ඇති කරද්දී ඒ ආයතනවලට, ඒ සේවකයන්ට, ඒ පාරිභෝගිකයන්ට ඒ සඳහා අවශ්‍ය කරන නීති-රීති අලුතෙන් පනවා, ඉඩ ප්‍රස්ථා ලබා දීලා, ඒ අයිතිවාසිකම් ලබා දීලා ඒවා ඇතුළේ මේ පුනරුදය සඳහා දායක වෙන්න ආණ්ඩුවක් විධියට අපිට වගකීමක් තිබෙනවා. ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයට අදාළව 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත පළමුවරට සංශෝධනය වුණා. එය අවසන්වරට සංශෝධනය වුණේ 1992දීයි. මේ පනත සංශෝධනය වෙලා මේ වෙනකොට අවුරුදු 34ක් වෙනවා. ඒ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අවුරුදු 34ක කාලය ඇතුළේ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ ජලය බෙදා හැරීම දෙගුණයකට වඩා වැඩි වෙලා තිබෙනවා, බෙදා හරින සීමාව වැඩි වෙලා තිබෙනවා.

ඒ කාලයේ අපට මලාපවහන පද්ධති සම්බන්ධයෙන් තිබුණු අත්දැකීම් ගත්තොත්, 1992 වෙනකොට ඒවා කොළඹ වාගේ නාගරික ප්‍රදේශවලට විතරයි සීමා වෙලා තිබුණේ. අද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඉන් එහාට ගිහිල්ලා තවත් නාගරික ප්‍රදේශවල ජලාපවහන කටයුතු සඳහා ඉතා වේගයෙන් මැදිහත් වෙමින් තිබෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉදිරි කටයුතු සාර්ථක කරගෙන යන්න එවැනි වටපිටාවක්; එවැනි වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. විශේෂයෙන්ම 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතට නව වගන්ති එකතු කිරීම් සහ සංශෝධන එකතු කිරීම් විධියට සංශෝධන 19ක් එකතු කරලා තිබෙන බව අපේ ගරු ඇමතිතුමා පැහැදිලි කළා. මේකෙදි විශේෂයෙන්ම ඇමතිතුමා කියපු කාරණාවලට අමතරව ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය වැඩකටයුතු කරගෙන යද්දි අපේ ජල සම්පාදන ක්ෂේත්‍රය තුළ ජල සම්පාදන මණ්ඩලයට අමතරව තවත් ජල සැපයුම් ක්‍රම විශාල ප්‍රමාණයක් ජලය බෙදා හැරීමේ කටයුතු කරන බව මෙම පනතේ IIIවන කොටසේ 57(1) වගන්තියෙහි විශේෂයෙන්ම දක්වා තිබෙනවා.

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව හරහා ප්‍රජා මූල සංවිධාන 4,000කට වැඩි ප්‍රමාණයක් ලංකාවේ විශාල පිරිසකට ජලය සපයන බව අපි දන්නවා. ප්‍රමාණාත්මකභාවය සම්බන්ධයෙන්, ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ඒ වාගේ ගැටලු තිබුණාට දුෂ්කරතා මැද අපේ ජනතාව ස්වේච්ඡාවෙන් ඒ ප්‍රජා මූල සංවිධානවල වැඩ කටයුතු කරමින් යන බව අපි දන්නවා. ඒ වාගේම ප්‍රාදේශීය සභා, පළාත් පාලන ආයතන, විවිධ කාර්මික වතුයායන්, කර්මාන්ත උද්‍යාන ඇතුළු හැම තැනකම මේ ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතිනවා. මේක ඒ ව්‍යාපෘතිවලට තාක්ෂණය අත්‍යවශ්‍ය වන මොහොතක්. ගරු ඇමතිතුමා කිව්වා වාගේ ඒ ප්‍රජා මූල සංවිධාන 4,000න් 2,000ක විතර ප්‍රතිසංස්කරණ සිද්ධ කළ යුතු මොහොතකයි අපි මේ ඉන්නේ. එවැනි වටපිටාවක, එම ප්‍රතිසංස්කරණ කිරීම සඳහා තාක්ෂණික සහයෝගය ලබා ගැනීමේදී ලංකාවේ එම තාක්ෂණය සම්බන්ධයෙන් ඉතා හොඳ හැකියාවක් තිබෙන ආයතනයක් තමයි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය. ඒ තාක්ෂණික සහයෝගය අනෙක් ආයතන අතර බෙදා ගැනීමට අදාළ කරන ඉඩ ප්‍රස්ථාව අපි හදලා දෙන්න ඕනෑ. අලුතින් සම්මත කරන මෙම පනත තුළින් එම තාක්ෂණික සහයෝගීතාව ලබා දීමට අදාළව තිබෙන නීතිමය බාධා සියල්ල අයින් කරලා ඊට අවශ්‍ය කරන පහසුකම් සපයා දීමක් කර ගැනීමට හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම ජල සම්පාදන ක්ෂේත්‍රය තුළ ඊට අවශ්‍ය කරන අධ්‍යයන කටයුතු කරන්න, අවශ්‍ය කරන විධිමත් අධ්‍යයන ක්‍රියාවලි පවත්වා ගෙන යන්න, ජල samples පරීක්ෂා කිරීමට අදාළ labsවල පහසුකම් සකස් කිරීමේදී ඒවාට අවශ්‍ය කරන පිරිස පුහුණු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. තාක්ෂණික කටයුතු සඳහා හොඳ පුහුණුවක් ලත් නිලධාරින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ හිටියත් අවශ්‍ය කරන පුහුණු කිරීම් කරන්න, අධ්‍යයන කටයුතු කරන්න අවශ්‍ය කරන නිල ඉඩප්‍රස්තා ලබා දීලා තිබුණේ නැහැ. ඒක නිසා අපි මේ පනත සම්මත කිරීම තුළ එම නිල ඉඩප්‍රස්තා ලබා දීලා රටට අවශ්‍ය කරන තාක්ෂණික නිලධාරින්, අධ්‍යයනයක් සහිත නිලධාරින් ජල සම්පාදන ක්ෂේත්‍රය ඇතුළේ වැඩි කර ගන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම විශේෂයෙන්ම ප්‍රජා ජල ක්ෂේත්‍රය, කර්මාන්තපුර, කර්මාන්ත උද්‍යාන, කසළ අපවහන කාර්යයන් සිදු කරන තැන්, අපේ පළාත් පාලන ආයතන යනාදී සියල්ල තුළම ජල ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් තිබෙනවා. එම ජල ව්‍යාපෘති සම්බන්ධව ගනුදෙනු කරද්දී, ඉතා කැමැත්තෙන් ජල සම්පාදන මණ්ඩලයට ඒවා භාර දෙන්න උත්සාහ කළත්, පවතින නීති රීති ඇතුළේ ඒ භාර ගැනීමේ ක්‍රියාවලිය සිද්ධ කරද්දී විවිධ බාධාවන් සිද්ධ වෙන සමහර අවස්ථා අපි දැක තිබෙනවා. නමුත් කැමැත්තෙන් කවුරු හරි තමන්ගේ ජල ව්‍යාපෘති ජල සම්පාදන මණ්ඩලයට පවරන්න කටයුතු කරනවා නම්, එසේ කටයුතු කිරීමට තිබෙන බාධාවන් ලිහිල් කරන්න අවශ්‍ය කරන මැදිහත්වීම මේ පනත තුළට ඇතුළත් කර තිබීම මෙහි තිබෙන සුවිශේෂී තත්ත්වයක් විධියට අපි දකිනවා. අපි ඒක ඉතා හොඳ, ඉතා සුවිශේෂී කාරණයක් විධියට දකිනවා. ඒකට අවශ්‍ය කරන ඉඩප්‍රස්තා මේ පනත් කෙටුම්පතෙහි 57අ. IIIවන කොටස තුළින් ජල සම්පාදන මණ්ඩලයට සකස් කර දී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජල සම්පාදන මණ්ඩලයට අදාළව සේවකයන් විශාල ප්‍රමාණයක් සේවය කරන බව අපි දන්නවා. එසේ සේවය කරද්දී; ඔවුන්ගේ රාජකාරිය කරද්දි, ඔවුන්ට අට-හතර රස්සාව කරන්න බැහැ. ඒ වාගේම මිනිස්සුන්ගේ ජල අවශ්‍යතා ලබා දෙනකොට අහවල් වෙලාවේ එන්නේ නැහැ, අහවල් වෙලාවේ එනවා කියලා වැඩ කරන්න බැහැ, ඉතා කැපවීමෙන් ඒ වැඩ කටයුතු කරන්න වෙනවා. එලෙස සේවය කරන සේවකයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් තිබෙන නීති රීති සහ ඔවුන්ට රක්ෂණාවරණය ලබා දීමට තිබෙන ඉඩකඩ විශාල ප්‍රමාණයක් අඩු වෙලා තිබුණේ. අපි මේ පනත් කෙටුම්පත තුළට විශේෂයෙන්ම 83අ අලුත් වගන්තිය එකතු කරලා, සේවකයාගේ පැත්තෙන් සුබසාධනය සැපයීම සඳහා වන රක්ෂණාවරණ ලබා ගැනීමට අදාළ කරන වැඩ කටයුතු සම්පාදනය කර තිබෙනවා. සේවකයෙකු රාජකාරියට වාර්තා කිරීමේදී තමා පදිංචි ස්ථානයේ ඉඳන් සේවා ස්ථානය දක්වා එද්දි තමන්ට කරදරයක් හෝ මොකක් හරි දෙයක් සිද්ධ වනවා නම්, ඊට අදාළව රක්ෂණයක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු අපි සම්පාදනය කර තිබෙනවා. ඒ වාගේම රාජකාරියේ යෙදී සිටියදී, වෙනත් සෙසු කටයුත්තක් කරමින් - රාජකාරියට අදාළ ආනුෂංගික කටයුත්තක් කරමින්- සිටියදී යම් ක්‍රියාවක් සිද්ධ වුණා නම්, ඒකට අදාළ කරන රක්ෂණාවරණයක් ලබා දෙන්නත් මෙහිදී සේවකයින්ගේ පැත්තෙන් කටයුතු කර තිබෙනවා.

අපි දන්නවා, ජල සම්පාදනය වාගේ ක්ෂේත්‍රවලදී විශාල වශයෙන් මතභේද ඇති වන බව. මිනිස්සු එක්ක ගනුදෙනු කරද්දි විවිධ ගැටුම් ඇති වනවා. එවැනි ක්‍රියාවලදී සේවකයින්ගෙන් පළිගැනීමක් හෝ වෙනත් කුමන හෝ කාර්යයක් සිද්ධ වෙද්දි ඒ සේවකයාගේ පැත්තේ හිටගෙන ඒකට අවශ්‍ය කරන රක්ෂණයක් ලබා දෙන්න, ඒකට අවශ්‍ය මැදිහත්වීමක් කරන්න මේ පනත ඇතුළේ ඉඩ ලබා දී තිබෙනවා. ඒක අපි හිතනවා, ජල සම්පාදන මණ්ඩලයේ සේවකයින්ගේ පැත්තෙන් ඉතාම සුවිශේෂ කාරණයක් කියලා.

ඒ වාගේම මේ පනත් කෙටුම්පතින් 1974 අංක 2 දරන පනතේ 90 වන වගන්තියේ ඇති සුවිශේෂ කාරණා ප්‍රමාණයක් පිළිබඳව කථා කරනවා, ඉහත සංශෝධනවලට අදාළව. ඉන් එකක් තමයි, ජල විද්‍යාත්මක රක්ෂිත හෝ මතුපිට සහ භූගත ජල විභව තුළුංවල ආරක්ෂාව සඳහා රක්ෂිත ප්‍රකාශයට පත් කිරීමේ බලය සහ ඒවා ආරක්ෂා කිරීමට අවශ්‍ය බලය ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලබා දීලා තිබෙනවා.

අපි දන්නවා, ලංකාව ඇතුළේ ජලය කොපමණ තිබුණත් ඒවා පරිහරණය කරන්න බැරි තරමට දූෂණය වන බව. මේ ජල උල්පත් පටන් ගන්නේ මලෙයහම් ජනතාව ජීවත් වන කඳුකර ප්‍රදේශවලින්. ඒ කඳුකර ප්‍රදේශවල ජලය දූෂණය වීම නිසා පහළ ප්‍රදේශවල ඉන්න ජනතාව විශාල වශයෙන් පීඩාවට පත් වනවා. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යොදා ගන්නා මේ ජල

[ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා]

මූලාශ්‍ර සියල්ල අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. ඒ වාගේම ජල උල්පත්වලට අදාළ කරන ජල පෝෂක ප්‍රදේශ නියාමනය කරන්න, පෝෂක ප්‍රදේශ ආරක්ෂා කරන්න, කළමනාකරණය කරන්න අවශ්‍ය මැදිහත්වීම කරන්න ඕනෑ. මතුපිට ජලය සහ භූගත ජලය කියන සියලු තැන්වලදී ජල පෝෂක ප්‍රදේශය ආරක්ෂා කිරීමට ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සුවිශේෂ හැකියාවක්, බලයක් ලබා දෙන වගන්ති මේ කෙටුම්පතට ඇතුළත් කර තිබෙනවා. අපි විශ්වාස කරනවා, හෙට දවස උදෙසා මේ රටේ ජලය ආරක්ෂා කරන්න නම්, එවැනි වගකීමක්, එවැනි බලයක් මේ ආයතනවලට ලබා දෙන්න ඕනෑ බව. මොකද, අපේ රටේ ජල පෝෂක ප්‍රදේශ අවදානමකට ලක් වෙලා තිබෙන්නේ. අපේ රටේ ජනතාව වෙනුවෙන් ඒ ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා නොකළොත් ජලය සම්බන්ධයෙන් මීට වඩා බරපතළ තත්ත්වයකට ඉදිරියේදී අපට මුහුණ දෙන්න සිද්ධ වෙයි. එම නිසා ජලය ලබා ගන්නා ප්‍රභවය ආරක්ෂා කර ගැනීම, ඒ වාගේම ඒ catchment එක ආරක්ෂා කර ගැනීම, ඒ ජලය ආරක්ෂිතව පාරිභෝගිකයා දක්වා ගෙන යන්න අවශ්‍ය විධිවිධාන හදලා දෙන්න අදාළ කරන වැඩ කටයුතු මේ පනත ඇතුළේ සම්පාදනය කරන්න කටයුතු කර තිබෙනවා.

ඒ වාගේම නාගරීකරණය සිද්ධ වෙද්දි අපජලය සම්බන්ධයෙන් විශාල අවශ්‍යතාවක් දැන් තිබෙන බව අපි දන්නවා. අපේ රටේ නාගරීකරණය ක්‍රමයෙන් වැඩි වෙද්දි, ජලය භාවිත කිරීම සහ අපජලය බැහැර කිරීමේ ක්‍රියාවලියත් විධිමත් කර ගන්න අවශ්‍ය වනවා. අපේ රටේ තවමත් ඒකට අවශ්‍ය නිශ්චිත විධිවිධාන, නීති රීති සම්පාදනය වෙලා නැහැ. පවතින නීති රීති විධිමත්ව ක්‍රියාත්මක වන්නේත් නැහැ. එම නිසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අදාළව ඒ නීති රීති හදලා දෙන එක, ඔවුන්ට අදාළ බලය ලබා දීම, ඒ අපජලය පිරිපහදු කර ගැනීමට, අපජලයට අදාළ ප්‍රමිති සකස් කර ගන්න අවශ්‍ය බලය ලබා දීමට අවශ්‍ය වැඩ පිළිවෙළ මේ පනත ඇතුළේ අපි සාකච්ඡා කරලා තිබෙනවා. ඒ නිසා අපි හිතනවා, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අදාළව තිබෙන සුවිශේෂී ගැටලු රැසකට මේ පනත ඇතුළේ නිල බලයක් හම්බ වනවා කියලා. ඒ වාගේම ඔවුන්ට විධිමත්ව වැඩ කටයුතු කරන්නත් අවස්ථාව හම්බ වනවා. ඒක ඇතුළේ අපේ ජල සම්පාදන ක්ෂේත්‍රයට අදාළ ඉදිරි කටයුතු සාර්ථකව කරගෙන යන්න අවස්ථාව හම්බ වෙලා තිබෙනවා.

ඒ වාගේම විශේෂයෙන්ම ජල සම්පාදන ව්‍යාපෘතියක් කරද්දි මහා පරිමාණයෙන් ඒ ව්‍යාපෘති කරන්න ඕනෑ. එහිදී ඉඩම් පවරා ගැනීම් සිද්ධ කරන්න ඕනෑ. ඒකට අදාළ කරන ගිවිසුම්වලට යන්න ඕනෑ. දැන් ඒ ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාවලියේදී බරපතළ ප්‍රශ්න ප්‍රමාණයක් ඉදිරිපත් වනවා. ඒවා වළක්වා ගන්න ඕනෑ. මතුපිට සහ භූගත ජලයට අදාළව යම් තැනැත්තෙකු සමඟ ගිවිසුම්ගත වීම වාගේම මිලදී ගැනීමේ ක්‍රියාවලිය පවත්වාගෙන යෑමත් මෙහිදී අවශ්‍ය වනවා. දේපළ අත්පත් කර ගැනීම සහ සතුව තබා ගැනීමේ වගකීම විතරයි මෙච්චර කාලයක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට තිබුණේ. මෙතැනින් පස්සේ දේපළ මිලදී ගැනීම සඳහා වන පහසුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අපි ලබා දීලා තිබෙනවා. මේවා ඇතුළේ අපි අපේක්ෂා කරන දේවල් ටිකක් තිබෙනවා. අර කියන පුනරුදයට යන්න නම් ජනතාවට ඉතා වේගයෙන් ජලය ලබා දීම අපේ රටට අත්‍යවශ්‍යයි. ඒ සඳහා ඉක්මනින් අපේ ජල ව්‍යාපෘති හදන එකට, ඒ පුනරුදයට යන එකට අදාළව මේ පනත සම්මත කිරීම අත්‍යවශ්‍ය වනවා. මෙන්න මේ නීති රීති පාවිච්චි කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට බලය ලබා දීම ඇතුළේ අපි විශ්වාස කරනවා, ඉතා ඉක්මනට අපේ අමාත්‍යතුමාගේ සංකල්පයට අනුව ඒ මහා ජල පුනරුදයට යා හැකි වේවි කියලා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.46]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින සාකච්ඡාවට ගන්නා සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත ඉතාම හොඳ පනත් කෙටුම්පත් දෙකක්. නමුත්, මම ඒවා ගැන වැඩිය කථා කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ දේ මුලින්ම කියන්න ඕනෑ. අපේ රටේ කවුරුවත් ජාතිවාදීව මේ ගැන හිතන්න එපා. අපි සිංහල බෞද්ධ අය තමයි. නමුත් මේ රටේ ජාතීන් කිහිපයක්ම ජීවත් වනවා. අපටත් ප්‍රශ්න තිබෙනවා. හේතුව, මුස්ලිම් අන්තවාදීන් තමයි පාස්කු ප්‍රහාරය සිද්ධ කළේ. මුස්ලිම් ජනතාව නොවෙයි, අන්තවාදී මුස්ලිම් කණ්ඩායමක් තමයි ඒ ප්‍රහාරය කළේ. නමුත්, අද තත්ත්වය පවතින්නේ ඒක මුස්ලිම් අන්තවාදී කණ්ඩායමක් කළේ නැති විධියටයි. හේතුව, මේ ප්‍රහාරය කරලා තිබෙන්නේ මුස්ලිම් අන්තවාදීන් නොවෙයි, මේ ප්‍රහාරය කරලා තිබෙන්නේ දැන් සිංහල අන්තවාදීන්. මොකද, දැන් අපට පෙනෙන විධියට ඒක සිංහල අන්තවාදීන් තමයි කරලා තිබෙන්නේ. අපේ සිංහල බෞද්ධ ජනතාවට මේක ඉතිහාසයේ ඉඳන්ම උරුමයක් වෙලා තිබෙන දෙයක්. පෘතුගීසින් ගැහුවා, ලන්දේසින් ගැහුවා, ඉංග්‍රීසින් ගැහුවා, ඊට පස්සේ LTTE එක ගැහුවා, දැන් JVP එකෙනුත් ගහනවා. හේතුව, පූජිත් ජයසුන්දරයි, හේමසිරි ප්‍රනාන්දුයි තමයි පාස්කු ප්‍රහාරයෙන් මියගිය 300කට ආසන්න පිරිසක් මරලා තිබෙන්නේ. බෝම්බ පත්තු කරගෙන තිබෙන්නේත් ඒ දෙදෙනා. ඒ සිදුවීමෙන් ඊබ්‍රහිම්ගේ පුතුන් දෙදෙනා මැරුණා. පුතුන් දෙදෙනා මැරිච්ච ඊබ්‍රහිම්ට ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම මේ සිද්ධියට සම්බන්ධ වෙච්ච කිසි කෙනෙකුට ප්‍රශ්නයක් නැහැ. පූජිත් ජයසුන්දරට සහ හේමසිරි ප්‍රනාන්දුට අවුරුදු 1,600 බැගින් සිර දඬුවම් සහිතව නඩු තීන්දුවක් ලැබිලා තිබෙනවා. ඔවුන් දැන් බන්ධනාගාරයේ ඉන්නවා. හැබැයි, දැන් තව එකයි කරන්න තිබෙන්නේ. ආණ්ඩුව ජනප්‍රිය වෙනවා නම් තවත් එකක් තිබෙනවා කරන්න. ජනාධිපතිතුමාට පුළුවන්, අත්සනක් ගහලා ඒ දෙදෙනාව එල්ලන්න කියන්න. මොකද, එච්චරයි නේ මේ මිනිස්සු දෙදෙනාට ඉතිරි වෙලා තිබෙන්නේ. ජනාධිපතිතුමාගේ අත්සන ගහලා ඒ දෙදෙනා එල්ලන එකත් කළා නම්, එතැනින් එහාට ඒ මිනිස්සු දෙදෙනාට තවත් කරන්න දෙයක් නැහැ.

ඒ සිද්ධිය වනකොට නැඟෙනහිර පළාතේ ආඥාපති විධියට හිටපු කෙනා අද මේ ආණ්ඩුවේ ආරක්ෂක නියෝජ්‍ය ඇමති. ඒ වාගේම ශානි අබේසේකර මේ සිද්ධියේ ඉන්නවා. අද ඒ පුද්ගලයා CID එකේ Director. රවී සෙනෙවිරත්න මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්. එහෙම බැලුවාම ඇතුළේ ඉන්න ඕනෑ මිනිස්සු එළියේ ඉන්නවා. එළියේ ඉන්න ඕනෑ මිනිස්සු ඇතුළේ ඉන්නවා. මේක බන්ධනාගාරයට ගියාම වෙනවා. කැරම් බෝඩ් බෙදන්න යෝජනා කරපු මිනිහා ඇමෙරිකාවේ. කැරම් බෝඩ් බෙදපු මිනිස්සු හිරේ. ඒ වාගේම ඉලුක්පිටිය කියන නිලධාරියා බලන්න. ඉලුක්පිටිය රාජ්‍ය නිලධාරියා හිරේ; මහ මොළකරු එළියේ. ආණ්ඩුව හිතනවා නම්, අපි හිරේ දැම්මා, හිරේ දැම්මා, මිනිස්සු හිරේ දැම්මා, දූෂිතයෝ හිරේ දැම්මා කියලා, දූෂිතයෝ

නොවෙයි හිරේ ඉන්නේ. හිරේ ඉන්න ඕනෑ මිනිස්සු දැන් ඉන්නේ එළියේ. ඉලුක්පිටිය හිරේ; මහ මොළකරු එළියේ. ඒ විතරක් නොවෙයි, පී. දිසානායක කියලා ජනාධිපති ලේකම් කෙනෙක් හිටියා. පී. දිසානායක ඇතුළේ; coffee shop එකේ සල්ලි ගන්න හිටපු මිනිස්සු එළියේ. සල්ලි දෙනකොට අහු වන පී. දිසානායක ඇතුළේ; coffee shop එකෙන් මාරු වෙච්ච මිනිස්සු එළියේ. "අපි දැන් හරියට කරනවා, අප වැරදිකරුවන් හිරේ දමනවා" කියලා අද ආණ්ඩුව හිතාගෙන හිටියාට ඒක වෙලා නැහැ.

ඒ එක්කම මේ කාරණයත් මම කියන්න ඕනෑ. ලාල් කාන්ත ඇමතිතුමනි, මම කුරුණෑගල රැස්වීමකදී සිංහල, බෞද්ධ ගැන කථා කරලා කිව්වා, හිටපු හමුදාපතිතුමා සේවා කාලය දීර්ඝ කර ගන්න කාදිනල්තුමාට පලතුරු වට්ටියක් අරගෙන ගියා කියලා. ඊට පස්සේ කාදිනල්තුමා කිව්වා, මට විරුද්ධව නඩුවක් දමනවා කියලා. මට නඩු දැම්මාට කමක් නැහැ. මම සාධාරණය ඉෂ්ට කළා, දැන් පත් වෙලා ඉන්න හමුදාපතිතුමාට. සිංහල, බෞද්ධ කෙනෙක් තමයි හමුදාපතිතුමා වශයෙන් පත් වුණේ. එදා මම ඒ කථාව කියපු හින්දා එතුමාට ඒ අවස්ථාව ලැබුණා. ඒ නිසා රටට අලුත් හමුදාපති කෙනෙක් පත් වුණා. නැත්නම් ආණ්ඩුව ඒකෙනුත් ගා ගන්නවා. සිංහලෙන් කියනවා නම්, "ගා ගන්නවා" කියන්නේ අසුචි නොවෙයි. දෙමළෙන් කියනවා, "පී ගා ගන්නවා" කියලා. මම එදා එහෙම කියපු නිසා එතුමාට ඒ අවස්ථාව හම්බ වුණා. නැත්නම් එතුමාට හමුදාපතිකම හම්බ වෙන්නේ නැහැ. හිටපු හමුදාපතිතුමාගේ සේවා කාලය ලබන පෙබරවාරි වෙනකම් මාස 6ක් දීර්ඝ කරලා තිබුණා නම් දැන් පත් වෙලා ඉන්න හමුදාපතිතුමාට සැප්තැම්බර් මාසයේ එළියට යන්න වෙනවාය කියන එකත් මම මේ වෙලාවේදී කියනවා.

ඊළඟ කාරණය මේකයි. අපේ අධිකරණ ඇමතිතුමා කියනවා, අග්‍ර විනිශ්චයකාරතුමාගේ සේවා කාලය අවුරුදු දෙකකින් දීර්ඝ කිරීම ගැන. අග්‍ර විනිශ්චයකාරතුමාට වයස අවුරුදු 65යි. හැබැයි, අපේ අධිකරණ ඇමතිතුමාට වයස අවුරුදු 54යි. ලාල් කාන්ත ඇමතිතුමනි, අධිකරණ ඇමතිතුමා කියනවා, වයසට යනකොටලු, කාර්යක්ෂම වෙන්නේ, වයසට යනකොටලු, හොඳට පළපුරුද්ද ඇති වෙන්නේ කියලා. අධිකරණ ඇමතිතුමාට වයස අවුරුදු 54 නේ. ඒ නිසා අධිකරණ ඇමතිතුමාට තිබෙනවා, හොඳ වැඩක් කරන්න. ඔය ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න වුවමනාවක් නැහැ. ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා, හාමුදුරුවරු හම්බ වෙන්න ගිහිල්ලා මේ රටේ මිනිස්සු දැනුවත් කරන්න ඕනෑ නැහැ. එතුමාට එක දෙයයි කරන්න තිබෙන්නේ. ඒ, මොකක්ද? ජාතික ලැයිස්තුවේ එක් කෙනෙක් අයින් කරලා, පද්මන් සූරසේන පාර්ලිමේන්තුවට ගෙනෙන්න. ඊට පස්සේ පද්මන් සූරසේන අධිකරණ ඇමති කරවලා අපේ ඇමතිතුමා වෙන අමාත්‍යාංශයක් ගන්න, කාර්යක්ෂමව වැඩ කරන්න බැරි නම්. එතකොට මම හිතන්නේ පද්මන් සූරසේන අධිකරණ ඇමති වුණා නම් ඉස්සරහ පුටුවේ. එතකොට එතුමා බන්ධනාගාර ගැනත් බලයි, නඩුත් ඉක්මනට කථා කරයි. මොකද, දැන් ඉන්න අධිකරණ ඇමතිතුමා බන්ධනාගාර කටයුතුවලදී අසාර්ථකයි නේ.

ඊට පස්සේ නඩු ගැනත් කියනවා. නඩු ඉක්මනට කථා කරන්නේ නැහැලු, කාර්යක්ෂම නැහැලු. පද්මන් සූරසේන මහත්මයා අධිකරණ ඇමතිකමට ගෙනාවා නම් ඉක්මනට නඩු ටිකත් කථා කරලා, බන්ධනාගාර ටිකත් බලාගෙන ඒ වැඩ ටික කරගෙන යන්න පුළුවන්. ඉතින්, එහෙම දෙයක් කරන්න තිබියදී කරන්න යන ඇත්ත කථාව මේකයි. පද්මන් සූරසේන මහත්මයාගේ සේවා කාලය අවුරුදු දෙකකින් දීර්ඝ කරන්න තමයි මේ ආණ්ඩුව මහන්සි වෙන්නේ. ඒකට ශ්‍රේෂ්ඨාධිකරණයේ අනෙක් විනිසුරුවරුන්ගෙන්, අභියාචනාධිකරණයේ අනෙක් විනිසුරුවරුන්ගෙන්, අනෙක් උසාවිවල විනිසුරුවරුන්ගෙන් විරෝධතා එනකොට ආණ්ඩුව කිව්වා, ඒ විනිසුරුවරුන්ගේ සේවා කාලයත් දීර්ඝ කරනවා කියලා. ඒ ඔක්කෝටම වැඩිය, විසිතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් වැඩිය හොඳයි නේ මම කිව්ව අර වැඩේ කරලා තිබුණා නම්. ඒක සාර්ථකයි නේ. මොකද, එතකොට එතුමා අධිකරණ ඇමති. දැන් ඉන්න අධිකරණ ඇමතිතුමාට වයස අවුරුදු 54යි. එතුමා කාර්යශූර නැති නිසා නේ එතුමාම කියන්නේ, අවුරුදු 65, 67 වනකොට වැඩ කරන්න පුළුවන්, පළපුරුද්ද තිබෙනවා කියලා. ඒ නිසා මම හිතනවා, පද්මන් සූරසේන අධිකරණ ඇමති කළාම හොඳයි කියලා. මොකද, ඔයගොල්ලන්ගේ ඕනෑ තරම් මන්ත්‍රීවරු ඉන්නවා නේ, ජාතික ලැයිස්තුවෙන් ආපු. ඒ අයගෙන් එක්කෙනෙක් අයින් වෙලා, පද්මන් සූරසේන මහත්මයා පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, අධිකරණ ඇමතිතුමාට වෙන අමාත්‍යාංශයක් දුන්නා නම් ඒක සෑහෙන්න වටිනවා.

මම තවත් සිද්ධියක් කියන්නම්. මාවනැල්ලේ බුදු පිළිම කැඩුවා. හැබැයි, මාවනැල්ලේ බුදු පිළිම කඩනකොට ඒක අල්ලලා දුන්නේ මුස්ලිම් කෙනෙක්. සහරාන්ලා බුදු පිළිම කඩනවා කියලා අල්ලලා දීපු තස්ලිම් කියන මුස්ලිම් දරුවාට සහරාන්ගේ කල්ලිය ඉස්පිරිතාලයට ඇවිල්ලා වෙඩි තැබුවා. දැන් ඒ ළමයා ඔළුව, අතපය පණ නැතිව ඉන්නවා. ඒ ළමයාට කවුරුවත් වන්දියක් දෙන්නේ නැහැ. බුදු පිළිම කඩපු එක අල්ලලා දීපු ළමයා ගැන කවුරුවත් හොයා බලන්නේ නැහැ. දැන් තස්ලිම්ගේ ඇඟේ පැත්තක් පණ නැහැ. ඔහුට ඇවිදින්න බැහැ. ඔහුගේ ඔළුවට වෙඩි වැදිලා, කකුල්වලට වෙඩි වැදිලා. නමුත් තස්ලිම්ට මේ ආණ්ඩුවෙන් සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නැහැ. හැබැයි, අද ඊබ්‍රාහිම්ට සාධාරණය ඉෂ්ට වෙනවා. නඩු කථා කරලා, වැරදිකාරයෝ කරනවා නම්, හිරේ දමනවා නම් මම කියන්නේ මේකයි. පී. දිසානායකට වයස අවුරුදු 75යි. ඔහු වැලිකඩ බන්ධනාගාරයේ ඉන්නවා. පොදු සමාව දීලා හරි ඔහුව එළියට අරගෙන ආණ්ඩුව ඔහුට කියන්න, ප්‍රකාශයක් කරන්න කියලා. මොකක් හින්දාද ඔහු ඇතුළේ ඉන්නේ, එළියේ ඉන්න කවුද ඇතුළට යන්න ඕනෑ කියලා එතකොට පී. දිසානායක හරියට කියයි. හැබැයි, මෙතැන වෙලා තිබෙන්නේ ඉලුක්පිටිය ඇතුළේ; මහමොළකරු එළියේ. ඒ වාගේ එළියේ ඉන්න ඕනෑ ගොඩක් මිනිස්සු ඇතුළේ. ඕක තමයි ඇත්ත කථාව.

මට කියන්න තව කාරණයක් තිබෙනවා, නිකවැරටිය ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන්. ප්‍රාදේශීය ලේකම්ගේ අවසර ගන්නේ නැතිව, ග්‍රාම සේවක වාර්තාවක් ගන්නේ නැතිව නිකවැරටිය ප්‍රාදේශීය සභාව, නිකවැරටිය පිට්ටනියේ තිබුණු සියලු ගස් කපා තිබෙනවා. ඒ සම්බන්ධව complaints ගියාම ප්‍රාදේශීය ලේකම් ඒ ගැන දන්නෙත් නැහැ, ග්‍රාම සේවක දන්නෙත් නැහැ. නිකවැරටියේ මාලිමාව බලය හොබවන ප්‍රාදේශීය සභාවක් තිබෙන්නේ. එම නිසා ඒ ගැන හොයා බලන්න. අපි කියපු ඒවා හොයා බැලුවාම ඒ ගැන දැනගන්න පුළුවන් වෙයි. කිසිම නීතියක්, මොනවාවත් බලන්නේ නැතිව ඒ පිට්ටනියේ තිබුණු ගස් බලෙන් කපලා. ගස් කපලා, කේස් එක ඇදුණාම මුල් ටික හාරලා සොහොනට අරගෙන ගිහිල්ලා ඒවා වළ දාලා. ලාල් කාන්ත ඇමතිතුමා මේ සභාවේ ඉන්න හින්දා මම මේ ගැන කියන්නේ. නිකවැරටිය ප්‍රාදේශීය සභාව අයත් වන්නේ ඔයගොල්ලන්ගේ පක්ෂයට.

ඊළඟ කාරණය ගනිමු. ලාල් කාන්ත ඇමතිතුමනි, මම මීට මාස 6කට කලින් කිව්වා, මහරගම තිබෙන "කැදැල්ල" කියලා ආයතනයක් ගෙවල් හදලා දෙනවා කියලා අහිංසක මිනිස්සුන්ගෙන් සල්ලි අරගෙන තිබෙනවාය කියා. ඒකේ උත්සවයට ගියේ මෙතැන ඉන්න නියෝජ්‍ය ඇමති කෙනෙක්. මම ඒ ගැනත් පාර්ලිමේන්තුවේදී කිව්වා. ඒ උත්සවයට ගියේ කොළඹ දිස්ත්‍රික්කයේ ඉන්න නියෝජ්‍ය ඇමතිතුමෙක්. එතුමා තමයි උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා. මේ වනකොට "කැදැල්ල"

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

කියන නිවාස හදලා දෙන ආයතනය ලංකාවේ ඉන්න මිනිස්සු 1,000කට විතර රුපියල් ලක්ෂ 50, 100 පොලු තියලා තිබෙනවා. ඒ මිනිස්සුන්ට ගෙවලුත් නැහැ, සල්ලිත් නැහැ. "දිට්වා" සුළි කුණාටුව නිසා ආපදාවට පත් වුණු ජනතාවට වන්දි වශයෙන් දීපු සල්ලිත් සමහරු ඒ ඉඩම්වල ගෙවල් හදලා දෙන්න කියලා දීලා තිබෙනවා. මේ වාගේ ප්‍රශ්න තිබෙනවා. ආණ්ඩුව ඒවා ගැන හොයා බලනවාද දන්නේ නැහැ. මම නම් පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒවා එකින් එක කියනවා.

ඊළඟ කාරණය මේකයි. අපි 1994 අවුරුද්දේ ඉඳන් තරුණ තරුණියන් කොරියාවට වාගේම ඊශ්‍රායලයට යැව්වා. 2024 අවුරුද්දේ පැවති අපේ ආණ්ඩුව කාලයේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් තරුණ තරුණියන් ඊශ්‍රායලයට යවා තිබෙනවා. මම මේ කියන ගණන් හිලව් වැරදුණොත් හරියට බලලා අපට ඒවා කියන්න, අපි ඒ වැරැද්ද භාර ගන්නවා. හැබැයි, මේවා ගැන හොයා බලන්න. අපේ ආණ්ඩුව පැවති කාලයේ රජයෙන් තරුණ තරුණියන් 5,235ක් ඊශ්‍රායලයට යවා තිබෙනවා, ලාල් කාන්ත ඇමතිතුමනි, ජල සම්පාදන ඇමතිතුමනි. අපේ කාලයේ රජයෙන් 5,200කට ආසන්න පිරිසක් ඊශ්‍රායලයට යවා තිබෙනවා. එතකොට ඒජන්සිවලින් යැව්වේ 434යි. මේ සැරේ - 2026දී - දැනට ඒජන්සිවලින් 4,000ක් යවා තිබෙනවා. දැනට රජයෙන් - මේ ආණ්ඩුවෙන් - යවා තිබෙන්නේ 336යි. 4,000ක් ඒජන්සිවලට මුදල් දීලා. එලෙස මුදල් දීපු ක්‍රමය ගැන අපි දන්නේ නැහැ. අහිංසක කොල්ලෙකුට ඒජන්සි හරහා ඊශ්‍රායලයට යන්න රුපියල් ලක්ෂ 45ක් වැය වනවා. හැබැයි, ආණ්ඩුවෙන් අර රුපියල් ලක්ෂ 15 loan එකත් දීලා යැව්වොත් ඒ පුද්ගලයාට රුපියල් ලක්ෂ 15ක් තමයි ඒ සඳහා වැය වෙන්නේ. මේ රටේ අහිංසක තරුණයෙකුට දැන් ඊශ්‍රායලයට යන්න බැහැ. ඒකට හේතුව තමයි, මේ ඔක්කෝම කොම්පැනිවලට දෙන එක. ඒක දෙන විදිය මොකක්ද කියලා දන්නේ නැහැ. එම නිසා ඒ ගැන හොයා බලන්න. ආණ්ඩුවට ඒක හොඳ නැහැ. මේවා බලාපොරොත්තුවෙන් නොවෙයි මිනිස්සු මාලිමා රජය පත් කළේ. තරුණයෝ විශාල පිරිසක් අද වනකොට ඊශ්‍රායල රටට යන්න බලාගෙන ඉන්නවා. මේ වාගේ ගොඩාක් දේවල් වෙනවා.

ඊළඟ කාරණය මේකයි. ඔයගොල්ලන් අලුතින් පත් කර තිබෙන ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා තානාපති ඊශ්‍රායලයට ගිහිල්ලා තිබෙනවා. අපේ රටින් ගිය තරුණයෝ එක තැනක වැඩ කරන්න බැරි වුණාම ඒ තැනින් පැනලා ගිහිල්ලා සරණාගත වීසා යටතේ වෙන තැන්වල වැඩ කරනවා. මේ අලුත් තානාපති ඊශ්‍රායලයට ගිහින් අපේ රටේ ප්‍රශ්න නැහැ කිව්වාට පස්සේ සරණාගතව ඉන්න 10,000ක විතර පිරිස ඊශ්‍රායලයෙන් ලංකාවට එවන්න ලැහැස්ති කරලා තිබෙනවා. මේ 10,000ක පිරිස ලංකාවට එව්වොත් විදේශ ශ්‍රමිකයන් මේ රටට එවන කොච්චර මුදල් ප්‍රමාණයක් ඔයගොල්ලන්ට නැති වෙනවාද?

අලුතින් පත් කරන ලද විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමාත් ඊශ්‍රායලයට ගිහිල්ලා තිබෙනවා. හැබැයි, මේ ප්‍රශ්නය විසඳලා නැහැ. ඊශ්‍රායලයට ගිය තරුණ තරුණියෝ සරණාගත වීසා යටතේ යවපු නිසා ඒගොල්ලන් බලාගෙන ඉන්නවා, ඔවුන්ව නැවත ලංකාවට එවයි කියලා. අපි මේ වාගේ ගොඩාක් දේවල් ගැන හොයලා පාර්ලිමේන්තුවේදී ඒවා ගැන කථා කරනවා.

ඊළඟ එක, ආයුර්වේද වෙදකම. ආයුර්වේද වෙදකම කියන්නේ සිංහල අපේ ඉතිහාසයේ ඉඳන්ම තිබුණු දෙයක්. දැන් මේ අලුත් පනතක් ගෙනැල්ලා ආයුර්වේදයේ ඉන්න අයට ඒ අනුව කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, මේ ආයුර්වේද වෙදකම ගියේ පවුලෙන් පවුලට. ඒ කියන්නේ, තාත්තා ආයුර්වේද කැඩුම් බිඳුම් වෙදකම සිදු කළා නම්, ඒ ආයුර්වේද වෙදකම ගියේ පවුලේ කෙනෙකුට; තමන්ගේ දරුවාට. තාත්තාගෙන් දරුවාට, දරුවාගෙන් ඔහුගේ දරුවාට. එහෙම තමයි ගියේ. දැන් අලුත් පනතක් ගෙනැල්ලා තිබෙනවා. ඒකට අනුව වයස අවුරුදු 70න් පසු ආයුර්වේද වෙදකම් කරන්න බැහැ. ආයුර්වේද වෙදකම වයස අවුරුදු 70න් පසු කරන්න බැහැ. හැබැයි, පද්මන් සුරසේනට වයස අවුරුදු 67 දක්වා කාලය දීර්ඝ කළාම ඔහුට පුළුවන් වැඩ කරන්න. හැබැයි, අර ආයුර්වේද දොස්තරලාට වයස අවුරුදු 70න් පසුව වැඩ කරන්න බැහැ. මේවා මොන කුණුහරුප ද දන්නේ නැහැ. මේවා වඳුරු කුණුහරුප. මේවාට කියන්නේ වඳුරු කුණුහරුප කියලා. එතකොට මේක දැන් අවුරුදු 70න් පස්සේ දීර්ඝ කරන්න එපා කියලා කියනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඊළඟට, දරුවන්ට දෙන්න බැරිලු, ලේ ඥාතීන්ට දෙන්න බැරිලු. පුදුම අණ පනත් තමයි ගෙනෙන්නේ.

ඊළඟ එක, අද සභානායකතුමා කිව්වා, - මරික්කාර් මන්ත්‍රීතුමනි, අර පෙන්වන්න එපා කියන්නේ, අපි පුරවන්නේ මොකක්ද?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
වත්කම් සහ බැරකම් ප්‍රකාශ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
හරි, වත්කම් සහ බැරකම් ප්‍රකාශ. ඉතින් ඔයගොල්ලන්ම නේ කිව්වේ, අපේ මේ හොරුන්ගේ වත්කම් සහ බැරකම් රටට පෙන්වන්න ඕනෑ කියලා. දැන් අපි ඒ ඔක්කොම පාර්ලිමේන්තුවට භාර දීලා Bribery Commission එකට යවලා තිබෙන්නේ. දැන් මොකක්ද කියන්නේ? දැන් කියනවා, ඒවා මේ රටේ සුළු මිනිසුන්ට දැනගන්න ඕනෑ නැතිලු. දැන් වත්කම් සහ බැරකම් පෙන්වන්න ලැහැස්ති කරන්න. මොකද, ලාල් කාන්ත ඇමතිතුමාගේ මන්ත්‍රී කාලයේ තිබුණු වත්කම් සහ දැන් තිබෙන වත්කම් ගැන අපි දැනගන්න ආසයි. ඒ වාගේම, අපේ කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමාගේ වත්කම් ගැන අපි දැනගන්න ආසයි. ඒ වාගේම අපේ පොළොන්නරුවේ රාජ්‍ය නායකයාගේ වත්කම් ගැන අපි දැනගන්න කැමැතියි. ඒ නිසා වත්කම් සහ බැරකම් පෙන්වන්න කියන්න. ඇයි දැන් අපට එකක්, ඒගොල්ලන්ට තව එකක්? අපි කැමැතියි, අපේ වත්කම් සහ බැරකම් පෙන්වන්න. දැන් ආයෙත් මොකක්ද කියන්නේ? ආයෙත් හංගලා ගහන්නේ ඇයි? වහලා ගහන්නේ ඇයි? කොළේ වහලා ගහන්න ඕනෑ නැහැ. අපි ගෙනාපු පනතට ආයෙත් සංශෝධන ගෙනෙන්න එපා. වත්කම් සහ බැරකම් පෙන්වමු. කාගෙත් - දෙගොල්ලන්ගේම - වත්කම් සහ බැරකම් පෙන්වා ගත්තාම හොඳයි නේ. මොකද, අපේ කාලයේ අපි වත්කම් සහ බැරකම් පෙන්නුවාම කිව්වා, අරවා ගත්තා, මේවා ගත්තා, මේවා ගත්තා කියලා. දැන් කියනවා ඒවා පෙන්වන්න ඕනෑ නැහැලු; කවුරුත් දැනගන්න ඕනෑ නැහැලු. මේක යකාගේ සෙල්ලමක් නේ. ඒ කාරණයත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අරුණ පනාගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.02]

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන් අද පාර්ලිමේන්තුවේ මේ වෙලාවේ විශේෂ පනත් කෙටුම්පත් දෙකක් විවාදයට ලක්වනවා. එයින් මම කැමැතියි, 1958 අංක 29 දරන සත්ව පනතට ගෙනෙන ලද සංශෝධනයට අදාළව යම් කරුණු දැක්වීමක් කරන්න. අපි කවුරුත් දන්නවා, මේ පනතට සංශෝධන ඉදිරිපත් කරද්දී, ගරු ලාල් කාන්ත ඇමතිතුමා මේ පනතට ගෙනෙන්න බලාපොරොත්තු වන මූලික සංශෝධන පිළිබඳව ඉතාම පැහැදිලිව මේ සභාවට කරුණු ඉදිරිපත් කළ බව. මේ පනත සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන්නේ ඇයි කියන කාරණාවට අදාළවත්, අපි කරන්න බලාපොරොත්තු වන්නේ කුමන සංශෝධනයක් ද කියන කාරණාව පිළිබඳවත් අපි කාටත් යම් අවබෝධයක් තිබෙනවා. මොකද, මේ පනත සම්මත කළාට පසුව පසුගිය කාලය පුරා කිසිදු සංශෝධනයක් සිදු කර නැහැ. ඒ නිසා එම පනත යාවත්කාලීන කරගන්න ඕනෑ වෙලා තිබෙන්නේ ඇයි කියන කාරණාව අපි කාටත් පැහැදිලියි. පසුගිය කාලය පුරා මේ පශු සම්පත් ක්ෂේත්‍රය පිළිබඳව, අපේ රටේ මේ ක්ෂේත්‍රයේ නියැළී සිටින ගොවීන්ට මේ පනත් සංශෝධනය නොවීම නිසා ඇතිවෙලා තිබෙන ගැටලු පිළිබඳව අපි නැවත නැවතත් හිතා බලන්න ඕනෑකම තිබෙනවා. මේ ක්ෂේත්‍රයට අදාළව අපි රජයක් විධියට ඉදිරියේදී කරන්න බලාපොරොත්තු වන යහපත් කාරණා වඩා හොඳින් සිදු කර මේ රටට යහපත් ප්‍රතිඵල අත්පත් කර දෙන්න කටයුතු කරනවා.

විශේෂයෙන් පසුගිය කාලයේ සූකර කර්මාන්තයට ඇතිවෙලා තිබුණු ගැටලු ගත්තොත්, රෝග සම්බන්ධයෙන් ගැටලුවක් ඇතිවෙලා සූකර කර්මාන්තය පහළට ඇද වැටුණා. සූකර නිෂ්පාදනයට සම්බන්ධ වෙලා හිටපු ගොවීන්ට විශාල පාඩු විඳින්න සිද්ධ වුණා.

අවසානයේ ඒ හැම එකකින්ම මේ රටේ ආර්ථිකයට දැවැන්ත බලපෑමක් එල්ල කළා. හැබැයි, අපි සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත මෙතැනදී සංවාදයට ලක් කරන කොට සූකරයින්ගේ ගැටලු, ඒ සතුන්ට ඇති වෙලා තිබෙන රෝගාබාධ ගැන කථා කරන්න කල්පනා කරන කොට, මේ පාර්ලිමේන්තුවේ ඒ සාකච්ඡාවට අදාළ ඉඩ කඩ විවර කර ගන්නේ නැතුව විපක්ෂය වෙනත් දේවල් ගැන කථා කරනවා. සූකර උණ නිසා තමයි එම කර්මාන්තයට විශාල ගැටලුවක් මතු වුණේ. මට සමහර වෙලාවට හිතෙනවා, මෙතැනත් ඒ උණ හැදුණු කට්ටිය ඉන්නවාද කියලා. මොකද, විපක්ෂයේ සමහර අය කථා කරන කොට අපට පෙනෙන්නේ සූකර උණ හැදිලා කථා කරනවා කියලායි. ඒ අය තමන්ගේ මන්ත්‍රී වරප්‍රසාද පාවිච්චි කරලා පාස්කු ඉරු දින ප්‍රහාරයට අදාළවත්, අනෙකුත් නඩු කටයුතුවලට අදාළවත් දී තිබෙන තීන්දු පිළිබඳව කට තිබුණු පළියට පහර ගහන්න, බොරු මත පතුරවන්න, ඒ විතරක් නොව වැරැදි අදහස් සමාජගත කරන්න මේ පාර්ලිමේන්තුවේ කාලය පාවිච්චි කරනවා. ඒක තමයි අපට පෙනෙන්නට තිබෙන්නේ.

විශේෂයෙන්ම, පසුගිය කාලයට අදාළව මේ රටේ සිද්ධ වෙලා තිබෙන දැවැන්ත අපරාධවලට, මහජන මුදල් මංකොල්ල කෑම්වලට හිරේට නියම වුවන්ට අදාළ සමහර නඩු තීන්දු පිළිබඳව විපක්ෂයේ සමහරු මෙතැනට ඇවිල්ලා කථා කරන්නේ මොකද? ඒ කරන්නේ විනිශ්චයකාරවරුන්ට තර්ජනයක් නේ. මෙතැනට ඇවිල්ලා, විනිශ්චයකාරවරුන් දුන් තීන්දු පිළිබඳව කියමින් ඔවුන්ට තර්ජනය කරනවා. අපි දන්නවා, ඒගොල්ලන්ගේ ආණ්ඩු කාලවලත් විනිශ්චයකාරවරුන්ට තර්ජනය කළ බව, ඒ අයට ගල් ගහපු බව, ඒ අයට හූ කියපු බව. ඒ කාලයේත් නඩු සම්බන්ධයෙන් උසාවි ඉස්සරහට ගිහිල්ලා විවිධ දේවල් කරලා, තර්ජනය කරපු සමහර අය අදත් මොකක්ද කරන්නේ? තමන්ගේ මන්ත්‍රී වරප්‍රසාද පාවිච්චි කරලා මෙතැන ඉඳගෙන විනිශ්චයකාරවරුන්ට තර්ජනය කරනවා. අද මේ රටේ විපක්ෂයට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? අපට පෙනෙන්න තිබෙන විධියට විපක්ෂයේ වැඩි දෙනෙකුට සූකර උණ හැදිලායි තිබෙන්නේ. ඒගොල්ලෝ කලබල වෙලා ඉන්නේ, භය වෙලා ඉන්නේ. සමහරු මරු කියවනවා. අද මේ රටේ කුමන ක්ෂේත්‍රයක වුවත් වැදගත් වෙනස්කමක් කරන්න ගියාම විපක්ෂය ඒකට කලබල වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වත්මන් රජය විධියට අපි මේ රට භාර ගන්නකොට මේ රට තිබුණේ ඉතාම නරක තැනකට ඇද දමලා. සෑම ක්ෂේත්‍රයකම ඉතාම නරක පැත්තක් තමයි දකින්න තිබුණේ. ඒ තුළින් අපේ රටේ ජනතාවට දැවැන්ත පීඩාවක් අත් පත් කර දෙමිනුයි තිබුණේ. විශේෂයෙන්ම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වුණත් මේ තත්ත්වය අපට පෙනෙන්නට තිබුණා. එම නිසා අද වත්මන් රජය විධියට අපි නොවිසඳුණු ගැටලු පිළිබඳව සොයා බලා, අදාළ පාර්ශ්වවලට පනත් මඟින් ඇති වෙන්න පුළුවන් අයහපත් ප්‍රතිඵල වෙනුවට යහපත් ප්‍රතිඵල අත් පත් කර දීම වෙනුවෙන් කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම, ඔවුන්ගේ කටයුතු සංවර්ධනය දිශාවට අරගෙන යන්න පුළුවන් වන විධියට පනත් සංශෝධනය කරලා දෙන්න, නිවැරැදි කරලා දෙන්න අපි සූදානම් වෙලා ඉන්නවා. ඒ වෙනුවෙන් තමයි අදත් මේ පාර්ලිමේන්තුවේ කාලය විවර වෙන්නේ. අපි ඒ විධියට කටයුතු කරන්න හදන කොට අද මේ විපක්ෂයට මොකක්ද වෙලා තිබෙන්නේ? විපක්ෂය මතක තබා ගන්න ඕනෑ, හොඳින් තේරුම් ගන්න ඕනෑ, 2024 සැප්තැම්බර් 21වැනි දායින් පසුව අපට පැවරුණු වගකීම මොකක්ද කියලා. මේ රටේ සියලු ක්ෂේත්‍රවල වෙනස්කම් ඇති කරමින්, මේ රට යහපත් දිශාවකට යොමු කරමින්, මේ රට ගොඩනඟන කාර්යය තමයි අපට පැවරුණේ. ඒ නිසා ගරු ජනාධිපතිතුමා, ජනාධිපතිවරයා හැටියට වගකීම් භාරගත් දවසේ ඉඳලා අපට කරන්න සිදුව තිබුණේ, මේ විපක්ෂය විසින් බංකොලොත් කරපු, විනාශ කරපු මේ රටේ සියලු දේ, අයහපත් පැත්තට හරවපු සියලු දේ නැවත වටයකින් යහපත් පැත්තකට කරකවලා, යහපත් දිශාවකට හරවලා මේ රටේ ජනතාවට පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් හදලා දෙන කටයුත්තයි. හැබැයි, ඒක කරන්න යන කොටම; එය කරන්න පටන් ගත්තු පළමුවැනි මොහොතේම ඉඳලා විපක්ෂය මොකක්ද කරන්නේ? ඒකට බාධා කරනවා, කඩාකප්පල් කිරීම් කරනවා, ජනතාව අතර බොරු මත පතුරුවන්නට කටයුතු කරමින් ඉන්නවා. මේ පාර්ලිමේන්තුවේ කාලය පාවිච්චි කරලා ඔවුන් වැරැදි දේවල්, බොරු සමාජගත කරනවා. ඒක තමයි මේ පෙනෙන්නට තිබෙන්නේ.

ගරු සභානායකතුමා අද උදෑසන මේ සභාව තුළ වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳව ප්‍රකාශයක් කළා. එතුමා බොහොම නිරවුල්ව කිව්වා, මහජන නියෝජිතයන්ගේ වත්කම් සහ බැරකම් සම්බන්ධව ජනතාවට දැන ගැනීමට තිබෙන අයිතිය කිසිසේත් වෙනස් කරන්නේ නැහැ කියලා. එහෙම කියා තිබියදීත් මේ සභාව තුළදීම මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා මොකක්ද කිව්වේ? එතුමා බොරුවක් සමාජගත කළා. වත්කම්, බැරකම් සම්බන්ධයෙන් මතු වෙලා තිබෙන සමහර කාරණා පිළිබඳව ගරු සභානායකතුමා බොහොම නිරවුල්, පැහැදිලි උත්තරයක් දුන්නා; සමහර රාජ්‍ය නිලධාරීන්ගේ ජීවිතවලට එල්ල වෙලා තිබෙන යම් යම් බලපෑම් වෙනස් කිරීම වෙනුවෙන් ඒ පනත ඉදිරි කාලයේදී සංශෝධනයට ලක් කරනවා කිව්වා. හැබැයි එතුමා එතැනදී බොහොම පැහැදිලිව කිව්වා, මහජන නියෝජිතයන්ට ඒක අදාළ නැහැ කියලා. එහෙම බොහොම පැහැදිලිව මේ ගරු සභාවට

[ගරු අරුණ පනාගොඩ මහතා]

කරුණු දක්වා තිබියදීත් මොකටද මේ බොරු කියන්නේ? ඒ, මහ ජනතාව නොමඟ යවලා වැරැදි මතයක් පතුරුවන්නයි. මේ විපක්ෂයේ බොහෝදෙනෙකු අද මේ උත්තරීතර සභාවේ කාලය මිඩංගු කරන්නේ මේ රටට බොරු කියන්නයි; මේ රටේ ජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය පාවිච්චි කරලා ජනතාවට වැරැදි තොරතුරු සම්ප්‍රේෂණය කරන්නයි. මොකක්ද මේ කරන්නේ? මේක මහා විගඩමක්; විහිළුවක්. අපි හිතනවා, විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේදී මීට වඩා වගකීම් සහගත වෙන්න ඕනෑ කියලා. ආණ්ඩුව කිසියම් කටයුත්තක් කරන්න හදද්දී එහි යහපත් දේ ගන්න. එහි නරක දෙයක් තිබෙනවා නම් පෙන්වා දෙන්න, ඒ සඳහා විවේචන ඉදිරිපත් කරන්න. එයට කිසිදු බාධාවක් නැහැ. හැබැයි, පාර්ලිමේන්තු රැස්වීම පටන් ගත්තු වෙලාවේ ඉඳලාම විපක්ෂය මොකක්ද කරන්නේ? වැරැදි කාරණා ජනගත කරලා, ජනතාව නොමඟ යවන, ජනතාව අනවශ්‍ය බියකට පත් කරන තැනකට ගේන්න තමයි ඔවුන් මේ පාර්ලිමේන්තුවේ කාලය පාවිච්චි කරන්නේ. ඒ වාගේම ඒ අය පාර්ලිමේන්තු මන්ත්‍රී වරප්‍රසාද පාවිච්චි කරලා, නඩු කටයුතුවලින් ගැලවිලා, උසාවියට පහර ගහලා, විනිසුරුවරුන් බියට පත් කරන ආකාරයේ ප්‍රකාශ මෙතැනදී සිදු කරනවා. අපේ රටේ විපක්ෂය මීට වඩා වගකීම් සහගත වෙන්න ඕනෑ කියා අපි හිතනවා.

විපක්ෂයේ මේ බොරු මඩ ප්‍රචාර, වැරැදි ජනගත කිරීම්වල එල්ලෙනවාට වඩා වැඩි වගකීමක් ආණ්ඩු පක්ෂය විධියට අපට තිබෙනවා. මහ ජනතාව අපට දුන්නු ජන වරම කුමක්ද කියා හඳුනා ගෙන, ජනතාවගේ ජීවිත යහපත් කිරීම වෙනුවෙන් නීති සම්පාදනය කරලා, ඇතැම් පනත් හේතුවෙන් ජනතාවට දීර්ඝ කාලයක් තිස්සේ මුහුණ දෙන්න සිද්ධ වෙච්ච ඇතැම් කාරණා නිවැරැදි කරලා, ඔවුන්ගේ කර්මාන්ත, ජන ජීවිත යථාවත් කිරීම වෙනුවෙන් අදාළ කටයුතු සම්පාදනය කර දීම තමයි අපට තිබෙන වගකීම. ඒ වෙනුවෙන් තමයි අපි 1958 අංක 29 දරන සත්ව පනත සංශෝධනය කිරීම සඳහා වන මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. එම පනතට ඉදිරිපත් කරන මේ සංශෝධනය හරහා කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ, විශේෂයෙන් පශු සම්පත් ක්ෂේත්‍රයේ නියැළී සිටින ජනතාවට විශාල පිටුවහලක් ලැබෙයි කියා අපි හිතනවා. එම නිසා මේ කෙරෙහි මේ ගරු සභාවේ කාගේත් අවධානය යොමු වෙලා, මේ කටයුතු ශක්තිමත් කිරීමට ඉඩ හසර ලබා දීම කළ යුතුයි කියා ප්‍රකාශ කරමින්, මට කාලය ලබා දුන්නාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
විනාඩි 5ක් නේද මට තිබෙන්නේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විනාඩි 4 යි.

[අ.භා. 2.12]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා හැටියට මා කිව යුතු කාරණයක් තිබෙනවා. බාල ගල් අඟුරු - ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු - ලංකාවට ගෙන ඒම පිළිබඳව දිගින් දිගටම පරීක්ෂණ සිදු කරලා ඒ පිළිබඳව නිකුත් කරපු වාර්තා ගැන අපි කියන කොට සමහර අය කිව්වා, අන්න බොරු කියනවා, වගකීමෙන් තොර ප්‍රකාශ සිදු කරනවා කියලා. අපි ඊයේ ඒ කාරක සභාව රැස් වෙච්ච වෙලාවේ ඒ කාරණය ගැන කථා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මුලදී අපි කිව්වා ලක්විජය බලාගාරයේ Reports තමයි හරි කියලා. එතකොට සමහර අය ආණ්ඩුව බේරා ගන්න කිව්වා, ලක්විජය බලාගාරයට accreditation නැහැ, ඒ නිසා ඒ වාර්තාවල කියන ඒවා වැරැදියි කියලා. ඒ අනුව අපි උපදෙස් ලබා දීලා Bureau Veritas International Trade Australia Pty. Limited එකෙන් තුන්වැනි පාර්ශ්වයේ පරීක්ෂණයක් කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාර්තාව අනුව ගත්තාම, නැව් 19ම failed. ඒ එක නැවකවත් කිලෝ කැලරි 5,900 නැහැ. පළමුවෙනි නැවේ කිලෝ කැලරි 5,420යි; දෙවැනි නැවේ 5,607යි; තුන්වැනි නැවේ 4,901යි; හතරවැනි නැවේ 5,389යි; පස්වැනි නැවේ 5,503යි; හයවැනි නැවේ 5,011යි; හත්වැනි නැවේ 4,762යි; අටවැනි නැවේ 4,776යි; නවවැනි නැවේ 4,929යි; දහවැනි නැවේ 4,959යි; එකොළොස්වැනි නැවේ 4,831යි; දොළොස්වැනි නැවේ 4,858යි; දහතුන්වැනි නැවේ 4,959යි; දහහතරවැනි නැවේ 4,897යි; පහළොස්වැනි නැවේ 5,822යි; දහසයවැනි නැවේ 4,871යි; දහහත්වැනි නැවේ 5,789 ; දහඅටවැනි නැවේ 5,340යි; දහනවවැනි නැවේ 4,943යි. මේවා මම කියන ඒවා නොවෙයි. මේක ආණ්ඩුව තුන්වැනි පාර්ශ්වයකින් - Bureau Veritas International Trade Australia Pty. Limited එකෙන් - ගත්තු Report එකක්. මම මේ ලියවිල්ල එහෙම පිටින්ම සභාගත කරන්නම්. ඒ නැව් 19හිම ගෙනාවේ බාල ගල් අඟුරු. දැන් අරගේ මෙහේ අතගාන්න එන්න එපා. ඒ නැව් 19හිම ගෙනාවේ බාල ගල් අඟුරු බව දැන් ඔප්පු වෙලායි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක මම කියන කාරණාවලින් තවත් එකක්. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සඳහන් කර තිබෙනවා, ජනවාරි මාසයේ 01වන දා ඉඳලා ජුනි මාසයේ 30වන දා දක්වා බාල ගල් අඟුරු ගෙන ඒම නිසා මෙගාවොට් 300ක් නිෂ්පාදනය කරන්න බැරි වීම හේතුවෙන් වූ අඩුව පියවන්න ඩීසල් සහ furnace oil බලාගාරවලින් විදුලිය මිල දී ගන්න රුපියල් මිලියන 8,536ක් වැඩිපුර ගිහිල්ලා තිබෙනවා කියලා. මේ බාල ගල් අඟුරු එළඹෙන සැප්තැම්බර් මාසයේ 12වන දා වනකල් පාවිච්චි කරන්න වෙනවා. එතකොට මේකෙන් විතරක් සිදු වන පාඩුව රුපියල් මිලියන 10,000කට වඩා වැඩි වෙනවා. ඒ වාගේම, බාල ගල් අඟුරු ගෙන්වීම නිසා-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

Emergency procurement කරලා ගෙනාපු ඒ එක නැවකට කොච්චර මුදලක් වැය කර තිබෙනවාද බලන්න. සාමාන්‍යයෙන් ගල් අඟුරුවලින් නිෂ්පාදනය කරන විදුලි ඒකකයකට වැය වන්නේ රුපියල් 20යි. දැන් එය රුපියල් 23ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. දැන් අපට ආරංචි වෙනවා, බාල ගල් අඟුරු භාවිතය නිසා යන්ත්‍ර සූත්‍රවලට හානි සිදු වෙමින් පවතිනවා කියලා. ඒවාත් ගණනය කළාම මේ අලාභය සැහෙන ප්‍රමාණයක් දක්වා වැඩි වෙනවා. කලින් ගෙනාපු Russian ඒවාත් එක්ක mix කරලායි ඒ බාල ගල් අඟුරු පාවිච්චි කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බාල ගල් අඟුරු ගෙන්වීම නිසා වූ පාඩුව ජනවාරි මාසයේ මිලියන 184යි; පෙබරවාරි මාසයේ මිලියන 513යි; මාර්තු මාසයේ මිලියන 3,460යි; අප්‍රේල් මාසයේ මිලියන 2,105යි; මැයි මාසයේ මිලියන 866යි. ජුනි මාසයේ 30වන දා වනකල් පාඩුව මිලියන 1,409යි. ජූලි මාසයේ, අගෝස්තු මාසයේ පමණක් නොවෙයි සැප්තැම්බර් මාසයේ 12වන දා වනකල්ම පාඩු වෙනවා. ඔන්න ඔහොම තමයි system change කෙරුවේ. ඇවිදින පුස්තකාල ඇවිල්ලා ඇමතිකම් කරලා ලංකා ඉතිහාසයේ පළමු වතාවට දෙපාරක් කරන්ට් බිල වැඩි කරන්න වුණේ බාල ගල් අඟුරු ගෙනාපු නිසායි. පුළුවන් නම් දැන් කියන්නකෝ, බාල ගල් අඟුරු ගෙනාවේ නැහැ කියලා? ඉහත කී ලේඛන සියල්ල මම **සභාගත*** කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් කුමාර ගමගේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.17]

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපේ විවාදයට අදාළ මාතෘකා වන්නේ, 1958 අංක 29 දරන සත්ව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සහ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතයි. මා හිතන විධියට, මරික්කාර් මන්ත්‍රීතුමාට මොකක් හරි පටලැවිලා ගල් අඟුරු විවාදය දවසේ කරන්න තිබුණු කථාවක් අද කළා. මම බැලුවා මට වැරැදිලා ද කියලා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

* **පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මට වැරැදිලා නැහැ, ගරු ඇමතිතුමා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ගල් අඟුරුවලින් ජනතාවට වරද්දපු එක පෙන්වන එක වැරැදිද? රිදෙනවාද එතකොට? අර ලාල් කාන්ත ඇමතිතුමා වාගේ අහගෙන ඉන්නකෝ.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
නැහැ, මට ඔබතුමා පිළිබඳ ප්‍රශ්නයක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මම මේ කිව්වේ අද තිබෙන විවාදයට අදාළ මාතෘකාව සහ ඔබතුමාගේ කථාව අතර තිබුණු වෙනස ගැනයි. ඒ ප්‍රශ්නයයි මට තිබුණේ. එහෙම නැතුව, ඔබතුමාගේ තර්කය පිළිබඳව නොවෙයි මා කියන්නේ. අප අද සාකච්ඡා කරන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත සහ සත්ව පනත සංශෝධනය කිරීම ගැනයි. ඒකයි මා පැහැදිලි කළේ. ඉතින්, විපක්ෂය දැන් වැටී තිබෙන තැන ගැන අපට හිතාගන්න පුළුවන් නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකාවේ ජනතාවට අත්‍යවශ්‍ය විශාල සේවාවක් සපයන ආයතනයක්; ලංකාවේ දීර්ඝ කාලයක් තිස්සේ පැවැත එන හොඳම ආයතනයක්. ඒ වාගේම, හොඳ, දක්ෂ සේවකයන් පිරිසක් ඉන්න, දක්ෂ කළමනාකරණයක් සහිත ආයතනයක්. හැබැයි මෙය දශක ගණනාවක් තිස්සේ විනාශයට පත් වෙමින්, වංචාවට දූෂණයට ලක් වෙමින් පැමිණි ආයතනයක්. ඒ බවට ඕනෑ තරම් කරුණු ඉතිහාසයේ තිබෙනවා. ඒ සියල්ල සිද්ධ වුණේ පසුගිය ආණ්ඩු සහ ඒ පැවැති දේශපාලන බල අධිකාරිවල තිබුණු තත්ත්වයන් නිසා. අපි විශ්වාස කරනවා, අපේ ආණ්ඩුව බලය ගත්තාට පස්සේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ හොඳ සහ දක්ෂ සේවකයන්ගෙන් වැඩ අරගෙන, දැන් ඒ ආයතනය හරි track එකට දාලා, දැන් මේ වැඩේ හරියට කරගෙන යනවා කියලා. සංඛ්‍යාලේඛන, දත්ත සහ තොරතුරු අනුව අපට ඒක පෙනෙන්න පටන් අරගෙන තිබෙනවා.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විශාල මුදල් වංචා, ප්‍රශ්න ඇති වෙච්ච අංශයක් තමයි, ව්‍යාපෘති අංශය. අපි ඒවාට කියනවා "සුදු කරපටි" වංචා කියලා. ඒ සමහර වංචා තිබෙනවා, නඩු දාලා, උසාවියේ තර්ක කරලා ඔප්පු කරන්න බැරි වංචා. මෙහෙම ආයතනවල වංචා කරන්න පුළුවන්. එහෙම කරලා තිබෙනවා. අතීතයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේත් ඒ වාගේ විශාල වංචා සිදු වුණු, දූෂණ සිදු වුණු ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් අපට හම්බ වෙනවා.

අපි ආණ්ඩු බලය ගන්න කොට විවිධ ප්‍රශ්න නිසා නවත්වලා තිබුණු ව්‍යාපෘති 11ක් අපි නැවත පටන් ගන්නවා. ඒ පටන් ගන්න ව්‍යාපෘතිවලට මුදල් වෙන් කරන්නේ කොහොමද? කලින් ආණ්ඩු කිය කියා හිටියේ මහා භාණ්ඩාගාරයේ සල්ලි නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සමහර අවුරුදුවලට අය වැයෙන් මුදල් වෙන් කරනවා. හැබැයි, සල්ලි ඉල්ලන්න ගියාම Treasury එක සල්ලි නැහැ කියනවා, වැඩේ කරන්න බැහැ. නමුත්

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

අපේ ආණ්ඩුව ආවාට පස්සේ අපි 2026 අවුරුද්දට භාණ්ඩාගාරයෙන් රුපියල් බිලියන 21ක් වෙන් කළා, මේ ව්‍යාපෘති ටික හදලා ඉවර කරන්න. මේවා ජනතාවගේ බදු මුදල්. මේක ජනතාවට පානීය ජලය දෙන්න තිබෙන ආයතනයක්. මේ වාගේ ව්‍යාපෘතිවල වැඩ ඉතා අකාර්යක්ෂම විධියට කෙරෙමින් තිබුණා. මම එක උදාහරණයක් විතරක් කියන්නම්. එක ව්‍යාපෘතියක් තිබුණා, පොල්ගහවෙල-පොතුහැර ව්‍යාපෘතිය කියලා. මේ ව්‍යාපෘතිය award කරන්නේ 2014 මාර්තු මාසයේ. මේ ව්‍යාපෘතිය advance කරලා පටන් ගන්නවා, 2017 අවුරුද්දේ. අපි බලය ගන්නකොටත් මේ ව්‍යාපෘතිය තිබුණා. 2014 award කරලා, 2017 පටන් ගත්ත ව්‍යාපෘතිය අපි බලය ගන්නකොටත් ක්‍රියාත්මක වෙනවා. හැබැයි, ඒ ව්‍යාපෘතියේ කාලය අවුරුදු තුනයි. එහෙම නම් 2017 පටන්ගත්ත ව්‍යාපෘතිය 2020දී ඉවර වෙන්න ඕනෑ. මේ පටන් ගත්ත බොහෝ ව්‍යාපෘතිවලට නියමිත කාලය වාගේ දෙතුන් ගුණයක කාලයක් අරගෙනත් මේ වැඩ කෙරුණේ නැහැ.

අපි බලයට ආවාට පස්සේ අපි ලබපු ආර්ථික ජයග්‍රහණත් එක්ක මහා භාණ්ඩාගාරය එකතු කරගත් මුදල් යොදවලා මේ ව්‍යාපෘති වහ වහා පටන් ගත්තා. මම හිතන හැටියට ඒ අනුව පොල්ගහවෙල-පොතුහැර ව්‍යාපෘතිය අපට මේ අවුරුද්දේ ඉවර කරන්න පුළුවන් වෙනවා. තව මාස එකහමාරකින් අවසන් කරනවා කියලා ඇමතිතුමා කියනවා. මම මේවා කියන්නේ අකාර්යක්ෂම සහ නාස්තිකාර විධියට වැඩ කරපු ආණ්ඩුවක බලය මාරු වුණාට පස්සේ, අපි වාගේ ආණ්ඩුවක් වැඩ කරන විධිය විපක්ෂයේ අයට පෙන්වන්නයි. ඕනෑ නම් මේ වාගේ තව උදාහරණ අපට ඕනෑ තරම් කියන්න පුළුවන්. නමුත් මට තිබෙන කාලය මදි හින්දා මම එක උදාහරණයක් විතරයි අරගත්තේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ වාගේම පටන් ගත්ත තව ව්‍යාපෘතියක් තිබුණා, "Water for All" කියලා. අපි ඒ දවස්වල ඒකට කිව්වේ, “waterfall” කියලා. මොකද ඒක ඒ වාගේ අතිශය නාස්තිකාර ව්‍යාපෘතියක්. තවමත් ඒ බට තිබෙනවා ඒවායින් කර ගන්නේ මොකක්ද කියලා හිතාගන්න බැරුව. මෙන්න මේ වාගේ නාස්තිකාර වැඩ විශාල ප්‍රමාණයක් පසුගිය ආණ්ඩුවලින් සිද්ධ වුණා. අපේ ආණ්ඩුව දැන් ඒවා නිවැරැදි කරලා තිබෙනවා. විශේෂයෙන් ඒ කාලයේ තිබුණා, unsolicited proposalsවලින් ව්‍යාපෘති පටන් ගන්න ක්‍රමයක්. අපේ ආණ්ඩුව ආවාට පස්සේ unsolicited proposals එකකින්වත් ව්‍යාපෘති පටන් ගත්තේ නැහැ. ඒ "ගේම්" ගහන ව්‍යාපෘති අපි ළඟ නැහැ. ඒක නිසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය දැන් හරි track එකේ, හරි විධියට වැඩ කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒක නිසාම අපි 2025 අවුරුද්දෙන් පස්සේ අලුත් ව්‍යාපෘති කිහිපයක් පටන් අරගෙන තිබෙනවා. ඒ ප්‍රධාන එකක් තමයි, එප්පාවල-ගිරිබාව ව්‍යාපෘතිය. ඒක අපි අලුතින් පටන් ගත්තා. ඒ වාගේම Climate-Resilient Sustainable Water Supply and Sanitation Project කියලා ව්‍යාපෘති 5ක් එකතු කරලා අපි ව්‍යාපෘතියක් පටන් ගත්තා. විදේශීය මූල්‍ය ආයතනවලින් ණය මුදල් ලබා ගත්ත ව්‍යාපෘති හැර මේ බොහෝ ව්‍යාපෘතිවලට මහා භාණ්ඩාගාරයෙන් තමයි අපි මුදල් වෙන් කරන්නේ. මොකද, මේ කෙටි කාලය තුළ ඒ ආර්ථික හයිය, මේ රටේ ආයෝජනය කරන්න පුළුවන් මූල්‍ය හයිය අපේ ආර්ථිකය තුළ අපි අත්පත් කරගෙන තිබෙනවා. ඒක තමයි අපි ලබපු විශාල ජයග්‍රහණය. ඒවා අපි ඔප්පු කරන්නේ මෙතැනට ඇවිල්ලා කෑ ගහන අයට දැනෙන්න නොවෙයි. මහජනතාවට දැනෙන්න, ආයතනවලට දැනෙන්න, ඒවායේ ඉන්න සේවකයන්ට දැනෙන්න තමයි අපි වැඩ කරමින් යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කියන්න සන්තෝෂයි, අපේ ආණ්ඩුව යටතේ, අපේ රජය යටතේ 2025 අවුරුද්දේ ජාතික ජල සම්පාදන මණ්ඩලය ඉතිහාසයේ ලබපු වැඩිම ලාභය වශයෙන් අත්පත් කර ගන්නවා, රුපියල් බිලියන 31ක්. මේක තමයි ජල සම්පාදන මණ්ඩලය ඉතිහාසයේ ලබා ගත්ත වැඩිම ලාභය. ඒ නිසා අපි ආණ්ඩුව කරනකොට, මෙන්න මේ වාගේ ආයතන දියුණු වෙනකොට ඒක බලා ගෙන ඉන්න බැරි කණ්ඩායමක් කොහොමත් ඉන්නවා. මොකද, ඒගොල්ලන්ට කියන්න දෙයක් නැති නිසා. ඇයි අපි මේ ලාභ ලබන්නේ? අපි ලාභ ලබන්නේ අපේ ආයතනවල වංචාව, දූෂණය, හොරකම දැන් සහමුලින් නවත්තලා තිබෙන නිසා. ඒක දැන් හැමෝම දන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි 2024 සැප්තැම්බර් මාසයේ බලය ගත්තාම, එදා සිටම මිනිස්සු වංචාවට, දූෂණයට බය වුණා. මිනිස්සු වැඩ කරන්න පටන් ගත්තා. මොකද, අපේ රටේ මිනිස්සු දැනගෙන හිටියා 2024දී එන ආණ්ඩුවත් එක්ක සෙල්ලම් කරන්න බැහැ, හොරකම් කළොත් අපට "කේස්" වෙනවා කියලා. ඒ නිසා එ ආයතනවල වැඩ කරන මිනිස්සු සූදානම් වුණා වංචා නොකර, දූෂණය නොකර කාර්යක්ෂමව වැඩ කරන්න. අපි සතුටු වෙනවා ජල සම්පාදන මණ්ඩලය වාගේ ආයතනයක් ලංකා ඉතිහාසයේ වැඩිම ලාභ ලබපු ආයතනය බවට අපේ ආණ්ඩුව යටතේ පත් කරන්න පුළුවන් වෙච්ච එකට. ඒ වෙනුවෙන් අපි ඒ සේවකයන්ට, කළමනාකරණ මණ්ඩලයට ඇත්තටම ස්තුති කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේකේ තිබුණා SoR එකේ ප්‍රශ්නයක්; මිනිස්සු බඳවා ගැනීමේ ප්‍රශ්නයක්. ජල සම්පාදන මණ්ඩලයේ තිබුණු මේ ප්‍රශ්නය 2011 ඉඳලා ඇදුණා. නමුත් උත්තර හොයන්න බැහැ. පසුගිය කාලයේ එක සභාපතිවරයෙක් කිව්වා, "මේක කවුරු හරි කළොත් මම උඩ තට්ටුවෙන් පහළට පනිනවා" කියලා. ඒ තරම් ඒක කරන්න අමාරුයි. හැබැයි, අපේ ආණ්ඩුව ඇවිල්ලා 2025 වෙනකොට මේ SoR එක හදලා, මේ සේවකයන්ගේ ප්‍රශ්නය විසඳලා, interview තියලා, අලුත් තනතුරුවලට පත් කරලා මේ 2011 ඉඳලා ඇදි ඇදී තිබුණු ප්‍රශ්නය අපි ඉවර කළා. ඒ වෙනකොටත් සමහර වැදගත් තනතුරුවල එක එක්කෙනා acting හැටියට හිටියේ. Acting හැටියට හිටපු තනතුරු විශාල ප්‍රමාණයක් මණ්ඩලයේ තිබුණා, මේ SoR එකේ ප්‍රශ්නය නිසා. අපි බලය ගත්තාට පස්සේ දශක ගණනාවක් තිබුණු ප්‍රශ්නයක් අපි විසඳලා තිබෙනවා. මම හිතන විධියට, ඒක තමයි අපට ආණ්ඩු කරන්න පුළුවන්, අපට කළමනාකරණය තේරෙනවා, අපට ප්‍රශ්න විසඳන්න පුළුවන් හැකියාවක් තිබෙනවාය කියන එක අපේ රටට, සමාජයට ඔප්පු කරන්න උදාහරණයක් හැටියට තිබෙන්නේ. ඒ නිසා තමයි මම මේ සාක්ෂි සහිතව කථා කරන්නේ.

ඒ වාගේම මෙහි manpower සේවක ප්‍රශ්නයක් තිබුණා. ඒ සේවකයන්ද අභ්‍යන්තර සේවකයන් විධියට සලකලා, ඒ සේවකයන්ද මේ ආයතනයට බඳවා ගන්න අවශ්‍ය වැඩ කටයුතු කරන්න අපි බලයට ආවාට පස්සේ එකඟ වුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ ගත්ත අයගේ දේශපාලනය මොකක්ද කියලා අපි බැලුවේ නැහැ. අපි මේ අය එළෙව්වේ නැහැ. පරණ ආණ්ඩුවලින් පොරොන්දු දීලා ගෙන්වාගෙන බඳවා ගත් කට්ටියත් හිටියා. හැබැයි, ඒ සියලු දෙනාටම අපි සාධාරණය ඉෂ්ට කළා, අපි දේශපාලන පළිගැනීම් කළේ නැහැ. ඒක තමයි අපේ දේශපාලන ක්‍රමවේදය; සදාචාරය. ලංකාවේ ප්‍රධාන ආයතනයක් වන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අපේ ආණ්ඩු කාලය තුළ ඉතා කාර්යක්ෂමව, හොඳින් ජනතාවට සේවය කරන ආයතනයක් බවට පත් වෙලා තිබීම ගැන, ලාභ ලබන ආයතනයක් බවට පත් වෙලා තිබීම ගැන අපි සතුටු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.29]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ගරු ඇමතිතුමා සඳහන් කළා, ජල සම්පාදන මණ්ඩලය අද සුරපුරයක් කියලා. ඇත්තටම එහෙම සුරපුරයක් වෙනවා නම් අපිත් කැමැතියි. ඔබතුමන්ලා ආවේ එහෙම සුරපුරයක් කරනවා කියලා තමයි.

හැබැයි, මැන්පවර් සේවක මහත්වරුන්ගේ ප්‍රශ්නයක් පිළිබඳව එතුමා සඳහන් කළා. අදටත් මැන්පවර් සේවක මහත්වරුන් ස්ථිර සේවයට බඳවා ගෙන නැහැ. ඔවුන් තමයි අවුරුදු 12ක්, 13ක් තිස්සේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ප්‍රාදේශීයව සිදු කරන හැම කටයුත්තක්ම සිදු කරන්නේ. ඔවුන් නැත්නම් අද වනවිට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විධියට එම කටයුතු කරන්න හැකියාව නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. ගරු ඇමතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා, ඒ පිළිබඳව සොයා බලනවා කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට ඇවිත් අවුරුදු දෙකක් වෙනවා. ඒ නිසා පුළුවන් නම් ඒ මැන්පවර් සේවක මහත්ම-මහත්මීන් ස්ථිර කිරීමේ කාර්යභාරය ඔබේ ආණ්ඩු කාලය තුළ සිදු කරන්නය කියා මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මොකද, ඒ තරම්ම සුවිශේෂී කාර්යභාරයක් ඔවුන් මේ මොහොත වනවිටත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ඉටු කරනවාය කියන කාරණයත් මා සිහිපත් කරනවා.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත අද දින දෙවන වර කියවීම සඳහා ගෙන ඒම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. ඒ පිළිබඳව අපේ එකඟත්වය පළ කරනවා. අපේ ගරු ඇමතිතුමා කිව්වා, සල්ලි තිබෙනවා කියලා. එහෙම සල්ලි තිබෙනවා නම්, ගාල්ලේ ජල ප්‍රශ්නයත් 2027 වසර වෙනකම් ගෙනියන්නේ නැතුව අපට ඉක්මනින්ම විසඳා දෙන්න කියාත් අපි ඉල්ලා සිටිනවා. ඒ වාගේම අපි තව ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම අද නිවෙස්වලට ලැබෙන වතුරවල තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි ඒවා මඩ වතුර, එහෙම නැත්නම් බීමට නුසුදුසු ජලය වීම. ඒ නිසා, සල්ලි තිබෙනවා නම් අපේ අහිංසක මිනිස්සුන්ට වතුර filters ලබා දීලා පිරිසිදු ජලය පානය කරන්න ඉඩ සලසා දෙන්න කියා අපි ඔබෙන් ඉල්ලා සිටිනවා. අපි ගෞරවනීයව එම ඉල්ලීම කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1958 අංක 29 දරන සත්ව පනත සංශෝධනය කිරීමට ඉදිරිපත් කර තිබීම පිළිබඳව මම නැවත වතාවක් ස්තුතිවන්ත වෙනවා. මේ මොහොතේ පළමුවෙන්ම අපි ඒ පිළිබඳව අපේ එකඟත්වය, ස්තුතිය පුද කරන්නට කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ඒකටත් එකඟ වන ගමන් ඉදිරියේදී ගෙන ඒමට නියමිත සත්ව සුබසාධන පනත් කෙටුම්පත ගැනත් යමක් සඳහන් කළ යුතුයි. ඒ මඟින් සංස්කෘතිමය අංශ සම්බන්ධයෙන් සිදු කරන්නට බලාපොරොත්තු වන ඒ කටයුතුවලට අපි අපේ දැඩි විරෝධය මේ මොහොතේ පළ කරනවා. මේ මොහොත වනවිට කථා වන ඒ කාරණාවට අපේ විරෝධය පළ කරන්නට ඕනෑ. අපි එම කාරණයට විරුද්ධ වෙනවා වාගේම, ඇත්තටම මේ තිබෙන බරපතළ ප්‍රශ්නය මහජන නියෝජිතයන් විධියට අපි මේ සභාවේදී පෙන්වා දෙන්නට ඕනෑ බවත් මේ මොහොතේ කියන්න කැමැතියි.

පළමුවෙන්ම මා කියන්න ඕනෑ, අපි සතුන්ට ආදරය කරන කණ්ඩායමක් බව. ඒ වාගේම සතුන්ට වන හිංසනයට, සත්ව ඝාතනයට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධ බවත් සඳහන් කළ යුතුයි. අපි ඇත්ත කථා කරන්නට ඕනෑ. අද අපි කැමති වුණත්, අකමැති වුණත්, අපේ රටේ මස් පිණිස සතුන් ඝාතනය කරන්න නීතිමය වශයෙන් අනුමැතිය දීලා තිබෙනවා. එහෙම රටක අද එක සත්ව කොටසකට විතරක් විශේෂ ආරක්ෂාවක් දීලා, අනෙක් සතුන්ට සිදු වන හිංසනය ගැන අපි කථා නොකළොත් ඒක සාධාරණද කියා මේ මොහොතේ අපි අහනවා. අලියෙකුට දම් වැලක් දමා තිබෙනකොට වේදනාව දැනෙනවා වාගේම අනෙක් සතුන්ටත් වේදනාව කියන එක දැනෙනවා. මේ ආණ්ඩුව දෙවිධියකට මේ කටයුතු කරන්නේ ඇයිද කියන කාරණය අපි අහනවා.

ඒ වාගේම මා විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ, මේ කාරණයත්. ඔබතුමන්ලා අලුතින් හඳුන්වා දෙන සත්ව සුබසාධන පනත් කෙටුම්පත තුළ සතුන්ගේ කකුල්වලට ලණුවක් හෝ දම් වැලක් දැමීම වරදක් ලෙස හුවා දක්වා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පිටුපස තිබෙන්නේ අපේ ඓතිහාසික, සංස්කෘතික අංශවලට, එහෙම නැත්නම් අපේ ආගමික සම්ප්‍රදායයන්ට වක්‍රාකාරයෙන් පහර දීමක්ද කියන කාරණය අපි අහන්න ඕනෑ. මහනුවර ඓතිහාසික ශ්‍රී දළදා පෙරහැර කියන්නේ රජ කාලයේ සිට පැවත එන අපේ උරුමයක්; අපේ ජාතික අනන්‍යතාවක් බව අපි දන්නවා.

අද ඔබතුමන්ලාගේ ආණ්ඩුව ගෙන එන්න හදන මේ පනත තුළින්, අපේ අලි-ඇතුන් පෙරහැරවල් සඳහා යොදා ගැනීමට යම් විරෝධයක් ගෙන එන්න ඔබ උත්සාහ ගන්නවාද කියන කාරණය අපි අහන්න ඕනෑ. මෙවැනි පනත් ගෙනැල්ලා අපේ ආගමට, අපේ සංස්කෘතියට යම් කිසි විධියකින් වක්‍රාකාරයෙන් පහර දෙන්න හදනවාද කියන කාරණය අපි මේ මොහොතේ අහනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම ග්‍රාම නිලධාරින් පිළිබඳව ප්‍රශ්නයට අද ඔබතුමන්ලාගේ ආණ්ඩුව "බීරි අලින්ට වීණා වයනවා වාගේ" නෑසුණා සේ ඉන්නවා. අද ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන්ගේ ප්‍රවාහන දීමනාව රුපියල් 600ක් වශයෙන් තිබෙන්නේ. ඒ මුදල වැඩි කරලා දෙන්න කියලා, ඔවුන් මාස ගණනක් තිස්සේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගෙන යමින් සිටිනවා. හැබැයි, ඔබතුමන්ලා ඊට ඇහුම්කන් දෙන්නේ නැහැ. ඔවුන් ඉතා විශිෂ්ට කාර්යභාරයක නිරත වෙනවා. ගමේ හැම ගැටලුවකදීම ඔවුන්ගේ කාර්යභාරය ඉෂ්ට කරන්න, ඔවුන් හැම තැනකදීම ඉදිරිපත් වෙනවා. හැබැයි, අද ඔවුන්ගේ රුපියල් 600ක් වූ ප්‍රවාහන දීමනාව වැඩි කරන්න ඔබතුමන්ලා කටයුතු කරලා නැහැ.

ඒ වාගේම, සංවර්ධන නිලධාරි මහත්ම මහත්මීන් මුහුණ දීලා තිබෙන ගැටලුවක් පිළිබඳවත් මේ මොහොතේ මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි. රජයේ ප්‍රජා සංවර්ධන නිලධාරින්ට පැවරී ඇති රාජකාරි සම්බන්ධයෙන් මේ දක්වා විධිමත් රාජකාරි පැවරීමක් සිදු කරලා නැහැ. ඒ නිසා ඔවුන්ගෙන් ඉටු විය යුතු මහජන කාර්යභාරයන් මේ මොහොත වන විට ලැබෙන්නේ නැති තැනට පත් වෙලා තිබෙනවා. ඒ නිසා සංවර්ධන නිලධාරින්ගේ වෘත්තීයභාවය වෙනුවෙන් කටයුතු කරන්න කියලා අපි ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම ඉතා ගෞරවයෙන් තව එක ඉල්ලීමක් කරනවා. ඊශ්‍රායල රැකියාවල නිරත වීමට බලාගෙන සිටින, අනාගතයේදී ඒ වරම ලබා ගන්න සිටින තරුණ තරුණියන් අද පොල්දූව මංසන්ධියේ උද්ඝෝෂණයක් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මේ මොහොතේ ඒ ගැනත් සිහිපත් කරන්න, විනාඩියක් දෙන්න.

පසුගිය රජයන් විසින් සියයට 70ක් ඊශ්‍රායල රැකියා සඳහා රජයෙන් යැව්වා. සියයට 30යි, පෞද්ගලික අංශයට දුන්නේ. 2024 වර්ෂයේ රජයෙන් 5,235ක් යැව්වා. පෞද්ගලික අංශයෙන් 434යි යැව්වේ. 2025 වර්ෂයේ රජයෙන් 4,143ක් යැව්වා. පෞද්ගලික අංශයෙන් යැව්වේ 2,347යි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2026 වර්ෂයේ රජයෙන් ඊශ්‍රායල රැකියා සඳහා යවලා තිබෙන්නේ 236යි. පෞද්ගලික අංශයෙන් 2,946ක් යවලා තිබෙනවා. අද ඒ චක්‍රය අනෙක් පැත්තට හරවලා තිබෙනවා. ඒ නිසා අපි ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ ඊශ්‍රායල රැකියා සඳහා ඔබේ අවධානය යොමු කරලා, මේ තරුණ තරුණියන්ට ඒ ඉඩකඩ ලබා දෙන්න කියලා.

මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීමනි, ඔබතුමා විනාඩියක් වැඩිපුර ගත්තා.

මීළඟට, සෙල්ලතම්බි තිලකනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. UPUL KITHSIRI took the Chair.*

[பி.ப. 2.36]

**ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் விலங்குகள் சட்டத்தில் திருத்தங்கள் மேற் கொள்ளப்பட உள்ளன. விலங்குகள் சட்டம், விலங்கு நோய்கள் சட்டம், விலங்கு உணவுச் சட்டம் என இலங்கையில் பல சட்டங்கள் விலங்குகள் தொடர்பாகக் காணப்படுகின்றன. 1958ஆம் ஆண்டின் 29ஆம் இலக்க, விலங்குகள் சட்டத்தில் விலங்குகளை ஏற்றிச் செல்வது தொடர்பில் திருத்தமொன்று கொண்டுவரப்பட்டுள்ளது. 1958ஆம் ஆண்டு உருவாக்கப்பட்ட விலங்குகள் சட்டத்தில் 'விலங்கு' என்பது பசுவையும் எருமையையுமே குறிக்கும். ஆடு, பன்றி, செம்மறியாடு போன்ற விலங்குகளை ஏற்றிச் செல்வதற்கு எந்தவிதமான தடைகளும் காணப்படவில்லை. இதன் காரணமாக, இலங்கையில் ஒரு பிரதேசத்தில் காணப்படும் விலங்கு சார்ந்த நோய் மற்றைய பிரதேசங்களுக்கு இலகுவாக பரவக்கூடியதாக இருந்தது. ஆனால், தற்பொழுது எங்களால் கொண்டுவரப் படுகின்ற சட்டத் திருத்தத்தின்மூலம் ஒரு பிரதேசத்தில் காணப்படுகின்ற நோயை ஏனைய பிரதேசங்களுக்கு காவிச் செல்ல முடியாத நிலைமை ஏற்பட்டுள்ளது.

விலங்குகள் சட்டத்துக்குக் கொண்டுவரப்படுகின்ற திருத்தத்தின்மூலம் ஆடு, செம்மறியாடு, பன்றி போன்ற விலங்குகள் திருடர்களால் களவாடப்பட்டு வெவ்வேறு இடங்களுக்கு எடுத்துச் செல்லப்படுவது தடுக்கப்படுகிறது. ஏனெனில், இச்சட்ட ஏற்பாட்டின்படி, சுகாதாரச் சான்றிதழைப் பெற்றுத்தான் இத்தகைய விலங்குகளை வெவ்வேறு இடங் களுக்குக் கொண்டுசெல்ல முடியும். இதனால் கால்நடைப் பண்ணையாளர்கள் மற்றும் பன்றி வளர்ப்பாளர்களுக்கு திருடர்களால் ஏற்படுகின்ற இழப்புகளைக் குறைக்க முடியும். அண்மையில் இலங்கையில் பன்றிக் காய்ச்சல் பரவியது. அதனால் அதிகளவான பண்ணையாளர்கள் பெருமளவு இழப்புகளைச் சந்தித்தனர். இவ்வாறான சட்டத் திருத்தங் களைக் கொண்டுவருவதன்மூலம் பண்ணையாளர்களுக்கு ஏற்படுகின்ற இவ்வாறான இழப்புகளை இயன்றவரை தவிர்க்கக்கூடியதாக இருக்கும்.

வடக்கு மாகாணத்தில் கிட்டத்தட்ட இரண்டு இலட்சம் ஆடுகள் உள்ளன. இலங்கையில் வட மாகாணத்தில்தான் அதிகளவான ஆடுகள் காணப்படுகின்றன. அதிலும் குறிப்பாக, யாழ். மாவட்டத்தில்தான் அதிகளவான ஆடுகள் காணப்படு கின்றன. வட மாகாணத்தில் ஆண்டொன்றுக்கு 15 இலட்சம் லீற்றர் பால் உற்பத்தி செய்யப்படுகின்றது. ஒரு லீற்றர் பாலின் விலை 600 ரூபாய் வரை செல்கின்றது. நாங்கள் இவ்வாறான சட்டத் திருத்தங்களைக் கொண்டுவருவதன்மூலம் இலங்கை யில் வாழ்கின்ற மக்களின் பால் தேவையை நிவர்த்தி செய்யக்கூடியதாக இருக்கும். இலங்கையின் பால் தேவையில் 40 சதவீதம்தான் உள்நாட்டில் உற்பத்தி செய்யப்படுகின்றது. மிகுதியானவை பாற்பொருட்களாக வெளிநாடுகளில் இருந்து இறக்குமதி செய்யப்படுகின்றன. இதனால் வருடமொன்றுக்கு கிட்டத்தட்ட 350 மில்லியன் டொலர் வெளிநாடுகளுக்குச் செல்கின்றது. நாங்கள் எமது நாட்டில் ஆடு உட்பட ஏனைய கால்நடைகளைச் சிறந்த முறையில் பராமரிப்பதன்மூலம் எமது நாட்டின் பால் தேவையைப் பூர்த்தி செய்துகொள்ளலாம்.

இலங்கையில் விலங்குகள் சார்ந்த பல்வேறு நோய்கள் காணப்படுகின்றன. இவை பன்றிகளுக்கு மாத்திரமன்றி ஏனைய கால்நடைகளுக்கும் ஏற்படுகின்றன. உதாரணத்துக்கு, கால்வாய் நோயைக் குறிப்பிடலாம். கடந்த காலத்தில்

இங்கிலாந்தின் லண்டனில் கால்வாய் நோய் பரவியபோது, அது இங்கிலாந்தின் ஏனைய இடங்களுக்குப் பரவாதவாறு தடுப்பதற்குப் பல்வேறு சட்டங்களை பிறப்பித்தார்கள். அதேபோல, எங்களுடைய நாட்டிலும் சட்டங்களைக் கொண்டுவருவதன்மூலம் இத்தகைய நோய்கள் நாட்டின் ஏனைய பிரதேசங்களுக்குப் பரவுவதைத் தடுத்துக்கொள்ள முடியுமென நான் இந்தத் தருணத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று கால்நடை துறையில் பல்வேறு குறைபாடுகள் காணப்படுகின்றன. குறிப்பாக, கால்நடை வைத்தியர்களுக்குப் பற்றாக்குறை காணப்படுகின்றது. இதனை நிவர்த்தி செய்வதற்காக தற்போது எமது அரசாங்கம் பல்வேறு நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றது. கால்நடை வைத்தியர்களுக்கென சேவைப் பிரமாணக்குறிப்பு காணப் படாததன் காரணமாக, தற்போது கால்நடை வைத்தியர்கள் சேவைப் புறக்கணிப்பில் ஈடுபட்டுள்ளனர். அவர்களுடைய பிரச்சினைக்குத் தீர்வைப் பெற்றுக்கொடுப்பது தொடர்பில் எமது அரசாங்கம் ஆலோசனை செய்து வருகின்றது. இதற்காக ஒரு குழுவை நியமித்து, குறைபாடுகளை நிவர்த்தி செய்து, அவர்களுக்குத் தேவையான வசதி வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுப்பதன்மூலம் இத்துறையை மேம்படுத்தலாம். இலங்கையில் சனத்தொகை பெருகும்போது, அதற்கு ஏற்ப பால் உற்பத்தியும் அதிகரிக்க வேண்டும். ஆனால், தற்போது இலங்கையின் பால் தேவையில் 40 சதவீதம் மட்டுமே உள்நாட்டில் உற்பத்தி செய்யப்படுகின்றது. உள்நாட்டில் பால் உற்பத்தியை அதிகரிப்பதற்காக நல்லின கறவை மாடுகளை உருவாக்க வேண்டும். அதற்காக வெளிநாடுகளில் இருந்து சிறந்த காளை இனங்களை இலங்கைக்கு வருவித்து, கலப்பின மாடுகளை உருவாக்க வேண்டும்.

தற்போது கால்நடைகளுக்கான மேய்ச்சல் தரை தொடர்பில் பல்வேறுபட்ட குறைபாடுகள் காணப்படுகின்றன. அவற்றை எமது அரசாங்கம் படிப்படியாக நிவர்த்தி செய்து வருகின்றது. மன்னார் மாவட்டத்தில் கிட்டத்தட்ட 120,000 கால்நடைகள் காணப்படுகின்றன. எனினும், அவற்றுக்குப் போதியளவு மேய்ச்சல் தரை இல்லை. கடந்த 'தித்வா' புயலின்போது கிட்டத்தட்ட 8,000 மாடுகள் வெள்ளத்தில் அடித்துச் செல்லப் பட்டன. அவற்றின் உரிமையாளர்களுக்கு எமது அரசாங்கம் பெருமளவு நிதியை வழங்கியது. இவ்வாறு இலங்கை பூராவும் பாதிக்கப்பட்ட கால்நடை பண்ணையாளர்களுக்கு நட்டஈடாக கிட்டத்தட்ட 4 பில்லியன் ரூபாய் கொடுக்கப்பட்டது. இதன் மூலம் கால்நடை பண்ணையாளர்களின் எதிர்காலத்தைப் பாதுகாக்க முடிவதோடு, அவர்கள் தங்களது தொழிலை தொடர்ந்து மேற்கொள்ளக்கூடியதாகவும் இருக்கும்.

முல்லைத்தீவு மாவட்டத்தில் வாழுகின்ற மக்களில் 44.5 சதவீதமானவர்கள் வறுமைக் கோட்டுக்கு உட்பட்டவர்களாகக் காணப்படுகின்றார்கள். அவர்களுடைய வாழ்க்கைத் தரத்தையும் வாழ்வாதாரத்தையும் முன்னேற்ற வேண்டு மென்றால், நாங்கள் கால்நடைத் துறையை அபிவிருத்தி செய்ய வேண்டும். அதற்காக எமது அரசாங்கம் பல்வேறுபட்ட உதவிகளைச் செய்து வருகின்றது. குறிப்பாக, கால்நடை பண்ணையாளர்களுக்கு கால்நடைகளை வளர்ப்பதற்கான கொட்டில்கள் மற்றும் பால் கறக்கும் இயந்திரங்கள் வழங்கப் படுகின்றன. அத்துடன், அவர்களுடைய அபிவிருத்திக்காக பல்வேறு வழிகளில் நிதி உதவிகளும் வழங்கப்படுகின்றன. குறிப்பாக, மாகாண சபை ஊடாகவும், மாகாண சபையின்கீழ் வருகின்ற திணைக்களத்தின் ஊடாகவும், மத்திய அரசின் ஊடாகவும் பெருமளவான நிதியை வழங்கி, இலங்கையில் கால்நடைத் துறையை அபிவிருத்தி செய்வதற்காக எமது அரசாங்கம் பல்வேறு வழிகளில் முயற்சித்து வருகின்றது என்பதை இந்தத் தருணத்தில் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நிலையியற் கட்டளை 91(ஏ)ஐ உங்களுடைய கவனத்துக்குக் கொண்டு வருகின்றேன். அதில், "உறுப்பினரெவரும் மற்றோர் உறுப்பினருக்கு எதிராக தகாத நோக்கத்தில் குற்றம் சாட்டுதலோ அல்லது மற்றோர் உறுப்பினரின் தனிப்பட்ட விடயங்கள் பற்றி குறிப்பிடுதலோ ஆகாது" என குறிப்பிடப் பட்டு இருக்கிறது. எனக்கு முன்னர் கதைத்த கௌரவ உறுப்பினர் அவர்கள், வடக்கு மாகாணத்தில் அதிகளவான ஆடுகள், செம்மறிகள் இருக்கின்றன என்று கூறி, இளங்குமரன் அவர்களுடைய பெயரைக் குறிப்பிடாமல் அவருக்கு எதிராகக் கதைத்தார். தயவுசெய்து, இதனை ஹன்சாட் அறிக்கை யிலிருந்து நீக்கச் சொல்லுங்கள்! ஏனெனில், இவர் இளங்குமரனுடைய பெயரைப் பாவிக்காமல், வடக்கு மாகாணத்தில் யாழ்ப்பாணத்தில்தான் கூடுதலாக ஆடுகள், செம்மறிகள் இருக்கின்றன என்று கதைத்தார். அது பிழை! ஒரே கட்சியில் இருந்துகொண்டு இளங்குமரனுக்கு இப்படிச் செய்யக் கூடாது. நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.45]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සාකච්ඡාවට භාජන වන මොහොතේ විශේෂයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජල යෝජනා ව්‍යාපෘති ගැන කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම බෙහෙවින් සතුටු වනවා.

විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, අද හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 576ක අහිංසක ජනතාවට පානීය ජලය නොමැතිවීම නිසා ඔවුන් අපහසුතාවට පත්ව තිබෙන බව. ඒ වාගේම සංචාරක හෝටල්වලට, කර්මාන්තවලට, නිවාස ව්‍යාපෘතිවලට අවශ්‍ය ජලය ලබා ගැනීමේ අපහසුතා ද ඇති වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - සාමූහික සැලසුම 2020-2025"

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

එළිදක්වා තිබෙනවා. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් සැලසුමක් සකස් කරලා, ශක්‍යතා වාර්තාව සකස් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විස්තර ඔක්කෝම ඇතුළත් කරලා පොතක් වශයෙන් සකස් කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අනුමත කරපු ඒ වාර්තාව තමයි මගේ අතේ මේ තිබෙන්නේ.

මේ අවස්ථාවේ මම කියන්න කැමැතියි, ඒ වාර්තාවේ තිබෙන, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 576ම ආවරණය වන යෝජනා ක්‍රම 19ක් ගැන. මම මේවා එකින් එකට කියන්නේ මේ ටික වාර්තා වෙන්න ඕනෑ නිසායි. මේවා වාර්තා වෙලා මේ ව්‍යාපෘති සඳහා මුදල් ලබාගෙන අපි මේ කටයුතු ක්‍රියාත්මක කරන්න ඕනෑ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මේ අවුරුද්දේ ලාභ තිබෙනවා කිව්වා. එතකොට ඒ අය හම්බ කරලා තිබෙනවා. ඒ නිසා මේ ව්‍යාපෘති පිළිබඳ විස්තර මම ඉදිරිපත් කරනවා. මොකද, මේ වනකොට මේවා වැඩ නතර වෙච්ච ව්‍යාපෘති. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හිටපු කාලයේ තමයි මේ ව්‍යාපෘති ආරම්භ කළේ, නමුත් ප්‍රශ්න ඇති වෙච්ච නිසා ඒ ව්‍යාපෘති නතර වුණා.

කිරම-කටුවන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියෙන් පවුල් 3,850ක් සඳහා, ඒ වාගේම ලුණුගම්වෙහෙර ජල සම්පාදන යෝජනා ක්‍රමය අදියර I සහ II මඟින් පවුල් 2,850ක් සඳහා, මැණික් ගඟෙන් ජලය ලබාගෙන කරන කතරගම ජල සම්පාදන යෝජනා ක්‍රමයෙන් පවුල් 5,720ක් සඳහා, වලවේ ගඟෙන් ජලය ලබාගෙන කරන බරවකුඹුක ජල සම්පාදන යෝජනා ක්‍රමය අදියර I සහ II යටතේ පවුල් 4,500ක් සඳහා, ඒ වාගේම තංගල්ල-නවයාලවිල ජල මූලාශ්‍රය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙන් පවුල් 3,600ක් සඳහා ජලය ලබා දීමට අපේක්ෂිතයි. ග්‍රාම නිලධාරි කොට්ඨාස ගත්තොත්, බෙලිඅත්තේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 25ක් සහ තංගල්ලේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 25ක් අයත් වනවා. ඒ වාගේම මුරුතවෙල ජල සම්පාදන ව්‍යාපෘතිය වැඩිදියුණු කරලා පවුල් 4,500ක් සඳහා, ඌරුබොක්ක ඔය ජල මූලාශ්‍රය හැටියට ගෙන කට්ටකඩුව ජල පවිත්‍රාගාරය වැඩිදියුණු කිරීමේ යෝජනා ක්‍රමයෙන් පවුල් 5,400ක් සඳහා, 6,000 m3/day ධාරිතාවකින් යුත් ජල පවිත්‍රාගාරය ඉදිකිරීම, ඌරුබොක්ක ඔයෙන් ජලය ලබාගෙන බෙදා හැරීම් පුළුල් කිරීම මඟින් පවුල් 450ක් සඳහා, ඒ වාගේම කිරිඳි ඔයෙන් ජලය ලබාගෙන කරන බුන්දල ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම මඟින් පවුල් 450ක් සඳහා, කටුවන ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩිදියුණු කරලා පවුල් 450ක් සඳහා, ලුණුගම්වෙහෙර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර I සහ II යටතේ පවුල් 17,900ක් සඳහා, මැණික් ගඟෙන් ජලය ලබාගෙන කරන කතරගම දිගු කාලීන ජල සම්පාදන ව්‍යාපෘතියෙන් පවුල් 5,040ක් සඳහා, රිදියගම ජල ටැංකිය-රුහුණුපුර අදියර II යටතේ පවුල් 9,900ක් සඳහා, චන්ද්‍රිකා වැව-මිද්දෙනිය ජල සම්පාදන ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම අදියර II යටතේ පවුල් 11,000ක් සඳහා, ඒ වාගේම මුරුතවෙල ජලාශය ජල මූලාශ්‍රය හැටියට ගෙන මුරුතවෙල දිගු කාලීන ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර I සහ II යටතේ පවුල් 6,300ක් සඳහා සහ හම්බන්තොට කර්මාන්තපුර ග්‍රාම නිලධාරි කොට්ඨාස 27ක් සඳහා ජලය ලබා දීමට යෝජනා වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ජල යෝජනා ක්‍රම 19හි කටයුතු 2021දී තමයි ආරම්භ කළේ. මේවාට අදාළව ජල කුලුනු ඉදිකිරීම, පවිත්‍රාගාර ඉදිකිරීම, ඉඩම් අත්පත් කර ගැනීම ආදී සියලු දේවල් ඇතුළත් කරලා ශක්‍යතා වාර්තා සකස් කරලා තිබෙනවා. මේ ව්‍යාපෘති ආරම්භ කරලා දැනට කිරම-කටුවන යෝජනා ක්‍රමයේ වැඩ නිම වෙලා තිබෙනවා. ඒ වාගේම ලුණුගම්වෙහෙර ජල යෝජනා ක්‍රමයේ වැඩ නිම වෙලා තිබෙනවා. මැණික් ගඟ ජල යෝජනා ක්‍රමයේ වැඩ නතර වෙලා තිබිලා මේ අමාත්‍යාංශයේ ලේකම්වරයා දැන් ඒ කටයුතු හිතවතෙකුට භාර දීලා ඒ වැඩ ඇදි ඇදී යනවා. අනෙක් කිසිම ජල යෝජනා ක්‍රමයක් ආරම්භ කර නැහැ. මේවායේ ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කරලා තිබෙන්නේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අහිංසක, දුප්පත් ජනතාව ඉන්නේ. හම්බන්තොට දිස්ත්‍රික්කය කියන්නේ වියළි කලාපයක්. එහි ග්‍රාම නිලධාරි කොට්ඨාස 576ක ජීවත් වන ජනතාවට පානීය ජලය නැහැ. මේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ හදපු වාර්තාවක්. මේ වාර්තාව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් අනුමත කරලා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අනුමත කරපු වාර්තාවක්.

මේ ආණ්ඩුව ඇවිල්ලා දැන් අවුරුදු දෙකක් වෙනවා. ජනාධිපතිවරයා පත් වෙලා අවුරුදු දෙකක් වෙනවා. ඔබතුමන්ලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවගේ ඡන්දය සියයට 75ක් ලබා ගත්තා. සියයට 75ක් ඡන්ද ලබා ගෙන අවුරුදු දෙකක් ගත වෙලා තිබුණත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවට පානීය ජලය ලබා දෙන්න තවම බැරි වෙලා තිබෙනවා. පසුගිය ආණ්ඩුවෙන් හදපු මේ ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ වැඩකටයුතු ක්‍රියාත්මක කරන්න රුපියල් බිලියන 27ක් වැය වනවා.

මේ ආයතනය ලාභ ලබපු ආයතනයක් කියලා අද ඇමතිතුමා කියනවා මම අහගෙන හිටියා. ජනාධිපතිතුමාගෙන් හා ඇමතිතුමාගෙන් මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. ලංකාවේ දූෂ්කරම දිස්ත්‍රික්කය තමයි, හම්බන්තොට දිස්ත්‍රික්කය. ඒ දිස්ත්‍රික්කයේ ජනතාව සියයට 75ක් ඔබතුමන්ලාට ආණ්ඩුව පිහිටුවන්න ඡන්දය ලබා දුන්නා. ජනාධිපතිවරයෙක් වෙන්න ඒ ජනතාව ඡන්දය ලබා දුන්නා. ඔබතුමන්ලාට පින් සිද්ධ වෙන්න, ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්න, ඔබතුමන්ලා ඔය පුටුවල වාඩි කරවන්න ඡන්දය ලබා දුන්නු ඒ දුප්පත්, අහිංසක ජනතාවට මේ පානීය ජලය ටික ලබා දෙන්න, මේ හදපු ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුව මේ ජල යෝජනා ක්‍රම ආරම්භ කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේවා කරන්න ඕනෑ වැඩ. ඒ මිනිස්සුන්ට බොන්න වතුර නැහැ. මිනිසුන්ට අද ජීවත් වෙන්න විධියක් නැහැ. අද නිවාස ව්‍යාපෘති 270 ගණනක් හදලා තිබෙනවා. ඒ මිනිස්සුන්ට වතුර බොන්න tap lines ගන්න විධියක් නැහැ. වතුර දෙන්න ජල නළ එළන්නේ නැහැ, pressure මදි කියනවා. මිනිස්සුන්ට කුණු ජලය එන්නේ.

මේ වාගේ ආණ්ඩු කරන්න පුළුවන්, ඕනෑ මිනිහෙකුට. භාණ්ඩාගාරයේ සල්ලි පිරිලා උතුරනවාලු. ඒ වාගේම පැලවත්තේ කොමිස් ගහලා සල්ලි උතුරනවා. භාණ්ඩාගාරයේයි, පැලවත්තේයි සල්ලි උතුරනවා. හැබැයි, මේ ආණ්ඩුව තමන්ට ඡන්දය දීපු අහිංසක ජනතාවට පානීය ජලය ටික ලබා දෙන්න බැරි ආණ්ඩුවක් බවට පත් වෙලා තිබෙනවා. ලාල් කාන්ත ඇමතිතුමනි, ඔබතුමා හරි මැදිහත් වෙලා ඒ ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන්න සැලසුම් කරන්න කියලා මම කාරුණිකව ඉල්ලනවා. "ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, සාමූහික සැලසුම 2020 - 2025, හම්බන්තොට දිස්ත්‍රික්කය" කියන පොත මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මම මේ පොත ඇමතිතුමාට එවන්නම්. මේ පොත අමාත්‍යාංශයේ තිබෙනවාද, නැද්ද දන්නේ නැහැ නැහැ. ආණ්ඩු මාරු වුණාම ඒ ව්‍යාපෘති නතර කරන්න එපා. හොඳ ව්‍යාපෘතියක් ඒ ආරම්භ කරලා තිබෙන්නේ. එය හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 576ම ආවරණය වන පරිදි ජලය ලබා දීමේ ව්‍යාපෘතියක්. රුපියල් බිලියන 27යි ඒ වෙනුවෙන් වැය වෙන්නේ. ගබඩාව පිරිලා නම්, සල්ලි පිරිලා නම් ඒවා හරිගස්සලා දෙන්න. මිනිස්සු ඡන්දය දුන්නේ ඒකට.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඊළඟට මම අපේ ලාල් කාන්ත ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අපේ දිස්ත්‍රික්කයේ අහිංසක ගොවි ජනතාව වෙනුවෙන්. ඒ ගොවි ජනතාව ඉල්ලන්නේ වී කිලෝවකට රුපියල් 140ක මිලක්. ඒ මිනිසුන්ට අද වී කිලෝවකට රුපියල් 120ක් ඔබතුමන්ලා දෙනවාය කියනවා. නමුත් රුපියල් 137ක් ඒ මිනිසුන්ට වී කිලෝවක් සඳහා වැය වෙනවා. එතකොට ඒ මිනිසුන්ට ජීවත් වෙන්න බැහැ, ණය ගෙවා ගන්න බැහැ. එම නිසා ඔබතුමන්ලා මැදිහත් වෙලා ඒ ගොවීන්ගේ ප්‍රශ්නය විසඳන්න. අහිංසක, දුප්පත් ජනතාවක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉන්නේ. ඒ අයට බොන්න වතුර නැහැ. කුඹුරුවල වී ටික විකුණා ගන්න බැහැ.

අපේ ගබඩා තුනක් තිබුණා, 1988-89 කාලයේ. ඒ ගබඩා තුනටම ගිනි තැබුවා, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඔය ඉන්න කට්ටිය. ඊට පස්සේ ගබඩා අටක් හැදුවා. එදා යහ පාලන ආණ්ඩුව කාලයේ ඒ ගබඩා අටේම වී ගබඩා කළා. වී අස්වැන්න වැඩි වෙලා බැරිම තැන රනිල් වික්‍රමසිංහ හිටපු අගමැතිතුමා නියෝගයක් දුන්නා, airport එකේ ගබඩාවක වී ගබඩා කරන්න කියලා. අන්න එහෙමයි අපි වී ගබඩා කළේ, ගොවීන්ගේ වී ගත්තේ. අපේ තිබුණු ගබඩා පිරිලා, airport එකේ ගබඩාවකත් වී stock කළා. අන්න ඒ ආකාරයට තමයි අපේ ආණ්ඩුව කාලයේ අපි ගොවි ජනතාවගෙන් වී ලබාගෙන, ඔවුන්ගේ ප්‍රශ්න විසඳුවේ. ඒ නිසා මම හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව වෙනුවෙන් ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ අයගෙන් වී කිලෝවක් රුපියල් 140 ගණනේ ලබා ගන්න කටයුතු කරන්න කියලා. සානුකම්පිතව ගොවීන් දෙස බලන්න කියාත් මම ඔබතුමන්ලා දෙපළගෙන් ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* හාල් ඕනෑ ගණනකට දෙන්න. ගොවීන්ට පොරොන්දු වෙච්ච දේ ඉෂ්ට කරන්නකෝ, ඔබතුමන්ලා. ඔබතුමන්ලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කොළඹට ගෙනැල්ලා උද්ඝෝෂණ කරලා, ආණ්ඩු බලය ලබා ගෙන, වී කිලෝවකට ඒ ගණන දෙනවාය කිව්වාට දැන් දෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඒ ගොවීන් තමයි අපට කන්න බත සපයන්නේ. එම නිසා ඒ ගොවීන්ගේ ප්‍රශ්නය විසඳන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවට ජලය ලැබෙන්නේ කිරිඳිඔය ව්‍යාපාරය, රිදියගම ව්‍යාපාරය, මුරුතවෙල ව්‍යාපාරය, කිරමඔය ව්‍යාපාරය, ඌරුබොකුඔය ව්‍යාපාරය සහ වලව දකුණු ඉවුර ව්‍යාපාරයෙන්. නමුත් මුරුතවෙල ව්‍යාපාරය යටතේ තිබෙන වලස්මුල්ල, ගලහිටිය, ඉත්තදෙමළිය, ඕමාරය, කොහොලංගල යන කොට්ඨාසවල අක්කර 700ක වගාවට ජලය නැහැ. ගිං-නිල්වලා යෝජනා ක්‍රමය ආරම්භ කළොත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජල ප්‍රශ්නය විසඳන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට විනාඩියක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැනටත් ඔබතුමා වෙලාව වැඩියෙන් අරගෙන තිබෙනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම අවසන් කරන්නම්.

මහවැලි ව්‍යාපාරයෙන් පෝෂණය වන කොට්ඨාස 7ක් තිබෙනවා. ගොවි සංවිධාන 310ක් තිබෙනවා. කුඹුරු හෙක්ටෙයාර 32,500ක් තිබෙනවා. ඒවාට මහවැලියෙන් ජලය ලැබෙන්නේ නැති වනකොට දෙවතාවක්ම කන්න පාළු වුණා. ඒ නිසා වතුර නැති වනකොට සමනල වැව, විදුලිය උත්පාදනය කරන project එකෙන් මහවැලි ව්‍යාපාරයෙන් පෝෂණය වන ප්‍රදේශයට වතුර ලබා දෙන්නම් කියලා agreement එකක් අත්සන් කරලා තිබෙනවා. විදුලිබල මණ්ඩලයේ agreement එක තිබෙනවා. ඒ agreement එක අරගෙන හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහවැලි ව්‍යාපාරයෙන් පෝෂණය වන කොට්ඨාස 7ට ජලය අඩු වනකොට ජලය ලබා දෙන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ සරත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.56]

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සහ 1958 අංක 29 දරන සත්ව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය පැවැත්වෙන මේ මොහොතේදී ඒ සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. මේ විවාදයට සම්බන්ධ වෙමින් ගාල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක නියෝජනය කරන විපක්ෂයේ මන්ත්‍රීවරු බොහොම කනගාටුවෙන් අදහස් ප්‍රකාශ කළා, ඒ දිස්ත්‍රික්කවල ශක්‍යතා අධ්‍යයන අවසන් කරලා තිබෙන ජල ව්‍යාපෘති ආරම්භ නොකිරීම සම්බන්ධයෙන්. ඒ මන්ත්‍රීවරුන්ට අපි මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, ශක්‍යතා අධ්‍යයන අවසන් කර තිබෙන, NPD approval ලැබී තිබෙන සියලුම ජල ව්‍යාපෘති 2027 අවුරුද්දේදී ආරම්භ කරන්න තීරණය කර තිබෙනවාය කියන කාරණය. ඒ වාගේම, ඒ කථාවල සමහර දෝෂ සහිත තැන් තිබෙනවා. ඒවා නිවැරදි කරන්නත් මම ඉතාම කෙටි වේලාවක් ගන්නවා.

ඊශ්‍රායලයට 2026 අවුරුද්දේ රජය මඟින් යවන ලද ශ්‍රමිකයන් ප්‍රමාණය සම්බන්ධයෙන් ඉතාම අසත්‍ය තොරතුරු තමයි මේ ගරු සභාවට ඉදිරිපත් කළේ. මන්ත්‍රීවරු දෙදෙනෙක් ඉදිරිපත් කළේ එකිනෙකට වෙනස් දත්ත. නමුත් නිවැරදි දත්ත ඉදිරිපත් කරන්න මම සූදානම්. ඊශ්‍රායලයට 2026 අවුරුද්දේ රජය විසින් යවන ලද මුළු ප්‍රමාණය 2,475යි. ඒ, සාත්තු සේවා සඳහා 471ක්, නිෂ්පාදන සේවාවලට 314ක්, ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා 240ක්, ප්‍රතිසංස්කරණ සේවා සඳහා 229ක්, හෝටල් කර්මාන්තය සඳහා 981ක්, යටිතල පහසුකම් ක්ෂේත්‍රය සඳහා 137ක්, ආපනශාලා සඳහා 88ක් සහ කෘෂිකාර්මික කටයුතු සඳහා 15ක් ආදී වශයෙන්. ඒ නිසා බොහොම ගෞරවයෙන් අපි ඒ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා, මිථ්‍යා මත, වැරදි තොරතුරු සමාජගත කිරීමට උත්සාහ කරන්න එපා කියලා.

[ගරු නීතිඥ සරත් කුමාර මහතා]

අද විවාදයට ලක් වන පනත් දෙක අතුරින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත සම්මත කළේ 1974 අවුරුද්දේ. ඊට පස්සේ ඒකට සංශෝධනයක් එකතු වෙන්නේ 1992 අවුරුද්දේ. ඒ සංශෝධනයේ ඉඳලා අද වනකොට දශක හතරකටත් ආසන්න කාලයක් අපි ගත කරලා තිබෙනවා. ඒකෙන් පැහැදිලියි, මේ ක්ෂේත්‍රය සම්පූර්ණයෙන්ම නොසලකා හැර, අත්හැර දමා තිබූ ක්ෂේත්‍රයක් කියන එක. පසුගිය කාලයේ අපේ රට පාලනය කළ පූර්වගාමී ආණ්ඩු නියෝජනය කළ මන්ත්‍රීවරු දැනටත් මේ පාර්ලිමේන්තුව නොමඟ යවමින් මිථ්‍යා මත, දත්ත සමාජගත කරන්න උත්සාහ කළාට එතුමන්ලා තමන්ගේ පාලන කාලවලදී තමන්ගේ යුතුකම් සහ වගකීම් නිසි පරිදි ඉටු කර නොමැති බව මේ දේවල්වලින් අපට පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 16වන වගන්තියට අද ඉතාම වැදගත් සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. ස්වේච්ඡාවෙන් පවරා දීමේ නියෝගයකින් හෝ අනිවාර්ය පැවරීමේ නියෝගයකින් මණ්ඩලය වෙත පවරන කර්මාන්තපුරයකට, කර්මාන්ත උද්‍යානයකට හෝ ප්‍රජාමූල සංවිධානයකට, පළාත් පාලන ආයතනයකට අයත් වෙලා තිබුණු ජල ව්‍යාපෘතියක් භාර ගන්නත්, ඒක පවත්වාගෙන යන්නත් පුළුවන් විධියට ප්‍රතිපාදන ලබා දීම මේ සංශෝධනය හරහා සිදු කරනවා. අපි හිතනවා, ඒක ඉතාම වැදගත් සංශෝධනයක් කියලා. මොකද, පසුගිය කාලයේ ආරම්භ කරන ලද ජල ව්‍යාපෘති තැනින් තැන අත්හැර දාලා ඉතාම අවිධිමත් තත්ත්වයට පත් වෙලායි තිබෙන්නේ.

විශේෂයෙන් අපි දන්නවා, මේ කාල වකවානුවේ අපේ රට එල් නිනෝ තත්ත්වයේ බලපෑමට හසු වෙලා තිබෙන බව. ඇතැම් ප්‍රදේශවල ජල හිඟය බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන් පස්සේ අවිධිමත් ආකාරයට අත්හැර දමා තිබෙන ඒ ජල ව්‍යාපෘතිවලට ඉතාම කඩිනමින් නැවත පණ දෙන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ වාගේම අත්හැර දාලා තිබෙන, දැනට අක්‍රිය තත්ත්වයේ තිබෙන, නඩත්තුව පවත්වාගෙන යන්න බැරි ව්‍යාපෘති නැවත නඩත්තු කරන්නත්, පවත්වාගෙන යන්නත් අවශ්‍ය ප්‍රතිපාදන මේ සංශෝධනය මඟින් සම්පාදනය කරනවා කියන එක විශේෂයෙන් මම සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 17වන වගන්තියටත් ඉතා වැදගත් සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, මේ 17වන වගන්තියට ගෙන එන සංශෝධනය මඟින් මේ පනතේ වෙනස්කම් විශාල ප්‍රමාණයක් කරන බව. ඒ වෙනස්කම් හරහා අපේ රටේ ජල සම්පාදන ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු බොහොමයක් මඟ හරවා ගන්න පුළුවන් කියන එක විශේෂයෙන් මම සඳහන් කරන්න ඕනෑ. විශේෂයෙන් ජල සම්පාදන මණ්ඩලයට අවශ්‍ය වන ජල මූලාශ්‍ර සම්බන්ධ වන ඉඩමක්, දේපළක් මිලදී ගැනීම සම්බන්ධ ගිවිසුම්වලට එළඹීම සම්බන්ධයෙන් ප්‍රතිපාදන ලබා දීම සිදු කරලා තිබෙනවා. ඒ වාගේම ජල සම්පත් සංවර්ධනය කර ගන්නත්, අනුබද්ධ සමාගම් පිහිටුවන්නත්, පුහුණු හා අධ්‍යාපන කටයුතු කරන්නත් ප්‍රතිපාදන සලසා තිබෙනවා.

අපේ අමාත්‍යතුමා මුල් අවස්ථාවේදීම පැහැදිලි කළා, මේ ක්ෂේත්‍රයේ තාක්ෂණික දැනුම තිබෙන කණ්ඩායම ඉන්නේ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කියලා.

එහෙම නම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතුව තිබෙන තාක්ෂණය, එම පහසුකම් අපි උපයෝගී කර ගන්න ඕනෑ අපේ රටේ තිබෙන මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න. ඒ අනුව අනුබද්ධ සමාගම් පිහිටුවන්න මේ පනත යටතේ අවස්ථාව සලසා දී තිබෙනවා. ඒ වාගේම පුහුණු අධ්‍යාපන කටයුතු සඳහාත් මේ යටතේ අවස්ථාව සලසා දී තිබෙනවා. ඒක විශේෂ අවස්ථාවක්. අපි දන්නවා අද වනකොට අපේ රට පුරාම විවිධ ක්ෂේත්‍රවල, විවිධ ආයතනවල ජල සම්පාදන හා ජලාපවහනය සම්බන්ධයෙන් බරපතළ ගැටලු නිර්මාණය වෙලා තිබෙන බව. ඒවා නිරාකරණය කර ගන්න අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීම බරපතළ ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. ඉතින් මේ සියලු ගැටලු විසඳා ගන්න පුළුවන් විධියේ සංශෝධන තමයි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතට අද ගෙනැල්ලා තිබෙන්නේ.

අපි දන්නවා, ගම්වල ආරම්භ කර තිබෙන සමහර ප්‍රජා ජල ව්‍යාපෘති මේ වන කොට ඉතාම ඛේදනීය තත්ත්වයකයි තිබෙන්නේ කියලා. මෙම සංශෝධන හරහා එම ප්‍රජා ජල ව්‍යාපෘතිවලට විශාල සහයෝගයක් ලබා දෙන්න අපට පුළුවන් කියලා අපි හිතනවා. ඒ අත්හැර දමා තිබෙන ව්‍යාපෘති නැවත ආරම්භ කරන්න අපට පුළුවන් කියන කාරණය මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේමයි, රසායනාගාර සේවා සැපයීම. අපි දන්නවා ඒ සේවාව සැපයීමේ හැකියාව සහ ඒ සම්පත් තිබෙන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට බව. අන්න ඒ සේවාව පෞද්ගලික අංශයට සහ රාජ්‍ය අංශයට ලබා දීමේ අවස්ථාවක් මේ සංශෝධනය හරහා නිර්මාණය වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 17වන වගන්තියට ගෙන එන සංශෝධන ඉතාම ප්‍රබලයි. ඒ යටතේ ලබා දෙන අවස්ථා මඟින් මේ ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් අපට දකින්න පුළුවන් වෙයි කියන කාරණයත් සඳහන් කරන්නම ඕනෑ. ඒ වාගේම පනතේ 36වන වගන්තියට ගෙනෙන සංශෝධනයත් ඉතාම වැදගත්. මොකද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන්ට ඇතැම් පරිශ්‍රයන්ට ඇතුළු වීම සම්බන්ධයෙන් යම් බාධක, සීමා තිබෙනවා. අන්න ඒ බාධක, සීමා ඉවත් කරමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයාට හෝ ඔහු විසින් බලය පවරනු ලබන නියෝජිතයෙකුට පොලිස් නිලධාරියකු සමඟ ප්‍රවේශ වීමේ අවස්ථාව මෙම සංශෝධනය මඟින් ලැබෙනවා. ජල මීටරය ඇතුළත සීමාව තුළ, ඒ කියන්නේ අපට අනාවරණය කර ගන්න බැරි සීමාව තුළ සිදු වන හානිය නිසා සියයට 36ක පමණ ආදායමක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අහිමි වන බව අපි හඳුනාගෙන තිබෙනවා. මම ඒ කාරණය මේ වෙලාවේ විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ඒ සියලු අක්‍රමිකතා නිවැරැදි කර ගනිමින්, අපේ රට පුරා ඇති සියලු ක්ෂේත්‍රවලට අස්වැසිල්ලක් ලබා දෙමින්, අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළ ආකාරයටම මෙම ක්ෂේත්‍රයේ නැවුම් පුනරුදයක් ඇති කරන්න අපි පියවර ගනිමින් ඉන්නවා කියන කාරණය විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

රැකියා කටයුතු කරන කොට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවක මහතුන්ට යම් යම් අනතුරු සිදු වන අවස්ථා තිබෙනවා. ඒ අනතුරු සිදු වන අවස්ථාවල ඔවුන්ගේ රැකවරණය වෙනුවෙන් රජයක් හැටියට අපි යම් පියවරක් ගන්න ඕනෑ. එම නිසා විශේෂයෙන්ම රක්ෂණාවරණ සැපයීම සම්බන්ධයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ **83**වන වගන්තිය සංශෝධනය හරහා ප්‍රතිපාදන ලබා දීම සිදු කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඩිජිටල්කරණය ගැනත් කථා කරනවා. ඩිජිටල්කරණය සම්බන්ධයෙනුත් පනතේ 87වන වගන්තියට ගෙන එන ඒ සංශෝධන හරහා ප්‍රතිපාදන ලබා දී තිබෙනවා. ඒ නිසා අප බලාපොරොත්තු වුණු ඉලක්කවලට යන්න පුළුවන් විධියේ සංශෝධන පනත් කෙටුම්පතක් තමයි අද අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මට කථා කරන්න තවත් බොහෝ කරුණු ඉතිරි වෙලා තිබුණත්, කාලය අවසන්ව ඇති නිසා මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.06]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றைக்கு நாங்கள் கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சுடன் தொடர்புடைய இரண்டு சட்டங்களுக்குக் கொண்டுவரப்பட்டுள்ள திருத்தங்கள் தொடர்பில் விவாதித்துக்கொண்டு இருக்கின்றோம்.

கௌரவ அமைச்சர் லால் காந்த அவர்கள் சபையில் இருக்கின்ற இவ்வேளையில், சம்பந்தப்பட்ட அமைச்சுக்குக்கீழ் வருகின்ற ஒருசில விடயங்களை அவருடைய கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, சுகாதார காரணங்களுக்காக புகையிலையைத் தடைசெய்வதை நான் கொள்கையளவில் எதிர்க்கவில்லை. புகையிலை - tobacco - விவசாயமானது வட மாகாணத்தைச் சார்ந்த, அதிகளவு வருமானத்தைப் பெற்றுத்தருகின்ற ஒரு தொழில் என்பது உங்களுக்குத் தெரியும். அந்தத் தொழிலானது, இன்றைக்கு இந்த அரசாங்கத்தால் தடைசெய்யப்பட்டு இருப்பதாக அறிவிக்கப்பட்டு இருக்கின்றது. அந்த விவசாயி களுக்கு எந்தவிதமான கால அவகாசமும் வழங்காமல் இந்தத் தடை அறிவித்தல் விடுக்கப்பட்டு இருப்பதால், புகையிலை விவசாயத்தை நம்பியிருந்த குடும்பங்கள் மிகப் பெரிய நெருக்கடிக்குள் தள்ளப்பட்டு இருக்கின்றன. கடந்த வருடம் அவர்கள் விவசாயம் செய்து கிடைத்த புகையிலையை வியாபாரிகளுக்கு வழங்கியிருக்கின்ற சூழலில், தற்பொழுது அதற்குரிய காசைப் பெற முடியாதளவுக்கு நிலைமை மோச மடைந்து, பெரும் கடனுக்குள் தள்ளப்பட்டு இருக்கிறார்கள். இருந்தாலும், நீங்கள் இந்த முடிவை நடைமுறைப்படுத்துவதை நாங்கள் கொள்கையளவில் எதிர்க்க முடியாது.

என்னைப் பொறுத்தவரையில், சுகாதார நோக்கத்துக்காகப் புகையிலையைத் தடைசெய்வதில் தவறில்லை. ஆனால், கால அவகாசம் வழங்க வேண்டும். அதுமாத்திரமன்றி, அந்த விவசாயிகளுக்கு மாற்று வழிகளைத் தேடுவதற்கான முழு உதவிகளையும் அரசாங்கம்தான் செய்து கொடுக்க வேண்டும். இத்தடை தொடர்பில் அவர்களுக்கு அறிவித்து, போதியளவு கால அவகாசம் வழங்கி, இதை நடைமுறைப்படுத்துவதை நாங்கள் எதிர்க்கப் போவதில்லை. எனவே, நீங்கள் இதில் தலையிட்டு அந்த விவசாயிகளுக்கு நீதியைப் பெற்றுக் கொடுக்க வேண்டும். இந்தத் தடையை ஆகக்குறைந்தது மூன்று வருடங்களுக்காவது தள்ளிப்போட்டு, அவர்களுக்கு கால அவகாசத்தை வழங்கி, மாற்று வழிகளை ஏற்படுத்திக் கொடுக்க வேண்டும். அதற்கு உங்களுடைய பூரண ஒத்துழைப்பு அத்தியாவசியம் என்பதை நான் இந்த இடத்தில் சுட்டிகாட்ட விரும்புகின்றேன்.

வவுனியா வடக்கு DS பிரிவின் சின்னடம்பன் GN Divisionஇல் அமைந்துள்ள கரப்புக்குத்தி குளமானது கிட்டத்தட்ட 17 வருடங்களாகப் புனரமைக்கப்படாமல் இருக்கின்றது. அந்தக் குளத்திலுள்ள நீரின் அலைகள் அதன் bundஇல் மோதி மோதி, அந்த bundஇன் அளவை கிட்டத்தட்ட அரைவாசியாகக் குறைத்திருக்கிறது. இன்றைக்கு அந்தக் குளத்தின் அணைக்கட்டு உடைந்து, அதனை அண்டிய முழுப் பிரதேசத்துக்கும் பாரிய சேதத்தை ஏற்படுத்தக்கூடிய அளவுக்கு நிலைமை மிக மோசமாகக் காணப்படுகின்றது. கிட்டத்தட்ட 320 ஏக்கர் விவசாயக் காணிகள் அந்தக் குளத்தால் போஷிக்கப் படுகின்றது. ஆனால், துரதிருஷ்டவசமாக இன்றைக்கு அந்தக் குளத்தைப் பாவிக்க முடியாத நிலைமை காணப்படுவதுடன், அதன் சுற்றுச்சூழலில் இருக்கக்கூடிய குடும்பங்கள் மிகவும் பயத்துடன் வாழுகின்ற நிலைமையும் காணப்படுகின்றது. Minor irrigation tank வகுதிக்குள் வருகின்ற இந்தக் குளமானது, 17 வருடங்களுக்கும் மேலாகப் புனரமைக்கப் படாமல் இருக்கும் நிலையில், அதை முழுமையாகப் புனரமைப்பதற்குத் தேவைப்படுகின்ற நிதி போதாமை காரணமாக, அது தொடர்ந்தும் பிற்போடப்பட்டுக்கொண்டே வருகின்றது. எனவே, நீங்கள் இது தொடர்பில் உங்களுடைய கவனத்தைச் செலுத்தி, ஏனைய அமைச்சுக்களோடும் பேசி, இந்த விடயத்தைத் தீர்த்துவைக்க வேண்டுமென நான் மிகவும் அழுத்தமாகக் கேட்டுக் கொள்கின்றேன். அபிவிருத்தி என்பது அத்தியாவசியம்! அதில் மாற்றுக் கருத்துக் கிடையாது.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
වැවේ නම?

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கரப்புக்குத்தி குளம் - 223 B, சின்னடம்பன், வவுனியா வடக்கு.

கௌரவ அமைச்சர் அவர்களே, கௌரவ சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் பாராளுமன்றத்தில் எழுப்பிய கேள்விக்கு நீங்கள் பதில் அளிக்கும்பொழுது, மயிலத்தமடு - மாதவனை பிரதேசம் எங்கே இருக்கின்றது என்று தெரியாதெனவும், அப்படிப்பட்ட ஒரு பிரதேசம் இல்லை யெனவும் கூறினீர்கள். இன்றைக்கு நாங்கள் கால்நடை வளர்ப்பு, பால் உற்பத்தி பற்றிய விடயங்களைப் பேசிக் கொண்டு இருக்கின்ற சூழலில், நீங்கள் இவ்வாறு பதில் கூறியது உண்மையிலேயே எனக்கு ஆச்சரியத்தை அளிக்கின்றது.

இந்த மாதிரியான பதிலை கடந்த அரசாங்கங்களில் இருந்த அமைச்சர்களின் வாயிலிருந்து வருவதை நாங்கள் எதிர்பார்க்கலாம். ஆனால், இந்த அரசாங்கமானது, அதிக அக்கறை எடுத்து தமிழ், முஸ்லிம் மக்களுடைய

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

பிரச்சினைகளையும் தீர்ப்பதற்குக் கடமைப்பட்டிருப்பதாக அழுத்திச் சொல்கின்ற அரசாங்கமாகும். எனவே, இவ்வாறு பதில் சொல்வது மிகவும் ஆச்சரியமாக இருக்கின்றது. போரால் பாதிக்கப்பட்ட ஒரு பிரதேசத்தில் தொடர்ந்தும் விவசாயக் காணிகள் ஆக்கிரமிக்கப்பட்டு, பாதிக்கப்பட்ட மக்களுக்கு அந்தக் காணிகளின் முழுமையான பலனை அனுபவிக்க முடியாத நிலைமை நீடிப்பதை ஏற்றுக்கொள்ள முடியாது. உதாரணத்துக்கு, தையிட்டி, மயிலிட்டி, பலாலி, வசாவிளான், முல்லைத்தீவில் கேப்பாப்பிலவு போன்ற பகுதிகளில் தனியாருடைய உறுதிக் காணிகளை இராணுவம் முழுமையாக ஆக்கிரமித்துக்கொண்டு இருக்கின்றது. இவ்வாறு தனியாருடைய ஆயிரக்கணக்கான ஏக்கர் காணிகளை - குடியிருப்புக் காணிகள் அல்லது விவசாயக் காணிகள் - தொடர்ந்தும் ஆக்கிரமித்துக்கொண்டு இருப்பது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகும்.

தனியாருடைய காணிகளெனத் தெரிந்துகொண்டும் இராணுவம் சட்டவிரோதமாக இனவாத நோக்கத்தோடு போர்க் காலத்தில் ஆக்கிரமித்த காணிகளை விடுவிக்காமல், இந்த மக்களுடைய காணிப் பிரச்சினையைத் தீர்க்கப் போவதாக அறிவித்துக்கொண்டு, கடந்த யூலை மாதம் 26ஆம் திகதி உங்களுடைய அமைச்சு Land Settlement Ordinanceஇன்கீழ் notice ஒன்றை publish பண்ணியிருக்கிறது. இந்த notice "Sunday Observer" பத்திரிகையில் பிரசுரிக்கப்பட்டு இருக்கிறது. இதை நான் **table*** பண்ணுகின்றேன்.

இதற்கு முன்னர், நீங்கள் உள்ளூராட்சிமன்றத் தேர்தல் நடைபெற்ற காலப்பகுதியில், வட மாகாணத்தில் இருக்கும் 6,000 ஏக்கர் காணிகள் தொடர்பில் Land Settlement Ordinanceஇன்கீழ் notice கொடுத்து, மூன்று மாதகால அவகாசம் வழங்கி, தனியார் தங்களுடைய உரிமையை உறுதிப்படுத்தாத பட்சத்தில், அவற்றை அரச காணியாகப் பிரகடனப்படுத்துவதற்குரிய நடவடிக்கைகளை முன்னெடுத்த பொழுது, அதற்கு நாங்கள் கடும் எதிர்ப்புத் தெரிவித்தோம். இறுதியில் அதை நிறுத்தவேண்டிய நிலைமைக்கு நீங்கள் தள்ளப்பட்டீர்கள். அதனுடைய தொடர்ச்சியாகவே நீங்கள் இந்த அறிவித்தலைச் செய்திருக்கிறீர்கள். காலப்போக்கில் அந்த notice உத்தியோகபூர்வமாக gazette பண்ணப்படும் என்பதையும் நீங்கள் சொல்லியிருக்கிறீர்கள். நான் எதைச் சொல்கின்றேன் என்றால், உண்மையிலேயே இந்த மக்களுடைய காணிப் பிரச்சினைகளைத் தீர்ப்பதாக இருந்தால், நீங்கள் செய்யவேண்டிய முதல் வேலை, அந்த மக்களுக்கு நம்பிக்கை ஏற்படக்கூடிய வகையில், ஏற்கெனவே உங்களுடைய அரசாங்கம் வழங்கிய வாக்குறுதியை நிறைவேற்ற வேண்டும் என்றுதான். இராணுவம் ஆக்கிரமித்துக்கொண்டு இருக்கக்கூடிய தனியாருடைய காணிகளை விடுக்க வேண்டும். இன்றைக்குப் போர் இல்லாத சூழலில் இராணுவம் தனியாருடைய காணிகளை ஆக்கிரமிக்கத் தேவை இல்லை. வட, கிழக்கில் இராணுவத்தின் பிரசன்னம் குறைக்கப்பட வேண்டும்.

இராணுவத்தினரை 250,000இலிருந்து 100,000ஆகக் குறைக்க இருப்பதாக மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த அரசாங்கத்தின் முதலாவது வரவு செலவுத்திட்டத்தில் கூறியிருந்தார். இவ்வாறெல்லாம் நீங்கள் உலகத்துக்குச் சொல்லிக்கொண்டு, இந்தக் காணிகளை விடுவிக்காமல் தனியாரிடம் இருக்கும் ஏனைய காணிகளையும் - அதன் உரிமையை உறுதிப்படுத்தாத பட்சத்தில் - அரச காணிகளாகப் பிரகடனப்படுத்துவதற்கு எடுக்கும் நடவடிக்கைகள் மென்மேலும் சந்தேகத்தை அதிகரிக்கும். தையிட்டி, மயிலிட்டி, பலாலி, வசாவிளான், கேப்பாப்புலவு பிரதேசங்களிலுள்ள மக்கள் தொடர்ச்சியாக தங்களுடைய காணிகளுக்காகப் போராடிக்கொண்டு இருக்கிறார்கள். இவ்வாறு தொடர் போராட்டங்கள் நடைபெற்றுக்கொண்டு இருக்கின்ற இந்தச் சூழலில், நீங்கள் கடந்த யூலை மாதம் 26ஆம் திகதி வெளியிட்ட noticeஐ இரத்துச் செய்துவிட்டு, ஏற்கனவே நீங்கள் ஆணையைப் பெறுவதற்காக வழங்கிய வாக்குறுதிகளை நிறைவேற்றுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

கிளிநொச்சியிலுள்ள பூநகரி, கிராஞ்சி, வேரவில், வலைப்பாடு போன்ற பிரதேசங்களில் 34 காற்றாலைகளை நிறுவுவதற்கு நடவடிக்கை எடுப்பதாக DS ஊடாக அங்குள்ள மக்களுக்கு அறிவிக்கப்பட்டு இருக்கிறது. கிராஞ்சி பிரதேசத்தில் 24 காற்றாலைகள் அமைக்கப்பட இருக்கின்றன. அதில் 13 காற்றாலைகள் நேரடியாகவே மக்களுடைய குடியிருப்புகளுக்கு உள்ளேயும் விவசாயக் காணிகளின் நடுவிலும் அமைக்கப்பட இருக்கின்றன.

கௌரவ அமைச்சர் அவர்களே, தயவுசெய்து நீங்கள் இதில் தலையிட்டு இச்செயற்பாட்டை நிறுத்த வேண்டும். அபிவிருத்தி என்பது முக்கியம்! அதில் மாற்றுக் கருத்து கிடையாது. ஆனால், போரால் பாதிக்கப்பட்ட பிரதேசத்தில் இருக்கக்கூடிய மக்கள் தலைநிமிரப் பார்க்கின்ற இந்தச் சூழலில், நீங்கள் அபிவிருத்தி என்ற பெயரில் அவர்கள் கஷ்டப்பட்டு கட்டியெழுப்பப் பார்க்கின்ற பொருளாதாரத்தை அழிக்கின்ற வகையில், அவர்களுடைய இடங்களை ஆக்கிரமிக்கத் தொடங்கினால் அந்த மக்களால் தலைதூக்க முடியாது. எனவே, நீங்கள் இதில் தலையிட்டு, அந்த மக்களுடன் கலந்துரையாடி, ஆலோசனைகளைப் பெற்று, அனைவரும் ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு நடைமுறையைக் கடைப்பிடிப்பதுதான் முறை. நீங்கள் இந்தக் காணி விடயம் தொடர்பில் கடந்த யூலை மாதம் 26ஆம் திகதி வெளியிட்ட noticeஐ இரத்துச் செய்து, அங்குள்ள மக்களோடும் மக்கள் பிரதிநிதிகளோடும் கதைத்து, இந்த விடயத்தில் இருக்கக்கூடிய உண்மையான சிக்கல்களையும் பிரச்சினைகளையும் தீர்ப்பதற்கு அனைவரும் ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு நடைமுறையைக் கடைப்பிடிக்க வேண்டும். அதற்கு எங்களுடைய முழு ஒத்துழைப்பும் இருக்கும். சரியானதொரு விடயத்தைச் செய்யும்பொழுது, அதற்கு எங்களுடைய ஒத்துழைப்பு உங்களுக்கு இருக்கும். அதைச் செய்யாமல் ஒருதலைப்பட்சமாக இப்படிப்பட்ட அறிவித்தல்களை வெளியிடுவது சந்தேகத்தை இன்னும் அதிகரிக்கும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒரேயோர் உதாரணத்தைச் சொல்லி எனது உரையை முடிக்கின்றேன். தையிட்டியில் தனியார் காணிகளை ஆக்கிரமித்து, அங்கு சட்டவிரோதமாக ஒரு விகாரை கட்டப்பட்டு இருக்கிறது. அந்தக் காணிகளை அளப்பதற்கு அரசாங்கத்தால் ஒரு முயற்சி மேற்கொள்ளப்பட்டது. "உங்களுக்குத் திரும்பவும் வழங்குவதற்குத்தான் இந்தக் காணிகளை அளக்கப் போகிறோம்" என்ற எழுத்துமூல உத்தரவாதத்தை அரசாங்கத் திடமிருந்து பெற்றுக் கொள்ளுமாறு அப்போது நாங்கள் பாதிக்கப்பட்ட மக்களுக்குச் சொல்லியிருந்தோம்.

அத்தகைய வாக்குறுதிகள் எதுவும் வழங்கப்படாத நிலையில், கிட்டத்தட்ட 3,000 ஏக்கர் அளவுடைய அந்தக் காணியில் ஓர் அங்குலம்கூட விடுவிக்கப்படாது என்றும் அது இராணுவத்தின் தேவைக்காகத் தொடர்ந்தும் பயன்படுத்

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

தப்படும் என்றும் பாதுகாப்பு அமைச்சு அறிவித்திருக்கிறது. இது எங்களுக்குச் சந்தேகத்தை ஏற்படுத்துகின்றது. காணிகளை விடுவிக்கும் விடயத்தில் இராணுவம் எந்தளவுக்குப் பிரச்சினையாக இருக்கும் என்பது எங்களுக்கு அனுபவத்தின்மூலம் தெரியும். தவறான அல்லது ஏமாற்றப்படக்கூடிய அணுகுமுறைகள் தொடர்பில் கண்ணை மூடிக்கொண்டு இருக்கக் கூடாது என்பதற்காகத்தான் நாங்கள் எங்களுடைய மக்களுக்கு அந்த adviseஐக் கொடுத்தோம். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் ஒரு சிரேஷ்ட அமைச்சர்; உங்களுடைய கட்சிக்குள் பயமின்றி இந்தக் கருத்துகளை ஆணித்தரமாகத் தெரிவிக்கக் கூடியவர். எனவே, நீங்கள் இந்த விடயத்தில் தலையிட வேண்டுமென தயவாகக் கேட்டுக்கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, Standing Order No. 91(e) states, I quote:

> "Every Member must confine his observations to the subject under discussion;"

මම මේ කාරණය අපේ ලාල් කාන්ත ඇමතිතුමාට අනිවාර්යයෙන් කියන්න ඕනෑ. අපි තයිඩ්ඩි පන්සල ගැන කථා කරලා ඒක මනින්න ගියා. ඒක,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ. ඒ කථා කරපු එකට මේක අදාළ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]*

[අ.භා. 3.21]

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දවසේ සාකච්ඡා කරන පනත් දෙක අතරින් අඩුවෙන්ම කථා වුණත් ඉතා වැදගත්ම පනතක් තමයි 1958 අංක 29 දරන සත්ව පනත. මේ පනත 1958දී ගෙනැල්ලා අවුරුදු 68කට පස්සේ අද අපි මේකට අලුතෙන් සත්තු ඇතුළත් කරන්න යනවා. මේ දක්වා මෙහි "සතුන්" කියන වර්ගීකරණයට ඇතුළත් කරලා තිබුණේ එළගවයින් සහ මීගවයින් පමණයි. ඒකට හේතුව මේකයි. 1958 වාගේ කාලය වෙද්දී විශේෂයෙන් ගවයා තමයි ගොවිපළවල වැදගත් සතෙක් විධියට සැලකුවේ, ඌරා, එළුවා, බැටළුවා ඒ තත්ත්වයෙන් සැලකුවේ නැහැ. මෙහි තිබෙන ගැටලුව තමයි, පසුගිය වකවානුවේ පැවති හැම රජයක්ම විශේෂයෙන්ම මුල් තැන දුන්නේ වැඩි ගොවීන් සංඛ්‍යාවකගේ අවධානය යොමු වුණු ක්ෂේත්‍රවලට පමණක් වීම. විශේෂයෙන් වී වගාවට, පොහොර සහනාධාරයට, වී මිලදී ගැනීමට මූලිකත්වය දුන්නා. ඒ වාගේම අනෙක් හුඟක් භෝගත් නොසලකා හැරලා තිබුණා. විශේෂයෙන්ම කුරක්කන් වාගේ දේශීය භෝග වර්ග ගැන කවුරුත් කථා කළේ නැහැ.

ඒ වාගේම තමයි, සත්ව පාලන ක්ෂේත්‍රයත් සම්පූර්ණයෙන් නොසලකා හැරපු ක්ෂේත්‍රයක්. එයින් ගව පාලනය ඇරුණාම විශේෂයෙන් ඌරු පාලනය, එළු පාලනය වාගේ ක්‍රමවලින් තමයි ලෝකයේ දියුණු රටවල මිනිස්සුන්ගේ ප්‍රෝටීන අවශ්‍යතාව සම්පූර්ණ කළේ. මොකද, අඩු වියදමකින් ප්‍රෝටීන් නිෂ්පාදනය කරන්න පුළුවන් කර්මාන්ත තමයි ඌරු පාලනය, එළු පාලනය සහ බැටළු පාලනය. ඒ වාගේම අපට ආහාර කාර්යක්ෂමතාව වැඩි කරන්න පුළුවන් වෙන්නේත් මේ කර්මාන්ත දියුණු කළොත් පමණයි. නමුත්, විශේෂ හේතුවක් නිසා හෝ හේතුවක් නැතිකම නිසා මේ ක්ෂේත්‍ර නොසලකා හැර තිබුණා. ඇත්ත වශයෙන්ම එළුවා, බැටළුවා, ඌරා වාගේ සතුන් අද - අවුරුදු 68කට පස්සේ හරි - සත්ව පනත ඇතුළට ගේන්න පුළුවන් වීම සම්බන්ධයෙන් අපි සතුටු වෙනවා.

විශේෂයෙන් මේ කර්මාන්ත දියුණු කර ගෙන යද්දී අපට නීතිමය ආවරණයක් ගේන්න සිද්ධ වෙනවා. මීගවයින්, එළගවයින් ප්‍රවාහනය කරද්දී නීතිමය ආවරණය තිබුණත් ඌරන්, එළුවන්, බැටළුවන් වෙනුවෙන් මේ අයිතිවාසිකම තිබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම අද මේක නිසා මේ සතුන්ට - එළුවන්ට, ඌරන්ට සහ බැටළුවන්ට - රැකවරණයක් ලැබෙනවා. මොකද, අපි මේ තුළින් ඒ සත්තුන් සතුන් විධියට ලෝකයේ නීතිමය පිළිගැනීමකට ලක් කරනවා. නීතිමය පිළිගැනීමක් නැතිව මේ කර්මාන්ත දියුණු කර ගෙන යනකොට විවිධාකාරයේ ගැටලු මතු වෙන නිසා තමයි අද රජයක් විධියට අපි ගව පාලනයට අමතරව එළු පාලනය, ඌරු පාලනය, බැටළුවන් ඇති කිරීම වාගේ කර්මාන්තවලට මූලිකත්වය දීමට විශේෂ වැඩ පිළිවෙළවල් විශාල සංඛ්‍යාවක් සකස් කර තිබෙන්නේ. මේ සඳහා නීතිමය ආවරණය අවශ්‍ය වෙනවා. ඇත්තෙන්ම ගත්තොත්, මේ ගැන අඩුවෙන්ම කථා වුණේ මේක ලොකු වෙනසක් විධියට කවුරුත් දකින්නේ නැති නිසා. මෙහිදී වෙන දේ තමයි, පනතේ තිබෙන සත්වයන් කියන වර්ගීකරණයට මේ සතුන් තුන්දෙනා ඇතුළත් කරන එක. මේක ලොකු වෙනසක් නොවුණත්, ලොකු වෙනසක් කියලා අපි දැක්කේ නැතත් වැදගත් දෙයක්. ඇත්ත වශයෙන්ම මේ ආරම්භක පියවර පොඩි පියවරක් තමයි. මොකද අපි දන්නවා, අපේ දියුණුව, නැත්නම් සංවර්ධනය ළඟා වෙන්නේ ලොකු අඩිවලින් පැනලා නොවෙයි කුඩා පියවරවලින් කියන එක. ඒ නිසා මේක ආරම්භක පියවරක් විධියට ඉතා හොඳ තීරණයක් කියලා අපි විශ්වාස කරනවා. මේ හරහා සතුන් ප්‍රවාහනය කිරීමේදීත්, රෝග ව්‍යාප්තිය වාගේ දේවල් වළක්වා ගන්නත් තිබෙන නීතිමය ආවරණය එළුවන්ට, බැටළුවන්ට, ඌරන්ට වාගේ සතුන්ටත් ලැබෙනවා. ඒක මේ තුළින් ලැබෙන එක වාසියක්.

අනෙක් කාරණය මේකයි. අපි විශේෂයෙන්ම මේ වාගේ පනතකට මේ සතුන් ඇතුළත් කිරීමට හේතුව මොකක්ද? මේ සතුන් ප්‍රවාහනය කිරීම හරහා ඇති වෙන රෝග බෝ වීම, ඒ කියන්නේ දිස්ත්‍රික්ක අතර සතුන් ප්‍රවාහනය කිරීම හරහා සමහර

[ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා]

රෝග බෝ වීම තුළින් සිදු වූ විශාල හානිදායක සිදුවීම් ඉතිහාසය පුරාම අපි අත් විඳලා තිබෙනවා. ඒ නිසා මේ තත්ත්වය පාලනය කරන්න නම් මේ සතුන් ප්‍රවාහනය කිරීමත්, මේ සතුන් ඇති කිරීමත් යම් යම් නියාමනයන්ට ලක් කරන්න අවශ්‍යයි. එහෙම කළොත් විතරයි මේ සඳහා නීතිමය ආවරණය ලැබිලා සතුන්ගේ කර්මාන්තය අපට දියුණු කරන්න පුළුවන් වෙන්නේ. රෝග බෝ වීම සහ තවත් ගොඩක් හේතු නිසා තමයි අපි මේ පනත තුළට මේ සතුන් ඇතුළත් කරනු ලබන්නේ.

ඉදිරි කාලයේදී අපි බලාපොරොත්තු වෙනවා, මේ හරහා ගව පාලනයට - මීගවයින්ට සහ එළගවයින්ට - අමතරව විශේෂයෙන් අනෙකුත් සතුන් වන එළුවන්, ඌරන් සහ බැටළුවන් ඇති කිරීමේ කර්මාන්තයට විශාල අවධානයක් යොමු කරලා එයට අවශ්‍ය තාක්ෂණය ගෙනෙන්න. මොකද, අපි දකිනවා, ලෝකයේ දියුණු රටවල මේ එළු පාලනය, බැටළු පාලනය, ඌරු පාලනය හරහා විශාල කර්මාන්තයක් ගොඩනැඟිලා තිබෙන බව. මිනිසුන්ගේ ප්‍රෝටීන අවශ්‍යතාවෙන් විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය වෙන්නේ මේ සතුන් ඇති කිරීමේ කර්මාන්තය ඇතුළේ. ඒ අනුව, ෆාම් අවස්ථා විශාල වශයෙන් ඇති කරන්නත්, ඒ වාගේම ගව පාලනය කරන්න බැරි ඉතා කුඩා පරිමාණයේ ඉඩම් ප්‍රමාණයක් තිබෙන ගොවීන්ට මේ එළු පාලනය, බැටළු පාලනය, ඌරු පාලනය වාගේ දේවල් කරන්නත් පුළුවන්කමක් ලැබෙනවා. විශාල ගව පට්ටි නඩත්තු කිරීමේදී අපට තණ බිම්වල ප්‍රශ්නයක් තිබෙනවා. මේ සතුන්ට අවශ්‍ය නීතිමය ආවරණය සලසා දීලා, මේ සතුන්ගේ කර්මාන්තය වැඩිදියුණු කිරීම හරහා ඉදිරි කාලයේ අපේ ජනතාවට සත්ත්ව ප්‍රෝටීන් සහිත හොඳ ආහාර වේලක් ලබාගන්න මේ නීතිමය ආවරණය පිටුවහලක් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ඇත්තවශයෙන්ම පසුගිය රජයන් මේ සතුන් ගැන කථා කළේ නැහැ. මොකද, සත්තුන්ට කථා කරන්න බැහැ; සතුන්ට මේ ඉල්ලීම කරන්න බැහැ. ඇත්තවශයෙන්ම එළුවන් හුඟක් කල් බලාගෙන ඉන්න ඇති, ඒගොල්ලන්ගේ නම සත්ත්ව පනතට ඇතුළත් වුණේ නැහැයි කියලා. මේක ඡන්දය බලාගෙන කරන දෙයක් නොවෙයි. ඇත්තටම ගත්තොත්, මේක මේ රටේ ප්‍රෝටීන නිෂ්පාදනය වැඩිදියුණු කරන්නත්, ඒ කියන්නේ ජනතාවගේ පෝෂණය වැඩිදියුණු කරන්නත්, එයට තිබෙන නීතිමය බාධා අයින් කරන්නත් ගත්ත මූලික පියවරක්. මේ පියවරෙන් පසු අපට ඉස්සරහට තව ගොඩක් දේවල් කරන්න තිබෙනවා. නමුත්, මේ පියවර ගන්නේ නැතිව, මේ සතුන් මේ නීතිමය ආවරණය තුළට ගෙනෙන්නේ නැතිව ඉදිරි කටයුතු කරන්න බැරි නිසා තමයි මේ සංශෝධනය ඉදිරිපත් කළේ.

දැන් ගොඩක් වෙලාවට අපි කථා කරනවා වෙනත් වෘත්තිකයින් ගැන. ඒ වෘත්තිකයින් ඒගොල්ලන්ගේ ජයග්‍රහණ අත්පත් කරගෙන භුක්ති විඳිනවා, ඒ ගැන මාධ්‍ය සාකච්ඡා පවත්වනවා. මේ සතුන් මේ පනතට ඇතුළත් කිරීම ගැන ගත්තොත්, මෙහිදී මේ එළුවන්වත්, ඌරන්වත්, අනෙක් සතුන්වත් මාධ්‍ය සාකච්ඡා පවත්වන්නේ නැහැ නේ. නමුත්, අවුරුදු 68කට පසුව හෝ ඒ සතුන් මේ පනතට ඇතුළත් කිරීම හරහා මේ රටේ විශාල පරිවර්තනයක් කරන්න පුළුවන්. මෙම සතුන් මේ නීතිමය ආවරණය තුළට ගෙනැල්ලා, ඒ සතුන්ගේ කර්මාන්තය වැඩිදියුණු කරන්න මේ නීතිමය ප්‍රතිපාදනය සම්මත කරගන්න අපට පුළුවන් වීම ගැන අපි සතුටු වෙනවා.

මම විශේෂයෙන් මේ වෙලාවේ මේ කාරණයත් කියන්න කැමැතියි. අද දවසේ අපි සතුටු වන කාරණයක් තිබෙනවා. ඒ තමයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිසිවෙකු මේ සංශෝධනයට විරුද්ධ වුණේ නැති එක. අද එතුමන්ලා කථා කළේ මේ මාතෘකාව ගැන නොවෙයි, වෙන වෙන කාරණා. පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව මේ මන්ත්‍රීවරු කිසිකෙනෙකු මේකට විරුද්ධ නැහැ. මොකද, මේක කලක් තිස්සේ නොසලකා හැරුණු, කරන්න ඕනෑ දෙයක් කියා කවුරුත් දන්නා කාරණයක්. පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව සත්ත්ව පනතට මේ සතුන් ඇතුළු කිරීමට හැම මන්ත්‍රීවරයෙක්ම සහයෝගය දෙන නිසා කිසිම භේදයකින් තොරව අපට මේ සංශෝධන පනත් කෙටුම්පත සම්මත කරගන්න පුළුවන්.

අපි ශිෂ්ටත්වය මනින්න විවිධාකාර ක්‍රම පාවිච්චි කරනවා. බලවත් අයට සලකන ආකාරයෙන් තමයි ගොඩක් වෙලාවට අපි ශිෂ්ටත්වය මනින්න යන්නේ. නමුත්, කවුරුත් කථා නොකරන, හඬක් නැති මේ සතුන්ට නීතිමය ආවරණයක් ලබා දීම ගත්තොත්, ඒක තමයි අපේ තිබෙන ශිෂ්ටත්වය. මොකද, එළුවාත්, ඌරාත්, බැටළුවාත් වෙනුවෙන් ඒ අවශ්‍ය නීතිමය ආවරණය ලබා දීලා, මේ කර්මාන්තය වැඩිදියුණු කරන්න තිබෙන බාධා අයින් කරලා, කෘෂිකර්මය යටතේ මේ සත්ත්ව පාලන ක්ෂේත්‍රයට ප්‍රධාන තැනක් දීලා, ඒ තුළින් ඉදිරි කාලයේදී අපේ ජනතාවට අවශ්‍ය ප්‍රෝටීන අවශ්‍යතාව සපුරන්න අඩු පිරිවැයකින්, කාර්යක්ෂමව ප්‍රෝටීන නිෂ්පාදනය කරන්න මේ ක්ෂේත්‍රය භාවිත කරන්න අවශ්‍ය මූලික නීතිමය ආවරණය මේ හරහා ලැබෙයි කියා අපි විශ්වාස කරනවා. මට අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

මට විනාඩි 7ක් තිබුණා නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විනාඩියක් අඩුවෙලා තිබෙන්නේ.

[අ.භා. 3.29]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාද කරන අවස්ථාවේදී ඒ සම්බන්ධව අදහසක් දක්වන්නට අවස්ථාවක් ලැබීම ගැන මා සතුටු වෙනවා. විශේෂයෙන්ම සත්ත්ව පනත සම්බන්ධව ඔබතුමා ගෙනාපු සංශෝධනය ගැන අපේ කිසිම ගැටලුවක් නැහැ, ගරු ඇමතිතුමනි. ඇත්තවශයෙන්ම කාලානුරූපව සිද්ධ විය යුතු සංශෝධනයක් හැටියට තමයි අපි එය සලකන්නේ. නමුත්, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. විශේෂයෙන්ම තමුන්නාන්සේ මේ සතුන් ප්‍රවාහනය කිරීමේදී පශු වෛද්‍යවරුන්ගෙන් වාර්තාවක් ගන්න බලාපොරොත්තු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පශු වෛද්‍යවරුන්ගේ දැඩි හිඟයක් තිබෙන අවස්ථාවේ මේ වාර්තා ලබා ගැනීමේදී මේ ප්‍රවාහන කටයුතුවලට යම්කිසි ගැටලුවක් ඇති වෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා, යම්කිසි කාලයක් දීලා, මේ පශු වෛද්‍යවරුන්ගේ ප්‍රශ්නය විසඳලා, ඒගොල්ලන්ගේ හිඟය සම්බන්ධව යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා මේක ක්‍රියාත්මක කරනවා නම් වඩා කාලෝචිතයි කියන එක මම අදහසක් හැටියට ඉදිරිපත් කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, මෙතැන තවත් ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලා මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කළ අවස්ථාවේ කිව්වා, ඉදිරි කාලයේදී සත්ත්ව සුබසාධනය සම්බන්ධවත් පනත් කෙටුම්පතක් ගෙනෙන්න බලාපොරොත්තු වනවා කියලා. මම හිතන විධියට, සත්ත්ව සුබසාධනය සම්බන්ධ පනත් කෙටුම්පතත් අවශ්‍ය දෙයක්. සතුන්ටත් මිනිසුන්ට වාගේම සැලකිය යුතු බවට වූ යෝජනාවක් ගෙනෙනවා නම් ඉතාම හොඳයි කියලා මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. නමුත්, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි, ගරු මන්ත්‍රීතුමනි.

රිළවුන් සම්බන්ධයෙන් මේ රටේ ලොකු ගැටලුවක් තිබෙන බව අපි දන්නවා. ඒ නිසා ගෙවතු වගාවක් කරන්න පුළුවන්කමක් නැහැ. විශේෂයෙන්ම අපේ කෑගල්ල දිස්ත්‍රික්කය ඇතුළු අනෙකුත් දිස්ත්‍රික්කවලත් මේ ගැටලුව තිබෙනවා. මේ සම්බන්ධව ඔබතුමාට අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. ඔබතුමන්ලා මීට අවුරුද්දකට විතර ඉස්සෙල්ලා, විශේෂයෙන්ම අපේ නාමල් කරුණාරත්න මැතිතුමාගේ මැදිහත්වීමෙන් රිළා සංගණනයක් කළා, අපට මතකයි. එම සංගණනය අනුව යම් පියවරක් ගන්න බලාපොරොත්තු වනවා කියලායි ඔබතුමන්ලා එදා ප්‍රකාශ කළේ. මේ සඳහා රුපියල් කෝටි 7කට වඩා රජයේ මුදලක් තමුන්නාන්සේලා වැය කළා. දැන් අවුරුද්දක් විතර ගත වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. රිළා සංගණනය සම්බන්ධව තවම -

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු මන්ත්‍රීතුමා, මම පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි. ඒ සඳහා සම්පූර්ණ වියදම ගියේ රුපියල් ලක්ෂ 27යි. රුපියල් කෝටි 7ක් වියදම් වුණේ නැහැ.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
රුපියල් ලක්ෂ 27ක් හරි ඔබතුමන්ලා වියදම් කළා නේ. මම අහන්නේ එවැනි මුදලක් වියදම් කරලාත් සිද්ධ වුණේ මොකක්ද කියලායි. රිළා ප්‍රශ්නය සම්බන්ධයෙන් විසඳුමක් ලබා දෙන්න තවම ඔබතුමන්ලාට හැකියාවක් ලැබිලා නැහැ. ඒ නිසා, ඇත්ත වශයෙන්ම මේ සම්බන්ධව දැඩි අවධානයක් යොමු කරන්න කියන එක තමයි මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ. අපි දන්නවා, මොන තරම් අණ පනත් ගෙනාවා වුණත් එයින් ප්‍රශ්නවලට විසඳුමක් ලැබෙන්නේ නැත්නම් වැඩක් නැහැ කියන එක.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කෘෂිකර්මය සම්බන්ධයෙන් කටයුතු කරනවා. වී වගාව, තේ වගාව, රබර් වගාව විතරක් නොවෙයි තිබෙන්නේ. අපේ ප්‍රදේශවල ජනතාවට නොයෙකුත් ආකාරයේ ගැටලු තිබෙන බව අපි දන්නවා. මොකද, ගෙවතු වගාවෙන් විශාල පිරිසක් ජීවත් වෙනවා. ඒකෙන් ඔවුන් යම් කිසි අමතර ආදායමක් ලබා ගන්නවා. නමුත්, අද ඒ එකක්වත් කරන්න පුළුවන්කමක් නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ සංශෝධන පනත් කෙටුම්පත් ගෙනෙනවා වාගේම, ඔබතුමන්ලා මේ සම්බන්ධවත් යම් කිසි ක්‍රියාමාර්ගයක් අරගෙන යම් විසඳුමක් ලබා දෙන්න. ඒ සඳහා ඔබතුමන්ලා ක්‍රියාත්මක වෙයි කියලා මේ අවස්ථාවේදී අපි බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී තවත් කාරණයක් කියන්න කැමැතියි. ඔබතුමන්ලා ගෙනෙන්න බලාපොරොත්තු වන සත්ත්ව සුබසාධන පනත් කෙටුම්පත යටතේ අලි ඇතුන් සම්බන්ධව තවත් යෝජනාවක් ගෙනැල්ලා තිබුණා. අලි ඇතුන් සම්බන්ධව සමාජයේ කථා බහක් පවතිනවා. අලි ඇතුන් සම්බන්ධවත් යම් සුබසාධනයක් කරන්න. අලි ඇතුන් පෙරහැරේ යන අවස්ථාවලදී හිංසනයට ලක් වනවා. ඒ වාගේම දම්වැල්වලින් ගැට ගහලා තිබෙනවා. ඇත්ගොව්වන් අතින් මේ සතුන්ට විවිධ අඩන්තේට්ටම් සිද්ධ වන එක සම්බන්ධවත් ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ කියා යම් අදහසක් ඉදිරිපත් වෙලා තිබෙනවා. මේවා සම්බන්ධවත් යම් යම් ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව ගැටලුවක් නැහැ. නමුත් මම මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි. හීලෑ ඇතුන් සම්බන්ධව තමයි හුඟාක් දෙනෙකු කථා කරන්නේ කියා අපි දන්නවා. හීලෑ ඇතුන්ට සිදු වන හිංසාවන් සම්බන්ධව හැම කෙනෙකුම කථා කරනවා. ඒ වෙනුවෙන් විවිධ සංවිධාන තිබෙනවා. නමුත්, වනඅලි ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. වනඅලින්ට සිදු වන හානිය, වනඅලින්ට සිදු වන විනාශය ගැන අපේ අවධානය යොමු වනවා මදි කියලා මම හිතනවා. ගිය අවුරුද්දේ විතරක් විවිධ හේතු නිසා 350-400 අතර අලි ඇතුන් සංඛ්‍යාවක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම මේ වසරේ අලි ඇතුන් 180ක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒ සම්බන්ධ ක්‍රියාමාර්ගයක් ගැනීමට කිසිදු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ නිසා මේවා සම්බන්ධවත් අවධානය යොමු කරන්න, ගරු ඇමතිතුමනි.

විශේෂයෙන්ම හරකුන්, එළුවන්, බැටළුවන් ගැන අවධානය යොමු කළාට කමක් නැහැ. නමුත්, නිරන්තරයෙන් මේ අලි-ඇතුන් පිළිබඳව මිනිසුන් කථා කරනවා. අලි-ඇතුන් ලංකාවට තිබෙන වැදගත් සම්පතක්. විශේෂයෙන්ම වනසතුන් - වනඅලින් - ආරක්ෂා කිරීම සම්බන්ධව ඔබතුමන්ලා යම් ක්‍රියාමාර්ගයක් ගන්නවා නම්, යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම්, මම මේ අවස්ථාවේ එය වැදගත්කොට සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ප්‍රමාණවත් කාලයක් නොමැති නිසා මම මේ අවස්ථාවේදී තව එක කාරණයක් පමණක් කියලා මගේ කථාව අවසන් කරන්නම්. විශේෂයෙන්ම ජල සම්පාදනය පිළිබඳව ඔබතුමන්ලා නීති රීති කිහිපයක් ගෙනැල්ලා තිබෙනවා. මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. එක්තරා ඇමතිවරයෙකු ප්‍රකාශ කළා, පසුගිය කාලසීමාව තුළ විසල් ජල යෝජනා ක්‍රමය, ඒ වාගේම ප්‍රජා ජල යෝජනා ක්‍රමය පිළිබඳව කිසිම වැඩක් කෙරුණේ නැහැ කියලා. පසුගිය අවුරුදු හතරහමාර තුළ, ඒ කියන්නේ යහපාලන ආණ්ඩුව කාලයේ යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ විතරක් ප්‍රජා ජල ව්‍යාපෘති යෝජනා ක්‍රම 20ක් ක්‍රියාත්මක කරන්න කටයුතු කළ බව මම කියන්න කැමැතියි. ඒ වාගේම මා දන්නා තරමින් පසුගිය අවුරුදු ගණනාවකදීම - අපේ ආණ්ඩු කාලසීමාව තුළ - විශේෂයෙන්ම ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ, ලෝක බැංකු ආධාර යටතේ ප්‍රජා ජල ව්‍යාපෘති යෝජනා ක්‍රම 500කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන්න කටයුතු කර තිබෙනවා. දැන් මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ මේවා නඩත්තු කරන්න කියලායි. මොකද, හුඟක් වෙලාවට මේ ප්‍රජා ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් අදාළ පාරිභෝගික සමිතියට තමයි වගකීම තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාරිභෝගික සමිතිය සාමාන්‍යයෙන් සාධාරණ මුදලක් තමයි ජල ගාස්තු හැටියට ගන්නේ. එම මුදලින් මේ වාගේ යෝජනා ක්‍රමයක් නඩත්තු කරන්න ඒ අයට පුළුවන්කමක් නැහැ. ඒවායේ අඩුපාඩුවක්

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

වුණොත්, ෆිල්ටර්වල යම්කිසි ප්‍රශ්නයක් වුණොත්, ඒවා සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න හැකියාවක් නැහැ. ඒ නිසා, අනිවාර්යයෙන්ම මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන්, ඒ වාගේම අමාත්‍යාංශයෙන් මා ඉල්ලා සිටින්න කැමැතියි. මේවා නඩත්තු කරලා ආරක්ෂා කර ගැනීමට යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත්, අනිවාර්යයෙන්ම මේවා ආරක්ෂා කර ගන්න පුළුවන්කම ලැබෙනවා.

තව කාරණා කිහිපයක් කියන්න තිබෙනවා. නමුත් වෙලාව ප්‍රමාණවත් මදි. කෙසේ වෙතත්, ජල සම්පාදනය සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ කඩිනම් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගීතා හේරත් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.36]

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේදී විවාද කරනු ලබන්නේ 1958 අංක 29 දරන සත්ව පනතට කරන ලද සංශෝධනයක් සහ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතට කරන ලද සංශෝධන ගැනයි. සත්ව පනතට කරපු සංශෝධනයක් ගැන අද අපි කථා කරනවා. අපි ඉදිරියේදී සත්ව සුබසාධන පනත් කෙටුම්පතක් පිළිබඳවත් සලකා බලන්න නියමිතයි. නමුත් අද දින සත්ව සුබසාධනය සම්බන්ධයෙන් කථා කරනවා කියලා වටහාගෙන ඇති බව තමයි යම් අවස්ථාවලදී ඉදිරිපත් වුණු කරුණු අනුව අපට හැඟී ගියේ. ඒ ගැන කථා කරනවා නම්, සත්ව හිංසනය සම්බන්ධයෙන් ගත්තාම, අපේ රටේ නීතිය අදාළ වන්නේ 1907 අංක 13 දරන සත්ව හිංසා වැළැක්වීමේ ආඥා පනතටයි. එතකොට, සත්ව හිංසනය කියන කාරණයත් ආවරණය වන ආකාරයට, සතුන්ගේ සුබසාධනය කියන කාරණයත් ආවරණය වන ආකාරයට තමයි අපි ඉදිරියේදී සත්ව සුබසාධන පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් සලකා බලන්න බලාපොරොත්තු වෙන්නේ. එතැනදී අලි-ඇතුන්ගේ ගැටලු සම්බන්ධයෙන් සමාජයේ යම් කථාබහක් ඇති වෙලා තිබෙනවා. ඒ පිළිබඳව තවදුරටත් අදහස් ලබාගෙන, ඉදිරියේදී එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සලකා බැලීමට අපි අපේක්ෂා කරනවා.

සත්ව පනතට ගෙනෙන සංශෝධනය ගැන කථා කළොත්, 1958 අංක 29 දරන පනත අවස්ථා කිහිපයකදී සංශෝධනය වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 1964 අංක 20 යටතේත්, 1968 අංක 10 යටතේත්, 1988 අංක 46 යටතේ සහ 2009 අංක 10 යටතේ මේ පනත සංශෝධනය වෙලා තිබෙනවා. ඊට අමතරව තමයි අපි අද මේ සංශෝධනය ගෙන එනු ලබන්නේ. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, 1958 වර්ෂය වෙනකොට අපේ තිබුණේ කෘෂි කාර්මික සමාජයක් බව. එහිදී ගවයා කියන සත්වයා අපේ ජන ජීවිතත් එක්ක බද්ධ වෙලා තිබුණා. විශේෂයෙන්ම එම පනත සලකා බලද්දී ක්ෂේත්‍ර 4ක් ආවරණය වුණා. සතුන් ඝාතනය කිරීමට අදාළව, පරිපාලන දිස්ත්‍රික්ක අතර සතුන් ප්‍රවාහනය කිරීම, සතුන් හන ගැසීම සහ වගා භූමිවලට අනවසරයෙන් සතුන් ඇතුළු වීම සම්බන්ධයෙන් වන නියාමනයන් පිළිබඳව තමයි 1958දී ඒ පනත ගෙනැල්ලා තිබෙන්නේ. එතැනදී විශේෂයෙන්ම කොටස් දෙකක් යටතේ සලකා බලා තිබෙනවා. එකක්, ප්‍රවාහනය සහ අනෙක සතුන් ගොවිපොළවලට අනවසරයෙන් ඇතුළු වීම සම්බන්ධයෙන්. එතැනදී සතුන් ප්‍රවාහනය ගත්තාම "සතා" කියන අර්ථ නිරූපණය යටතේ හරකා, එහෙම නැත්නම් ගවයා, එළගවයා, මීගවයා කියන ගවයින් සම්බන්ධයෙන් පමණයි අදාළ වුණේ. එතැනින් එහාට ගියාම ප්‍රවාහනය සම්බන්ධයෙන් සෞඛ්‍ය සහතිකයක් ලබා ගැනීම අනිවාර්ය වෙලා තිබුණා. එතකොට එක් තැනකින් තවත් තැනකට සතුන් ප්‍රවාහනය කරද්දී රෝග සම්ප්‍රේෂණය වීම වැළැක්වීමක් එතැනදී සිද්ධ වුණා. විශේෂයෙන්ම ඌරා, එළුවා, බැටළුවා සහ කුකුළා කියන සතුන් පනතේ 4වන කොටසට, ඒ කියන්නේ අනවසරයෙන් ඇතුළු වීම කියන එක සම්බන්ධයෙන් අදාළ වුණා. ඒ තත්ත්වය ඒ ආකාරයෙන් තියෙද්දී එතැනින් එහාට ගිහිල්ලා අපට සංශෝධනයක් කරන්න අවශ්‍ය වුණා. මොකද, සතුන් ප්‍රවාහනයේදී සිද්ධ වන රෝග ගවයින්ගෙන් විතරක් නොවෙයි, වෙනත් සතුන්ගෙනුත් සම්ප්‍රේෂණය වෙන්න පුළුවන්. විශේෂයෙන්ම පසුගිය කාලවලදී අපේ රටේ අපි අත්වින්ද දෙයක් තිබුණා. ඒ තමයි, අප්‍රිකානු සූකර උණ රෝගය නිසා විශේෂයෙන්ම සූකර කර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල වුණා. එහිදී සතුන් විශාල වශයෙන් මිය ගියා. ඒක එතැනින් එහාට ගිහිල්ලා, කැලෑවල ඉන්න සතුන් පවා, වල්ඌරන් පවා මිය යන තත්ත්වයක් ඇති වුණා. මේ වෙනකොටත් ඒ බිඳ වැටිච්ච කර්මාන්ත නැවත නඟාසිටුවා ගත නොහැකි ආකාරයේ අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ ගවයින් කියන තැනින් ඔබ්බට ගිහිල්ලා පනතින් කලින් ආවරණය වුණු සතුන් වන - ඒ කියන්නේ, ඒ සතුන් ප්‍රවාහනයට අදාළ වුණේ නැහැ - ඌරා, එළුවා, බැටළුවා කියන සතුනුත් ප්‍රවාහනයට, නැත්නම් II වන කොටසින් ආවරණය වන ආකාරයට මේ සංශෝධනයට ඇතුළත් කරලා තිබෙනවා. ඒක, ප්‍රගතිශීලී තත්ත්වයක් කියලා මම කියන්න කැමැතියි. අපි කියන මතය තවත් තහවුරු කරන්න පුළුවන්, විපක්ෂයෙන් මේ දක්වා කථා කරපු ගරු මන්ත්‍රීවරුන් කිසිම කෙනෙක් මේ සංශෝධනය හොඳ නැහැ කියලා කරුණු දැක්වීමක් කළේ නැති නිසා. මේ පනත් කෙටුම්පත හරහා ගෙනෙන සංශෝධනය හොඳයි කියන කාරණය තමයි එතුමන්ලාත් පැහැදිලි කළේ.

මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මෙවැනි සංශෝධන ගෙන එද්දී අපි ලෝකයේ අනෙකුත් රටවල් අනුගමනය කරන ක්‍රමවේද වාගේම සත්ව සෞඛ්‍ය සඳහා වූ ලෝක සංවිධානයේ මාර්ගෝපදේශ - guidelines - පවා අදාළ කරගත්තා කියන එක. මේ විධියට නීති රීති විධිමත් කිරීම අපේ රටේ සමස්ත ආර්ථිකයටත් බලපානවා. පසුගිය කාලයේ අපේ රටේ සූකර කර්මාන්තය බිඳ වැටුණා. මොකද, ඒ සතුන්ට යම්කිසි රෝග තත්ත්ව වැළඳී තිබියදී ආනයන අපනයන සීමාවලට යටත් වන්න අපට සිදුවනවා. මුඛ හා කුර රෝග ගත්තොත්, එම රෝග පාලනය කරන අනෙකුත් රටවල තිබෙන දැඩි නීති රීති අනුව අපට එවැනි රටකට අපේ රටේ භාණ්ඩයක් අපනයනය කිරීමට පවා නොහැකි වෙන්න පුළුවන්. අපි කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරනවා නම්, ඒ රටේ තිබෙන ආනයන සීමා අනුව අපේ භාණ්ඩ ඒ රටට ආනයනය කරන එක තහනම් කරන්න පුළුවන්. මම ඒ කිව්වේ උදාහරණයක්. ඒක අදාළ කර්මාන්තයට පමණක් නොවෙයි, සමස්ත ආර්ථිකයටම බලපාන්න පුළුවන්. ඒ නිසා මෙය, සතුන් ප්‍රවාහනයේදී රෝග ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා ඉදිරිපත් කරන සංශෝධනයක් කියලා මම කියන්න කැමැතියි. ඒ වාගේම සෞඛ්‍ය සහතිකයක් ලබා ගන්න යනකොට නොයෙක් අපහසුතාවලට පත්වන නිසා යම්කිසි ආකාරයකට ගැටලු සහගත තත්ත්වයක් ඇතිවෙන්නත් පුළුවන්. මේ සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන් පසු එම රෙගුලාසි සකස් කිරීමේදී අපට ඒ පිළිබඳව සැලකිලිමත් වෙන්න පුළුවන්. මොකද, ජනතාව අපහසුතාවට පත්වීම වැළැක්වීම තමයි අපේ අරමුණ.

අද දවසේ කථා කරන අනෙක් පනත් කෙටුම්පත තමයි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත. ජල සම්පත් මණ්ඩලය, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන සහ ග්‍රාමීය ජල ව්‍යාපෘතිවලින් ජල සැපයුම ලබා දුන්නත්, අපේ රටේ ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලැබෙනවාද කියන ගැටලුව තිබෙනවා. මොකද, අද වන විටත් සියලු ජනතාවට එහෙම සුරක්ෂිත පානීය ජලය ලැබෙන්නේ නැහැ. ජනතාවට සුරක්ෂිත ජල සැපයුමක් ලබා දීම වෙනුවෙන් ආණ්ඩුවක් විධියට අපි කටයුතු කරනවා. විෂය භාර අමාත්‍යතුමා අද උදෑසන ඒ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරද්දීත් දැනුම් දුන්නා, පානීය ජල පුනරුදයක් ඇති කිරීම වෙනුවෙන් කටයුතු කරනවා කියලා. ඒ වාගේම මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මෙම සංශෝධනය තුළින් නීති විරෝධී ලෙස ජල භාවිතය, ජල නාස්තිය සහ අනවසර ජල සම්බන්ධතා සම්බන්ධයෙන් වන නීතිය ශක්තිමත් කර තිබෙන බව. ඒ වාගේම දඩ අය කිරීමේ ක්‍රමවේදයත් සංශෝධනය කරලා තිබෙනවා. එම නිසා මෙය හොඳ ප්‍රගතිශීලී පනත් කෙටුම්පතක් විධියට හඳුන්වන්න පුළුවන්. ජලය, සීමිත සම්පතක්. අපි ඒ සීමිත සම්පත ආරක්ෂා කරගන්න අවශ්‍යයි. පිරිවැයක් දරලා තමයි අපට මේවා ජනතාවට ලබා දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මෙවැනි නීති සංශෝධන ඇතුළත් කිරීම හොඳ තත්ත්වයක් කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

අද උදෑසන සිටම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් දැක්වූවා. නමුත් එතුමන්ලා මෙම පනත් කෙටුම්පත් දෙක සම්බන්ධයෙන් කරුණු දක්වන්නේ නැතිව වෙන වෙන කාරණා ගැන තමයි කරුණු දැක්වූයේ. මට ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමට කාලවේලාව ප්‍රමාණවත් නැහැ. අවසාන වශයෙන්, අද දවසේදී විවාදයට ගනු ලබන මේ සංශෝධන පනත් කෙටුම්පත් දෙක ප්‍රගතිශීලී පනත් කෙටුම්පත් දෙකක් බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.45]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ඔබතුමාගේ අවසරය ඇතිව, ස්ථාවර නියෝග 91(ඊ) යටතේ කථා කරන්නේ. අද දින විවාදයට ගැනෙන පනත්වලට අදාළ වෙන්නේ නැති සමහර දේවල් මම දෙමළ භාෂාවෙන් කියලා ඊට පස්සේ තමයි පනත් ගැන කථා කරන්නේ.

இன்றைய தினம் நான் இந்தப் பாராளுமன்றத்திலே கதைக்க வேண்டிய முக்கியமான விடயம், யாழ்ப்பாணம், பருத்தித்துறை நீதிமன்றத்திலே நடக்கின்ற ஒரு வழக்கு பற்றிய தாகும். உங்களுக்குத் தெரியும், யாழ்ப்பாண பல்கலைக் கழகத்தின்

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

என்று சொல்லப்படுகின்றவர் இதுவரைக்கும்-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අද දවසට අදාළව කථාව කරගෙන යන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඒක තමයි මම කිව්වේ, ඔබතුමාගේ අවසරය ඇතිව ස්ථාවර නියෝග 91(ඊ) යටතේ කථා කරනවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, ඔබතුමා අද දින විවාදයට අදාළව කරුණු ඉදිරිපත් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
யாழ்ப்பாண பல்கலைக்கழகத்தின்

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

என்று சொல்லப்படுகின்ற ஒருவர் தொடர்பான வழக்கு இன்றைய தினம் பருத்தித்துறை நீதிவான் நீதிமன்றில் நடைபெறுகின்றது. 14 மாணவிகளைக் கற்பழித்தமை தொடர்பாக அந்த வழக்கு நடைபெறுகின்றது. குறித்த 14 மாணவிகளும் தங்களுக்கு இழைக்கப்பட்ட அநியாயம் தொடர்பாக -VC - பீடாதிபதியிடம் கூறியபோது, அவர்களுக்கு எதிரான விடயங்கள் வெளியில் கதைக்கப்பட்டன. அதாவது, விசாரணை ஆரம்பிக்கப்பட்டது. இவர்கள் என்ன செய்திருக் கின்றார்கள் என்றால், நீதிமன்றத்திலே வழக்குத் தாக்கல் செய்துள்ளார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අද දින විවාදයට අදාළව කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you. එතැනත් තත්පර 30ක් ගියා. මෙච්චර වෙලා කථා කළා, ඒවා ගැන බැලුවේ නැහැ නේ. කමක් නැහැ. මම කථා කරනවා, ඕනෑ එකක් කරගන්න. நீதிமன்றத்திலே அந்த வழக்கு நடந்து கொண்டிருக்கின்றது. அவ்வாறு வழக்கு நடந்து கொண்டிருக்கும்போது, குறித்த 14 மாணவிகளுக்கும் நடந்த பாலியல் நடவடிக்கைகள் தொடர்பாக, நீதிமன்றத்தில் ஒருபோதுமே அவர் முன்னிலைப்படுத்தப்படவில்லை. பேராசிரியர் ஒருவர் - *[இடையீடு]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, - *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම කථාව නවත්වන්නද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයට අදාළව කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔයගොල්ලෝ මගේ වෙලාව නාස්ති කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ඕනෑ ඕනෑ දේවල් කථා කරන්න බැහැ. ඒ නිසා ඔබතුමා අද පවතින විවාදයට අදාළව කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එහෙනම් මම කථාව නවත්වන්නද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක ඔබතුමාගේ තීරණයක්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මෙහෙමයි. දැන් මෙච්චර වෙලාවක් සමහරුන් කථා කර කර හිටියා නේ. දැන් ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා point of Order එක ගන්නකොට ඔබතුමා මොකුත් කිව්වේ නැහැ නේ. එයා අදාළ නැති ඒවා නේ, කථා කළේ. මම මේ කථා කරන්නේ මිනිස්සුන්ගේ වැදගත් ප්‍රශ්නයක්. මෙතැන ඉන්න හංසක කියන නිලධාරියා මම මේ කථා කරන පුද්ගලයාගේ batchmate. ඒ නිසා තමයි මෙයාට මේක කථා කරන එක බලන් ඉන්න බැරි වෙලා තිබෙන්නේ. ඒ නිසායි නැඟිටලා ඇවිල්ලා ඔබතුමාට මේක කියන්නේ. මිනිස්සුන්ගේ ප්‍රශ්නයක් ගැන මම මේ කියන්නේ. මම මේ කථා කරන්නේ උතුරේ ඉන්න 14දෙනෙක් නඩු දාපු එකක් සම්බන්ධයෙන්.

*මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒක ගැන කථා කරන්න යන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා තමුන්නාන්සේ අද දින විවාදයට අදාළව කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මෙතැන ඉන්න මේ හංසක කියන්නේ ඒ නඩුව කරන එක්කෙනාගේ යාළුවා. එතකොට ඒ කෙනා ඇවිල්ලා ඔබතුමාට කිව්වාම ඔබතුමා මට කරදර කරනවා. එහෙනම් කියන්න, කථා කරන්න එපා කියලා. අපි මේක දාලා යන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා තීරණය කරන්න, කථා කරනවාද, නැද්ද කියලා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ඔබතුමාගෙන් අවසර ඉල්ලා, සිංහලෙන් කථා කරලා තමයි මේක කථා කරන්න පටන් ගත්තේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සිංහලෙන් කථා කළත්, ඔබතුමාට මේ පාර්ලිමේන්තුවේ අනවශ්‍ය දේවල් කථා කරන්න බැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මොකක්ද, මේ සෙල්ලම? නාමල් රාජපක්ෂට අරවා මේවා මෙහෙමයි කියලා කථා කරද්දි ඔබතුමන්ලා කොහේද හිටියේ? මොකක්ද, මේ මූලාසනයේ ඉඳගෙන කරන වැඩේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මූලාසනයේ ඉඳගෙන නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේ විවාදයට අදාළව කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කොච්චර වෙලාව නාස්ති වුණාද? එහෙනම් කියන්න ඕනෑ, කථා කරන්න එපා කියලා. මම මේ කථා කරන්නේ වැදගත් ප්‍රශ්නයක් ගැන. උතුරේ එක්කෙනෙකුට නඩුවක් දාලා තිබෙනවා. ඒක ගැන කථා කරන්නේ. ඇයි අපිට ඔහොම කරදර කරන්නේ? හංසක කියන ඔතැන ඉන්න නිලධාරියාට මේක කියන්න. ගුරුවරන් කියන එයාගේ යාළුවා තමයි මේ නඩුව කරන්නේ. කරුණාකරලා මට කරදර කරන්න එපා. *[බාධා කිරීමක්]*

**ගරු ගයාන් ජනක මහතා**
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු ගයාන් ජනක මන්ත්‍රීතුමා?

**ගරු ගයාන් ජනක මහතා**
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාතෘකාවට අදාළ නොවන, මේ සභා ගර්භයට නොගැළපෙන හැම දෙයක්ම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මා යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එහෙම ඉවත් කරන්න කියලා කොහේවත් කියලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ time එක කියන්නකෝ, කොච්චර වෙලාවක් තිබෙනවාද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 7යි තිබෙන්නේ. ඔබතුමාට අදාළව අද දවසේ විනාඩි 7ක කාලයක් වෙන්කර තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මෙහෙමයි. මම කථා කරන්නේ උතුරේ තිබෙන ප්‍රශ්නයක් ගැන. අපි බලාගෙන හිටියොත් අවුරුදු ගණනක් යනවා, ඒ ප්‍රශ්න ගැන කථා කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා ඒකට වෙන අවස්ථාවක් ගන්න. මේක අද දින විවාදයට ඔබතුමාට වෙන් කර තිබෙන වෙලාව.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මේ සභාව ඇතුළේ කොච්චර දවසක් මේ වාගේ ඒවා කථා කරලා තිබෙනවාද? මම කථා කරන්නේ වැදගත් ප්‍රශ්න. මම ආණ්ඩුවට අත දික් කරලා නැහැ. ඔබතුමා හංසකගේ කථාවක් අහලා මගේ කථාව නවත්වන්නේ ඇයි? මම කථා කරන්නේ උතුරේ අහිංසක ගැහැනු ළමයි 14දෙනෙක් දාලා තිබෙන නඩුව ගැන. ඒක ගැන කථා කරන්න බැරිද, මේ පාර්ලිමේන්තුවේ? මොකක්ද, මේ සෙල්ලම? ලාල් කාන්ත ඇමතිතුමනි, පොඩ්ඩක් කියන්නකෝ, මේ පුටුවේ වාඩිවෙන්න කලින් Standing Orders කියවලා එන්න කියලා. මගේ time එක කියන්න, තව කොච්චර වෙලාවක් තිබෙනවාද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි 3යි, තත්පර 12ක් තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මොකක්ද මේ සෙල්ලම? මම කථා කරන්න යන්නේ උතුරේ මිනිස්සුන්ට තිබෙන ප්‍රශ්නයක් ගැන. මේ බලන්නකෝ, විනාඩි 4ක් කොහොම නාස්ති කරලා තිබෙනවාද කියලා. අපි දැන් කොහොමද මේ සභාව ඇතුළේ කථා කරන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අදාළ කරුණු ගැන කථා කරන්න. ඔබතුමාට ඕනෑ ඕනෑ දේවල් මේ පාර්ලිමේන්තුව ඇතුළේ කථා කරන්න බැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ, මේ බලන්නකෝ. ඔයගොල්ලෝ කැතම කැත වැඩ නේ කරන්නේ; කැතම කැත වැඩක් කරන්නේ; කැතම කැත වැඩක් කරන්නේ. මගේ කථාව සම්පූර්ණයෙන්ම නාස්ති කරලා. මේ හංසක කියන පුද්ගලයාගේ යාළුවාගේ නඩුව ගැන කථා කරන්න යන්නේ. මේ ඉස්සරහ පුටුවේ වාඩිවෙලා ඉන්න එක්කෙනාගේ. කරුණාකරලා මගේ time එක දෙන්න; කරුණාකරලා මගේ time එක දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා විවාදයට අදාළව කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
நன்றி! කරුණාකරලා interpretation එක අහන්න. 14 மாணவிகள் வழக்குத் தாக்கல் செய்திருக்கின்றார்கள். அந்த வழக்கு இன்றைய தினம் பருத்தித்துறை நீதிமன்றத்தில் நடைபெறுகிறது. அந்த மாணவிகள் rape பண்ணப் பட்டிருப்பதை அவர்களால் நிரூபிக்க முடியாது. இந்த வழக்கில் பாதிக்கப்பட்ட மாணவிகள் எங்கே போய் முறையிடுவது? அதனால், நான் எங்களுடைய நீதிபதிகளின் மனச்சாட்சியைத் தொட்டுக் கேட்கின்றேன், தயவுசெய்து, அந்தப் 14 மாணவிகளுக்கும் சரியான நீதியை வழங்குங்கள்!

ලාල් කාන්ත ඇමතිතුමනි, මම කථාව නවත්වන්නම්. මම තව මාසයකින් පාර්ලිමේන්තුවෙන් යනවා. කැතම කැත වැඩ කරන්නේ ඔතැනින්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම නවත්වනවා, මගේ time එක ඇතුළේ. ඔබතුමන්ලා මගේ time එක ඇතුළේ කථා කරන්න ඕනෑ නැහැ නේ. මම තව එක දෙයක් කියලා කථාව ඉවර කරන්නම්.

ලාල් කාන්ත ඇමතිතුමනි, ඔබතුමා ගැන වැදගත් දේවල් ටිකක් කථා කරන්න මම ලැහැස්ති වෙලා හිටියේ. හැබැයි, මූලාසනයෙන් මගේ වෙලාව ඔක්කොම ටික නාස්ති කළා. අපේ පඩිය වැඩි කරලා තිබෙනවා. දැන් මගේ පඩිය රුපියල් 484,000ක් වෙනවා. රුපියල් 484,000ක් තමයි MP කෙනෙකුට ගෙවන්නේ. MP කෙනෙකුට රුපියල් 60,000ක් වැඩි කරලා තිබෙනවා. හැබැයි, ඔයගොල්ලන් අපේ අහිංසක මිනිසුන්ගේ පඩි එක වතාවක්වත් වැඩි කරලා නැහැ. ත්‍රිරෝද රථ පදවන අයට සහනාධාරයක් හැටියට ඔයගොල්ලන් රුපියල් 60,000ක් වැඩි කළාද? *[බාධා කිරීමක්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වැදගත් දේවල් කථා කරන්න හිටියේ. ඔබතුමා Standing Orders දන්නේ නැත්නම් කරුණාකරලා ඔය පුටුවේ වාඩි වෙන්න එපා. *[බාධා කිරීමක්]* තව දෙයක් මම කියන්නයි හදන්නේ. කරුණාකරලා මට කථා කරන්න දෙන්න. *[බාධා කිරීමක්]* කරදර කරන්නේ නැතුව කරුණාකරලා මට කථා කරන්න දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මොකක්ද, මේ සෙල්ලම? කථා කරන්න දෙන්නකෝ අනේ! මම දන්නේ නැහැ, මේ රජය කොතැනටද වැටෙන්න යන්නේ කියලා. හැබැයි, අපි ඉවත් වෙලා යන්නම්. අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මම එකක් කියන්නම්. කාට හරි දඬුවම් දෙන්න මට

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

බලය තිබෙනවා නම්, මේ වංචා, දූෂණකාරයෝ අයින් කරලා දාලා යන්න මට බලය තිබෙනවා නම්, මේ ඉස්සරහ පේළියේ කෑ ගහන හැම පුද්ගලයෙක්ම මම නැති කරනවා. එහෙම නේද, ඔයගොල්ලන්ගේ ලොක්කා කථා කළේ? මතකයිද? ඔයගොල්ලන්ගේ ලොක්කා කථා කළේ එහෙම නේ. හැබැයි, මතක තියා ගන්න, අපටත් කාලයක් එනවා කියන එක.

Audit reports ගැන තමයි දැන් මම කථා කරන්න හදන්නේ. ඔයගොල්ලන්ම කිව්වා නේ, වංචා, දූෂණ ගැන කථා කරන්න කියලා. ලාල් කාන්ත ඇමතිතුමනි, 5වැනි audit report එකත් මම ඉදිරිපත් කරනවා. මම මේ මාසයේ විතරයි පාර්ලිමේන්තුවේ ඉන්නේ. 5වැනි audit report එකත් මම ඉදිරිපත් කරනවා. මම අත දික් කරන්නේ නැහැ, මේ සෞඛ්‍ය ඇමතිතුමාට. *[බාධා කිරීමක්]* අනේ! කට වහගෙන ඉන්නකෝ බබාලා. මම අත දික් කරන්නේ නැහැ, මේ සෞඛ්‍ය ඇමතිතුමාට. මේක සිද්ධ වෙලා තිබෙන්නේ 2022දී, ඔබතුමන්ලාගේ රජය කාලයේ නොවෙයි. 2022දී සිදු කළ රුපියල් මිලියන 38.5ක වංචාවක් පිළිබඳ මේ Internal Audit Report එක මම ඔයගොල්ලන්ගේ අමාත්‍යාංශයට ගෙනැල්ලා දුන්නා. දැන් අවුරුදු දෙකක් ගත වෙලා තිබෙනවා, අද වෙනකල් ඔයගොල්ලන් ඒ සම්බන්ධයෙන් කිසිම පියවරක් අරගෙන නැහැ. ලාල් කාන්ත අමාත්‍යතුමනි, ඒ වාගේ audit reports 5ක් ගෙනැල්ලා දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ඉවර කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මගේ කාලය නාස්ති කළා නේ. මගේ කථාව ඉවර කරන්න මට තව තත්පර 30ක් දෙන්න පුළුවන්ද, බැරිද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඉවර කරන්න, ඉවර කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

5වැනි audit report එක තමයි මම අද submit කරන්නේ. මේක ඔබතුමන්ලාගේ රජය කාලයේ එකක් නොවෙයි. මේ audit report එකට මොකක්ද වෙන්නේ කියලා මම අමාත්‍යතුමාගෙනුයි, නියෝජ්‍ය අමාත්‍යතුමාගෙනුයි අහනකොට ඒගොල්ලන් කිව්වා, අපි මේ සම්බන්ධයෙන් inquiry එකක් කරන්න කිව්වත්, පහළ ඉන්න නිලධාරියා - DGHS - මේවා ගැන බලන්නේ නැහැ කියලා. එතකොට ඒගොල්ලන්ම අපට කියනවා, ඔයා ගිහිල්ලා පාර්ලිමේන්තුවේ කථා කරන්න කියලා. වැදගත් දේවල් මම මේ කථා කරන්නේ. ඔයගොල්ලන් නේ අපට කිව්වේ, වංචා සහ දූෂණ හොයාගෙන ඇවිල්ලා කථා කරන්න කියලා. මම මේ ඉදිරිපත් කරන්නේ 5වැනි Audit Report එක. වංචාව රුපියල් මිලියන 38.5යි. මේක වෙලා තිබෙන්නේ කොවිඩ් කාලයේ. කොවිඩ් කාලයේ ඔයගොල්ලන් රජයේ හිටියේ නැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉවර කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුනි.

ඒ දවස්වල කිව්වා, අවුරුදු 4ක් ගිහිල්ලාත් කොවිඩ් කාලයේ සිදු වූ දේවල් තවමත් audit කරනවා කියලා. එතකොට මම නලින්ද ජයතිස්සගෙනුයි, හංසක විජේමුණිගෙනුයි අහනකොට ඒගොල්ලන් කිව්වා, ඔයා ගිහිල්ලා මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කරන්න, අපි කොච්චර try කළත් මේවා හොයා ගන්න බැරි වෙලා තිබෙනවා කියලා. මම ඒවා හොයාගෙන ඇවිල්ලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නම්. ඒවා ගැන කථා කරන්න යනකොට පොල් ගැනයි, තව දේවල් ගැනයි මට කථා කරන්න පුළුවන්ද?

මතකයි නේද, මාව DCC meeting එකෙන් එළියට දාපු හැටි? ලාල් කාන්ත ඇමතිතුමනි, මම ඒක ගැන කථා කරන්න ආවේ නැහැ. ඔයගොල්ලන්ගේ ඇමති කෙනෙක් අපට ගහන්නත් ආවා නේ. මම ඒ ගැන complain කළාද, ඔයගොල්ලන්ට ඇවිල්ලා? *[බාධා කිරීමක්]* ඔය පුටුවේ වාඩි වෙලා ලජ්ජා නැති වැඩ කරන්න එපා. පුටුවට ගරුත්වය තිබෙනවා. හැබැයි, ඔයගොල්ලන් කරන්නේ නම් මාර ලජ්ජා නැති වැඩක්. ඔයගොල්ලන් ඕනෑ නම් හොරු අල්ලන්න, නැත්නම් ඔහොමම ගිහිල්ලා වැටෙන්න. Audit reports සහ ඊට අදාළ ලේඛන මම **සභාගත*** කරනවා.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.54]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று இந்தச் சபையில் நடைபெறுகின்ற தேசிய நீர் வழங்கல், வடிகால் சேவைகள் சபை (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு, எங்களுடைய திருகோணமலை மாவட்டத்தில் காணப்படுகின்ற நீர் வழங்கல் சம்பந்தமான பிரச்சினைகள் பற்றி இந்த இடத்தில் பேசலாமெனநினைக்கின்றேன்.

நான் இந்த உயரிய சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புவது என்னவென்றால், திருகோணமலை மாவட்டத்தில் மூவின மக்களும் நீண்ட காலமாக எதிர்நோக்குகின்ற மிக முக்கியமான, மக்கள் நலப் பிரச்சினையான, பாதுகாப்பான, தொடர்ச்சியான மற்றும் தரமான குடிநீர் விநியோகத்திலுள்ள பிரச்சினைகள் பற்றியதாகும். குடிநீர் என்பது அபிவிருத்தித்

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

திட்டத்துடன் மாத்திரம் தொடர்புபட்ட ஒன்றல்ல. அது மக்களின் ஆரோக்கியத்திலும், வாழ்க்கைத் தரத்திலும், எதிர்காலப் பாதுகாப்பிலும் நேரடியாகத் தொடர்புடைய அடிப்படை உரிமை சார்ந்த விடயமாகும். எனவே, திருகோணமலை மாவட்ட மக்களுக்கு நிலையான குடிநீர் வசதியை வழங்குவது இந்த அரசாங்கத்தின் முக்கிய பொறுப்பாகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, திருகோணமலை மாவட்டத்தில் பிரதான குடிநீர் வழங்கல் திட்டமாகக் காணப்படுவது, Greater Trincomalee Integrated Water Supply Scheme - GTIWSS - ஆகும். இந்தத் திட்டம் 1985ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்டது. ஆரம்பத்தில் நாளொன்றுக்கு 36,000 கனமீற்றர் நீரை உற்பத்தி செய்யும் திறன் கொண்டதாக இருந்த இந்தத் திட்டம், 2013ஆம் ஆண்டு நாளொன்றுக்கு 54,000 கனமீற்றர் நீரை உற்பத்தி செய்யும் வகையில் விரிவுபடுத்தப்பட்டது. இன்று இந்தத் திட்டத்தின் மூலம் திருகோணமலை நகரம் மற்றும் பட்டினமும் சூழலில் 42 கிராம சேவையாளர் பிரிவுகளுக்கும், கிண்ணியாவில் 31 கிராம சேவையாளர் பிரிவுகளுக்கும், தம்பல காமத்தில் 12 கிராம சேவையாளர் பிரிவுகளுக்கும், கந்தளாயில் 23 கிராம சேவையாளர் பிரிவுகளுக்கும், குச்சவெளியில் 7 கிராம சேவையாளர் பிரிவுகளுக்கும் என மொத்தம் 5 பிரதேச செயலாளர் பிரிவுகளிலுள்ள 115 கிராம சேவையாளர் பிரிவுகளுக்கு குடிநீர் வழங்கப்பட்டு வருகின்றது.

தற்போதைய நிலவரப்படி, திருகோணமலை மாவட்டத்தில் இதனால் பயனடையும் மக்களின் தொகை சுமார் 344,400 ஆகும். மொத்த குடிநீர் இணைப்புகளின் எண்ணிக்கை 80,880 ஆகும். தற்போதைய உற்பத்தித்திறன் நாளொன்றுக்கு 54,000 கனமீற்றர் ஆகும். இத்திட்டம் தற்போது முழுமையான கொள்ளளவில் இயங்குவதால், அதிகரித்துவரும் தேவையைப் பூர்த்தி செய்ய முடியாத நிலை ஏற்பட்டுள்ளது. இதன் விளைவாக, புதிய குடிநீர் இணைப்புகளை வழங்குவதில் தாமதம், குறைந்த அழுத்தத்துடனான குடிநீர் விநியோகம், சில பகுதிகளில் தொடர்ச்சியற்ற - ஒருநாள் அல்லது இரண்டு நாட்கள் விட்டு -குடிநீர் விநியோகம், மக்கள் அன்றாடத் தேவைகளைப் பூர்த்தி செய்வதில் சிரமம் என்பன ஏற்பட்டுள்ளன. இவற்றின் காரணமாக எங்களுடைய பிரதேச மக்கள் தொடர்ந்து பாதிக்கப்படுகின்றனர்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இப்பிரச்சினை எதிர்காலத்தில் மேலும் தீவிரமடையக்கூடிய நிலைப்பாடு காணப்படுகின்றது. தரவுகளின் அடிப்படையில், 2030ஆம் ஆண்டில் எதிர்பார்க்கப்படும் பயனாளிகளின் எண்ணிக்கை 348,664 எனவும், 2050ஆம் ஆண்டில் எதிர்பார்க்கப்படும் பயனாளிகளின் எண்ணிக்கை 488,007 எனவும் மதிப்பிடப்பட்டுள்ளது. எனவே, இன்று எடுக்கப்படும் தீர்மானங்கள் அடுத்த 25 வருடங்களுக்கான குடிநீர் பாதுகாப்பைத் தீர்மானிக்கும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையால் முன்னெடுக் கப்படுகின்ற இந்தத் திட்டம் இப்பொழுது இடைநிறுத்தப்பட்டு இருக்கின்றது. இத்திட்டத்தின் மதிப்பிடப்பட்ட செலவு 27,390 மில்லியன் - 27.39 பில்லியன் - ரூபாய் ஆகும். இந்தத் திட்டத்தின்கீழ், அல்லே மகாவலி ஆற்று நீர் எடுத்துக் கொள்ளும் நிலையத்தை 65,000 கன மீற்றர்/நாள் கொள்ளளவு உடையதாக மேம்படுத்துதல், புதிய 20,000 கனமீற்றர்/நாள் கொள்ளளவு கொண்ட நீர் சுத்திகரிப்பு நிலையத்தை உருவாக்குதல், மஹ்ரூப் கிராமத்தில் 3,000 கன மீற்றர் கொள்ளளவு கொண்ட நீர் சேமிப்புத் தொட்டியை அமைத்தல், தம்பலகாமம் பகுதியில் 2,000 கன மீற்றர் கொள்ளளவு கொண்ட நீர் சேமிப்பு வசதிகளை அமைத்தல், புதிய நீர் கடத்தல் மற்றும் விநியோகக் குழாய் கட்டமைப்புகளை அமைத்தல் என்பன மேற்கொள்ளப்பட திட்டமிடப்பட்டுள்ளது. இன்று இந்தத் திட்டம் இடைநிறுத்தப்பட்டு இருக்கின்ற காரணத்தால் பல பிரச்சினைகள் ஏற்பட்டு இருக்கின்றன. எனவே, அரசாங்கம் இந்தத் திட்டத்தை மீள ஆரம்பிப் பதற்குரிய நடவடிக்கைகளை மும்முரப்படுத்த வேண்டும்.

இன்று நீர் வழங்கல் சம்பந்தமாக மக்கள் பல்வேறு பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள். எங்களுடைய பிரதேசத்தில் சனத்தொகை அதிகரித்துச் செல்கின்ற காரணத்தால், அங்குள்ள மக்களுக்குத் தரமான குடிநீரைப் பெறுவது என்பது எட்டாக்கனியாக உள்ளது. எனவே, இது தொடர்பில் விசேட கவனத்தைச் செலுத்தி, உரிய அதிகாரிகளுடன் கலந்துரையாடி குறுகிய கால, இடைக்கால மற்றும் நீண்டகால திட்டங்களை வகுத்துச் செயற்பட வேண்டும்.

இன்று பல திட்டங்கள் நிறைவுபெறாமல் இருக்கின்றன. குறிப்பாக, கப்பல்துறை குடிநீர் வழங்கல் திட்டம் 8 ஆண்டு களுக்கும் மேலாகத் தாமதமடைந்து காணப்படுகின்றது. கந்தளாய் நீர் சுத்திகரிப்பு நிலைய 'பம்ப்' மாற்றும் திட்டம், வெல்லமணல் - கிண்ணியா வீதி குழாய் மாற்றும் திட்டம் என்பன 7 ஆண்டுகளுக்கும் மேலாகத் தாமதமடைந்து காணப்படுகின்றது. அதேபோல், கரிமலையூற்று - பாதிஸ்புர 'பூஸ்டர்' அமைப்புத் திட்டம் 5 ஆண்டுகளுக்கும் மேலாகத் தாமதமடைந்து காணப்படுகின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
*ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.*

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
*අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.*

இந்தத் திட்டங்கள் ஆரம்பிக்கப்பட்டு பல ஆண்டுகளா கின்றன. இவற்றைப் பூரணப்படுத்துவதில் ஏன் தாமதம் ஏற்பட்டு இருக்கின்றது? இந்தத் திட்டங்களுக்கான நிதியை எவ்வாறு பெறுவது என்ற விடயத்தில் அரசாங்கம் கவனம் செலுத்தி, இந்தத் திட்டங்களை மிக விரைவில் மீளவும் ஆரம்பித்து, நிறைவு செய்வதன்மூலம் திருகோணமலை மாவட்டத்தில் காணப்படுகின்ற நீர் வழங்கல் சார்ந்த பிரச்சினைகளை முடிவுக்குக் கொண்டுவரலாம். எனவே, இந்த விடயத்தில் விசேட கவனத்தைச் செலுத்துமாறு கௌரவ அமைச்சர் அவர்களிடம் வேண்டுகோள் விடுத்து, என்னுடைய உரையை முடிக்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
*ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා*

[பி.ப. 4.01]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்த உயரிய சபையில் தேசிய நீர் வழங்கல், வடிகால் சேவைகள் சபை (திருத்தம்) சட்டமூலம் தொடர்பாக கருத்துரைக்கக் கிடைத்த வாய்ப்புக்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். காலத்தின் தேவையை உணர்ந்து, நாட்டில் நீர் வழங்கல் மற்றும் வடிகால் சேவைகளை நவீனமயப்படுத்தும் நோக்கில் இந்தச் சட்டத் திருத்தத்தை முன்வைத்துள்ள கௌரவ அமைச்சர் அவர்களுக்கும் எமது தேசிய மக்கள் சக்தி அரசாங்கத்துக்கும் எனது நன்றிகளையும் பாராட்டுக்களையும் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீர் என்பது வெறும் இயற்கை வளம் மட்டுமல்ல. அது மனித வாழ்வின் அடிப்படை உரிமையாகும். "நீரின்றி அமையாது உலகு" என இற்றைக்கு 2,000 ஆண்டுகளுக்கு முன்னர் திருவள்ளுவர் கூறியிருக்கிறார். இந்த ஒரு வரியானது, மனித வாழ்வுக்கும் சமூக முன்னேற்றத்துக்கும் நீரின் முக்கியத் துவத்தை மிகத் தெளிவாக எடுத்துரைக்கின்றது. இன்று உலகில் காணப்படுகின்ற மிகப் பெரிய சவால்களில் ஒன்றுதான், பாதுகாப்பான, சுத்தமான குடிநீரை மக்களுக்கு வழங்குவது. அந்த வகையில்தான் எங்களுடைய அரசாங்கம் இந்தச் சட்டத் திருத்தத்தைக் கொண்டுவந்துள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 1974ஆம் ஆண்டு உருவாக்கப்பட்ட தேசிய நீர் வழங்கல், வடிகால் சேவைகள் சபைச் சட்டமானது, அந்தக் காலத்தின் தேவைக்கு ஏற்ப உருவாக்கப்பட்ட முக்கியமான ஒரு சட்டமாகும். ஆனால், இன்று இந்த நாட்டின் தேவைகள் மாறியுள்ளன. காலநிலை மாற்றம், அதிகரித்து வரும் மக்கள் தொகை, நகரமயமாக்கல், தொழிற்றுறை வளர்ச்சி, நீர் வளப் பாதுகாப்பு, கழிவுநீர் முகாமைத்துவம் ஆகிய புதிய சவால்களை எதிர்கொள்ள இந்தச் சட்டத்தை நவீனப்படுத்துவது அவசியமாகும். இந்தச் சட்டத் திருத்தத்தின்மூலம், நீர் வழங்கல் சேவைகளை விரிவுபடுத்துதல், தொழிற்பேட்டைகள் மற்றும் தொழிற்றுறை பகுதிகளுக்கான நீர் சேவைகளை ஒழுங்குபடுத்துதல், சமூக அடிப்படையிலான நீர்த் திட்டங்களை வலுப்படுத்துதல், நீர் வீணாக்கம் மற்றும் சட்டவிரோத இணைப்புகளை கட்டுப்படுத்துதல், கழிவுநீர் முகாமைத்துவத்தை மேம்படுத்துதல் போன்ற முக்கிய நடவடிக்கைகளை மேற்கொள்ள முடியும். Water, the supply of which is a public service, is a fundamental, human right. A responsible government must ensure safe, reliable and equal access to water for every citizen. அந்த வகையில், மக்களின் அடிப்படைத் தேவையை முன்னிலைப்படுத்தும் இந்தச் சட்டத் திருத்தத்துக்கு எனது முழுமையான ஆதரவைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஓர் ஆளும் கட்சி உறுப்பினராகவும், தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் பிரதிநிதியாகவும், எமது பொறுப்பு வெறுமனே சட்டங்களை இயற்றுவதுடன் முடிவடைவதில்லை. அந்தச் சட்டங்களின் பயன் ஒவ்வொரு கிராமத்தையும், ஒவ்வொரு குடும்பத்தையும் சென்றடைய வேண்டும். மக்கள் எமக்கு ஆணை வழங்கியது, பிரச்சினைகளை அடையாளம் காண்பதற்கு மட்டுமல்ல, அவற்றுக்கான நிலையான தீர்வுகளை வழங்குவதற்கும் ஆகும். Our responsibility is not only to identify problems, but also to find sustainable solutions and deliver meaningful results to our people.

இந்தக் கொள்கையின் அடிப்படையில், யாழ்ப்பாணம் மற்றும் கிளிநொச்சி மாவட்ட மக்களின் குடிநீர்த் தேவையை நிறைவேற்றுவதற்கு ஓர் அரசாங்கமாக நாங்கள் நடவடிக்கை எடுத்து வருகின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையால் முன்னெடுக்கப்பட்ட யாழ்ப்பாணம் - கிளிநொச்சி நீர் வழங்கல் மற்றும் சுகாதாரத் திட்டத்தின் - Jaffna-Kilinochchi Water Supply and Sanitation Projectஇன் - கட்டுமானப் பணிகள் நிறைவடைந்து, தற்போது நீர் விநியோகப் பணிகள் ஆரம்பிக்கப்பட்டுள்ளமை முக்கியமான ஒரு முன்னேற்றமாகும். இதற்காக சம்பந்தப்பட்ட அமைச்சுக்கும், தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபைக்கும் எனது நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இது ஓர் ஆரம்பம் மட்டும்தான். தற்போது யாழ்ப்பாண மாவட்டத்தில் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபைமூலம் சுமார் 5.25 சதவீதமான மக்களுக்கே குடிநீர் வழங்கப்படுகின்றது. இன்னும் 94 சதவீதத்துக்கும் மேற்பட்டவர்களுக்கு குடிநீர் வழங்கவேண்டிய தேவை இருக்கின்றது. ஏனைய மாவட்டங்களுடன் ஒப்பிடுகையில், இது மிகவும் குறைவான நிலையாகும். எனவே, ஏற்கனவே அமைக்கப்பட்டுள்ள பிரதான நீர் விநியோகக் கட்டமைப்பின் பயனை, அதிகமான மக்களிடம் கொண்டுசெல்வதே எமது அடுத்த முக்கியமான இலக்காக இருக்க வேண்டும். Infrastructure development becomes meaningful only when its benefits reach the ordinary people at their doorstep. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பிரதான நீர் விநியோகக் குழாய்கள் பல பகுதிகளில் அமைக்கப் பட்டுள்ளபோதிலும், இன்னும் பல பகுதிகளுக்கு அவற்றை விரிவுபடுத்த வேண்டியுள்ளது. குறிப்பாக, வேலணை, ஊர்காவற்றுறை, மண்டைதீவு, காரைநகர், சுழிபுரம், அராலி, வட்டுக்கோட்டை, கரவெட்டி, உடுப்பிட்டி, இருபாலை, வாதரவத்தை, சுன்னாகம், நல்லூர் மற்றும் யாழ்ப்பாண நகரப் பகுதிகளில் நீர் விநியோகக் குழாய்க் கட்டமைப்பை விரிவுபடுத்தி, பாதுகாப்பான குழாய் மூலமான குடிநீரை அனைத்து மக்களுக்கும் வழங்க நடவடிக்கை எடுக்க வேண்டும். தேசிய மக்கள் சக்தி அரசாங்கமாக, மக்களின் அரசாங்கமாக இதை நாங்கள் நிச்சயமாக செய்து முடிப்போமென இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முக்கியமாக நயினாதீவு, நெடுந்தீவு மக்களுடைய நீர்ப் பிரச்சினையை இங்கு குறிப்பிட விரும்புகின்றேன். அண்மைய தினங்களில் நான் உட்பட எங்களுடைய அமைச்சர்களும் பாராளுமன்ற உறுப்பினர்களும் குறித்த பிரதேசங்களுக்குச் சென்று பார்த்தோம். அதன்பொழுது, நெடுந்தீவு மற்றும் நயினாதீவு பிரதேசங்கள் குடிநீர்ப் பிரச்சினையால் பாரிய சவால்களைச் சந்தித்து வருவது தெரியவந்தது. நேற்று முன்தினம் நாங்கள் நெடுந்தீவுக்குச் சென்றபொழுது, அங்குள்ள மக்கள் எங்களிடம் கூறிய விடயம் என்னவெனில், தங்களுக்குப் போக்குவரத்து வசதிகளை ஏற்படுத்தித் தர வேண்டும் என்றுதான். மேலும், நெடுந்தாரகை, வடதாரகை

படகுகளில் பயணிகளை மட்டுமே ஏற்றிச் செல்ல முடியும் என்பதால், யாழ். குடா பகுதியிலிருந்து தங்களுக்குத் தேவையான குடிநீரைக் கொண்டுசெல்ல முடியாத நிலை இருப்பதாகவும் சொன்னார்கள். எனவே, அந்த மக்களுக்கு அவர்களுடைய இடத்திலேயே குடிநீரைப் பெற்றுக்கொடுக்க வேண்டும். அதுவே அவர்களுடைய முக்கிய தேவையாகக் காணப்படுகின்றது. தற்போது நயினாதீவில் அமைக்கப்பட்டு இருக்கின்ற RO plant ஊடாகவே அனலை தீவுக்கும் எழுவை தீவுக்கும் குடிநீர் வழங்கப்படுகின்றது. எனினும், வழங்கப்படுகின்ற நீரின் அளவு குறைவாக இருப்பதுடன், அதன் தரமும் மிக மோசமாகக் காணப்படுகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தீவுப் பகுதிகளின் புவியியல் அமைப்புக் காரணமாக, அங்குள்ள மக்கள் நீண்ட காலமாக நீர் சார்ந்த சவால்களை எதிர்நோக்கி வருகின்றனர். எனவே, நாங்கள் அவர்களுக்கு நிரந்தரமான solutionஐ வழங்க வேண்டும். Geography should never become a barrier for development. The Island's communities deserve equal access to essential public services. எனவே, அவர்களுக்கு குழாய் மூலமாக குடிநீர் வழங்கப்பட வேண்டும் என்பதை நான் இந்த இடத்தில் அழுத்தம் திருத்தமாகக் கூறிக்கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, யாழ்ப்பாணத்தின் எதிர்கால நீர் பாதுகாப்பை உறுதி செய்வதற்கு நீண்டகாலத் திட்டங்கள் அவசியமாகும். தற்போது கடல்நீரை மூலாதாரமாகக்கொண்டு குடிநீர் வழங்கும் முயற்சிகள் உடனடித் தேவையைப் பூர்த்திசெய்தாலும், நிரந்தரத் தீர்வாக மேற்பரப்பு நீர் மூலாதாரங்களை உருவாக்க வேண்டும். அந்த வகையில், பாலியாறு நீர்வள அபிவிருத்தித் திட்டம் தொடர்பான சாத்தியவள ஆய்வுகளை நாங்கள் மேற்கொள்ளவேண்டிய இருப்பதுடன், அது தொடர்பான நடவடிக்கைகளையும் எடுக்கவேண்டி இருக்கின்றது. அதற்குரிய நடவடிக்கைகளை எமது அரசாங்கம் எடுத்து வருகின்றது என்பதை நான் இந்த இடத்தில் கூறிக் கொள்ள விரும்புகின்றேன். We must move beyond temporary arrangements and focus on long-term water security for future generations.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீர் வழங்கல் மட்டுமல்ல, கழிவுநீர் முகாமைத்துவமும் ஒரு நவீன நகரத்தின் அடிப்படைத் தேவையாகும். யாழ்ப்பாண மாநகர பிரதேசத்தைப் பொறுத்தவரையில், முறையான sewerage project ஒன்றை நடைமுறைப்படுத்துவது மிகவும் அவசியமாகும். தற்போது தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையால் ஆசிய அபிவிருத்தி வங்கியின் நிதியுதவியுடன், சுமார் 60 மில்லியன் அமெரிக்க டொலர் மதிப்பீட்டில் யாழ். நகரின் ஒரு பகுதியை உள்ளடக்கிய கழிவுநீர் சுத்திகரிப்புத் திட்டம் முன்னெடுக்கப்பட்டு வருகின்றது. இது ஒரு முக்கியமான ஆரம்பமாகும். யாழ். மாநகர பிரதேசம் முழுவதையும் இந்த sewerage project க்குள் கொண்டுவர நடவடிக்கை எடுக்க வேண்டும். அதுவே எங்களுடைய இலக்காகக் காணப்பட வேண்டும். A modern city requires not only supply of clean water, but also an effective wastewater management system. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கிளிநொச்சி மாவட்டமும் எதிர்கால அபிவிருத்திக்கான முக்கியமான ஒரு மாவட்டமாகும். விவசாயம், தொழில் வளர்ச்சி, முதலீடுகள், புதிய குடியிருப்புகள் என்பவற்றைக் கருத்திற்கொண்டு நீர் திட்டமிடல் மேற்கொள்ளப்பட வேண்டும். அந்த வகையில், Jaffna-Kilinochchi Water Supply and Sanitation Projectஇன் முன்னேற்றத்தை அதிகரித்து, அந்த மக்களுக்கான நீர் தேவையைப் பூர்த்திசெய்ய வேண்டிய தேவை இருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு ரஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Please give me one more minute, Sir.

வடக்கு மக்களின் நீர்ப் பிரச்சினை ஒரு நீண்டகால சவாலாக இருந்தபோதும், அதனை எதிர்காலத்துக்கு தொடரவிட முடியாது. தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் கொள்கை என்பது அனைத்து மக்களுக்கும் சமமான அரச சேவைகளை வழங்குவதாகும். யாழ்ப்பாணம் மற்றும் கிளிநொச்சி மக்களின் குடிநீர் பாதுகாப்பை உறுதிசெய்வது எமது பொறுப்பாகும். மக்களுடனும் அமைச்சுகளுடனும் அதிகாரிகளுடனும் இணைந்து நாம் இந்தப் பணிகளை முன்னெடுப்போம். எனவே, இந்தத் திருத்தச் சட்டமூலம் நிறைவேற்றப்படுவது உண்மையிலேயே மகிழ்ச்சியளிக்கிறது எனக்கூறி, வாய்ப்பு வழங்கியமைக்கு நன்றி கூறி, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහීර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.11]

**ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் தேசிய நீர் வழங்கல், வடிகால் சேவைகள் சபை (திருத்தம்) சட்டமூலம் மற்றும் விலங்குகள் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதம் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது. இந்த இரண்டு விடயங்களும் மனித வாழ்வோடு ஒன்றிணைந்தவையாகக் காணப்படுகின்றன.

முதலில் நாங்கள் குடிநீர் பற்றி பார்ப்போம். அம்பாறை மாவட்டத்திலுள்ள கொண்டுவட்டுவான் நீர்த்தேக்கத்திலிருந்து அந்தப் பிராந்தியத்தில் இருக்கின்ற அனைத்து மக்களுக்கும் குடிநீர் வழங்கப்பட்டு வருகின்றது. கடந்த காலங்களில் இந்த வேலைத்திட்டம் மிகச் சிறப்பாக நடைபெற்று வந்தாலும்கூட, தற்போது அங்கு மக்களுடைய குடிநீர் தேவை கூடுதலாகக் காணப்படுவதால், கூடுதலானவர்களுக்குக் குடிநீரை வழங்கவேண்டி உள்ளது. வேறு தேவைகள் காரணமாக அங்குள்ள மக்கள் தங்களுடைய காணிகளில் இருந்த கிணறுகளை மூடிவிட்டதால், பழங்காலத்தில் இருந்த கிணற்று நீரைப் பாவிக்கின்ற முறைமை இப்போது இல்லாமல்போய் இருக்கின்றது. இந்தச் சூழலில், அதிகமான மக்கள் நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபைமூலம் நீரைப் பெறும்போது, அரசாங்கத்துக்குக் கூடுதலான வருமானம்

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

கிடைக்கின்றது. இவ்வாறு பெறுகின்ற நீரை மாத்திரம் நம்பி இருக்கின்ற மக்களுக்கு தொடர்ச்சியாக நீர் தட்டுப்பாடு ஏற்படுகின்றது. அவ்வாறான சந்தர்ப்பங்களில் மாற்று வழிகளை ஏற்பாடு செய்யவேண்டிய தேவைப்பாடு இருக்கின்றது.

எங்களுடைய கரையோரப் பிரதேசங்களில் இருக்கின்ற மக்கள் காணிகளின் விலை அதிகரிப்பு காரணமாக அடுக்கு மாடி வீடுகளை அமைத்து வருகின்றார்கள். குறைந்த அழுத்தத்துடன் நீர் வருவதால், மேல்மாடிக்கு நீர் போய்ச் சேருவது கஷ்டமாக இருக்கின்றது. அம்பாறை மாவட்டத்தின் கரையோரப் பிரதேசங்களுக்கு குடிநீர் போதியளவு கிடைப்ப தில்லை. அதனால் குடிநீர் தட்டுப்பாடு ஏற்படுகின்றது. எனவே, இது தொடர்பில் கவனம் செலுத்தி உரிய நடவடிக்கை எடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

பொத்துவில் பிரதேச மக்கள் நீண்ட காலமாக குழாய் மூலமான குடிநீரை எதிர்பார்த்த வண்ணம் இருக்கிறார்கள். அந்தப் பிரதேசம் உலகளாவிய ரீதியில் சுற்றுலாத்துறைக்குப் பெயர்போன ஓர் இடமாக இருக்கின்றது. ஆட்சிக்கு வருகின்ற எல்லா அரசாங்கங்களும் ஹெட ஓயா திட்டத்தை முன்வைத்து பொத்துவில் மக்களுடைய வாக்குகளைப் பெறுவதை நாங்கள் பார்க்கின்றோம். மொனராகலை, சியம்பலாண்டுவ பிரதேசங்களைத் தாண்டி இந்த நீர் விநியோகத் திட்டத்தைக் கொண்டுவருவதால், இனங்களுக்கு இடையில் பிரச்சினை ஏற்படுமெனச் சொல்லி, கடந்த அரசாங்கங்கள் இத்திட்டத்தை இடைநடுவிலே விட்டுவிட்டன. அதாவது, வாயளவில் மாத்திரம் சொல்லிவிட்டு, இந்த நீர் விநியோகத் திட்டத்துக்குத் தடையாக இருந்தன. இன்று எந்தவிதமான இன, மத வேறுபாடும் இல்லாமல் நாட்டைக் கட்டியெழுப்புகின்ற இந்த அரசாங்கத்தின்மூலம் அந்த மக்களுக்குத் தீர்வு கிடைக்குமா? என நான் கேட்கின்றேன். மேலும், அந்தப் பிரதேசத்தில் இருக்கின்ற விவசாயிகளுக்கு விவசாய நடவடிக்கைகளை மேற்கொள்வதற்குத் தேவையான நீரை வழங்க வேண்டிய தேவைப்பாடும் இருக்கின்றது. தற்பொழுது, இச்சபையில் கௌரவ அமைச்சர் அவர்கள் இருக்கிறார். இந்த நாட்டில் உற்பத்தியை அதிகரிக்கும்போதுதான் எங்களால் நாட்டை மேலும் கட்டியெழுப்ப முடியும். இந்த விடயத்தில் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்துவாரென நினைக்கின்றேன்.

அம்பாறை மாவட்டமானது, இந்த நாட்டின் மொத்த நெல் உற்பத்தியில் 35 சதவீத பங்களிப்பை வழங்குகின்றது. இன்று நெல்லுக்கு விலை நிர்ணயம் செய்யப்பட்டுள்ளதால் விவசாயிகள் ஓரளவு நட்டத்திலிருந்து மீண்டு இருக்கிறார்கள் என்று நினைக்கின்றேன். நெற்களஞ்சியசாலைகளைப் புனரமைக்கும் பணிகள் அம்பாறையில் இடம்பெறுகின்றன. நிந்தவூரிலுள்ள நெற்களஞ்சியசாலையைப் புனரமைப்பதற்காக 80 இலட்சம் ரூபாய் நிதி வழங்கப்பட்டு இருந்தபோதிலும், அந்த வேலைகள் இன்னும் முடிவுறுத்தப்படவில்லை. நிந்தவூரிலும் அம்பாறையிலும் நடந்த DCCஇல் நாங்கள் இது தொடர்பில் முடிவுகளை எடுத்தோம். அந்தக் களஞ்சிய சாலையின் புனரமைப்புப் பணிகளை முடிப்பதற்கான சந்தர்ப்பம் குறைவாக இருப்பதனால், நிந்தவூர் பிரதேசத்தில் பெறப்படுகின்ற நெல்லை அட்டாளைச்சேனையில் இருக்கின்ற களஞ்சியசாலைக்குக் கொண்டுசென்று, அந்த விவசாயி களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்கு முதற்கட்ட நடவடிக்கை எடுக்குமாறு நாங்கள் பணித்தோம். எனினும், உத்தியோகத்தர்கள் இதுவரை அதற்கான நடவடிக்கைகளை மேற்கொள்ளவில்லை என்பதை நான் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன்.

நிந்தவூரிலுள்ள விவசாயிகளின் நெல்லை அங்கேயே களஞ்சியப்படுத்தினால் அந்த விவசாயிகளுக்கு போக்குவரத்து உட்பட ஏனைய விடயங்கள் இலகுவாக இருக்கும். நிந்தவூரில் 80க்கும் மேற்பட்ட அரிசி ஆலைகள் இருக்கின்றன. இதனால் அந்தப் பிரதேசத்திலேயே அவர்களுடைய நெல்லை நல்ல விலைக்குக் கொடுப்பதற்கான சந்தர்ப்பங்களும் இருக்கின்றன. மேற்குறித்த வேலைத்திட்டம் நடைபெறாததால், இந்த அரசாங்கம் எங்களுடைய மக்களுக்கு ஒன்றும் செய்யவில்லை என்று உங்கள்மீது வீணான குற்றச்சாட்டு சுமத்தப் படுவதற்கான சந்தர்ப்பமும் இருக்கின்றது. எனவே, இந்த நிலை ஏற்படுவதை தவிர்த்துக்கொள்ளுமாறு கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, விலங்குகள் சம்பந்தமான விடயத்தை எடுத்துக் கொள்வோம். விவசாயிகளுக்குப் பாரிய பிரச்சினையாக இன்று யானைகள் மாறியிருக்கின்றன. நாங்கள் யானை களையும் ஏனைய விலங்குகளையும் பாதுகாக்க வேண்டிய அதேநேரம், மனிதர்களையும் அவர்களின் வாழ்விடங்களையும் ஏனைய சொத்துக்களையும் பாதுகாக்க வேண்டும். எனவே, இந்தப் பிரச்சினைக்கு ஒரு நிரந்தரத் தீர்வைப் பெற்றுக் கொடுக்க வேண்டிய தேவைப்பாடு இருக்கின்றது.

சேனாநாயக்க சமுத்திரத்தை அண்டியுள்ள பிரதேசங்கள் தற்போது குடியிருப்புகளாக மாறிவருவதால், அங்குள்ள யானைகள் உணவுக்காக கரையோரங்களை நாடி வருகின்றன. இது எங்களுடைய பிரதேசங்களிலுள்ள குடியிருப்புகளுக்கு அச்சுறுத்தலாக அமைகின்றது. எனவே, இந்த விடயத்தைக் கவனத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையில் பணிபுரிகின்ற உத்தியோகத்தர்களின் இடமாற்றம் சம்பந்தமாக circular ஒன்று வெளியிடப்பட்டுள்ளதாக நாங்கள் அறிகின்றோம். மேல் மாகாணத்தில் பணிபுரிபவர்கள் 5 கிலோ மீற்றர் தூரத்துக்கு அப்பாற்பட்ட இடங்களுக்கும், ஏனைய 8 மாகாணங்களில் பணிபுரிபவர்கள் 50 கிலோ மீற்றர் தூரத்துக்கு அப்பாற்பட்ட இடங்களுக்கும் இடமாற்றம் கோர முடியுமென அதில் குறிப்பிடப்பட்டுள்ளது. இந்தச் சுற்றறிக்கையிலுள்ள விடயங்களை விபரமாகக் கூறுவதற்கு நேரம் போதாமல் இருக்கின்றது. எனவே, அந்த உத்தியோகத்தர்களுக்கு ஆகக் குறைந்தது அவர்களது மாவட்டத்துக்குள்ளேயே பணிபுரிவதற்கான சந்தர்ப்பத்தை வழங்குமாறு நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபை தொடர்பாக நாங்கள் இன்னும் பல விடயங்களைப் பார்க்கவேண்டி இருக்கின்றது. இலங்கை மின்சார சபை மக்களுக்கு வழங்கும் சேவைகளைவிட, குறைவான சேவை களையே இச்சபை வழங்குகின்றது. நீர் இணைப்புக் கட்டணம் உட்பட ஏனைய கட்டணங்களைச் செலுத்துவதற்கு அம்பாறை மாவட்டத்தில் நான்கு இடங்கள்தான் ஒதுக்கப்பட்டுள்ளன. அவையாவன: அம்பாறை, அக்கரைப்பற்று, சம்மாந்துறை, சாய்ந்தமருது. எனவே, அங்கு இருபதுக்கும் மேற்பட்ட இடங்களில் இவ்வாறான சேவை நிலையங்களை நிறுவுவதன் மூலம் இலகுவாகக் கட்டணங்களைச் செலுத்துவதற்கான சந்தர்ப்பம் மக்களுக்குக் கிடைக்கும். Onlineமூலம் கட்டணங்களைச் செலுத்தினாலும்கூட, அவர்களுடைய கணக்குகள்மூலம் மூன்று நாட்களுக்குப் பிறகுதான் வரவு

வைக்கப்படுகின்றது. இந்த நிலையை இல்லாமல் செய்வதற் குரிய ஏற்பாடுகளையும் இந்தத் திருத்தத்தின்மூலம் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, நாவிதன்வெளி பிரதேசத்தில் நீர் இணைப்புக் குரிய பிரதான குழாய்களைப் பொருத்துவதற்கான சந்தர்ப்பங்கள் குறைவாகவே இருக்கின்றன. இது சம்பந்தமாக அங்கிருக்கின்ற அலுவலர்களிடம் கேட்டால், இதற்கான பொருட்களுக்குத் தட்டுப்பாடு இருப்பதாகக் கூறுகின்றார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි. කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
ஒரு நிமிடம் தாருங்கள்!

போதியளவு பொருட்கள் இருந்தால் தங்களுக்கு வேலை அதிகரித்துவிடும் என்ற நோக்கில் அவர்கள் அவற்றைப் பெற்றுக்கொள்ளாமல் இருக்கிறார்களென நான் நினைக்கின்றேன். எனவே, எமது பிரதேசத்தில் காணப் படுகின்ற பிரச்சினைகளைத் தீர்த்துவைக்க வேண்டுமெனவும், எதிர்காலத்தில் பொதுமக்களின் நலன்கருதி நீர்க் கட்டணத் தைக் குறைப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனவும் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඊ.එම්. බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.20]

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂ පනත් දෙකකට සංශෝධන එකතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ අතරින් එකක් තමයි, ජාතික ජල සම්පාදන හා ජලාවපහවහන මණ්ඩල පනත සංශෝධනය කිරීම. වර්තමානයේ අපේ රටේ පානීය ජල පරිභෝජනය සම්බන්ධයෙන් විශේෂ ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අමතරව ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය, පළාත් පාලන ආයතන හරහාත් පෞද්ගලික - තනි තනි - වශයෙන් මිනිසුන් ජලය ලබා ගෙන තිබෙනවා. ඒ විධියට ජලය ලබා ගැනීමේදී එහි සෞඛ්‍යාරක්ෂිත බව කොපමණ දුරට තහවුරු වෙනවාද කියන එක ගැනත්, ඒ වාගේම ජලය අරපිරිමැස්මෙන් පාවිච්චි කරනවාද කියන එක ගැනත් ගැටලුවක් මතුව තිබෙනවා. මේ ආදී කරුණු සලකා බලන විට අද මේ අපි කථා කරන, විවාදයට ගත්ත පනත ඉතා සුවිශේෂී වෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය එහි නියාමනය ලබාගත්තාට පසුව පළාත් පාලන ආයතන, ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව හරහා ස්වාධීනව - ආයතන මට්ටමෙන් - ජලය ලබා ගැනීමේදී සිදුවන අක්‍රමවත්භාවය හා සෞඛ්‍යාරක්ෂිතභාවය කළමනාකරණය කරගන්න අපට පුළුවන් වෙනවා. අද මේ පනතට ගෙනෙන සංශෝධන හරහා සිද්ධ වෙන්නේ ඒ මහා කාර්යභාරයයි.

අපි දන්නවා, සමහර පුද්ගලයන්, සමහර ආයතන ජල මූලාශ්‍ර තමන්ගේ පෞද්ගලික දේපළක් බවට පත්කරගෙන තිබෙන බව. ඒ මඟින් විශාල පිරිසකට ජලය පාවිච්චි කරන්න පුළුවන් අවස්ථා තිබුණත් අපට ඒක නියාමනය කරගන්න බැහැ, යම් යම් අය තනිව ඒකට අයිතිය ප්‍රකාශ කරමින් ඉන්න නිසා. හැබැයි අපට පුළුවන් වෙනවා, මේ පනතට ගෙනෙන සංශෝධන හරහා ඒ අවස්ථාව මඟ හරවා ගන්න. අපි දකිනවා, පළාත් පාලන ආයතන හා වෙනත් ආයතනවල ජල මූලාශ්‍රවලින් ජලය ලබා ගෙන ඒවාට මීටර සවි කර නොමැති ආකාරය. මීටර සවි කර නොමැති වීම නිසා ජල කළමනාකරණය හරියට සිද්ධ වෙන්නේ නැහැ. මිනිස්සු 100කට පාවිච්චි කරන්න පුළුවන් ජල ප්‍රමාණය සමහර වෙලාවට පවුල් 10ක්, 12ක් පාවිච්චි කරනවා. ඒවාට හරියට මිලක් අයවෙන්නේ නැහැ. ඒ අතින් ගත්තාම, මේ පනත ඉතා සුවිශේෂී හා කාලෝචිතයි කියලා අපි විශ්වාස කරනවා.

ජලය පිළිබඳව කථා කළොත්, ලෙඩ රෝගවලට විශේෂයෙන්ම ලංකාවේ උග්‍ර ප්‍රශ්නයක් වන වකුගඩු රෝගයට ජලය කියන එක මූලික වශයෙන් පදනම් වෙනවා. පසුගිය කාලය පුරාවට නතර වෙලා තිබුණු, නතර කර තිබුණු ජල යෝජනා ක්‍රම කිහිපයක් වර්තමාන ආණ්ඩුව විසින් ආරම්භ කර තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ උතුරු ජල යෝජනා ක්‍රමයත් එහෙම එකක්. දැන් අපි ඒකේ වැඩ ආරම්භ කර තිබෙනවා. 2027 අවුරුද්දේ මැද භාගය වෙනකොට එහි වැඩ අවසන් කරගන්න පුළුවන් කියලා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් සහතික කර තිබෙනවා. එතකොට අපට පුළුවන් වෙනවා, ඒකෙන් දැනට ජලය ලබා දෙන පවුල් 20,000ට අමතරව තවත් පවුල් 30,000කට, 40,000කට ආසන්න ප්‍රමාණයකට ජලය ලබා දෙන්න. ඒ ජල යෝජනා ක්‍රමය අපට අවසන් කරගන්න පුළුවන් වෙනවා, 2027 අවුරුද්ද මැද භාගය වෙනකොට. මේක නතර වෙලා තිබුණේ නිකම් නොවෙයි. පසුගිය කාලය පුරාවට මේවායේ බිල්පත් ටික නොගෙවීම නිසා, විශාල මුදලක් අපේ ආණ්ඩුව ඇවිල්ලා මේ අවුරුදු එකහමාරට ආසන්න කාලයේදී ගෙවලා තමයි නැවත මෙය ක්‍රියාත්මක කරන්න පටන් ගෙන තිබෙන්නේ.

අද මේ පනත් ගැන කථා කරනකොට විපක්ෂයේ මන්ත්‍රීවරු වෙන වෙන කථා කිය කියා හිටියා. තව එකක් තමයි, මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ - හාරගම ජල යෝජනා ක්‍රමය. මේ ජල යෝජනා ක්‍රමයට 2027දී මුදල් වෙන් කරන්න ජනාධිපතිතුමා එකඟ වෙලා තිබෙනවා. මේ ජල යෝජනා ක්‍රමයත් සාර්ථක කරගත්තාට පසුව මහනුවර දිස්ත්‍රික්කයේ තවත් පවුල් 40,000කට ආසන්න ප්‍රමාණයකට ජලය ලබා දීමට අපට හැකියාව ලැබෙනවා. ග්‍රාම නිලධාරි වසම් 142ක ජල ප්‍රශ්නය විසඳන්න පුළුවන් වෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මේවාට මැදිහත් වුණාට පස්සේ අපට මේ කටයුතු ඉතා සාර්ථකව කරගන්න පුළුවන් වෙනවා.

ඒ වාගේම අපි දන්නවා, මහනුවර දිස්ත්‍රික්කයේ බලගොල්ල ජල පවිත්‍රාගාරය ගැන. එය මේ වෙනකොට වැඩිදියුණු කරමින් පවතිනවා. මේකෙන් අපට පවුල් 60,000කට පමණ ජලය සපයන්න හැකි වෙනවා. ඒකට මිලියන 600ක් පමණ අපි මේ වෙනකොට වියදම් කර තිබෙනවා. ඒ විධියට ගත්තාම, අපේ දිස්ත්‍රික්කයේ ඇතුළෙත්, පොදුවේ රට ඇතුළේ හැම දිස්ත්‍රික්කයකමත් මේ වාගේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා.

ඊළඟට මම මතක් කරන්න කැමතියි, මේ කාරණයත්. මගේ ආසනය තමයි උඩුදුම්බර ආසනය. වර්ෂ ගණනාවක් නතර කරලා තිබුණු ජල යෝජනා ක්‍රමයක් තමයි මිනිපේ ජල යෝජනා ක්‍රමය. අපට මිනිපේ ජල යෝජනා ක්‍රමය 2026 අවුරුද්දේ අවසානයේ නැවත ආරම්භ කරන්න පුළුවන් කියලා සාකච්ඡා කරලා දැන් එය

[ගරු ඊ.එම්. බස්නායක මහතා]

ස්ථිර කරලා තිබෙනවා. මීනිපේ ජල යෝජනා ක්‍රමය සාර්ථක වුණොත් පවුල් 30,000කට ආසන්න ප්‍රමාණයකට - ග්‍රාම නිලධාරි වසම් 32කට - ජල පහසුකම් ලබා දෙන්න හැකියාව ලැබෙනවා.

ඊළඟට, හීං ගඟ ජල යෝජනා ක්‍රමය මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මේ විධියට ගත්තාට පස්සේ, උඩුදුම්බර ආසනයේ මීනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 48ටම 2027 අවුරුද්ද අවසන් වෙනකොට ජලය ලබා දීමට අපට පුළුවන් වෙනවා. මේ හැම එකක්ම ක්‍රියාත්මක වෙන්නේ අපේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යටතේයි. මම ඒ සම්බන්ධව කථා කරන එක දැන් නතර කරලා දැන් අනික් පනත ගැන කථා කරන්නම්.

අද අපි තවත් පනතක් ගැන කථා කරනවා. ඒක විශේෂ පනතක්. ඒ තමයි, සත්ව පනත. මම මේ අවස්ථාවේ සත්ව පනත ගැන අදහස් දක්වන්න පොඩි වේලාවක් ගන්නවා. සත්ව පනතත් ඒ වාගේම තමයි. මේ වෙනකම් සත්ව පනත ඇතුළේ තිබුණේ මීහරකා හා එළහරකා යන සත්ව දෙවර්ගය ප්‍රවාහනය කිරීමට සෞඛ්‍ය ආරක්ෂිත සහතිකයක් ලබා ගන්න අවශ්‍යයි කියලායි. අපි මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තිබෙනවා, එළුවා, බැටළුවා, ඌරා වැනි සතුනුත්. මේ පනත් කෙටුම්පතෙන් නීත්‍යනුකූලභාවය පමණක් නොවෙයි සුරක්ෂිත වෙන්නේ. අපි දන්නවා, මේ හැම සතෙක්ම මිනිසා බිහි වෙච්ච දා සිට මිනිසාත් එක්කම ජීවත් වෙච්ච ජීවීන් කොටසක් බව. මේ ජීවීන්ගෙන් අපි ආරක්ෂාව ලබාගෙන තිබෙනවා. ඒ වාගේම අපේ ආහාර පාන ටික සපයා ගන්න සතුන් යොදාගෙන තිබෙනවා. විශේෂයෙන් අපේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාගන්න අපි මේ ජීවීන් භාවිත කර තිබෙනවා. ඒ වාගේම අපේ ප්‍රෞඪත්වය; ගාම්භීරත්වය ආරක්ෂා කරගන්න, එහෙම නැත්නම් උද්දීපනය කරගන්න අපි මේ සතුන් පාවිච්චි කරලා තිබෙනවා. ඒ නිසා මෙහිදී පනත් කෙටුම්පතක් ගෙනැල්ලා සතුන් ආරක්ෂා කරනවාට වඩා අපට හැඟීමක් ඇති කරන්න පුළුවන්. සතුන් පිළිබඳව අපට වෙන වටිනාකමක් හදන්න පුළුවන්. ඒක තමයි මේ පනත්වලින් කරන්නේ. නීතියම විතරක් නොවෙයි අපි මේ පනත් කෙටුම්පතින් ගෙනෙන්නේ. අපි සතුන් ගැන වැඩියෙන් කථා කරන්න පටන් ගන්නවා. සතුන්ගේ ආරක්ෂාව ගැන, සතුන්ගේ සෞඛ්‍ය පිළිබඳව අපි කථා කරනවා.

අද අපි ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත් දෙක ගත්තොත්, ඉතාම ආරක්ෂිත, විශේෂිත පනත් කෙටුම්පත් දෙකක් හැටියට සලකන්න පුළුවන්. ඒ වාගේම මේ අවස්ථාවේ කියන්න ඕනෑ, සත්ව පනත සංශෝධනය කරනවා කියන්නේ නීතියම නොවෙයි, සතුන් කෙරෙහි මානුෂීය වගකීම තහවුරු කිරීමක් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ පනත් කෙටුම්පත් දෙක ගැන කථා කරද්දී අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුත් කථා කරනවා අපි දැක්කා. එක මන්ත්‍රීවරයෙක් මේ පනත් කෙටුම්පත් දෙක ගැන කථා කරද්දී හිර ගෙවල්වල ධාරිතාව ගැන, හිර ගෙවල්වල වෙන සිදුවීම් ගැන කථා කරනවා අපි දැක්කා. අපි අහනවා හිර ගෙවල්වල මිනිස්සු පිරෙන්න හේතුව මොකක්ද කියලා. ඔබතුමන්ලාගේ කාලය තුළ නීතිය හරියට ක්‍රියාත්මක නොවීමත්, සමාජය තුළ වැරැදිවලට පෙළඹෙන්න ඇති අවකාශ වැඩියෙන් විවෘත කරලා තිබීමත් නිසා තමයි ඒ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. අපි මේ වෙනකොට සමාජය තුළ වැරදිවලට, හොරකම්වලට, වංචාවලට, දූෂණවලට, මිනීමැරුම්වලට තිබෙන අවකාශය අඩු කරමින් ඉන්නවා. ඒ වාගේම හිර ගෙවල්වල්වලට අවශ්‍ය පහසුකම් ටික සපයමින් ඉන්නවා. අපි දැක්කා තව මන්ත්‍රීතුමෙක් කියනවා, මේ වෙලාවේ හිරේ ඉන්නේ කවුද, නැත්තේ කවුද කියන එක තීරණය කරනවා කියලා. අපි ඒ මන්ත්‍රීතුමාට කියනවා, හිරේ ඉන්නේ කවුද, එළියේ ඉන්නේ කවුද කියන එක තීරණය කරන්නේ අධිකරණ පද්ධතිය හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන බව. ආණ්ඩුවක් හැටියට අපට බැහැ කවුද ඇතුළේ ඉන්නේ, කවුද එළියේ ඉන්නේ කියලා කියන්න. ඒ මන්ත්‍රීතුමන්ලා මේ වාගේ පනත් කෙටුම්පතක් ගෙනාවාට පස්සේ වෙනත්, වෙනත් දේවල් කථා කරනවා. "යන්නේ කොහේද?" ඇහුවාම, "මල්ලේ පොල්" කියනවා වාගේ කථා කියමින්, විශේෂයෙන් අපේ රටේ සමාජය, පොදු ජනතාව නොමඟ යවන්න බොරු කියමින්, වැඩකඩ නැති දේවල් කථා කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවක් හැටියට, ජාතික ජන බලවේගය හැටියට අපි, ඔබතුමන්ලා දශක හතකට ආසන්න කාලයක් තුළ මේ රටේ ඉතිරි කරලා තිබුණු ප්‍රශ්න ටික - අවසන් කරන්නේ නැතිව තිබුණු ප්‍රශ්න ටික - එකින් එක තෝරා බේරාගෙන අවශ්‍ය විධියට, පුළුවන් ආකාරයට, විනිවිදභාවයක් සහිතව, සැලසුම් සහගතව, ඉලක්ක සහිතව අපේ මේ රටේ ජනතාවගේ අවශ්‍යතා ටික සම්පූර්ණ වන ආකාරයෙන් විසඳනවා කියන සහතිකය ලබා දෙමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.30]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම 1974 අංක 2 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත හා සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන මේ අවස්ථාවේ විශේෂ කරුණු කිහිපයක් පිළිබඳව කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. මට ලැබී තිබෙන කාල වේලාව මදි නිසා ඒ ගැන කෙටියෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගස්තොට, ගලගෙදර, මාවතගම, මල්ලවපිටිය ජල යෝජනා ක්‍රමය අපි 2015දී ආරම්භ කරලා මේ වනකොට විවෘත කරලා තිබෙනවා. මේකේ දිගු කිරීම් කරන්න කියලා ඉල්ලීම් ගණනාවක් කර තිබෙනවා. ඇමතිතුමාත් ඒ සම්බන්ධයෙන් දන්නවා. ඇත්තටම ඒවා අත්‍යවශ්‍ය දිගු කිරීම්. ඒ ප්‍රදේශය විශාල ජනතාවක් ජීවත් වෙන ප්‍රදේශයක්. විශේෂයෙන්ම ආයෝජන කලාපයටත් මෙකෙන් ජලය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම විශාල ජන සනත්වයක් තිබෙන ප්‍රදේශයක් වුණත්, ප්‍රධාන පාරේ ඉඳලා කිලෝමීටර දෙකක් දක්වා තමයි ගොඩක් තැන්වල මේ ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. එතැනින් එහාටත් ඉල්ලීම් ගණනාවක් තිබෙන නිසා ඒ සම්බන්ධයෙන් රජය හැටියට අවධානය යොමු කරලා, ඒ අයට අවස්ථාව ලබා දෙනවා නම් ඉතාම වැදගත් වෙනවා. මොකද expressway එකත් ගලගෙදර ප්‍රදේශය දක්වා එන නිසා ඉතාම දියුණු කලාපයක් හැටියට තමයි මාවතගම, මල්ලවපිටිය කලාපය හඳුනාගෙන තිබෙන්නේ.

2017දී පොල්ගහවෙල, පොතුහැර, අලව්ව ඒකාබද්ධ ජල ව්‍යාපෘතිය අපි ආරම්භ කළා. නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා ඒ ගැන දන්නවා. ඒක විවෘත කරන්න දින නියම වෙලා, මාස තුනකට ඉස්සෙල්ලා ඒක ආපහු කල් ගිහිල්ලා තිබෙනවා. අවුරුදු ගණනාවක්ම මේක ප්‍රමාද වෙනවා. මේක විශේෂයෙන්ම ග්‍රාම සේවා කොට්ඨාස 167කට යන ජල ව්‍යාපෘතියක්. අපි 2017දී

තමයි ආරම්භ කළේ. ප්‍රමාද වීම තුළ විශාල ජන ප්‍රමාණයකට මේ අවාසිය ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පොල්ගහවෙල, අලව්ව, වීරඹුගෙදර, කුරුණෑගල, මල්ලවපිටිය කියන කොට්ඨාස හැම එකකටම මේ ජල ව්‍යාපෘතියෙන් ජලය ලැබෙනවා.

ඉදිරියේදී එල් නිනෝ තත්ත්වය ඇති වුණොත් මේ ප්‍රදේශවල ගොඩාක් වෙලාවට ජල හිඟයක් ඇති වෙන්න පුළුවන්. මේ ප්‍රදේශය ගෙවල් ගණනාවක් හැදිලා තිබෙන ප්‍රදේශයක්. කුරුණෑගල අවට ජනගහනය විශාල ලෙස වර්ධනය වෙලා තිබෙනවා. මේකේ වැඩ ගොඩාක් අවසන් වෙලා තිබෙනවා. එම ජල ව්‍යාපෘතිය ඉතා ඉක්මනින් විවෘත කරලා, ජනතාවට අවස්ථාව ලබා දෙනවා නම් වැදගත් කියලා මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. දැනට තිබෙන විධිය බැලුවාම, ලබන අවුරුද්ද දක්වා ඒක කල් යනවා කියලා තමයි ඉංජිනේරුවෝ සමඟ කථා කළාම ප්‍රකාශ කරලා තිබෙන්නේ. මේක, දැනට මාස තුනකට ඉස්සෙල්ලා විවෘත කරන්න තිබුණු ව්‍යාපෘතියක්. ඒක නිසා ඔබතුමන්ලා මේක කඩිනමින් විවෘත කිරීමට අවශ්‍ය පියවර ගත්තොත්, ඉස්සරහට එන නියඟ තත්ත්වයත් එක්ක එම ග්‍රාම සේවා වසම් 167හි ජීවත්වන ජනතාවට එය ලොකු ශක්තියක් වෙයි කියලා හිතනවා.

පසුගිය කාලයේ "දිට්වා" සුළි කුණාටුවෙනුත් මේ මල්ලවපිටිය කොට්ඨාසයට විශාල හානි සිදු වුණා. මේ වෙනකල් තවමත් ඒවා සමනය වෙලා නැහැ. ඒ සම්බන්ධයෙනුත් මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ කරුණු කාරණා එක්ක තමයි මේ ප්‍රමාදය ඇති වෙලා තිබෙන්නේ. අපට පානීය ජලය ඉතාම වැදගත්. කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුව, ගල්ගමුව, නිකවැරටිය කියන ප්‍රදේශවල පානීය ජලය සුදුසු නැති තත්ත්වයක තිබෙන නිසා දැන් වකුගඩු රෝගය විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. මොකද, අනෙක් දිස්ත්‍රික්ක එක්ක බලන කොට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉතා අඩු පානීය ජල ව්‍යාපෘති ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වියළි කලාපයේ, විශේෂයෙන් හිරියාල, යාපහුව, ගල්ගමුව, නිකවැරටිය කියන ආසනවල පදිංචි ජනතාව වෙනුවෙන් පානීය ජල ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් ආරම්භ කරන්න වෙනවා කියන එකත් අපි මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. මොකද, සියයට ගණන ගත්තාම සියයට 20ට අඩු ප්‍රමාණයක් තමයි කුරුණෑගල දිස්ත්‍රික්කයේ පානීය ජල ව්‍යාපෘති ආරම්භ වෙලා තිබෙන්නේ. ඒ නිසා මෙන්න මේ තත්ත්වය තුළ ඒකටත් අවධානය යොමු කරන්න කියලා මතක් කරනවා.

විශේෂයෙන්ම කෘෂිකර්ම ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ සිටින නිසා මේ කාරණයත් මම මතක් කරන්න කැමැතියි. අනුරාධපුර දිස්ත්‍රික්කය වාගේම වී ගොවිතැන විශාල වශයෙන් තිබෙන දිස්ත්‍රික්කයක් තමයි කුරුණෑගල දිස්ත්‍රික්කය. ඔබතුමා දන්නවා, මේ වෙනකොට වී ගොවියා ඉතාම අපහසු තත්ත්වයකට පත් වෙලා තිබෙන බව. ඔබතුමන්ලා බලයට පත් වෙන්න ඉස්සෙල්ලා මේ සම්බන්ධයෙන් ජනතාවට පොරොන්දු ගණනාවක් දුන්නා. ඒ අය එම පොරොන්දු ඔළුවේ තියාගෙන ඉන්නවා. අද මේ ඇති වෙලා තිබෙන තත්ත්වය සමනය කරන්න අවශ්‍ය පියවර ගන්න කියන එක තමයි අපි පැහැදිලිව කියන්නේ. දැන් ඔබතුමන්ලා කියන විධියටත්, අපි දන්නා විධියටත් භාණ්ඩාගාරයේ මුදල් පිරිලා තිබෙනවා. ඒ නිසා, ගොවියා වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලාට පුළුවන්. ඒක පාඩු වෙන්නේ නැහැ. මොකද, මේ තත්ත්වය දිගටම ගියොත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි සියලු දිස්ත්‍රික්කවල අපේ ගොවි ජනතාව වී ගොවිතැනින් ඉවත් වෙන තැනට යන මට්ටමට අද පත් වෙලා තිබෙනවා. නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා මේ ගැන හොඳින් දන්නවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නය කියලා මම මතක් කරන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.36]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**

(மாண்புமிகு ரவீந்திர பண்டார)

(The Hon. Ravindra Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධවයි අපි විවාද කරන්නේ. ඒ වාගේම සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත ගැනත් විවාද කරනවා. විශේෂයෙන්ම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත ගැන අදහස් දක්වන්න මම කැමැතියි. මේක ඉතාම කාලෝචිත බව අපි දන්නවා. මොකද, අපි රජයක් ලෙස ඩිජිටල්කරණයත් එක්ක ඉස්සරහට යනකොට, ඒ ඩිජිටල්කරණයත් එක්කම ඒකට ගැළපෙන ආකාරයට තමයි මේ පනත් කෙටුම්පත සකස් වෙලා තිබෙන්නේ. එහිදී බිල්පත් ලබා දීම වාගේ කාරණා ගැන කියනවා නම්, ඉදිරියේදී ඒ ඩිජිටල්කරණයත් එක්ක ගැළපෙන ආකාරයට තමයි මේ සංශෝධනයෙන් ඉඩහසර සලසා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් කිසි සංශෝධනයක් එනකොට ඒක සුබවාදී වෙන්න ඕනෑ. 1974දී ආපු මේ පනතත් එක්ක, සංශෝධනත් එක්ක නොයෙක් නීති විරෝධී ක්‍රියා පාලනය කරන්න මේකෙන් ඉඩහසර ලැබෙනවා කියලා අපි දන්නවා. ඒ කියන්නේ, මීටරය මඟ හැරලා ජල සම්පාදන සම්බන්ධතා ලබා ගෙන තිබෙනවා නම්, ජලය අනවශ්‍ය පරිදි නාස්ති කරනවා නම් මීටරෙන් එහාට ගිය කොටස පවා නියාමනය කිරීම සිදු කළ යුතු වෙනවා. ඒ වාගේම තමයි ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම. මොකද, ජලය ලබා ගන්න නම් මේ ජල මූලාශ්‍ර වැදගත්. ඒ ජල මූලාශ්‍ර ආරක්ෂා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජල සම්පාදන මණ්ඩලයට අමතරව පළාත් පාලන ආයතන, ප්‍රජා ජල ව්‍යාපෘති යනාදිය ක්‍රියාත්මක වෙනවා. ඒවාට අවශ්‍ය උපදෙස් දෙනවා. මා නියෝජනය කරන කොස්ලන්ද ප්‍රදේශයේ හල්දුම්මුල්ල ආසනයේ ජනතාවගේ ඉල්ලීමක් තිබෙනවා, පළාත් පාලන ආයතනයෙන් කෙරෙන ඒ ජල පිරිපහදුව ජල සම්පාදන මණ්ඩලයට ගන්න කියලා. ඒ වාගේ අවස්ථාවලදී ඒ ආකාරයෙන් කටයුතු කෙරෙන්න ඕනෑ. එසේ නොවන්නේ නම් ඒ අවශ්‍ය උපදේශන ක්‍රියාවලි සිදු කරන්නත් ඉඩකඩ තිබෙනවා. ඒ නිසා මේක ඉතා සුබවාදී වෙනවා. ඒ වාගේම ඔය කියන අනෙකුත් කාරණා අවධානයට ලක් වුණා කියලා මම හිතනවා.

මම විශේෂ කාරණයක් මතු කරන්න කැමැතියි. 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ ඉතා පැහැදිලිව නීතිමය ප්‍රතිපාදනයක් ගැන සඳහන්ව තිබෙනවා. ජනතාවාදී රජයක් විධියට අපි දන්නවා, මෙතෙක් පැවැති ආණ්ඩු කාලවල, ඒ ගොඩක් තැන්වලදී දේශපාලන අධිකාරියට අසීමිත බලයක් තිබුණා කියලා. මේ පනතේ සඳහන්ව තිබෙනවා, "මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේදී යම් ආරවුලක් පැන නඟින අවස්ථාවේ දී අමාත්‍යවරයා තීරණයක් ගැනීමට පෙර දෙපාර්ශ්වයටම කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දීමට විධිවිධාන සලසයි" කියලා. ඒක ඉතාම වැදගත් දෙයක්. අමාත්‍යවරයා විශේෂ බලයක් ලබා ගන්නවා වෙනුවට, ඒක නැති කරලා තිබෙනවා. ඒ වාගේ බොහොම සුබවාදී කාරණා ගොඩාක් මේකෙන් සිදු වෙනවා කියලා මම හිතනවා.

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

ඒ වාගේම තමයි සේවක සුබසාධනය. විදුලිබල මණ්ඩල පනත සංශෝධනය වෙනකොටත් නොයෙක් කථා කිව්වා නේ. නේද? කලින් වාගේ සේවකයෝ ඉවත් කරනවා කිව්වා. නමුත් එහෙම නැහැ. සේවක සුබසාධනයටත් මේකේ ඉඩ දීලා තිබෙනවා. ඒ වාගේම තමයි නව තාක්ෂණයත් එක්ක යන්නේ. අපි අද විපක්ෂයේ කථා ඇහුවාම, ඇත්තටම මේ පනත් ගැන නොවෙයි කථා කළේ. වෙනත් වෙනත් දේවල් ගැන තමයි කථා කළේ. නමුත්, පනත ගැන විශේෂ විවේචන තිබුණේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දෙයක් කියන්න ඕනෑ. අපි දන්නවා, අපට මේ රටේ ජන වරමක් ලැබුණේ මේ රටේ තිබුණු දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න බව. ඒක තමයි තිබුණු ප්‍රධානම දේ. නීතිය ක්‍රියාත්මකවීම වාගේ දේවල් කිව්වා. ජලය ගැන කථා කරනකොට මට කියන්න දෙයක් තිබෙනවා. මම පදිංචිව සිටින්නේ; මගේ ගෙවල් තිබෙන්නේ බණ්ඩාරවෙල. බණ්ඩාරවෙල ප්‍රදේශය ගත්තාම දවස් 8කට, 9කට වතාවක් තමයි වතුර දෙන්නේ. අපේ ගෙදරටත් එහෙමයි. මේ ළඟදී මට ගමේ කෙනෙක් ඇවිල්ලා කිව්වා, "ඉස්සර නම් ඇමතිතුමා ඉන්න ගමට, මන්ත්‍රීවරයා ඉන්න ගමට හැමදාම වතුර ලැබෙනවා. දැන් මන්ත්‍රීතුමා ඉඳලාත් එහෙම ලැබෙන්නේ නැහැ නේ" කියලා. අපට කියන්න තිබෙන්නේ, අලුත් දේශපාලන සංස්කෘතිය ඒක බවයි. හැබැයි, බණ්ඩාරවෙලට පැය 24ම වතුර ලබා දීම සඳහා වූ project එකක් දැන් පටන්ගෙන තිබෙනවා. 2028 වසරේදී එය ක්‍රියාත්මක වනවා. ඒ වාගේම තමයි මා නියෝජනය කරන හල්දුම්මුල්ල ප්‍රදේශයේත් රුපියල් මිලියන 3,000ක වියදමින් නව ජල ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙනවා. මේක අලුත් දේශපාලන සංස්කෘතියක් කියලා මම කිව්වේ ඒ නිසායි. රැකියා දෙනකොට වුණත් එහෙමයි. ඉස්සර ගොඩක් වෙලාවට රැකියා ලබා දුන්නේ සම්මුඛ පරීක්ෂණවලින්. විභාග නැහැ. ඒ කාලයේ ඇමතිවරුන් තමයි ගොඩක් තීරණ ගත්තේ. දැනටත් මිනිස්සු ඇවිල්ලා අපෙන් අහනවා, විභාග ලකුණු එහෙම වෙනස් කරන්න බැරිද කියලා. ඒ වෙලාවට නම් සඳහන් කරලාම කියනවා, ඉස්සර ආණ්ඩුවේ හිටපු අහවල් මන්ත්‍රීතුමා නම් එහෙම කළා කියලා. ඒක තමයි ඒ කාලයේ තිබුණු දේශපාලන සංස්කෘතිය.

අපි දැක්කා, ජනාධිපති උපදේශකලා රජයේ මුදලින් වැටුප් ගෙවා ඒගොල්ලන්ගේ කාර්ය මණ්ඩල තමන්ගේ පෞද්ගලික වැඩවලට යොදාගෙන තිබෙන ආකාරය. ඒ අයගේ වාහනය ඉස්සර කරගෙන යන්න බැහැ, වෙනත් සාමාන්‍ය කෙනෙකුට. පරිවාර රථ තිබුණා. ඇමතිවරයෙක්, මන්ත්‍රීවරයෙක් යනකොට අනෙක් වාහන පාරෙන් අයින් කරගන්න ඕනෑ. එහෙම පැවති දේශපාලන සංස්කෘතිය වෙනස් වී තිබීම ගැනයි මම සඳහන් කළේ.

මේ වෙලාවේ මම තව කාරණයක් කියන්න ඕනෑ. හල්දුම්මුල්ල, මහලන්ද ප්‍රදේශයේ රක්ෂිතයක් තිබෙනවා. ඒ රක්ෂිතය සම්බන්ධව 2002දී ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දී තිබෙනවා, අලිවැටක් සකස් කරන්න කියලා. ඒ සඳහා රක්ෂිත මායිම් පවා ලකුණු කර තිබුණා. ඒ පැත්තේ අන්නාසිගල කියලා ප්‍රදේශයක් තිබෙනවා. දහයියාගල රක්ෂිතය තිබෙන්නේ ඒ ප්‍රදේශයේ. ඒක කැලයක්. එක ගෙදරක්වත් නැති කැලයක කණු 48ක් සිටුවා medium voltage line එකක් ඇද තිබෙනවා. ඒ සියල්ල පිටුපස තිබෙන්නේ දේශපාලන හස්ත. ඒ කාලයේ එහෙම දේවල් පවා කර තිබුණා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 56ක් වියදම් කර තිබුණා. එසේ මහජන මුදල් අවභාවිත කර තිබෙන ආකාරය ගැනත් දැන් පරීක්ෂණ සිදු වනවා. ඒ අනුව සියලු පරීක්ෂණ දැන් සිද්ධ වනවා. එම පරීක්ෂණ සිදු කර, ඒවාට වගකිව යුත්තන්ට අපි දඬුවම් ලබා දෙනවා. අලි ගැවසෙන අලිමංකඩ තමයි එසේ එළි කර තිබෙන්නේ. එතැන තණකොළ සහ වෙනත් ගස් වර්ග හොඳින් තිබෙනවා, වතුර තිබෙනවා. ඒ සියල්ල පරිහරණය කරනවා, අර ජාවාරම්කරුවන්. අපට දැනගන්න ලැබුණු විධියට, මිනිස්සු කියන විධියට එතැන අලි 21ක් මරා තිබෙනවා. 21වැනි අලියා තමයි ගිය සතියේ මරලා තිබුණේ. ඒ ඝාතන බොහොම කෲර විධියට කර තිබෙන්නේ. ඒගොල්ලන් නීතිවිරෝධී අලිවැටවල් හදලා ඒවාට විදුලිය සපයා තිබෙනවා. ඒ විධියට සතුන් ඝාතනය කර තිබෙනවා. ඒ වාගේම වෙඩි තබා ඝාතනය කර තිබෙනවා. ඒ හැම කාරණයකටම එරෙහිව නීතිය ක්‍රියාත්මක කරනවා. ඒ විතරක් නොවෙයි. කොයි විධියටද ඒවාට විදුලිය දුන්නේ, කොයි විධියටද ඒවා ජනාවාස කළේ, නීති උල්ලංඝනය කර තිබෙන්නේ කොහොමද කියන කාරණාත් අපි දන්නවා. හිටපු ජනාධිපතිවරුන්ගේ අනුග්‍රහය මත තමයි ඒ දේවල් ගොඩක්දුරට සිද්ධ වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව දෙයක් කියන්න තිබෙනවා. මොකද, අද ඉතාම වැරදි දෙයක් මෙතැන කියැවුණා, ගල් අඟුරු සම්බන්ධව. මමත් ඒ SOC එක නියෝජනය කරනවා. ප්‍රමිතියෙන් අඩු ගල් අඟුරු කියන එක අලුත් දෙයක් නොවෙයි. නමුත් ඒක වැරදියි. ප්‍රමිතියෙන් අඩු ගල් අඟුරු සැපයීම සම්බන්ධව මෙතැනදි කාරණා ඉදිරිපත් කළා. එතකොට ඔය සිංහ හම් පොරවාගෙන ඉන්න හිටපු ඇමතිවරුන් කිව්වා, මෙහෙම මෙහෙම දූෂණ වුණා, ඒවා මේවා වුණා කියලා. හැබැයි, දැන් ජනාධිපති කොමිසම හරහා පූර්ව වැරදි විමර්ශනය කරනකොට ඒගොල්ලන් වෙනස් කථා කියනවා. මෙහෙම වුණා, අපට මේකට එකඟ වෙන්න වුණා, අපට වැඩි මුදලට ගන්න වුණා, ඒකට ජනාධිපතිවරුන් බලපෑම් කළා, අමාත්‍යාංශ ලේකම් බලපෑම් කළා, අන්න ඒ නිසා මට එහෙම කරන්න සිද්ධ වුණා කියනවා. ප්‍රමිතියෙන් අඩු ගල් අඟුරු ගෙනා නිසා පසුගිය දවස්වල ඇති වුණු සිද්ධිය ගැන කිව්වා, ප්‍රමිතිය බාල වීම වැනි කාරණා ගැන කිව්වා. හැබැයි, අපේ මරික්කාර් මන්ත්‍රීතුමාට අමතක වුණා, එතැන කියපු විශේෂිතම කාරණය.

එතැනදි විශේෂයෙන්ම ඇහුවා, ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු නිසා කොච්චර පාඩුවක් වෙලා තිබෙනවාද, ඒක මහජනතාවගෙන්ද අය කරන්නේ කියලා. රජයක් ලෙස අපි ඉතා පැහැදිලිව ප්‍රකාශ කළා, ඒ සඳහා මහජනතාවගේ මුදල් වැය කරන්නේ නැහැ, ඒක හේතු කරගෙන විදුලි බිල වැඩි වන්නේ නැහැ කියලා. ඒ අදාළ සමාගමෙන් රුපියල් බිලියන 16ක් රඳවා තිබෙනවා. රුපියල් බිලියන 10කට ආසන්න පාඩුවක් තමයි වෙලා තිබෙන්නේ. අතීතයේ එහෙම රඳවා ගැනීම් සිද්ධ වුණේ නැහැ නේ. අතීතයේ වෙච්ච දේවල් නිසා ලැබෙන්න ඕනෑ මුදල් පවා තවම ලැබී නැහැ. ඒවා ලබාගෙනත් නැහැ. දැන් පූර්ණ බලැති ජනාධිපති කොමිසම හරියට ක්‍රියාත්මක වනකොට ඒ අතීත කාරණා සම්බන්ධවත් සොයා බලනවා.

බාල ගල් අඟුරු කුඩු ගිහිල්ලා turbinesවල වදිනවා වාගේ කථා තමයි පාර්ලිමේන්තුවේදී කලින් කිව්වේ. ජලය වාෂ්ප වුණු කථාවක් ඒගොල්ලන් කිව්වේ නැහැ. ඒ වාගේම නොරොච්චෝලේ බලාගාරය ගැනත් කිව්වා. අදත් කියනවා, මේක කැඩෙනවා, ඒ ගැන අපි ඉස්සර වාර්තා කළා කියලා. හැබැයි අපි දන්නවා, මේ අවස්ථාවේදී එහෙම හානියක් වුණේ නැහැ කියන කාරණය. සාමාන්‍ය මනුස්සයෙකුගෙන් ඇහුවත් කියනවා, නොරොච්චෝලේ බලාගාරය ඉස්සර කැඩුණු විධියයි, පසුගිය අවුරුදු දෙක තුළ වුණේ මොකක්ද කියන එකයි ගැන. ඒ අවස්ථාවේදී ක්‍රියාත්මක වුණු අදාළ ඉංජිනේරුවරුන්ට සහ එම කාර්ය මණ්ඩලයට අපි ස්තුතිවන්ත වනවා. ඒ වාගේම අපි දන්නවා, අතීතයේදී දඩ අය කරගන්නේ නැතුව, ප්‍රමාද ගාස්තු අය කරගන්නේ නැතුව සිද්ධ වුණු අනීතික - වැරදි සහගත - දේවල් ගැන. අන්න ඒ දේවල් තමයි දැන් අපි ජනතාවට හෙළි කරන්නේ. ඒ වාගේම මේ අවස්ථාවේදී යම් කිසි පාඩුවක් වුණා නම්, ඒ

සියල්ල දැනටමත් අය කරගෙන තිබෙනවා. ඒ සියලු දේවල් දැන් සිද්ධ වනවා. කලින් කථා කරපු මන්ත්‍රීවරයෙක් account number එකක් ගැන කිව්වා. මම හිතුවා, කලබල වෙලා මේ කැගහන්නේ අර account number එක හම්බ වෙලා කියලා. නමුත්, account number එක ගැන නොවෙයි, අර හැමදාම කියන පුරුදු කථාව තමයි කිව්වේ. නමුත්, ඒ අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී වෙච්ච ඉතාම වැදගත් කාරණාව ගැන කථා කළේ නැහැ.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, අද විවාද කරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන එන්නේ අද දවසට නොවෙයි අනාගතයට බව. අනාගතයේදී ඩිජිටල්කරණය වන විධියට, අනාගතයට මේ ජල මූලාශ්‍ර සුරක්ෂිත වන විධියට සහ සියලු ආකාරයේ දූෂණ නවතින විධියට පූර්ණ විනිවිදභාවයෙන් මේ දේවල් සිද්ධ වීමට අවශ්‍ය පනත් කෙටුම්පතක් තමයි මේ ගෙනැල්ලා තිබෙන්නේ. ඒ සම්බන්ධව මට කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. UPUL KITHSIRI left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[பி.ப. 4.46]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நாட்டில் பால் உற்பத்திக்குப் பெயர்பெற்ற அம்பாறை மாவட்டத்தின் கால்நடை வளர்ப்பாளர்கள் தங்களது கால்நடைகளை வளர்ப்பதற்காக மேய்ச்சல் தரையின்றி கடந்த 40 ஆண்டுகளுக்கும் மேலாக கஷ்டப்பட்டு வருவதை இந்த வேளையில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். வன இலாகா மற்றும் வனசீவராசிகள் திணைக்களம் இந்த விடயத்தில் மிக மோசமான முறையில் நடந்துகொள்வதை இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

கால்நடைகள் அவ்வாறான பிரதேசங்களுக்குள் ஊடுருவுவதால் அவற்றின் உரிமையாளர்களுக்கு எதிராக அடிக்கடி வழக்குகள் தாக்கல்செய்யப்பட்டு வருகின்றன; அவர்கள் தண்டம் செலுத்தியும் வருகின்றனர். எனவே, அரசானது இந்த கால்நடை வளர்ப்பாளர்களது நலன்கருதி திருக்கோவில், வட்டமடு, பொத்துவிலில் கள்ளியப்பத்தை போன்ற இடங்களில் 18,000 கால்நடைகளுக்காக மேய்ச்சல் தரைகளை அடையாளப்படுத்தி வழங்க ஆவனபுரிய வேண்டுமென இந்தச் சபையில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

நாட்டுக்கு 20-23 சதவீதம் வரைக்கும் அரிசியை வழங்குவது அம்பாறை மாவட்டமாகும். இங்கு 65,247.9 ஹெக்டெயார் நிலத்தில் விவசாயச் செய்கை பண்ணப் படுகின்றது. இதற்காக சுமார் 14,680 மெற்றிக்தொன் யூரியா தேவையாக இருக்கின்றது. இதில் 62 சதவீதம் மட்டுமே இம்முறை வழங்கப்பட்டுள்ளது. எமது பொத்துவில் விவசாயிகள் சுமார் 2,143 ஹெக்டெயார் நிலத்தில் விவசாயத்தை மேற்கொண்டார்கள். 482.2 மெற்றிக் தொன் யூரியா இதற்காகத் தேவைப்பட்டது. இதில் 60 சதவீதம் மட்டுமே இம்முறை வழங்கப்பட்டு இருக்கின்றது. மீதமாக 75 மெற்றிக் தொன் வழங்கவேண்டி இருந்தபோதும், இறுதியான நாட்களில் ஏற்பட்ட வறட்சியின் காரணமாக பல்லாயிரக் கணக்கான ஏக்கர் காணிகளில் பயிர்கள் அழிந்து போயுள்ளன. அரசு இதனை அவதானித்து நட்டஈட்டை வழங்க ஆவன புரிய வேண்டும்.

எமது Pottuvil, Panama, Lahugala, Siyambalanduwa, Komari, Urani போன்ற பிரிவுகள் உட்பட பிராந்தியத்தின் குடிநீர், விவசாய நீர்ப் பிரச்சினையைத் தீர்க்க 'ஹெட ஓயா' திட்டம் மட்டுமே எமது தீர்வு என்பதை எமது மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் 2026.05.22ஆம் திகதிய அம்பாறை மாவட்ட DCCஇல் எடுத்துரைத்தார். இதன் பிரகாரம், மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த விடயத்தைக் கவனத்திலெடுத்து, தனது ஆட்சிக் காலத்துக்குள் இந்த 'ஹெட ஓயா' திட்டத்தை ஆரம்பித்து முடிவுறுத்துவதுடன், எமது பிராந்திய மக்கள் பரிபூரணமான பிரயோசனத்தை அடைய வழி ஏற்படுத்தவும் வேண்டும்.

அம்பாறை மாவட்ட பிரதி விவசாய ஆணையாளர் (ஆராய்ச்சி) எல்.ஜி. சாமினி சோமடாஸ அவர்கள் கடியன் பள்ளம் குள அணைக்கட்டு வேலைகளைத் திட்டம் ஒன்றின்மூலம் செயற்படுத்தி வருகிறார். இப்போகத்துக்காக முடியுமான வரைக்கும் பசளைகளைப் பெற்றுத் தந்தமைக்காக அவருக்கு நன்றிகளைக் கூறிக்கொள்வதோடு, இதனது குறை வேலைகளாக இருக்கின்ற துரிசு, வான், வாய்க்கால் வேலைகளையும் செய்து முடித்துத் தர ஆவன புரிய வேண்டும் என்றும் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொத்துவில் ஆதார வைத்தியசாலைக்கு நிரந்தர வைத்திய அத்தியட்சகராக Dr. Jawahir அவர்களையும் VOGஆக Dr. M.I Muzammil அவர்களையும், VPஆக Dr. A.J.S. Safrina அவர்களையும் நியமித்துத் தந்தமைக்காக சுகாதார அமைச்சர் (Dr.) Nalinda Jayatissa அவர்களுக்கு எனது மக்கள் சார்பாக நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். மேலும், எமக்குள்ள நீண்டகாலக் குறைபாடாக இருக்கும் கண் வைத்தியநிபுணர், ECG operator, நிரந்தரமான ஒரு dental surgeon, 23 health labourers உட்பட எமது ஆதார

[ගරු එම්.එස්. අබ්දුල් වාසිත් මහතා]

வைத்தியசாலைக்கு அனுமதிக்கப்பட்ட ஆளணியில் வெற்றிடமாக உள்ள நியமனங்களையும் பூர்த்தி செய்துதர ஆவனபுரிய வேண்டும் என்பதுடன், கடந்த 11 ஆண்டு களுக்கும் மேலாக அக்கரைப்பற்று ஆதார வைத்தியசாலையில் கடமைபுரியும் எமது பிரதேசத்தைச் சேர்ந்த 12 சுகாதார ஊழியர்களுக்கும் பொத்துவில் ஆதார வைத்தியசாலைக்கு இடமாற்றத்தைப் பெற்றுக்கொடுக்க கௌரவ அமைச்சர் அவர்கள் அனுமதி வழங்க வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன். மேலும், திருக்கோவில் வைத்தியசாலையில் ஆளணிப் பற்றாக்குறை இருப்பதால் அப்பகுதி மக்கள் பெரும் சிரமங்களை எதிர்கொண்டு வருகிறார்கள். எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்தில் கவனம் செலுத்தி குறித்த ஆளணியை நிர்ணயம் செய்ய உதவுமாறு கேட்டுக் கொள்கின்றேன்.

கடந்த ஆண்டு கல்முனையில் இயங்கி வந்த வெளிநாட்டு வேலைவாய்ப்பு மாவட்ட அலுவலகத்தை மீண்டும் நிரந்தர மாகக் கொண்டுவருவதற்குப் பல முயற்சிகள் எடுக்கப்பட்டும் இன்றுவரைக்கும் அது நடைபெறவில்லை. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் எமது மாவட்டத்திலேயே பொது மக்களுக்குச் சேவைகளை வழங்கும்பொருட்டு மீண்டும் இந்த வெளிநாட்டு வேலைவாய்ப்பு அலுவலகத்தை கல்முனை மாநகரில் திறப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். நாளடாவிய ரீதியில் திறக்கப் படவுள்ள இலஞ்ச, ஊழல் விசாரணை ஆணைக்குழுவின் 23 பிராந்திய அலுவலகங்களில் ஒன்றை எமது பொத்துவில் பிரதேசத்தில் திறக்க வேண்டுமென அப்பகுதி மக்கள் விரும்புகிறார்கள். காரணம், இலஞ்சம் வழங்கி வேலைகளை முடிக்கும் கலாசாரம் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களின் இந்தப் புதிய அரசில் இடம்பெறக்கூடாது என்பதனாலாகும். எனவே, அரசானது எமது மாவட்ட மக்களுக்கு உதவும் பொருட்டு அதன் பிராந்திய அலுவலகம் ஒன்றை பொத்துவிலில் திறக்க ஆவனபுரிய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அண்மையில் வெளியிடப்பட்ட க.பொ.த. சாதாரண தரப் பரீட்சைப் பெறுபேற்றின் அடிப்படையில் எமது அக்கரைப்பற்று கல்வி வலயம் மாகாண மட்டத்தில் 1ஆம் இடத்தைப் பெற்றுக்கொண்டமைக்காக வலயக் கல்விப் பணிப்பாளர் உட்பட அதனோடு தொடர்புபட்ட அனைத்து அதிகாரிகளுக்கும் அனைத்துப் பாடசாலை அதிபர்களுக்கும் மாணவர்களுக்கும் இந்த உயரிய சபையில் பாராட்டுக்களையும் நன்றிகளையும் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், மாவட்ட ரீதியாக விசேட தேவையுடை யோருக்கான தங்குமிடத்துடன்கூடிய பாடசாலைகளை ஏற்படுத்த வேண்டும் என்று ஏலவே இந்த உயரிய சபையிலே பேசியிருக்கின்றேன். எனவே, கல்வி அமைச்சும் அரசும் இணைந்து அந்த மாணவர்களை இனம்கண்டு, அவர்களுக் கான பாடசாலைகளை அமைத்து, அந்த மாணவர்களும் சிறந்த, பூரணமான கல்வியைப் பெறுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். தற்போது எமது பொத்துவில் பிரதேச செயலகப் பிரிவில் பல்வேறு சிரமங்களுக்கு மத்தியில் AL-Hidaya Maha Vidyalaya, பொத்துவில் Methodist Tamil Maha Vidyalaya என்பவற்றில் இவ்வாறான மாணவர்கள் கல்வி பயில்வதைச் சுட்டிக்காட்ட விரும்பவதுடன், அவர்களுக்குக் கல்வி கற்பிக்கும் ஆசிரியர்களுக்கும் இந்த சபையில் நன்றியைக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாடளாவிய ரீதியில் பொத்துவில் பிரதேச செயலகம் உட்பட ஏனைய பிரதேச செயலகங்களில் துண்டு அடிப்படையில் தட்டச்சு - கணனி வேலைகளை மேற்கொள்ளும் பலர் இன்று வரைக்கும் நிரந்த நியமனம் செய்யப்படாமல் கடமை புரிகின்றார்கள். அனைத்துத் தகுதிகளையும் கொண்ட இவர்கள், ஏன் இன்னும் நிரந்தர நியமனம் செய்யும் சுற்றுநிருபத்தில் சேர்த்துக்கொள்ளப்படவில்லை என்பது கவலையளிக்கின்றது. கௌரவ அமைச்சர் அவர்கள், நிதி பிரதி அமைச்சர்கள் மற்றும் அமைச்சின் செயலாளர் ஆகியோரிடம் இது பற்றி எடுத்துரைத்து இருக்கின்றேன். எனவே, அமைச்சர் அவர்கள் இனிவரும் காலங்களிலாவது இவ்வாறு துண்டு அடிப்படையில் கடமை புரியும் ஊழியர்களை நிரந்தர நியமனத்தில் உள்ளீர்த்து அவர்களது எதிர்காலத்தைச் சிறப்பாக்கி பரிபூரணமான அரச சேவையை மேற்கொள்ள ஆவன செய்ய வேண்டுமென இந்தச் சபையில் கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

எமது பொத்துவில் பிரதேச செயலகத்தின்கீழ் 40 இளைஞர் கழகங்களும், 40 விளையாட்டுக் கழகங்களும் பதிவு செய்யப்பட்டு இயங்கி வருகின்றன. சுமார் 2,000 இளைஞர், யுவதிகள் விளையாட்டுக்களில் மாவட்ட, மாகாண, தேசிய, சர்வதேச ரீதியில் தமது திறமைகளை நிரூபித்து வந்திருக்கிறார்கள். அண்மையில் மரணித்த மர்ஹூம் எம். அப்துல் மஜீப் உட்பட ஏ.எல்.எம். அஷ்ரப் போன்றோரை இதற்கு உதாரணமாகக் குறிப்பிடலாம். எனவே, எமது பொத்துவில் சர்வோதயபுரம் பிரிவில் ஒதுக்கப்பட்ட 10 ஏக்கர் நிலத்தில் ஒரு நவீனரக பொது மைதானத்தை அமைத்து எமது பகுதி இளைஞர், யுவதிகள் விளையாட்டில் மென்மேலும் பிரகாசிக்க ஆவன புரிய வேண்டுமென கௌரவ அமைச்சர் அவர்களையும் அரசாங்கத்தையும் இந்த வேளையில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். இது விடயமாக பல தடவை இந்த உயரிய சபையில் உரையாற்றியதையும் ஞாபகமூட்ட விரும்புகின்றேன்.

கிழக்கு மாகாண காணிகளைப் பாதுகாக்கவும், கரையோரங்களைப் பாதுகாக்கவும் என்று அரசினால் குழு ஒன்று அமைக்கப்பட்டு, தற்போது பிரதேச செயலக ரீதியாக நேரில் சென்று பல நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. குறிப்பாக, சுற்றுலாத்துறைக்குப் பெயர்போன பல கரையோரப் பிரதேசங்களில் உள்ள காணி ஆவணங்களைப் பற்றி பேச விரும்புகிறேன். Arugam Bay உட்பட பல பிரதேசங்களது காணி உரிமைக்காக annual permit, LDO permit, deed என்றும் பலர் permitக்காக விண்ணப்பித்தும் சுற்றுலாத்துறைக்காக hotel, homestayயும் செய்து வருகின்றார்கள். அதிகபட்சம் 40 perch நிலத்திலேயே இந்த hotels அமைக்கப்பட்டுள்ளன. சுமார் 50 ஆண்டுகளுக்கு முன்னர் சிறிது சிறிதாக ஆரம்பிக்கப்பட்ட இந்தத் துறை தற்பொழுது ஒரு நல்ல நிலையை அடைந்திருக்கிறது. ஓர் ஆண்டில் சுமார் 100 நாட்கள் மட்டுமே இந்தத் தொழில் நடைபெறுகின்றது என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

எனவே, இந்த அரச குழுவானது எமது பகுதி hotel உரிமையாளர்களுக்கு அநீதி இழைக்கப்படாத அளவுக்கு இவற்றுக்கான அரச நில ஆவணங்களை நடைமுறைப்படுத்த, இந்த அரசு முன்னெடுத்துள்ள "Himikama" உரிமை ஆவணங்களை வழங்க வேண்டும் என்பதுடன், இதற்காக பொத்துவில் பிரதேச செயலகம் அதீத அக்கறையுடன் நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும் என்பதுடன், இவ்வாறு வழங்க முடியாது என்று குழு முடிவை எடுத்தால் அப்பகுதி ஹோட்டல் உரிமையாளர்களுக்காக lease வழங்க

வேண்டும். குறித்த நிலங்களில் ஆண்டுக்கு ஒரு தடவை 100 நாட்களுக்கு மட்டுமே வியாபாரம் நடைபெறுவதால் இந்தக் காலப்பகுதிக்கு மட்டும் lease வழங்க நடவடிக்கை எடுக்க வேண்டுமென்பதுடன், அதற்கான ஆவணங்களின் எண்ணிக்கையைக் குறைக்க வேண்டும் என்பதுடன், அப்பிரிவில் நிரந்தரமாகக் குடியிருந்து வருபவர்களை இத்திட்டத்தில் சேர்த்துக்கொள்ளாமல் "Himikama" திட்டத்தில் சேர்த்துக்கொள்ள ஆவன புரிய வேண்டும் எனவும் கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கிழக்கு மாகாணத்தின் கீழுள்ள பிரதேச சபைகள், நகர சபைகள், மாநகர சபைகள் உட்பட அனேகமான அரச அலுவலகங்களில் ஆளணி வெற்றிடங்கள் காணப்படு கின்றன. குறிப்பாக, செயலாளர், MSO, driver, health labourer, road labourer, librarian, supervisor, revenue supervisor போன்றோருக்கான வெற்றிடங்கள் காணப்படுகின்றன. எனவே, அரசானது கிழக்கு மாகாண சபைக்கு மேற்படி ஆளணியை நியமிக்க அனுமதியை வழங்கி, மாகாண அரச அலுவலகங்கள் பரிபூரணமான செயற்பாடுகளை மேற் கொள்ள வழி ஏற்படுத்த வேண்டுமென இந்தச் சபையில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

Alayadivembu MOH கட்டிடமானது பள்ளப்பிரிவில் அமைக்கப்பட்டு இருப்பதால் மழை காலங்களில் அங்கு செல்லும் பொதுமக்கள் கஷ்டப்படுவதை அவதானிக்க முடிகின்றது. எனவே, அரசும், மாகாண சுகாதார அமைச்சும் இது விடயமாக அவதானித்து இதனை நிரப்பி பரிபூரணமான சுகாதார சேவையை வழங்க ஆவன புரிய வேண்டும் என்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இறுதியாக, எனது இந்த நிலைமைக்குக் காரணமான Mufarish, Jahan, Safna, Zafana, Hathiya Maryam, Aznif, Bary, Nafaz, Mufazzal, Fawaz, Bary-B Silmir, Ahath, Mujahith, M.B.A. Raheem (PR) Kamil, A.H. Fahim, Haneefa, Yahya Mou, Maizan, A. Abdullah, K.M. Ibrahim, I. Iqbal, P.M. Cader, K. Nizar, Jemzith Rafy Ijaz, Mohideen, Azaak, Muhajjitha, Jehan, Punithen, Mahroof, Danizh, Munaz ( MPS) ஆகியோருக்கு எனது மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ටී.බී. සරත් නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.55]

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය පැවැත්වෙන මේ මොහොතේදී ඒ පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම අපි මේ පනත සංශෝධනය කිරීමේ මූලික අරමුණ වුණේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත නවීන අවශ්‍යතා අනුව සංශෝධනය කිරීමයි. ජල සම්පාදනය හා අපජල කළමනාකරණ සේවා වඩාත් කාර්යක්ෂමව, විධිමත්ව සහ තිරසාර ආකාරයෙන් පවත්වා ගෙන යෑම සඳහා මණ්ඩලයේ බලතල, වගකීම් හා නීතිමය විධිවිධාන ශක්තිමත් කිරීම මෙම පනත් කෙටුම්පත මඟින් අවධානයට ලක් කර තිබෙනවා. එසේම කර්මාන්ත උද්‍යාන, ප්‍රජාමූල සංවිධාන, ජල මූලාශ්‍ර ආරක්ෂාව, අපජල සේවා සහ සේවක සුබසාධනය සම්බන්ධව නව විධිවිධාන මෙහි ඇතුළත් කරලා තිබෙනවා. ඒ වාගේම කර්මාන්ත උද්‍යාන, ප්‍රජාමූල සංවිධාන සඳහා වන ව්‍යාපෘති මණ්ඩලය යටතට ගෙන ඒවා විධිමත්ව කළමනාකරණය කිරීම, ජල හා අපජල කළමනාකරණ ක්ෂේත්‍රයේ පුහුණු පර්යේෂණ හා උපදේශක සේවා සංවර්ධනය කිරීම, ජල නාස්තිය හා නීති විරෝධී භාවිතය අවම කිරීම හා ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම මෙහි මූලිකම ඉලක්කය වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම, මෙහි සමාජයීය හා ආර්ථික බලපෑම ගත්තොත්, මෙම පනත් සංශෝධනය මඟින් ජනතාවට වඩා විශ්වාසදායක, ආරක්ෂිත හා තිරසාර ජල හා අපජල සේවා ලබා දීමේ හැකියාව වැඩිදියුණු වෙනවා. එමඟින් මහජන සෞඛ්‍ය ආරක්ෂාව ඉහළ නැංවීමටත්, පාරිසරික දූෂණය අවම කිරීමටත් හැකියාව ලැබෙනවා. ප්‍රජාමූල ජල ව්‍යාපෘති, කර්මාන්ත කලාපවල ජල සේවා විධිමත්ව පවත්වා ගෙන යෑම හරහා ප්‍රාදේශීය සංවර්ධනයට දායකත්වය ලැබෙනවා. එසේම ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම සහ අපජල කළමනාකරණය ශක්තිමත් කිරීම හරහා අනාගත ජල සුරක්ෂිතතාව තහවුරු කිරීම මෙම සංශෝධනයේ අරමුණ වෙනවා. ආර්ථික වශයෙන් ජල හා අපජල සේවා සඳහා නිසි ගාස්තු ක්‍රමවේද හඳුන්වා දීම මඟින් මණ්ඩලයේ ආදායම් තත්ත්වය ශක්තිමත් වන අතර, ජල නාස්තිය හා නීති විරෝධී භාවිතය අවම කිරීම සිදු වන අතර මූල්‍ය පාඩුවද අඩු වෙනවා. තවද, පුහුණු වැඩසටහන්, උපදේශන සේවා හා රසායනාගාර සේවා වැනි නව සේවා හඳුන්වා දීම මඟින් අතිරේක ආදායම් මාර්ගද නිර්මාණය වෙනවා. මෙම සියලු ක්‍රියාමාර්ග මඟින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය සහ සේවා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට හැකි වනු ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතෙහි සංශෝධනය වන කාරණා සැකෙවින් ගත්තොත්, මෙම සංශෝධන පනත් කෙටුම්පත මඟින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බලතල හා කාර්යභාරය පුළුල් කරමින්, ජල සම්පාදන

[ගරු ටී.බී. සරත් මහතා]

හා අපජල කළමනාකරණ සේවා වඩාත් විධිමත්ව හා කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යෑම සඳහා අනුබද්ධ සංවිධාන හා අනුබද්ධ ව්‍යාපාර ඒකක ස්ථාපිත කිරීම හා පවත්වා ගෙන යෑමට අවශ්‍ය නව විධිවිධාන ඇතුළත් කර තිබෙනවා.

තවද, කාර්මික කලාප, කාර්මික උද්‍යාන, ප්‍රජා මූල ව්‍යාපෘති මණ්ඩලයේ අධිකාරිය යටතට පවරා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා නෛතික ප්‍රතිපාදන හඳුන්වා දී තිබෙනවා. එසේම ජල සම්පාදනය සහ අපජල කළමනාකරණය සම්බන්ධ පුහුණු වැඩසටහන්, පර්යේෂණ, උපදේශක සේවා, ඩිප්ලෝමා පාඨමාලා සහ දැනුම හුවමාරු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයට බලය ලබා දී තිබෙනවා. තවද, ජල නාස්තිය, නීති විරෝධී ජල භාවිතය සහ අනවසර සම්බන්ධතා පිළිබඳව කටයුතු කිරීමට අදාළ නීති ශක්තිමත් කරමින් දඩ හා අය කිරීම් ක්‍රමවේද සංශෝධනය කර තිබෙනවා. මෙම පනත් කෙටුම්පත මඟින් ජල හා අපජල සේවා සඳහා ගාස්තු නියාමනය, විදුලුත් තැපැල් මාර්ග ඔස්සේ දැනුම්දීම් කිරීම, ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම හා අපජල මුදා හැරීම පාලනය කිරීම සඳහා නව විධිවිධාන හඳුන්වා දී තිබෙනවා. මීට අමතරව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන් සඳහා රක්ෂණ ආවරණය සහ ආරක්ෂණ පහසුකම් ලබා දීම පිළිබඳ විධිවිධාන මේ පනත හරහා යොදලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ මේ විවාදයේදී මතු වෙච්ච කාරණා ගණනාවක් පිළිබඳවත් මේ සභාවේ අවධානය යොමු කරන්න මා බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් විපක්ෂයේ කථිකයන් කථා කරපු අවස්ථාවලදී රටේ විවිධ දිස්ත්‍රික්කවල, විවිධ ව්‍යාපෘති පිළිබඳව අවධාරණය කළා. අපි රජය විධියට බොහොම පැහැදිලිව කියනවා, දැනට ශක්‍යතා වාර්තා අවසන් කරලා තිබෙන සියලු ව්‍යාපෘති සඳහා ලබන අවුරුද්දේ මුදල් වෙන් කරන්න අපි බලාපොරොත්තු වන බව. දැනටමත් අපි යෝජනා කරලා තිබෙනවා, මේ ව්‍යාපෘති සඳහා ඉදිරි අය වැයෙන් රුපියල් බිලියන 100කට වඩා මුදල් වෙන් කරන්නට.

විශේෂයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ අපේ දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා කථා කරනකොට, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් 524ක් පිළිබඳව කථා කළා, ජලය නැහැ කියලා. අවුරුදු දෙකක් ගිහිල්ලාත් ජලය දෙන්න බැරිවෙලා තිබෙනවා කියලා එතුමා සඳහන් කළා. එතුමන්ලා මේ රට පාලනය කළා; මම හිතන විධියට, යූඑන්පී එක පාලනය කළා, අවුරුදු 35කට, 40කට වැඩි කාලයක්. ඒ වාගේම 2015-2020 ආණ්ඩු කාලයේ එතුමා ඇමතිවරයෙක් විධියටත් හිටියා. හැබැයි, මාළු කකා හිටියා විතරයි, මේ ව්‍යාපෘති පිළිබඳව හිතුවේ නැහැ, කල්පනා කළේ නැහැ. නමුත් අපි බොහොම වගකීමෙන් කියනවා, එතුමා පොතක් විධියට ගෙනැල්ලා පෙන්වූ ඒ ව්‍යාපෘති සම්බන්ධයෙන් ඊට වඩා විධිමත් විධියට කටයුතු කරලා, ශක්‍යතා වාර්තා අවසන් වුණාට පසුව ලබන අවුරුද්දේ ඒ සියලු ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කරන්න අපි කටයුතු කරනවා කියලා. අනිවාර්යයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කරන්න වත්මන් ආණ්ඩුව හැටියට අපි කටයුතු කරන බව මම ඉතාම වගකීමෙන් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජල ප්‍රශ්නයකුත් මතු කළා. 2027 අවුරුද්දේ අපි නව පිරිපහදු මධ්‍යස්ථානයක් සඳහා මුදල් වෙන් කරන්නත්, දැනට තියෙන ජල ධාරිතාව දෙගුණයකින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට වැඩි කිරීම සඳහාත් අපි අනිවාර්යයෙන් කටයුතු කරනවා. ඒ වාගේම උතුර, නැඟෙනහිර ගත්තොත්, විශේෂයෙන්ම උතුරේ යාපනය, මුලතිව්, වන්නි, කිලිනොච්චි වැනි දිස්ත්‍රික්කවල පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කරන්න පසුගිය අවුරුදු 76ක පාලන කාලය ඇතුළෙත් පුළුවන් වෙලා තිබෙන්නේ සියයට 10කට, 12කට ආසන්න ප්‍රමාණයකට. මේක කිසිසේත් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ නිසා නව ජල ව්‍යාපෘති ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම උතුරේ ඒ සඳහා අවශ්‍ය කරන ජල ප්‍රභව පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඉතින් අපි මල්වතු ඔය ආශ්‍රිතව නව ජල ප්‍රභව පිළිබඳව පරීක්ෂණ කරමින් තිබෙනවා. ඒවායේ ශක්‍යතා අධ්‍යයන අවසන් කළ වහාම එම පානීය ජල අවශ්‍යතාව ලබා දීම සඳහා අවශ්‍ය කරන මුදල් වෙන් කරලා ඒ ව්‍යාපෘති ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ විශේෂයෙන් පොල්ගහවෙල ජල ව්‍යාපෘතිය පිළිබඳවත් මතු කළා. දැනටමත් අපි එහි වැඩ අවසන් කරගෙන යනවා. අලුත් ජල සම්බන්ධතා ලබා දීම, පානීය ජල සම්බන්ධතා ජනතාවට ලබාදීමේ කටයුතු දැනටමත් අපි ආරම්භ කර තිබෙනවා. ලබන අවුරුද්ද මුල වෙනකොට අපට ඒ ජල ව්‍යාපෘතිය විවෘත කරන්න පුළුවන් වෙනවා. විශේෂයෙන් නුවර, පාතදුම්බර, තඹුත්තේගම, අත්තනගල්ල, පොල්ගහවෙල, මතුගම-අගලවත්ත යන ජල ව්‍යාපෘති සඳහා මේ මොහොත වන විටත් මුදල් වෙන් කරලා, වැඩ ආරම්භ කරලා තිබෙනවා.

ලබන අවුරුද්ද වෙනකොට අනිවාර්යයෙන්ම ඒවා ජනතා අයිතියට පැවරීම සඳහා කටයුතු කරන්න පුළුවන් වෙයි. ඒ වාගේම රත්මලාන-මොරටුව මලාපවහන පද්ධතිය, මහනුවර මලාපවහන පද්ධතිය යන මලාපවහන පද්ධති දෙකේම වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා මුදල් වෙන් කරලා, දැන් ව්‍යාපෘති පටන් අරගෙන තිබෙන්නේ. ඒ වාගේම ආණමඩුව ජල ව්‍යාපෘතිය පටන් අරගෙන තිබෙන්නේ. අනිවාර්යයෙන්ම ඉදිරි අවුරුදු දෙක ඇතුළත ඒ ව්‍යාපෘති අවසන් කරලා, ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව වෙනුවෙන් විවෘත කරන්න අපට පුළුවන්.

පසුගිය කාලයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ උසස්වීම් දුන්නේ නැහැ. පුරප්පාඩු පිරෙව්වේ නැහැ. අපි දැන් මේ මොහොත වන විට ක්‍රමිකව ඒ උසස්වීම් ලබා දෙමින්, පුරප්පාඩු පුරවමින් ඉන්නවා. ක්‍රමිකව ඒ අවශ්‍ය කටයුතු සම්පූර්ණ කරමින් ඉන්නවා, අපේ ආණ්ඩුව. ඒ වාගේම කොන්ත්‍රාත් පදනමෙන් බඳවා ගත්ත 2,800කට වැඩි සේවක සංඛ්‍යාවක් ජල සම්පාදන මණ්ඩලයේ ඉන්නවා. ඒ 2,800ම සුදුසුකම් අනුව ක්‍රමිකව දැන් ස්ථිර කරමින් ඉන්නවා. පසුගිය මාසයේත් 145දෙනෙකු ස්ථිර කළා. ඉදිරියේදීත් අපි ක්‍රමිකව ඒ අය ස්ථිර කරන්න අනිවාර්යයෙන්ම කටයුතු කරනවා.

ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ ඒ උසස්වීම් ලබාදීම වාගේම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය කාර්යක්ෂම කිරීම, විධිමත් කිරීම, දූෂණය, වංචාව අවසන් කිරීම වැනි දේවල් තුළින් 2025දී අපි රුපියල් බිලියන 31ක ආදායමක්, ලාභයක් ලබා තිබෙනවා. ඒ, ඉතිහාසයේ අප ලබපු විශාලම ආදායම. ඒ හැම පැත්තක්ම බැලුවාම, අපි මේ අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විධිමත්ව සංවර්ධනය කරන්නත්, ආදායම් මාර්ග වැඩි කර ගන්නත් කටයුතු කරන ගමන් ජනතාවගේ අවශ්‍යතා සම්පූර්ණ කරන්නත් කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම ගාල්ල, කළුතර, කොළඹ වැනි දිස්ත්‍රික්කවල ඇති වෙලා තිබෙන ජල ප්‍රශ්න පිළිබඳව අපි සොයා බලා තිබෙනවා. ඒ සඳහා විසඳුමක් ලෙස අපි අලුත් ව්‍යාපෘති ආරම්භ කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගාල්ලේ ජල ප්‍රශ්නය පිළිබඳව ඔබතුමාගේ කථාවේදී මතු කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ප්‍රශ්නය විසඳීම සඳහාත් අපි ලබන අවුරුද්දේදී මුදල් වෙන් කරලා, වැඩ ආරම්භ කරන්න කටයුතු කරනවා. ජනතාවට කාර්යක්ෂම සේවාවක් සැපයීම, ජනතාවට විශ්වාසදායී ලෙස ජලය ලබා දීම, ඒ වාගේම දූෂණය, වංචාව නැති කිරීම වෙනුවෙන් නව විධිවිධාන ඇතුළත් කරලා, පනත ශක්තිමත් කරලා, ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන්න තමයි මේ පනතට ගෙනෙන සංශෝධනය තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අබූබකර් අතම්බාවා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.06]

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சினால் கொண்டு வரப்பட்டுள்ள விலங்குகள் (திருத்தம்) சட்டமூலம், தேசிய நீர் வழங்கல், வடிகால் சேவைகள் சபை (திருத்தம்) சட்டமூலம் என்பன நிறைவேற்றப்பட இருக்கின்றன. இந்த இரண்டு சட்டமூலங்களும் நாட்டின் அபிவிருத்திக்கு மிகவும் அவசியமானதாகும். ஆளும் கட்சி, எதிர்க்கட்சி என்ற வேறுபாடு இல்லாமல் அனைவரும் இந்தச் சட்டமூலங்கள் பற்றி இங்கு தங்களது கருத்துக்களை முன்வைத்துக்கொண்டு இருக்கிறார்கள்.

இலங்கையில் குடிநீர் என்பது மக்களின் அடிப்படை உரிமைகளில் ஒன்றாகும். நாட்டு மக்களுக்குப் பாதுகாப்பான குடிநீரை வழங்கவேண்டிய முக்கிய பொறுப்பு தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபைக்கும் சமூகம் சார்ந்த அமைப்புகளுக்கும் இருக்கின்றது. இன்று நகர்ப்புறங்களில் பெரும்பாலும் குழாய்மூலம் சுத்திகரிக்கப்பட்ட நீர் வழங்கப் படுகின்ற அதேநேரம், கிராமப்புறங்களில் பலர் இன்னும் கிணறுகள், குழாய்க் கிணறுகள், நீரூற்று, மழைநீர் சேகரிப்பு என்பவற்றின்மூலம் குடிநீரைப் பெறுகின்ற நிலை காணப்படு கின்றது. இலங்கையில் சுமார் 80 சதவீதமான மக்களுக்குப் பாதுகாப்பான குடிநீர் கிடைக்கின்றபோதிலும், கிராமப் புறங்களிலுள்ள மக்கள் அதனைப் பெறுவதில் இன்னும் சவால்கள் உள்ளன. வறட்சி, நீர் மாசுபடுதல், காலநிலை மாற்றம், பழைய நீர் விநியோகக் கட்டமைப்பு என்பன பாதுகாப்பான குடிநீர் வழங்கலில் முக்கிய சவால்களாக உள்ளன. நகர்ப்புறங்களில் குடிநீரைப் பெறுகின்ற குழாய் நீர் சேவை அதிகமாக இருந்தாலும், கிராமப்புறங்களில் மக்கள் இன்றும் கிணறு மற்றும் மழைநீரை நம்பியே வாழ்கின்றனர். பாதுகாப்பான குடிநீர் சேவையை அனைவருக்கும் சமமாக வழங்க வேண்டியது மிக மிக அவசியமாகும்.

இந்த நாட்டில் இருக்கின்ற பல நீர்நிலைகள் மக்களுக்கு குடிநீரை வழங்கக்கூடிய முக்கிய வளமாகக் காணப்படு கின்றன. இருந்தாலும், மக்கள் அவற்றில் திண்மக் கழிவு களையும் மிதக்கும் பொருட்களையும் போட்டு மாசடையச் செய்கின்றனர். நிலத்தடி நீர், மேற்பரப்பு நீர் என்பன மக்களுடைய குடிநீர் தேவைக்காக மாத்திரமல்ல, விவசாயத் தேவைகளுக்கும் பயன்படுத்தப்படுகின்றன.

நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையானது, தொழில்நுட்பங்களையும் உபகரணங்களையும் பயன்படுத்தி, மக்களுக்கு சுத்திகரிக்கப்பட்ட குடிநீரை வழங்கினாலும், அதன் தரம் குறிப்பிடத்தக்க அளவுக்கு இருப்பதாகக் கொள்ள முடியாது. எனவே, இச்சபையானது நீர் சம்பந்தமான தொழில்நுட்ப அறிவுகொண்ட நிறுவனங்களின் உதவியைப் பெற்று, மக்களுக்குத் தரமான நீரை வழங்கவேண்டியது காலத்தின் தேவையாக இருக்கின்றது. தொழில்நுட்பத்தை அடிப்படையாகக் கொண்டு எதிர்காலத்தில் மக்களுக்கான குடிநீர் விநியோகத்தை மேற்கொள்ள இந்த அரசாங்கம் திட்டமிட்டு இருக்கின்றது. அந்த வகையில், தேவையான மாற்றங்களை ஏற்படுத்துவதற்காக இந்தத் திருத்தச் சட்டமூலம் கொண்டுவரப்பட்டுள்ளது. இது சுமார் 19 விடயங்களை அடிப்படையாகக் கொண்டுள்ளது. முஸ்லிம் அரசியல்வாதிகள் தேர்தல் காலங்களில் நீரை அடிப்படையாகக் கொண்டு மக்களுக்குப் போலியான வாக்குறுதிகளைப் பல இடங்களில் வழங்கியதை நாங்கள் கடந்த காலங்களில் பார்த்தோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair and DEPUTY CHAIRPERSON OF COMMITTEES took the Chair.*

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அம்பாறை மாவட்டத்திலுள்ள பொத்துவில் பிரதேசமானது உல்லாசப் பிரயாணத்துறைக்குச் சிறந்த இடமாகக் காணப்படு வதுடன், மிகக் கூடுதலாக மக்கள் வாழுகின்ற பிரதேசமாகவும் இருக்கின்றது. எனினும், அந்தப் பிரதேசத்துக்கு இன்னமும் குடிநீர் வழங்கப்படாமல் இருக்கின்றது.

கடந்த காலங்களில் அந்த மக்கள் அரசியல்வாதிகளால் ஏமாற்றப்பட்டார்கள். அவர்களுக்குப் போலி வாக்குறுதிகள் வழங்கப்பட்டன. அதாவது, ஹெட ஓயா திட்டத்தின்மூலம் குடிநீரைக் கொண்டுவருவதாகவும், அது முடியாமற்போனால் கடல் நீரையாவது சுத்திகரித்து மக்களுக்குக் குடிநீரை வழங்குவதாகவும் வாக்குறுதிகளை வழங்கினார்கள். இவர்கள் 25-30 வருடங்களாக பல அரசாங்கங்களில் அமைச்சர்களாக, பிரதி அமைச்சர்களாக குறிப்பாக, நீர் வழங்கலுக்குப் பொறுப்பான அமைச்சராக இருந்தும்கூட, பொத்துவில் மக்களுக்குக் குடிநீரை வழங்க முடியவில்லை. எங்களுடைய அரசாங்கமானது, எதிர்காலத்தில் ஹெட ஓயா திட்டம்மூலம் பொத்துவில் மக்களுக்குக் குடிநீரை வழங்குவதற்காகப் பல்வேறு கலந்தாலோசனைகளை மேற்கொண்டு வருகின்றது. எனவே, எதிர்காலத்தில் எங்களுடைய அரசாங்கத்தின்மூலம்

[ගරු අබූබකර් ආතම්බාවා මහතා]

அந்தப் பிரதேச மக்கள் குடிநீரைப் பெற்றுக்கொள்வதற்குச் சந்தர்ப்பம் இருக்கின்றது. அத்தோடு, அந்தப் பிரதேசத்தில் மூன்று போகங்கள் விவசாயம் செய்வதற்கான சந்தர்ப்பமும் இருக்கிறது. அதுமாத்திரமல்ல, வெள்ளப்பெருக்கு ஏற்படு வதைத் தவிர்த்துக்கொள்ளவும் முடியும். செங்காமம், ஜெய்க்கா, ரொட்டை, அறுகம்பை, ஊறணி, கோமாரி, சங்கமன்கண்டி, லகுகல, பானம போன்ற பிரதேசங்களுக்கு மாத்திரமன்றி, ஊவா மாகாணத்துக்குக்கூட ஹெட ஓயா திட்டம்மூலம் குடிநீரை வழங்குவதற்கான சந்தர்ப்பங்கள் இருக்கின்றன.

கடந்த காலங்களில் அம்பாறை மாவட்டத்தில் குடிநீர் விநியோகத்தில் தொழில்நுட்பத்தைச் சரியான முறையில் பயன்படுத்தாததால், இப்போது சாய்ந்தமருது, கல்முனை, நிந்தவூர், காரைதீவு போன்ற பிரதேசங்களில் குடிநீருக்குத் தட்டுப்பாடு நிலவுகின்றது. இவற்றையெல்லாம் நிவர்த்தி செய்ய வேண்டுமாக இருந்தால், இவ்வாறான சட்டமூலங் களைக் கொண்டுவந்து, அந்த மக்கள் எதிர்பார்க்கின்ற குடிநீரைப் போதியளவு வழங்க வேண்டும். சாய்ந்தமருது, கல்முனை போன்ற பிரதேசங்களில் இருக்கின்ற சுனாமியால் பாதிக்கப்பட்டவர்களுக்கு வழங்கப்பட்ட EHED போன்ற வீட்டுத்திட்டங்கள் மற்றும் வெலிவேரியன் கிராமத்துக்கு குடிநீர் வழங்குவதற்கு இன்னும் 500 மீற்றர் வரை நிலக்கீழ் குழாய்களைப் பொருத்தவேண்டி இருக்கின்றது. அதனையும் இந்த அரசாங்கம் எதிர்காலத்தில் முன்னெடுப்பதற்கான சந்தர்ப்பங்கள் நிறையவே காணப்படுகின்றன. அதுமாத்திர மல்ல, அந்தப் பிரதேசங்களில் இன்றும் வடிகான் அமைப்பில் பல குறைபாடுகள் காணப்படுகின்றன. எங்களுடைய உள்ளூராட்சி மன்றங்கள் அவற்றைச் சரியான முறையில் முகாமைசெய்யுமாக இருந்தால், அவற்றையும் நிறைவுசெய்யக் கூடியதாக இருக்குமெனக் கூறி, எனது உரைய நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.14]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் விலங்குகள் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதம் நடைபெறுகின்றது. மிக முக்கியமாக, மட்டக்களப்பு மாவட்டத்திலுள்ள மயிலத்தமடு - மாதவனை மேய்ச்சல் தரையைக் காலங்காலமாக தமிழ் கால்நடை வளர்ப்பாளர்கள் தங்களுடைய சொந்த இடமாகக் கொண்டு, அந்த இடத்தில் கால்நடைகளை வளர்த்து பயன்பெற்று வந்தார்கள். அவர்களுடைய ஏராளமான கால்நடைகள் - மாடுகள் - அந்தப் பகுதியில் அத்துமீறி சோளச் செய்கையில் ஈடுபடுகின்ற பொலன்னறுவை மாவட்டத்தைச் சேர்ந்த சிலரால் கொல்லப்பட்டு இருக்கின்றன. இந்த விடயம் தொடர்பில் கடந்த 6-7 ஆண்டுகளாக இந்த உயர்ந்த சபையில் நாங்கள் பல தடவை பேசியிருக்கிறோம். எனினும், மயிலத்தமடு - மாதவனை மேய்ச்சல் தரை தொடர்பில் இந்த அரசாங்கமும் ஒரு தெளிவான முடிவை இதுவரை எடுக்கவில்லை என்பது மிகவும் துயரமானதும் துர்ப்பாக்கிய மானதுமான விடயமாகும். எனவே, நாங்கள் அரசாங்கத்திடம் ஒரு கேள்வியைக் கேட்கின்றோம். அதாவது, விலங்குகள் தொடர்பான சட்டமூலத்தைக் கொண்டுவருகின்ற நீங்கள், ஏன் மயிலத்தமடு - மாதவனை மேய்ச்சல் தரையை அங்குள்ள கால்நடை உரிமையாளர்களிடம் கையளித்து, அவர்களது கால்நடைகள் வளர்வதற்கான வசதியைச் செய்துகொடுக்க மறுக்கிறீர்கள்? இந்த வசதியைச் செய்து கொடுக்கவேண்டியது அரசாங்கத்தின் பொறுப்பு! கடந்த காலங்களில் இருந்த அரசாங்கங்கள் இதனை நிராகரித்தன. இந்த அரசாங்கமும் அதனைத்தான் செய்து வருகின்றது.

இன்று யாழ்ப்பாண மண்ணில் குறிப்பாக, மயிலிட்டி, பலாலி, வசாவிளான் போன்ற பிரதேசங்களில் மக்கள் தங்களுடைய காணிகளை விடுவிக்குமாறு கோரி தொடர்ந்து போராட்டம் நடத்தி வருகிறார்கள். 2026.07.14ஆம் திகதி வலிகாமம் வடக்குப் பிரதேச செயலாளரால் விமான நிலையத்துக்குக் காணி சுவீகரிப்பதாகக் கூறி, சிலருக்குக் கடிதங்கள் அனுப்பி வைக்கப்பட்டுள்ளன. சென்ற கிழமை அந்த மக்களை அங்கு அழைத்தும் பேசியிருந்தார்கள். அதன்போது, அந்த மக்கள் தங்களது கருத்துகளைச் சொல்லியிருந்தார்கள். குறிப்பாக, தங்களுக்குத் தங்களுடைய நிலம் வேண்டும் எனவும், தங்களுடைய காணிகளை விட்டுக்கொடுக்க முடியாதெனவும் சொல்லியிருந்தார்கள்.

1990ஆம் ஆண்டு யூன் மாதம் 15ஆம் திகதியான வெள்ளிக்கிழமை, மயிலிட்டி, வசாவிளான், பலாலி, தோலகட்டி போன்ற இடங்களைச் சேர்ந்த மக்கள் சமைத்த உணவைக்கூட சாப்பிட முடியாத நிலையில் இராணுவத் தினரால் அங்கிருந்து கலைக்கப்பட்டார்கள். அவர்களைக் கலைத்தது மட்டுமல்ல, அந்த இடங்களை வலுக்கட்டாயமாக இராணுவத்தினர் பறித்தும் இருந்தார்கள். இன்று அந்த இடங்களில் இராணுவத்தினர் தோட்டம் செய்கிறார்கள்; மரக்கறியை வெளியில் மக்களுக்கு விற்கிறார்கள். அதுமாத்திர மல்ல, அந்த மக்களுடைய தென்னை மரங்களிலிருந்து தேங்காய்களைப் பறித்து, அவர்களுடைய கண்களுக்கு முன்னாலேயே அவற்றை விற்பனையும் செய்கிறார்கள்.

அண்மையில் கௌரவ மனோ கணேசன் அவர்கள்கூட ஒரு சிங்கள ஊடகத்துக்கு வழங்கிய செவ்வியில், "ஏன் நீங்கள் யுத்தம் இல்லாத நேரத்தில் அந்த மக்களுடைய காணிகளை வைத்திருக்கிறீர்கள்? அவற்றை அந்த மக்களுக்கு வழங்குவதில் என்ன தடங்கல்கள் இருக்கின்றன? இப்பொழுது இந்த நாட்டில் யுத்தம் இல்லை; ஆயுதங்களோடு யாரும் இல்லை" என்று சொல்லியிருந்தார். வலிகாமம் வடக்குப் பிரதேச செயலாளர் பிரிவிலுள்ள 16 கிராம அலுவலர் பிரிவுகளில், முழுமையாக 3 கிராம அலுவலர் பிரிவுகள் இராணுவத் தினருடைய முகாம்களாக இருக்கின்றன. உண்மையிலேயே அவை முகாம்கள் அல்ல. அவர்கள் அங்கு விவசாயம் செய்கிறார்கள்; சலூன் வைத்திருக்கிறார்கள்; சாப்பாட்டுக் கடைகளை வைத்திருக்கிறார்கள். அந்தக் காணிகளை அந்த மக்களிடம் வழங்குவதற்கு அரசாங்கம் தயாராக இல்லை.

மாண்புமிகு சனாதிபதி அவர்கள் பலாலிக்கு வந்தபொழுது மக்களிடம் சொன்னார், "உங்களுடைய காணிகள் உங்களுக்குத்தான்; நாங்கள் அந்தக் காணிகளை விடுவிப்போம்" என்று. பலாலி விமான நிலையத்துக்கான காணி சுவீகரிப்புத் தொடர்பில், நான் 2026.07.27ஆம் திகதி வலிகாமம் வடக்குப் பிரதேச செயலாளருக்குக் கடிதமொன்றை அனுப்பியிருந்தேன். அதில் நான் மிக முக்கியமாகக் குறிப்பிட்ட விடயங்கள் பின்வருமாறு:

1. விமான நிலைய விரிவாக்கத்துக்காக காணிகள் சுவீகரிக்கப்படவுள்ள துல்லியமான எல்லைகள் மற்றும் வரையறைகள் எவை என்பது அறிவிக்கப்படவில்லை.

2. எந்தெந்தக் கிராம அலுவலர் பிரிவுகளில் மொத்தமாக எத்தனை ஏக்கர் காணிகள் சுவீகரிக்கப்படவுள்ளன என்பது தொடர்பில் எந்தவித தெளிவான தகவலும் வழங்கப்படவில்லை.

3. சுவீகரிக்கப்படவுள்ள காணிகளுக்கான நட்டஈடு வழங்கும் முறை அதன் மதிப்பீட்டு அடிப்படை மற்றும் வழங்கப்படவுள்ள இழப்பீட்டுத் தொகை தொடர்பில் எவ்வித விளக்கமும் குறிப்பிடப்படவில்லை.

4. 'விமான நிலைய அபிவிருத்தி' என்ற நோக்கத்துக்காகச் சுவீகரிக்கப்படவுள்ள காணிகள் பின்னர் இராணுவத்தின் விவசாய அல்லது பிற நடவடிக்கைகளுக்காகப் பயன்படுத்தப்படலாம் என்ற சந்தேகம் காணி உரிமையாளர்கள் மத்தியில் பரலாக நிலவுகின்றது. இச்சந்தேகத்தை நீக்கும் வகையில், அரசாங்கத்தின் உத்தியோகபூர்வ நிலைப்பாடு வெளிப் படுத்தப்பட வேண்டும். மக்கள் அதனை வலியுறுத்து கின்றனர்.

5. சுவீகரிக்கப்படும் காணிகளுக்கான நட்டஈடு எந்தக் காலவரையறைக்குள் வழங்கப்படும் என்பது தொடர்பில் உறுதியான அறிவிப்போ, நடைமுறையோ இதுவரை வெளியிடப்படாத நிலையில், மக்கள் தமது எதிர்கால வாழ்வாதாரம் குறித்து கடும் கவலையடைந்துள்ளனர்.

அந்த வகையில், இந்தக் காணி சுவீகரிப்பு நடவடிக்கையை உடனடியாக நிறுத்துமாறு நான் கோரியிருந்தேன். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அந்தக் கடிதத்தின் பிரதியை நான் சபாபீடத்துக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
எனக்கு 8 நிமிடங்கள் ஒதுக்கப்பட்டு இருந்து. தயவுசெய்து, அந்த நேரத்தை முழுமையாகத் தாருங்கள்!

அடுத்து, முல்லைத்தீவு மாவட்டத்திலுள்ள கேப்பாப்புலவு காணி பற்றி சொல்ல வேண்டும். இங்கு கௌரவ துரைராசா ரவிகரன் அவர்கள் இருக்கிறார். அவர் இந்த உயர்ந்த சபையில் பல தடவை இந்தக் காணி தொடர்பான கோரிக்கைகளை முன்வைத்திருக்கிறார். அந்த மக்கள் 12 ஆண்டுகளாகத் தங்களுடைய சொந்த நிலத்துக்குப் போவதற்காகப் போராடு கிறார்கள். 2026.06.04ஆம் திகதி மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு அந்த மக்கள் கடிதமொன்றை எழுதியிருந்தார்கள். 48 பேர் கையொப்பமிட்டு, மாண்புமிகு சனாதிபதிக்கு அனுப்பிய அந்தக் கடிதத்தின் பிரதியையும் நான் சபாபீடத் துக்குச் ***சமர்ப்பிக்கின்றேன்**.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

இன்றும் அந்தக் கடிதத்துக்கு சனாதிபதியிடமிருந்து சரியான பதில் கிடைக்கவில்லை. நானும்கூட, இந்த விடயம் தொடர்பில் 2026.07.28ஆம் திகதி மாண்புமிகு சனாதிபதிக்குக் கடிதமொன்றை அனுப்பினேன். பாதிக்கப்பட்ட காணி உரிமையாளர்கள் 62 பேரின் பெயர் விபரங்களையும் அதனுடன் சேர்த்து அனுப்பினேன். தயவுசெய்து, அந்த மக்களுடைய காணிகளை அவர்களுக்கு வழங்குங்கள்! அந்தக் கடிதத்தின் பிரதியை நான் சபாபீடத்துக்குச் ***சமர்ப்பிக்கின்றேன்**.

நாட்டில் யுத்தம் இல்லாத நிலையில், நேற்று முன்தினம் இந்தச் சபையில் பாதுகாப்புப் பிரதி அமைச்சர் கௌரவ அருண ஜயசேகர அவர்கள் சொன்னார், "நாங்கள் அந்தக் காணிகளைக் கொடுக்க மாட்டேம்; அவை பாதுகாப்புக்கு அவசியமானவை" என்று. இந்த நாட்டில் எங்கே யுத்தம் நடக்கிறது? இந்த நாட்டில் யுத்தம் முடிந்து எல்லாம் சுமுகமாகியுள்ளதென நீங்கள் உலகம் முழுக்கச் சொல்கின் றீர்கள். அதாவது, உலக நாடுகளுக்குச் சொல்கின்றீர்கள், இந்த நாட்டில் எந்த யுத்தமும் இல்லை என்று. அப்படியானால், ஏன் அந்த மக்களின் காணிகளை வழங்குவதற்குத் தயங்குகிறீர்கள்? யுத்தம் இல்லாத நாட்டில் உங்களுக்கு எதற்கு மக்களுடைய காணிகள்? வலிகாமம் வடக்கில் கிட்டத்தட்ட 3,000 ஏக்கர் காணிகளையும், கேப்பாப்புலவில் 200 ஏக்கர் காணிகளையும் ஏன் நீங்கள் பறித்து வைத்திருக்கிறீர்கள்? அந்த மக்கள் பரம்பரை பரம்பரையாக - காலாகாலமாக - வரலாற்று ரீதியாக வாழ்ந்த மண்ணை நீங்கள் பறித்திருக்கிறீர்கள். கொழும்பிலோ, பதுளையிலோ, அம்பாந்தோட்டையிலோ, மாத்தறையிலோ இவ்வாறு இராணுவமுகாம் உள்ள இடங்களைச் சுற்றி நீங்கள் காணிகளைப் பிடித்திருக்கிறீர்களா? அல்லது பெரிய பிரதேசங்களை வைத்திருக்கிறீர்களா? ஏன் தமிழர் பகுதியில் மட்டும் -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසානයි ගරු මන්ත්‍රීතුමා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நீங்கள் அமர்வு நேரத்தைக் கொஞ்சம் அதிகரித்து இருக்கிறீர்கள். ஆகையால், எனக்குப் பேசுவதற்கு இன்னும் கொஞ்சம் நேரம் தர வேண்டும்.

பலாலி என்பது எதைப் போட்டாலும் முளைக்கக்கூடிய வளங்கொழிக்கும் பூமி! அந்தப் பிரதேசத்திலுள்ள மக்களின் - பலாலி, வசாவிளான், மயிலிட்டி மக்களின் - வாழ்வாதாரம் சிதைக்கப்பட்டு, இன்று அவர்கள் தெருக்களில் போராடிக் கொண்டு இருக்கிறார்கள். பாதுகாப்புப் பிரதி அமைச்சர் கௌரவ அருண ஜயசேகர அவர்கள் எந்த மனநிலையோடு இந்தச் சபையில் அந்த மக்களுடைய காணிகளைப் பற்றி பேசுகிறார். தயவுசெய்து, சிந்தியுங்கள்! அந்த மக்களுடைய காணிகளை அவர்களுக்கே வழங்குங்கள்! அந்த மக்கள் NPPக்குத்தான் வாக்களித்தார்கள். அந்த மக்கள் வெளிப்படை யாகவே சொல்கிறார்கள், "எங்களுடைய காணிகளை

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

விடுவிப்பதாகச் சொன்னதால்தான், நாங்கள் கடந்த பாராளுமன்றத் தேர்தலில் யாழ்ப்பாண மண்ணில் NPPக்கு வாக்களித்தோம்" என்று. நீங்கள் அந்த மக்களுடைய வாக்குகளைப் பெற்று, பாராளுமன்ற உறுப்பினர்களையும் பெற்றுக்கொண்ட பின்னர், கிட்டத்தட்ட இரண்டு ஆண்டுகளாகியும் இன்னும் அவர்களுடைய ஒரு துண்டு நிலத்தைக்கூட உங்களால் விடுவிக்க முடியவில்லை என்றால், இந்த நாட்டில் உங்களுடைய நீதி என்ன? நியாயம் என்ன? இவ்வளவு காலமும் இருந்த அரசாங்கங்கள் - கடந்த அரசாங்கங்கள் - கடைப்பிடித்த அதே நடைமுறையைத்தான் நீங்களும் கடைப்பிடிக்கின்றீர்களா?

தயவுசெய்து, முல்லைத்தீவு - கேப்பாப்புலவு மக்களுக்கு நீதி கிடைக்கச் செய்யுங்கள்! அந்த மக்களுக்கான நீதியை நிலைநாட்டுங்கள்! நீங்கள் கண்ணியமிக்க, நேர்மைமிக்கவர்கள் என்றால், அந்த மக்களைச் சம உரிமையோடு மதிக்கிறீர்கள் என்றால், அவர்களுடைய காணிகளை விடுவியுங்கள்! அவர்கள் சொந்த நிலத்திலிருந்து உங்களுடன் பேசட்டும்! அதற்கான வழியை இந்த அரசாங்கம் ஏற்படுத்தாத வரை, நீங்கள் இந்த நாட்டில் இருக்கின்ற மக்களை வேறுபடுத்தித்தான் பார்க்கிறீர்கள். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஆயுதம் தூக்கிப் போராடுகின்ற யாரும் இல்லாத இந்த நாட்டில், 'பாதுகாப்பு' என்ற அடிப்படையில் மக்களுடைய காணிகளை எதற்காகப் பறிக்கின்றீர்கள்? உங்களுக்கு எதற்கு அந்தக் காணிகள்? திரும்பவும் ஆயுதம் தூக்க வேண்டுமென நீங்கள் விரும்புகின்றீர்களா? அதைத்தான் நீங்கள் வற்புறுத்துகின்றீர்களா? நீங்கள் எப்பொழுதும் தமிழர்களை ஆயுதம் தூக்கியவர்களாகப் பார்க்க விரும்புகின்றீர்களா? தயவுசெய்து, அவர்களுடைய காணிகளை அவர்களிடம் கொடுங்கள்! இந்த நாட்டினுடைய தர்மமும் பௌத்த தர்மமுமாக இது இருக்கும்! எனவே, இதனை உடனடியாகச் செய்யுமாறு கேட்டு நிறைவு செய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.24]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද උදේ පටන් පනත් දෙකකට අදාළ සංශෝධන පිළිබඳව මේ සභාවේ සාකච්ඡා වුණා. 1958 අංක 29 දරන සත්ව පනත සහ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පනතට අදාළ සංශෝධන තමයි අද සාකච්ඡා කෙරුණේ, සාකච්ඡා වෙන්නේ.

1958 අංක 29 දරන සත්ව පනත ගත්තාම, මීට පෙර ඒකට සංශෝධන 4ක සිද්ධ වෙලා තිබෙනවා. 5වෙනි සංශෝධනය තමයි අද මේ ඉදිරිපත් වෙන්නේ. ඒ යටතේ, පෙරහැරට බාධා කරනවා, පෙරහැරට බාධා වෙයි, අනෙකුත් සංස්කෘතික කටයුතුවලට බාධා වෙයි ආදී වශයෙන් සාකච්ඡාවකුත් මේ සභාව තුළ ගියා. නමුත් අද මේ ගෙනෙන සංශෝධනය තුළ එහෙම කිසිම දෙයක් නැහැ. නමුත් සත්ව සුබසාධන පනත් කෙටුම්පතක් දැන් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒක වෙනම කාරණයක්. 1907දී සම්පාදිත සත්ව හිංසා වැළැක්වීමේ ආඥා පනත තමයි දැනට සතුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් තිබෙන පනත. ඒක සංශෝධනය වෙලා නැහැ මේ වෙනකම්, අවුරුදු 119ක් පුරාවට. සත්ව සුබසාධනය ඉෂ්ට කිරීමටත්, සතුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් අදාළව නීති රෙගුලාසි ගොඩනැහෙන්න ඕනෑය කියන සාකච්ඡාවක් රට තුළ ලොකුවටම ගොඩනැඟිලා තිබෙනවා. ඊට අදාළ කටයුතු මේ වෙනකොට අපි කරගෙන යනවා. ඒකට අදාළ යෝජනාවලියක් ඇවිල්ලා තිබෙනවා. ඒ යෝජනාවලියට යම් යම් සංශෝධනත් ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම ඊට අදාළ සාකච්ඡා ඉල්ලා තිබෙනවා. අපේ ලාල් කාන්ත ඇමතිතුමාගේ මැදිහත්වීම යටතේ ඒ සාකච්ඡාවලට අවස්ථාත් ලබා දීලා තිබෙනවා. සතුන්ගේ සුබසාධන කටයුතු ආරක්ෂා වෙන විධියටත්, සතුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙන විධියටත්, සතුන් පාවිච්චි කරලා අපේ රටේ සිදු කරන ආගමික කටයුතු, සංස්කෘතික කටයුතු සහ කෘෂි කාර්මික කටයුතුවලට බාධාවක් නොවන විධියටත් ඉදිරියේදී ඒ නීති රෙගුලාසි ගේන්න ඕනෑකම තිබෙනවා. ඒක ඉදිරියේදී සිද්ධ වෙනවා. ඒ නිසා කිසි කෙනෙක් කලබල වෙන්න අවශ්‍යතාවක් නැහැ. ඒ තුළින් සංස්කෘතික වශයෙන් සිදු කරන කිසිම කටයුත්තකට බාධාවක් පැමිණවීමට කිසිම අදහසකුත් නැහැ, එහෙම සිද්ධ වෙන්න ඉඩ තියන්නෙත් නැහැ කියන කාරණය මම මේ වෙලාවේ සඳහන් කරනවා.

විශේෂයෙන්ම 1958 අංක 29 දරන සත්ව පනතේ රෙගුලාසි තුළින් සතුන් ප්‍රවාහනය කිරීම සහ සතුන් වගා බිම්වලට අනවසරයෙන් ඇතුළුවීමට අදාළව තමයි නීති සම්පාදනය කරලා තිබෙන්නේ. එතැනදී සතා කියන අර්ථකථනය මී හරකා සහ එළහරකා කියන සතුන් දෙන්නාට සීමා වෙලා තිබෙනවා. නමුත් එළුවා, ඌරා, බැටළුවා, කුකුළා කියන සත්තු අනවසරයෙන් ඇතුළුවීම නීතියට අනුව ගත්තොත්, ගැටලුවක් තිබෙනවා. ඒකට අදාළ බාධා පමුණුවලා තිබෙනවා.

මෙන්න මේ තත්ත්වයත් එක්ක තමයි ඇත්තටම මේ පනතට සංශෝධනයක් ගෙන එන්නේ.

එළුවා, සූකරයා සහ බැටළුවා යන සත්තු තුන්දෙනා ප්‍රවාහනය කිරීමේ කටයුත්තට අදාළ කාරණා මේ පනතට ඇතුළත් කර තිබෙනවා. ඇත්තටම ඊට අදාළ කරුණු සාකච්ඡා කෙරුණා මෙතැනදී. ඊට හේතු මොනවාද කියන කාරණාත් පැන නැඟුණා. ඒ සඳහා මෙතැනදී කිසිම කෙනෙකුගෙන් විරෝධයක් පැන නැඟුණේ නැහැ. හැමෝගේම එකඟතාවක් තමයි ලැබුණේ. ඒ නිසා ඒ පිළිබඳව මම ලොකු විස්තරයක් කරන්න යන්නේ නැහැ. නමුත් විශේෂයෙන්ම මෙතැනදී මම මතක් කරන්න ඕනෑ, මේ කාරණයත්. සූකර කර්මාන්තය වාගේ කර්මාන්තවල යෙදිලා ඉන්න ප්‍රජාව මෙතැනදී කලබල වෙන්න අවශ්‍ය නැහැ. ඔබතුමන්ලා දන්නවා, අප්‍රිකානු සූකර උණ අපේ රටේ සූකරයන්ට බෝ වෙලා අපේ සූකර කර්මාන්තය සියයට 90කට වඩා සම්පූර්ණයෙන්ම කඩා වැටුණු බව. ඒ ලෙඩේ අන්තිමට කැළේ ඉන්න සූකරයන්ටත් බෝ වුණා. කැළේ පුරාවට සූකරයෝ මැරි මැරී වැටෙන්න පටන් ගත්තා. ඒක ලොකු ප්‍රශ්නයක් වුණා. ඒ ලෙඩ බෝ වීම ව්‍යාප්ත වීමට බලපෑ ප්‍රධාන කාරණයක් තමයි ඒ සත්තු ප්‍රවාහනයේදී නිදහසේ අරගෙන යන්න පුළුවන්කම තිබීම. අන්න ඒ නිසා තමයි මේ පිළිබඳව ජනාධිපති කාර්ය සාධක බලකායකුත් පත් කරලා, ඒ වාගේම ආහාර ප්‍රතිපත්ති සහ සුරක්ෂිතතා කමිටුවත් ඒ අදාළ සංගම් එක්කත් සාකච්ඡා කරලා මේ තීරණවලට එළැඹ තිබෙන්නේ. මේ ප්‍රවාහනය කිරීමේ කටයුත්තේදී මොනවා හරි බාධාවන් තිබෙනවා නම්, අපට රෙගුලාසිවලින් ඒවා වෙනස් කර ගන්න පුළුවන්; ඒවා ඇතුළත්

කර ගන්න පුළුවන්. කොහොම වුණත්, ඒ සත්තු ප්‍රවාහනය කිරීමේදී පශු වෛද්‍යවරයා මූලික වෙච්ච සෞඛ්‍ය සහතිකයක් ලබා ගැනීමේ වුවමනාව තිබෙනවා. ඒ අනුව, ලෙඩ සත්තු ප්‍රවාහනය කරන්න ඉඩකඩ ලැබෙන්නේ නැහැ. ඒ කාරණය තමයි මෙතැනදී ප්‍රධාන වශයෙන්ම සැලකිල්ලට අරගෙන තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සතුන්ට බෝ වන ලෙඩ රෝග සමහර විට මිනිසුන්ටත් බෝ වනවා. උදාහරණයක් ගත්තොත්, ඕස්ට්‍රේලියාවෙන් හරක් ගෙනාවා. එම හරකුන්ට තිබුණා, bovine viral diarrhea කියන රෝගය. එම රෝගය තිබෙන බව හොයා ගත්තා. රෝගය අනෙක් සතුන්ටත් බෝ වුණා. එම රෝගයෙන් සතුන් විශාල ප්‍රමාණයක් මැරුණා. ඊළඟට, Fasciola hepatica කියන රෝගය සතුන්ට තිබෙනවා කියලා සැක කළා. ඒ අනුව පරීක්ෂණ කළා. නමුත්, එම රෝගය තිබෙන බවට තහවුරු වුණේ නැහැ. එම රෝගය තිබුණා නම් ක්ෂීරපායි සතුන් සියල්ලන්ටම රෝගය බෝ වනවා. ඒ විතරක් නොවෙයි, මිනිසුන්ටත් බෝ වනවා. එවැනි තත්ත්වයක් තුළ සතුන් ප්‍රවාහනයේදී නියාමනයක් නොකළොත් බරපතළ තත්ත්වයන්වලට මුහුණ දෙන්නට අපට සිද්ධ වනවා. ඔන්න ඔය කාරණා අනුව තමයි මේ තීරණය අරගෙන තිබෙන්නේ. එම නිසා මෙම කර්මාන්තයේ යෙදෙන ගොවි ප්‍රජාවට අපි කියා සිටිනවා, ඔබේ කර්මාන්ත ආරක්ෂා කර ගන්න නම් මේ කියන පොදු නීති, රෙගුලාසිත් එක්ක ඉස්සරහට යන්න ඕනෑකම තිබෙන බව. එහිදී ඔබ මුහුණ දෙන විශේෂ ගැටලු තිබෙනවා නම් අපත් එක්ක සාකච්ඡා කරලා, මීට අදාළ රෙගුලාසි පැනවීමේදී අපට ඒවා බේරා ගන්න පුළුවන් කියන පණිවුඩය අපි මේ වෙලාවේ ගොවි ප්‍රජාවට දැනුම් දෙන්න කැමැතියි.

අද විවාද කරන පනත් කෙටුම්පත් දෙක සම්බන්ධයෙන් අදහස ඉදිරිපත් කරන අතරේ, වීවලට අදාළ කාරණා ගරු සභාවේ ප්‍රධාන මාතෘකාවක් බවට පත් වුණා. ඒ ගැන කථා කරන්න පෙරාතුව, සත්ව සමීක්ෂණය පිළිබඳව මම කථා කරන්න ඕනෑ. මොකද, ඒ ගැනත් මෙතැන සාකච්ඡා වුණා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයකු කිව්වා, සත්ව සමීක්ෂණය සඳහා කෝටි 7ක වියදමක් ගිහින් තිබෙනවා කියලා. එය සම්පූර්ණයෙන් සාවද්‍ය ප්‍රකාශයක්. ඒ සියලු තොරතුරු අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එම සත්ව සමීක්ෂණයට ගිය සම්පූර්ණ වියදම මම රවුම් අගයෙන් කියන්නම්. වියදම් වුණේ රුපියල් ලක්ෂ 27යි. ඩෙල්ෆ්ට් දූපත සහ ග්‍රාම නිලධාරි වසම් 6ක් හැරුණුකොට මුළු රටේම අනෙකුත් ග්‍රාම නිලධාරි වසම් සම්බන්ධ කර ගත් එම සමීක්ෂණ කටයුත්ත සිද්ධ කළේ රුපියල් ලක්ෂ 27ක වියදමකින්. ඇත්තටම ඒ කථා කළ කට්ටිය මෙය කළා නම් සමහර විට රුපියල් ලක්ෂ 27ක් නොවෙයි, කෝටි 27ක් වැය වෙන්න තිබුණා. අපි පත්‍රිකාවක් මුද්‍රණය කරලා, යාපනය ඇතුළු හැම තැනකට ඒ පත්‍රිකා ප්‍රවාහනය කරලා හැම ගෙදරකටම බෙදා හැරියා. ඒක, රජයේ නිලධාරීන් සහ සියලු ප්‍රජාව සම්බන්ධ කරගෙන කළ දැවැන්ත ක්‍රියාවලියක්. රුපියල් ලක්ෂ 27කින් තමයි ඒ වැඩේ කළේ.

ඊළඟට, වී මිල සම්බන්ධයෙනුත් මම කථා කරන්න ඕනෑ. වී මිල සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමාත්, තවත් මන්ත්‍රීවරුත් කරුණු මතු කළා. විවාදය පටන් ගත්ත මන්ත්‍රීතුමාත් කථාව පටන් ගත්තේම වී මිල සම්බන්ධයෙන් කියමින්. මුලින්ම විපක්ෂ නායකතුමාට මම මේ කාරණය කියන්න කැමැතියි. එතුමාගේ ඔය පුටුවේ ඉඳගෙනම එතුමා ප්‍රශ්නයක් ඇහුවා. මෙතැන ඉඳන් මමම තමයි එම ප්‍රශ්නයට උත්තරය දුන්නේ. එතුමා මතු කළා, පොහොර තහනම් කළ කාලයේ රටේ වී නිෂ්පාදනය සියයට 35කින් අඩු වුණා කියලා. ඒ කියන්නේ, කලින් ගොවියා වී කිලෝ 1,000ක අස්වැන්නක් ගත්තා නම් එය වී කිලෝ 650 දක්වා අඩු වුණා කියන කාරණය තමයි කිව්වේ. ඒක ඇත්ත, අස්වැන්න අඩු වුණා; සියයට 35කින් හෝ ඊට වඩා අඩු වුණා. ඒක එක කාරණයක්. ඊළඟට, එම කාල පරාසය තුළ පොහොර මිටියක මිල රුපියල් 40,000ක්, 50,000ක් දක්වා ඉහළ ගියා. අනෙකුත් කෘෂි රසායනික ද්‍රව්‍ය හොයා ගන්න බැරි වුණා; ඒවා අතුරුදහන් වුණා. අනෙකුත් ගාස්තු ඔක්කෝම වැඩි වුණා. අස්වැන්න අඩු වුණා. පොහොර ඇතුළු ගාස්තුවල මිල ගණන් වැඩි වුණා. ඒ තත්ත්වය තුළ නිෂ්පාදන පිරිවැය ගණන් බැලීමේදී එදා වී කිලෝවකට රුපියල් 150කට වැඩි පිරිවැයක් ගියා. ඔන්න ඕක තමයි අපි රුපියල් 154ක් කියලා කිව්වේ. අපි කොතැනකදීවත් කියලා නැහැ, රුපියල් 154ක මිලක් වීවලට දෙන්න කියලා. වී මිල සම්බන්ධව අපි අතරේම සාකච්ඡාවක් ඇති වුණා. අපේ ගරු ලාල් කාන්ත ඇමතිතුමාගේ මූලිකත්වයෙන් තමයි එම කටයුත්ත සිද්ධ වුණේ. වීවල නිෂ්පාදන වියදම රුපියල් 150 පැන්නාට, නිෂ්පාදන වියදම තවත් වැඩි කරලා වීවලට මිලක් ඉල්ලන්න අපි එදා තීන්දුවක් ගත්තේ නැහැ. මොකද, එහෙම වුණොත් පාරිභෝගික ජනතාවට ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වනවා. ඔන්න ඔය තත්ත්වය තුළ තමයි එදා නිෂ්පාදන වියදම අඩු කර ගන්න අපි අරගළ කළේ. අපි නිෂ්පාදන වියදම අඩු කර ගන්න අරගළයක් කළා මිස, නිෂ්පාදන වියදමට සියයට 30ක් එකතු කරලා වීවලට මිලක් ඉල්ලුවේ නැහැ. දැන් හැම තැනකදීම කියන්නේ, නිෂ්පාදන වියදම 154යි කියන එක. ඒ වාක්‍යය විතරයි තිබෙන්නේ. මට ඒ පැහැදිලි කිරීම කරන්න ඕනෑකම තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ප්‍රධාන වශයෙන් වීවල නිෂ්පාදන වියදම අපේ අමාත්‍යාංශයට අදාළ දෙපාර්තමේන්තු හා ආයතන 6ක් සම්බන්ධ වෙලා ගණන් බලලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසානයි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

එම ගණන් බැලීමට අනුව රතු නාඩු වී කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 76යි; සුදු නාඩු වී කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 87යි; සම්බා වී කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 97යි; කීරි සම්බා වී කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 109යි. එහෙම නම්, නිෂ්පාදන වියදමත් එක්ක අස්වැන්න අරගෙන බලමු. අපි අක්කරයකින් ලබා ගත් අස්වැන්නේ ආසන්න අගය අරගෙන තිබෙනවා. ඒ අනුව රතු නාඩු කිලෝ 2,315ක, සුදු නාඩු කිලෝ 2,016ක, සම්බා කිලෝ 1,779ක සහ කීරි සම්බා කිලෝ 1,589ක අස්වැන්නක් ලබාගෙන තිබෙනවා. ඒ අනුව ගොවියාට රුපියල් 120ට, 130ට හා 140ට වී ටික විකුණා ගැනීමට මේ වනකොට ඉඩකඩ ලැබිලා තිබෙනවා. ඒ නිසා මතක තබා ගන්න, අස්වැන්නත් වැඩි වෙලා තිබෙනව බව. ඔන්න ඔය තත්ත්වය ඇතුළේ අපි පිළිගන්නවා, ඉන්ධන මිල වැඩි වීමත් එක්ක ගොවි ජනතාව ගෙවිය යුතු ට්‍රැක්ටර් ගාස්තු, ගොයම් කපන "භූතයා" යන්ත්‍රයේ ගාස්තු වැඩි වුණු බව. ඒකෙන් ගොවියාට යම්කිසි පීඩනයක් ඇති වුණා.

ගොවි ජනතාවට පොහොර සම්බන්ධයෙන් ආණ්ඩුව ලොකු සහනයක් ලබා දුන්නා. මෙම නිෂ්පාදන වියදමට පොහොර සහනාධාරය එකතු කරලා නැහැ. පොහොර සහනාධාරය නිෂ්පාදන වියදමට එකතු කළා නම්, මේ නිෂ්පාදන වියදම මීටත්

[ගරු නාමල් කරුණාරත්න මහතා]

වඩා අඩු වෙනවා. මේක තමයි ඇත්ත තත්ත්වය, යථාර්ථය. ගොවි නායකයන් අමාත්‍යාංශයට ඇවිල්ලා සාකච්ඡා කළා. එම සාකච්ඡාවේදී ගොවි නායකයන් පිළිගත් කාරණයක් තමයි මම මේ ගරු සභාවේ මතු කරන්නේ. මේ තත්ත්වය තේරුම් අරගෙන, ඊළඟ කාල පරාසය තුළ මේ ගැටලු ක්‍රමානුකූලව නිරාකරණය කර ගැනීම සඳහා අපි මැදිහත් වෙමින් සිටිනවා කියන කාරණය මේ වෙලාවේ දී ගොවි ජනතාවට මතක් කරන්න මම කැමැතියි. ඒ පණිවුඩය ලබා දෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு கே.டீ. லால் காந்த]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. K.D. Lal Kantha]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත
## தேசிய நீர்வழங்கல், வடிகால் சேவைகள் சபை (திருத்தம்) சட்டமூலம்
## NATIONAL WATER SUPPLY AND DRAINAGE BOARD (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Susil Ranasinghe]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES in the Chair.]*

***1 සිට 20 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 20ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 20 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සඳහා සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව කල්තබන අවස්ථාවේ ප්‍රශ්න.

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් මා මෙම ප්‍රශ්නය අහනවා.

01. 2026 ජූලි මස මුල් සතියේ මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම හේතුවෙන් මියගිය බන්ධනාගාර නිලධාරින් සංඛ්‍යාව කොපමණද?

02. තුවාල ලැබූ නිලධාරින් සංඛ්‍යාව කොපමණද?

ගරු ඇමතිතුමනි, මේ ගැටුම නිසා බන්ධනාගාර නිලධාරින් පිරිසක් මිය ගියා. මේ සම්බන්ධව ජනාධිපතිතුමා විසින් ඊට දවස් දෙකකට විතර පස්සේ සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ සාකච්ඡාවේදී ඔවුන් වෙනුවෙන් රුපියල් ලක්ෂ 10 බැගින් දෙනවා කියලා පොරොන්දුවක් වුණා. නමුත්, තවමත් මේ සම්බන්ධයෙන් කිසිම වැඩ පිළිවෙළක් සකස් කරලා නැහැ. මේ නිලධාරින් එකතු කරලා දුන් මුදල් ටික තමයි ඒ මියගිය අයගේ පවුල්වලට ලැබිලා තිබුණේ. මේ ප්‍රශ්නයේදී මම ඒ සම්බන්ධවත් දැනගන්න කැමැතියි.

03. බන්ධනාගාරවල සේවය කරන නිලධාරින් අවම පහසුකම් යටතේ, ලැබිය යුතු වාර්ෂික දීමනා නිසි පරිදි නොලබා සේවය කරන බව ඔබතුමා දන්නේද?

විශේෂයෙන්ම අද වන විට ඔබතුමාත් දන්නවා, මේ නිලධාරින් සමහර සතිවල දින 3ක් එක දිගට වැඩ කරන බව, උදේ, දවල් සහ රාත්‍රී. ඒ වාගේම ඔවුන්ට මූලික පඩිය විධියට ලැබෙන්නේ රුපියල් 58,000යි. විශේෂයෙන්ම ඔවුන් දිගින් දිගටම ඉල්ලා සිටිනවා, වැටුප් වැඩිවීමක්, අවදානම් දීමනාවක්. ඒ වාගේම ඔවුන්ට ලැබිය යුතුව තිබෙන සපත්තු, නිල ඇඳුම් ලැබිලා නැහැ. මම දන්නා විධියට අවුරුදු 3කින් විතර සපත්තු දීලා නැහැ. මේ වාගේ ප්‍රශ්න ගණනාවක් ඔවුන්ට තිබෙනවා. මේ නිසා ඔවුන් විශාල අවුලක ඉන්නේ. විශේෂයෙන්ම මම ඔබතුමාට මෙන්න මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. සමහර බන්ධනාගාර නිලධාරින් කිලෝමීටර 150ක්, 170ක් දුර සිට තමයි රාජකාරියට වාර්තා කරන්නේ. මේ බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්වරයා යටතේ නොවෙයි, ඊට කලින් මේ අය ස්ථානමාරු කරලා තිබුණා. ඒ නිසා මේ පීඩනයත් ඔවුන්ට විශාල වශයෙන් එල්ල වෙලා තිබෙනවා. එම නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉන්නවා, මේ සම්බන්ධවත් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා.

04. ඔවුන්ගේ සේවාවන් සඳහා වන අවශ්‍යතා නිසි පරිදි අඛණ්ඩව ලබා දීමට රජය ගෙන ඇති පියවර කුමක්ද?

විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් මම කරුණු කිහිපයක් මතු කළා. ඒ පිළිබඳවත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, නිලධාරින්ගේ uniforms, කැප්, තොප්පි, සපත්තු, නිල ලාංඡන අවුරුදු ගණනාවකින් ලැබිලා නැහැ කියන චෝදනාව ඔවුන් ඉදිරිපත් කරනවා. මේ පිළිබඳවත් සොයා බලන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මේ නිලධාරින්ගේ නිල නිවාස අද හරක් ගාල්වල තත්ත්වයට පත්වෙලා තිබෙනවා. අවුරුදු ගණනාවකින් ඒවා අලුත්වැඩියා කරලා නැහැ. ඔබතුමාගේ පාලන කාලය තුළ විතරක් නොවෙයි, මේක කලින් ඉඳලාම තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා මම විශේෂයෙන්ම

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ඔබතුමාගෙන් ඉල්ලනවා, මේ සම්බන්ධයෙන් සොයා බලන්න යම්කිසි visit එකක් කරන්න කියලා. සාමාන්‍යයෙන් සියලුම අධිකරණ ඇමතිවරුන් වැඩ බාර ගත්තාට පස්සේ ඒ බන්ධනාගාරවලට ගිහිල්ලා field visit එකක් කරනවා. නැත්නම් ලේකම්තුමිය ගිහිල්ලා ඒ ක්‍රියාවලියට සම්බන්ධ වනවා. නමුත්, මේ වනතුරු එවැනි තත්ත්වයක් අපට දකින්න ලැබුණේ නැහැයි කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

05. එකී ගැටුමෙන් මියගිය රැඳවියන් සංඛ්‍යාව කොපමණද?

06. තුවාල ලැබූ රැඳවියන් සංඛ්‍යාව කොපමණද?

07. අදාළ ගැටුමට හේතුව කුමක්ද?

08. ඒ සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂණවල තොරතුරු ඉදිරිපත් කරන්නේද?

09. මීගමුව බන්ධනාගාරයේ සිටි රැඳවියන් මේ වන විට මාරු කර ඇති බන්ධනාගාර මොනවාද?

10. එම බන්ධනාගාරවලදී ඔවුන් වධහිංසාවට ලක් කළ බව ඔබතුමා දන්නේද?

විශේෂයෙන්ම මීගමුව බන්ධනාගාරයේ වූ සිද්ධියෙන් පස්සේ චරිත සමරසිංහ යන අය වෙනත් ස්ථානයකට මාරු කර තිබෙනවා. මා සතුව තිබෙන මේ ලේඛනයේ විශාල කරුණු ගණනාවක් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙනවා. ඔහුට පහර දුන් අය පිළිබඳවත් සඳහන් වනවා. මම මේකේ තිබෙන නම් සඳහන් කරන්නේ නැහැ, බන්ධනාගාර නිලධාරින්ගේ නම් සඳහන් කිරීම හොඳ නැති නිසා. නමුත්, මේ සම්බන්ධයෙන් විශාල ප්‍රශ්න ගණනාවක් සෑම තැනකම තිබුණා. විශේෂයෙන්ම දුම්බර බන්ධනාගාරය ඇතුළු ඒ රැඳවියන් යවපු තැන්වලදී ඔවුන්ට විශාල වශයෙන් පහර දුන්නා කියලා සඳහන්ව තිබෙනවා.

11. අදාළ ස්ථාන මාරු කිරීම් සමඟ බන්ධනාගාරවල ඉඩපහසුකම්වල ගැටලු මතුව ඇති බවත්, අවම කාර්ය මණ්ඩලයක් සිටින බැවින් ආරක්ෂාව සම්බන්ධ ගැටලු මතු ව ඇති බවත් ඔබතුමා දන්නේද?

කාර්ය මණ්ඩලයේ නිලධාරින් 6,331ක් ඉන්න ඕනෑ. නමුත් නිලධාරින් 1,635ක් හිඟයි. ඒ නිසා තමයි බන්ධනාගාර නිලධාරින්ට මේ ප්‍රශ්න මතුවෙලා තිබෙන්නේ. ඒ නිලධාරින්ට එක දිගට දවස් තුනක්, ගෙදරවත් යන්න බැරිව උදේ, දවල් සහ රාත්‍රි වැඩ කිරීමට සිදුවීම නිසාත්, නිලධාරින් විශාල පිරිසකට ඈත ප්‍රදේශවල ඉඳලා රාජකාරියට වාර්තා කරන්න සිදුවීම නිසාත් ඔවුන් විශාල අර්බුදයකට පත්ව තිබෙනවා. ඔබතුමා මේ ගැන දන්නවා.

වැලිකඩ බන්ධනාගාරයේ අනුමත ධාරිතාව 839යි. නමුත් රැඳවියන් 3,400ක් ඉන්නවා. කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ ධාරිතාව 328යි. නමුත් 2,782ක් ඉන්නවා. මැගසින් බන්ධනාගාරයේ අනුමත ධාරිතාව 499යි. නමුත් 3,046ක් ඉන්නවා. මහර බන්ධනාගාරයේ ධාරිතාව 991යි. නමුත් 4,447ක් ඉන්නවා. බෝගම්බර බන්ධනාගාරයේ ධාරිතාව 799යි. නමුත් 2,500කට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. අනුරාධපුරය බන්ධනාගාරයේ 279යි ඉන්න ඕනෑ. නමුත්, 1,366ක් ඉන්නවා. කළුතර බන්ධනාගාරයේ ධාරිතාව 460යි. නමුත් 2,099ක් ඉන්නවා. කුරුවිට බන්ධනාගාරයේ ඉන්න පුළුවන් ප්‍රමාණය 362යි. නමුත් 1,154ක් ඉන්නවා. යාපනය බන්ධනාගාරයේ 294යි ඉන්න පුළුවන්. නමුත් 1,200ක් ඉන්නවා. වාරියපොල බන්ධනාගාරයේ 418යි ඉන්න ඕනෑ. නමුත් 1,761ක් ඉන්නවා. කෑගල්ල බන්ධනාගාරයේ 136යි ඉන්න පුළුවන්. නමුත්, 877ක් ඉන්නවා. ඒ නිසා අද විශාල ප්‍රශ්න ගණනාවක් ඇතිවෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරන්න ලැබෙන්නේ විනාඩි 7ක කාලයක් විතරයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

හොඳයි. මම ප්‍රශ්නයේ ඉතිරි කොටස් ඉදිරිපත් කරන්නම්.

12. ඉදිරියේදී බන්ධනාගාරවල ගැටුම් ඇති නොවීමට රජය යම්කිසි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්නේද?

13. නොඑසේ නම් ඒ මන්ද?

මේ සම්බන්ධයෙන් දැන් දරන මතය තමයි, විපක්ෂය විසින් සංවිධානය කරලා බන්ධනාගාර කඩනවා කියන එක. මේ වෙලාවේ ඒකත් මම විශේෂයෙන් මතු කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරන්න ලබා දී තිබුණු කාලය අවසානයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, මේ ක්‍රියාවලිය ගැන පැහැදිලි කිරීමක් කරන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, මගේ ප්‍රශ්නය අවසන් කරනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නය සම්බන්ධයෙන් මුලින්ම යම් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. එතුමා සඳහන් කරන්නට යෙදුණු බන්ධනාගාර තදබදය ගැන මා පිළිගන්නවා. හැබැයි, අපේ රජය බලයට එනකොටත් ඒ තැන්වල රැඳවියන් 29,000ක් හිටියා. දැන්, 40,000ක් ඉන්නවා. ඒවායේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවුරුදු 20ක් තිස්සේ පැවති එකම ආණ්ඩුවක්වත් කටයුතු නොකරපු නිසා තමයි අද අපි මේ අර්බුදයට මුහුණ දෙන්නේ. මේක අපි ආපු ගමන් ඇතිවුණු ප්‍රශ්නයක් නොවෙයි. නමුත්, අපි එය විසඳිය යුතු බව මා පිළිගන්නවා.

ගරු මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01. මීගමුවේ ඇති වූ ගැටලු සහගත තත්ත්වයෙන් බන්ධනාගාර නිලධාරින් 10දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා.

02. නිලධාරින් 21දෙනෙකු තුවාල ලබා තිබෙනවා.

ඔවුන්ට යම් මුදල් ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. ඊට අමතරව මේ සම්බන්ධව සොයා බලන්න ජනාධිපතිවරයා විසින් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුවෙන් බලාපොරොත්තු වන කාර්යභාරයක් තිබෙනවා. සාමාන්‍යයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව, සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට පත් වූ නිලධාරින්ට සහ තුවාල වූ නිලධාරින්ට වන්දි ගෙවීමේ ක්‍රම තිබෙනවා. නමුත් එතැනින් එහාට විශේෂිත තත්ත්ව පිළිබඳව, එනම් වන්දි

මුදල්, ඔවුන්ගේ සුබසාධන කටයුතු, විශ්‍රාම වැටුප්, ඔවුන් ගත් ණය පිළිබඳ ප්‍රශ්න, තුවාල වෙච්ච අයට ගෙවීම් කරන්නේ කොහොමද, පූර්ණ ආබාධිත අයට ගෙවීම් කරන්නේ කොහොමද කියන ඒවාට නිර්ණායක හඳාගන්න අවශ්‍ය කමිටුව තමයි මේ පත් කර තිබෙන්නේ. ඒ කමිටුවෙන් ඒ දේවල් තීරණය කළාට පස්සේ ඔවුන්ට ඉතා ඉක්මනින් ඒ වන්දි මුදල් ලැබෙනවා.

03. බන්ධනාගාරයේ සේවය කරන නිලධාරින්ට පහසුකම් අඩු බව මා පිළිගන්නවා.

නමුත් ඔවුන්ට නීත්‍යානුකූලව ලැබිය යුතු වාර්ෂික දීමනාව නිසි ලෙස ලැබෙනවා. හැබැයි, ඒ දීමනා ප්‍රමාණවත්ද? උත්තරය, 'නැත' යන්නයි. ඒ නිසා මේ නිශ්චිත මොහොතේ ඔවුන්ගේ දීමනා වැඩිකිරීම සම්බන්ධයෙන් වෙනම සාකච්ඡාවක් පැවැත්වෙනවා. ඒ බන්ධනාගාර නිලධාරින් කියන විධියට ඔවුන්ට ප්‍රථම වතාවට, ජනාධිපතිවරයාව කෙළින්ම මුණ ගැසී තමන්ගේ ගැටලු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබුණා. ඒ අවස්ථාවේදී ඔවුන්ට අවශ්‍ය දේවල් සම්බන්ධයෙන් විශාල යෝජනාවලියක් ඉදිරිපත් වුණා. ඒවා සම්පාදනය කරන්න, මේ Budget එකේදී කටයුතු කරන්නේ කොහොමද කියලා සාකච්ඡා කරමින් පවතිනවා.

04. ඔවුන්ගේ සේවාවන් සඳහා වන අවශ්‍යතා නිසි පරිදි අඛණ්ඩව ලබා දීමට රජය ගෙන ඇති පියවර විධියට මම කලින් කියපු ඒවාට අමතරව පහත පියවරත් ඇතුළත් වෙනවා.

(i) දීමනා ලබා දීම.

- විදුලිය දීමනාව
- රාත්‍රී සංචාර දීමනාව
- සිරමැදිරි රාත්‍රී රාජකාරි දීමනාව
- ආරක්ෂණ රාජකාරි දීමනාව
- යහපත් කල් ක්‍රියා දීමනාව
- අවදානම් දීමනාව
- සෞඛ්‍ය ආරක්ෂිත දීමනාව

(ii) වැලිකඩ, වවුනියාව, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, මොනරාගල, පල්ලන්සේන, බූස්ස, මහර, මීගමුව බන්ධනාගාරවල සිටින නිලධාරින් 50කට බැගින් පහසුකම් සැපයිය හැකි බැරැක්ක ඉදිකිරීම ආරම්භ කරලා තිබෙනවා. මීට අමතරව වාහන හිඟය මඟ හරවා ගැනීම සඳහා බස් රථ 40ක්, වෑන් රථ 15ක් මිලදී ගෙන තිබෙනවා. මීට අමතරව ඉදිරියේදී කැබ් රථ 10ක් සහ වෑන් රථ 11ක් මිලදී ගැනීමට නියමිතයි.

(iii) ඊට අමතරව, ඉඩ පහසුකම් ඇති ස්ථානවල නිලධාරින් සඳහා පෙරසවි තාක්ෂණය ඔස්සේ අර්ධ ස්ථාවර බැරැක්ක ඉදි කිරීමට මිල ගණන් කැඳවා තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියන්නට උත්සාහ කළා, එම නිලධාරින්ගේ නිල නිවාසවල ගරා වැටිච්ච තත්ත්වය ගැන. මම ළඟ මේ වෙලාවේදී දත්ත නැතත් ඉතිහාසය තුළ බන්ධනාගාර වෙනුවෙන් වෙන් කරපු වැඩිම මුදල අපි මෙවර වෙන් කර තිබෙනවා. නමුත් ඔවුන්ට වැඩ කරගන්න තාක්ෂණිකව සහ engineersලාගේ ගැටලු තිබෙනවා. ඒ පහසුකම් ලබා දෙන්නට ඕනෑ. මුදල්වල අඩුපාඩුවක් නැහැ. ඒ වාගේම, visit කරන්න ඕනෑ තැන් මමත්, ලේකම්තුමියත් visit කරනවා. ඊට අමතරව අපි මාසිකව වාර්තා කැඳවමින් මේ සිද්ධි නිරාකරණය කරනවා.

(iv) නිලධාරින් සඳහා සෞඛ්‍ය සායන සංවිධානය කිරීම සහ බෝ නොවන රෝග සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදු කිරීම වෛද්‍ය අධිකාරිය හරහා සිදු වෙනවා.

- 2025 වසරේ බස් රථ 40ක්, වෑන් රථ 15ක්, ගලි බවුසර් 5ක්, ට්‍රැක්ටර් 3ක් මිලදී ගෙන තිබෙනවා.
- ඊට අමතරව 2026 වර්ෂයේදී බස් රථ 20ක්, වෑන් රථ 11ක්, කාර්ය මණ්ඩල කැබ් රථ 10ක්, ට්‍රැක්ටර් 2ක් මිලදී ගැනීම සඳහා කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ නිර්දේශයට යොමු කරලා තිබෙනවා. BEC එක පත් කරලා තිබෙනවා. මේවායේ නිලධාරින්ගේ සුබසාධනය පිණිස පුහුණු පාසල් ශක්තිමත් කිරීමට බස් රථයක් හා වෑන් රථයක් ලබා දී තිබෙනවා.
- වසර තුළ නිලධාරි ධාරිතා ප්‍රවර්ධනයට රුපියල් මිලියන 46ක් වෙන් කරලා තිබෙනවා.
- නිලධාරින් සඳහා අවි පුහුණුව ලබා දීමට අවශ්‍ය කටයුතු කර තිබෙනවා.
- ආරක්ෂක උපකරණ ලබා දීමට කටයුතු කර තිබෙනවා.
- නිලධාරි ආරක්ෂාව පිණිස බොඩි කැමරා 20ක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවා තිබෙනවා.
- Riot helmets -150, riot battons - 300, riot shields -300 මිලදී ගැනීමට රුපියල් මිලියන 13.7ක් වෙන් කරලා මිල ගණන් කැඳවීමට කටයුතු කර තිබෙනවා.

05. එකී ගැටුමෙන් මිය ගිය රැඳවියන්ගේ සංඛ්‍යාව 22යි.

06. තුවාල ලැබූ රැඳවියන් සංඛ්‍යාව 106යි.

07. මෙහිදී කලින් සඳහන් කළ පරිදිම කණ්ඩායම් දෙකක් අතර ඇති වූ ගැටුමකදී තමයි මේ දේ සිද්ධ වෙලා තිබෙන්නේ. නමුත් එතැනින් එහාට ගිය වෙනත් වරදක් සිදු වෙලා තිබෙනවාද කියන එක සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරමින් පවතිනවා. ඒ වාගේම, මේ සම්බන්ධයෙන් වූ ජනාධිපති විමර්ශන කමිටුවේ වාර්තාවත් දැන් ජනාධිපතිවරයා වෙත යොමු කර තිබෙනවා. ඊට අමතරව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව විමර්ශන කරමින් පවතිනවා.

08. ඒ සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂණවල තොරතුරු මෙතැනට ඉදිරිපත් කරන්න පුළුවන් තත්ත්වයක නැහැ. මක්නිසාද, CID එකේ විමර්ශන තවම අවසන් නැහැ. ඒ වාගේම, මේ වනවිට යම් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම් පවා සිදු කර තිබෙනවා, මේ වරද සම්බන්ධයෙන්.

09. ඔවුන් මාරු කර ඇති බන්ධනාගාර ගත්තොත්, වැලිකඩ, අනුරාධපුරය, වාරියපොල, යාපනය, බෝගම්බර, මොනරාගල, බූස්ස, කුරුවිට, අඟුණකොළපැලැස්ස, පොළොන්නරුව, මඩකලපුව, කළුතර සහ පල්ලන්සේන යන ස්ථානවලට ඔවුන්ව විතැන් කර තිබෙනවා.

10. එම බන්ධනාගාරවලදී ඔවුන් වධ හිංසාවලට ලක් කළ බව දන්නේ නැහැ. නමුත් ඒ සම්බන්ධයෙන් මුහුණු පොත්වල නොයෙකුත් පැමිණිලි රාශියක් සඳහන් වෙලා තිබෙනවා. ඒ නිසා අපේ ලේකම්තුමිය විසින් අමාත්‍යාංශ මට්ටමින් විමර්ශන කමිටුවක් පත් කරලා, රැඳවියන්ට පහරදීම් සිදු වී ඇද්ද යන්න සම්බන්ධයෙන් සොයා බලනවා.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

11. ස්ථාන මාරු කිරීම් සමඟ බන්ධනාගාරවල ඉඩ පහසුකම්වල ගැටලු මතු වී ඇති බව පිළිගන්නවා. මොකද, ඒවායේ කලිනුත් ඉඩකඩ අඩුවෙනුයි තිබුණේ. බන්ධනාගාරවල ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ. මොකද, අපි මේ වනවිට විශේෂ ආරක්ෂක විධිවිධාන රාශියක් ක්‍රියාත්මක කර තිබෙනවා. ලැබෙන බුද්ධි තොරතුරු අනුව අපි අවශ්‍ය පියවර ගන්නවා.

12. බන්ධනාගාරවල අතීතයේදීත් ගැටුම් ඇති වුණා. ඉදිරියේදීත් ඇති විය හැකියි. ඒක මෙහේ විතරක් නොවෙයි, හැම තැනම සිදු වෙනවා. අවශ්‍ය වන්නේ ඒ ගැටුම් අවම කිරීමත්, එවැනි ගැටුමක් ඇති වූ පසු ඉතා ඉක්මනින් ඒක කළමනාකරණය කරගෙන ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමත්ය. ඒ සඳහා වන කැබිනට් කමිටුවක් පසුගිය සතියේ ගරු ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබෙනවා. ඒ කැබිනට් කමිටුවේ සභාපතිත්වය දරන්නේ මම. ආනන්ද විජේපාල මැතිතුමාත් ඒ කමිටුවේ ඉන්නවා. ඒ වාගේම, නීතිපති, රජයේ රස පරීක්ෂක, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් යන සියලුදෙනාම නියෝජනය කරමින් තමයි ඒ කමිටුව ක්‍රියාත්මක වන්නේ.

එම කමිටුවේ කාර්යභාරය පහත පරිදි වෙනවා.

i. බන්ධනාගාර තදබදයට බලපාන හේතු හඳුනා ගෙන ඒවා විශ්ලේෂණය කිරීම.

ii. රැඳවියන්ගේ නඩු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

iii. රජයේ රස පරීක්ෂක වාර්තා නිකුත් කිරීමේ ප්‍රමාදය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග යෝජනා කිරීම.

iv. ඇප ලබා දීමේ ක්‍රමවේදය, විකල්ප දඬුවම් ක්‍රම සහ ප්‍රජා පාදක පුනරුත්ථාපන ක්‍රමවේද පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.

v. අවශ්‍ය නීති සංශෝධන සහ පරිපාලන ප්‍රතිසංස්කරණ හඳුනා ගෙන යෝජනා කිරීම.

vi. බන්ධනාගාර ධාරිතාව සහ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

vii. නියමිත කාල සීමාව ඇතුළත සිය අවසන් වාර්තාව ගරු ජනාධිපතිතුමාට හා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

13. අදාළ නොවේ.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

සභාව කල් තබන අවස්ථාවේ මීළඟ ප්‍රශ්නය, ගරු අජිත් අගලකඩ මහතා.

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා මෙම ප්‍රශ්නය අහන්නේ නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන්.

එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ වාර්තාවකට අනුව ආදායම් මට්ටමට සාපේක්ෂව නිවසක් මිලදී ගැනීමට හෝ තනා ගැනීමට වඩාත් අසීරු රටවල් අතර දෙවන ස්ථානයට ශ්‍රී ලංකාව පත්ව ඇත්තේ පසුගිය පාලන සමයන්හි පැවති අධික උද්ධමනය, ජාලගත නොවූ නිවාස ප්‍රතිපත්ති සහ ගොඩනැඟිලි ද්‍රව්‍යවල අධික මිල ගණන් හේතුවෙනි. වත්මන් රජය මධ්‍යම හා අඩු ආදායම්ලාභී ජනතාවගේ නිවාස අයිතිය තහවුරු කිරීම සඳහා සහනදායී ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් සිදු කරමින් සිටී.

(I) එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ වාර්තාව මඟින් පෙන්වා දී ඇති පරිදි මෙරට ජනතාවට නිවසක් හිමි කර ගැනීමට අසීරුතාව අවම කිරීම සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ගොඩනැඟිලි ද්‍රව්‍ය මිල ගණන් පාලනය කිරීමට සහ බදු සහන ලබා දීමට රජය ගෙන ඇති කඩිනම් පියවර මොනවාද?

(II) මධ්‍යම පාන්තික සහ අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් සහනදායී පොලී අනුපාත යටතේ දීර්ඝ කාලීන නිවාස ණය ලබා දීමට රාජ්‍ය සහ පෞද්ගලික බැංකු පද්ධතිය උනන්දු කරවීම සඳහා රජය සකස් කර ඇති ප්‍රතිපත්තිය කුමක්ද?

(III) නාගරික ජනාකීර්ණ ප්‍රදේශවල වෙසෙන ජනතාව උදෙසා ක්‍රියාත්මක වන රාජ්‍ය නිවාස ව්‍යාපෘති කඩිනම් කර සාධාරණ වාරික ක්‍රමයක් යටතේ හිමිකාරිත්වය පැවරීමට නිවාස සංවර්ධන අධිකාරිය හරහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

(IV) රාජ්‍ය හා පෞද්ගලික හිමිකාරිත්වය යටතේ අඩු පිරිවැය නිවාස - low-cost housing projects - නිර්මාණය කිරීම සඳහා විදෙස් ආයෝජකයන්ට ලබා දීමට නියමිත දිරිගැන්වීම් කවරේද?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලෝක ඉතිහාසයේ ගඩොල් කැටය හොයාගෙන අද වනකොට ආසන්න වශයෙන් අවුරුදු 7,000ක් විතර වෙනවා. ශ්‍රී ලංකා ඉතිහාසයේ ගඩොල් කැටය හොයාගෙන අද වනකොට ආසන්න වශයෙන් අවුරුදු 3,000ක් විතර වෙනවා. එහෙම තත්ත්වයක් තුළ දරු පැටවුන් එක්ක එකතු වෙලා ජීවිතය සහනදායීව, සැනසිලි සහිතව ගත කරන්න තවමත් නිවසක් තනා ගැනීම මේ තරම් අර්බුදයක් වෙලා තිබෙන එක කනගාටුවට කරුණක් වෙලා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ තොරතුරුවලට අනුව Visual Capitalist කියන ආයතනය තමයි රාජ්‍යයන් මේ ආකාරයෙන් පෙළ ගස්වා වාර්තාව නිකුත් කරලා තිබෙන්නේ. නිවසක් මිලදී ගැනීම සඳහා යන වියදම සහ ආදායම අතර අනුපාතය තමයි මේකට මූලික කරගෙන තිබෙන්නේ. ඒ වාර්තාවට අනුව අපේ රට දෙවැනි තැනට පත් වෙලා තිබුණත්, මේ වනකොට ලෝකයේ බිලියන 3.4ක විතර නිවාස හිඟයක් තිබෙනවා කියලා එහි සඳහන්ව තිබෙනවා. ඒ වාගේම ලංකාවේ ආසන්න වශයෙන් මිලියන 1.1ක විතර නිවාස හිඟයක් තිබෙනවා කියලා වාර්තා වෙලා තිබෙනවා.

නිවසක් කියන්නේ නිකම්ම බිත්ති, වහල, ගෙබිම තිබෙන ගොඩනැඟිල්ලක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. දරු පැටවුන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය, අධ්‍යාපනය, අනාගත සිහින සියල්ලම ගොඩනැඟිලා තිබෙන්නේ මේ නිවස ඇතුළේ. එහෙම තත්ත්වයක් යටතේ, නිවසක් තනා ගැනීම විශාල ගැටලුවක් වෙනවා නම් ඒක රටක සමාජ සාධාරණත්වය පිළිබඳ ප්‍රශ්නයකට හේතු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රජයක් විධියට අපි මේ දත්ත, සංඛ්‍යා පදනම් කර ගෙන තිබෙන්නේ 2023 වර්ෂය දක්වා පමණයි. 2023 වර්ෂයේ අපේ රටේ තිබුණු ආර්ථික මට්ටමත් එක්ක තමයි ශ්‍රේණිගත කිරීම්වලදී මේ රට දෙවැනි තැන කියලා කියන්නේ. එහෙම වුණත් වගකිව යුතු රජයක් විධියට අපේ රටේ ජනතාවට සුරක්ෂිත නිවසක් තනා දීම සම්බන්ධයෙන් අපට වගකීමක් තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීන්දු අරගෙන තිබෙනවා. මේ ඇති වී තිබෙන තත්ත්වය සමනය කර

ගැනීම සඳහා අපේ රජයේ නව ප්‍රතිපත්ති යටතේ රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද? මා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන ලෙස ගරු අමාත්‍යතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)

(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, UN-Habitat ආයතනය - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව ජනාවාසකරණය සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන නියෝජිත ආයතනය - විසින් නිකුත් කරපු වාර්තාවේ අපේ රට නිවාස මිලදී ගැනීමේ හැකියාව අතින් දෙවැනි තැනට පත්වෙලා කියලා තිබුණු ප්‍රවෘත්තියත් සමඟ මාධ්‍යවේදීන් කිහිපදෙනෙකුම මගෙන් විමසුවා, අපේ රටේ තත්ත්වය එතරම් හොඳ නැහැ නේද කියලා. මම දැක්කා, සමාජ මාධ්‍යයේත් මේක විවිධ විධියට වාර්තා කර තිබුණු ආකාරය. මේ අදහස නිවැරදි කරන්න පිළිතුරක් ලබා දෙන්න මම මේක අවස්ථාව කරගන්නවා. විශේෂයෙන්ම අපේ රට ගත්තාම, ඔබතුමිය දන්නවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා, අපේ රටේ ආර්ථික ස්ථායීකරණය හොඳයි, හොඳ පැත්තට යමින් තිබෙනවා කියලා. ලෝක බැංකුව ගත්තාම, අපි මැදි ආදායම්ලාභී රටක් ලෙස ඉහළට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම, S&P Global Ratings, Moody's Ratings වාගේ ශ්‍රේණිගත කිරීමේ ආයතන අපේ ආර්ථිකය ණය ගෙවීමේ හැකියාව අතින් හොඳ තැනකට ගෙනෙමින් තිබෙනවා. ලෝක සාම දර්ශකය ගත්තාම, අපව ඒකක 30කින් ඔසවා තබා තිබෙනවා. ඒ වාගේම, අපේ passport එක ගත්තාමත්, අපව ඉහළ තැනකට ගෙනෙනවා. මේ වාගේ විවිධ අංශවලින් අපේ රට, අපේ ආර්ථිකය ඉහළට එනකොට මේ නිවාස ප්‍රශ්නය සම්බන්ධයෙන් පහළට යන්නේ ඇයි කියන කරුණ මතු කරමින් තිබෙනවා. නමුත්, මේ වාර්තාව 2023දී තිබුණු මිල ගණන් එක්ක, තිබුණු දත්ත එක්ක හදපු වාර්තාවක්. ඒ නිසා ඒක අදට ගළපන්න බැහැ. ඒ සම්බන්ධයෙන් තමයි මම පිළිතුර සකස් කර තිබෙන්නේ.

(I) එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන - UN-Habitat - විසින් නිකුත් කරන ලද World Cities Report 2026හි ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නිවාස දැරිය හැකිභාවය පිළිබඳ විශ්ලේෂණය පදනම් වී ඇත්තේ 2023 වර්ෂයේ දත්ත මතය. මෙම වාර්තාවේ, 2023 වසරේ ශ්‍රී ලංකාවේ නිවසක විකුණුම් මිලට ආදායම් අනුපාතය ඉතා ඉහළ මට්ටමක පැවැති බව දක්වා ඇති අතර, එය එවකට පැවැති ආර්ථික අර්බුදය හේතුවෙන් ජනතාවට නිවාස හිමි කර ගැනීමේ අසීරුතාව ඉහළ ගොස් තිබූ තත්ත්වය පිළිබිඹු කරයි. 2023 වසරේ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය උද්ධමනය සියයට 17.9ක් වූ අතර, රුපියල අවප්‍රමාණ වීම, ඉහළ පොලී අනුපාත, ආනයන සීමා, ඉන්ධන සහ ප්‍රවාහන පිරිවැය ඉහළ යෑම සහ සැපයුම් දාම බාධා හේතුවෙන් සිමෙන්ති, වානේ, ටයිල්, විදුලි වයර් ඇතුළු ඉදිකිරීම් ද්‍රව්‍ය මිල සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබිණි. එහෙත් 2025 වසරේ උද්ධමනය සෘණ සියයට 0.5 දක්වාත්, 2026 වසරේ සියයට 5.5ක පමණ සාමාන්‍ය මට්ටමකට පත්වීමත් සමඟ සිමෙන්ති, ටයිල්, විදුලි වයර් ඇතුළු ප්‍රධාන ඉදිකිරීම් ද්‍රව්‍යවල වෙළෙඳ පොළ මිල 2023 වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇති අතර, නිවාස ඉදිකිරීමේ පිරිවැය ද අඩු වී තිබේ. එබැවින්, UN-Habitat වාර්තාවේ සඳහන් තත්ත්වය 2023 වසරේ ආර්ථික පසුබිම පිළිබිඹු කරන අතර, වර්තමාන තත්ත්වය ඊට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වී ඇත.

ඒ කියන්නේ, 2023 වසරේ උද්ධමනය සියයට 17යි දශම ගණනක්. දැන් උද්ධමනය ඊට වඩා අඩුවෙලා තිබෙනවා, තනි ඉලක්කමකට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අනිවාර්යයෙන් මේ ඉදිකිරීම් කර්මාන්තයේ නිවාස ඉදිකිරීම් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යවල මිල අඩුවෙලා තිබෙනවා. ඒ නිසා මේ කියන නිර්ණායකය දැන් පහළට ඇවිල්ලා තිබෙනවා, ශුභවාදී තැනකට ඇවිල්ලා තිබෙනවා. ඒ අතින් අපි දැන් ලෝකයේ දෙවැනි තැන නොවෙයි.

(II) 2026 අය වැය කථාවේ 33.5 ඡේදය යටතේ රාජ්‍ය සේවකයන්ට ලබාදුන් දේපළ ණය යෝජනා ක්‍රමය නව ව්‍යුහයක් යටතේ රුපියල් ලක්ෂ 50 දක්වා ණය ලබා ගැනීමට හැකිවන පරිදි සක්‍රිය කිරීමට යෝජනා කර ඇති අතර, එහිදී මුල් රුපියල් ලක්ෂ 30 දක්වා සියයට 4ක පොලී සහනයක් ද, රුපියල් ලක්ෂ 30 සිට 50 දක්වා සියයට 2ක පොලී සහනයක් ද ලබාදීම සඳහා රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කර ඇත.

(III) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය දිවයින පුරා ස්ථිර නිවසක් නොමැතිව ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා ස්ථිර නිවාස ලබා දීමට රජයේ පූර්ණ අනුග්‍රහය ඇතිව "තමන්ගේම තැනක්-ලස්සන ජීවිතයක්" නිවාස ආධාර වැඩසටහන සෑම ග්‍රාම නිලධාරි වසමක්ම මුල් කරගෙන ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ යටතේ අඩු ආදායම්ලාභීන් ඉලක්ක කරමින් වර්ග අඩි 550ක පමණ නිවසක් ඉදිකිරීම සඳහා රුපියල් ලක්ෂ 10ක ආධාර මුදලක් ලබාදෙනු ලැබේ. ඒ අනුව, 2026 වර්ෂයේ දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි මෙම වැඩසටහන යටතේ නිවාස 9,700ක් අලුතින් ඉදිකිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර වැඩ අවසන් කරමින් පවතී. එසේම, පහළ මැදි ආදායම්ලාභීන්, අඩු ආදායම්ලාභීන් හා රාජ්‍ය සේවකයන් ඉලක්ක කර ගනිමින් සහනදායි කොන්දේසි යටතේ රුපියල් ලක්ෂ 15 දක්වා ණය මුදලක් ලබාදෙනු ලැබේ. ඒ යටතේ 2026 වර්ෂය සඳහා නිවාස 3,500ක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 3,500ක් ඇස්තමේන්තු කර ඇත. මීට අමතරව ස්ථිර නිවසක් හෝ ඉඩමක් නොමැතිව ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල් සහ කුලී නිවැසියන් සඳහා ස්ථිර නිවසක් ලබා දීමේ අරමුණින් දිස්ත්‍රික්ක 6ක මහල් නිවාස ව්‍යාපෘති ඉදිකිරීම සඳහා 2027 වර්ෂයේදී අය වැය ප්‍රතිපාදන ලබා ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. එසේම, රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතනවල සහනදායී මූල්‍ය ආධාර යටතේ ණය මුදලක් ලබාගෙන පහළ හා මැදි - මධ්‍යම - ආදායම් පවුල් සඳහා පුළුල් වූ නිවාස වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයා බලමින් පවතී.

තවද, උතුරු නැඟෙනහිර පැවැති යුද්ධය ගැටුම්වලින් අවතැන් වූ පවුල් නැවත පදිංචි කරවීමේ වැඩසටහන යටතේ 2026 වර්ෂය සඳහා ඉදිකිරීමට අපේක්ෂිත මුළු නිවාස ගණන 2,411ක් වන අතර, ඒ සඳහා එක් නිවසකට රුපියල් මිලියන 2 බැගින් රුපියල් මිලියන 4,822ක මුදලක් වෙන් කර ඇත.

(IV) මධ්‍යම ආදායම් සහිත පවුල් සහ කුලී නිවාසවල සිටින පවුල් සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව මොඩලය - PPP model - යටතේ නිවාස ඉදිකිරීමට මේ වනවිට පෞද්ගලික අංශය සමඟ සාකච්ඡා කරමින් පවතී.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේකෙන් අදහස් කරන්නේ 2023 වසරට සාපේක්ෂව අපේ රටේ ඉදිකිරීම් වියදමත් අඩුවෙලා තිබෙනවා, නිවාස මිලත් අඩුවෙලා තිබෙනවා කියන එකයි. ඒ වාගේම අපි නිවාස ඉදිකර ගැනීම සඳහා සහනයක් අවශ්‍ය ජනතාවට සහ

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

කණ්ඩායම්වලට රජය විධියට සහයෝගය දෙමින් ඉන්නවා. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නැවත පදිංචි කිරීමේ අංශය හරහා අපේ අමාත්‍යාංශයෙන් පමණක් පවුල් 12,000කට ගෙවල් 12,000ක් සඳහා සෘජු ආධාර දෙනවා. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන සියල්ල හරහා මේ අවුරුද්දේ දළ වශයෙන් පවුල් 20,000කට වැඩි සංඛ්‍යාවකට රජය සෘජු ආධාර ලබා දෙනවා. ඒවා ණය නොවෙයි, ආධාර. එම නිසා, දහස් ගණනක් වන පවුල් සඳහා, ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා වියදම් දරන්න බැරි අයට රජය විධියට අපි සහන ලබා දෙමින් ඉන්නවා. ඒ වාගේම, රාජ්‍ය සේවකයින්ට නිවාස ණය ලබා ගැනීම සඳහා එහි පොලිය අඩු කරන්න අපි රුපියල් බිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. මෙම ක්‍රියාමාර්ග හරහා අපි ජනතාවට නිවාසයක් හදා ගන්න වාගේම, නිවාසයක් මිලදී ගැනීම සඳහාත් සහන සලසා තිබෙනවා. එම නිසා, ලංකාව මේ වාර්තාවේ දෙවැනි තැනට දාලා තිබෙන එක 2023 වසරට අදාළ එකක්. නමුත්, අපි දැන් ඒක වෙනත් තැනකට ගෙනැල්ලා තිබෙනවා. අපේ ජනතාවට සහනයක් ලබා දීලා තිබෙනවා. අවුරුදු එකහමාරක්, දෙකක් ඇතුළත නිවාස පැත්තෙන් අපි මෙච්චර ගමනක් ඇවිල්ලා තිබෙනවා නම්, ඊළඟ අවුරුදු තුන, තුනහමාර ඇතුළත අපේ රටේ ජනතාවට නිවාස වෙනුවෙන් විශාල සහනයක් ලබා දෙන්න, ආධාරයක් ලබා දෙන්න රජය විධියට අපට පුළුවන් කියලා මම හිතනවා. ඒ සඳහා අපි සූදානම් වෙලා ඉන්නවා සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් ඉන්නවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.08ට, 2026 අගෝස්තු 07වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.08க்கு, பாராளுமன்றம் 2026 ஓகஸ்ட் 07, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.08 p.m. until 9.30 a.m. on Friday, 07th August, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.